

# අද්විතීය ආරක්ෂාව සමඟ අනාගතය සුරක්ෂිත කර ගැනීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2024

අපගේ මූලාශ්‍ර ශක්තිය තුළ ස්ථානගතවීම නව්‍යකරණය හා ප්‍රගතිය සඳහා ස්ථිර අවධානය යොමු කරන අතර ඉන් ක්ෂේත්‍රයෙන් ඔබ්බට අද්විතීය ආරක්ෂාව පිරිනැමීම සඳහා අපගේ හැකියාව නියෝජනය කරයි. අවදානම් අවම කරමින් ආරක්ෂාව පිරිනැමීම කෙරෙහි අපි අවධානය යොමු කළ බැවින් 2024 දී සිදු වූ පරිවර්තනීය සංක්‍රාන්තිය අපගේ ස්ථාවරත්වය හා ප්‍රගතිය වැඩි කර ඇත. අපගේ සුපිරි නිෂ්පාදන රාමුව සමඟ අප පිරිනමන සදාචාර ප්‍රවේශය සහ විනිවිදභාවය කාලය පුරා ලද ප්‍රවීනතාව සමඟ රක්ෂණ සේවා සපයන්නෙක් ලෙස තරඟකාරිත්වයෙන් අපව වෙන් කරයි. ව්‍යාපාර සහ පුද්ගල වත්කම්වල අනාගතය සුරක්ෂිත කරමින්, තිරසාර දිගුකාලයක් සඳහා වටිනාකම් නිර්මාණය තුළ සිය වෙළෙඳපොල නායකත්වය ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් තවදුරටත් ශක්තිමත් කරයි. අපගේ දශක ගණනාවක පළපුරුද්ද තුළින් විශිෂ්ඨත්වය හා අඛණ්ඩතාව සමඟ ජාතියට සහ එහි ජනතාවට අපි සේවය කරමු.

# Cont

## 01 අප ගැන

5 ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ගැන
6 අධ්‍යක්ෂ මණ්ඩලය
11 නායකත්ව කණ්ඩායම
21 මූල්‍යමය වැදගත් අවස්ථා
22 මූල්‍ය නොවන වැදගත් අවස්ථා

## 02 නායකත්ව සමාලෝචන

25 සභාපතිතුමාගේ පණිවිඩය
29 ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය

## 03 වාර්තා පැතිකඩ

33 වාර්තා පැතිකඩ

## 04 උපායමාර්ගය හා අවධානය

38 ව්‍යාපාර ආදර්ශය
40 ප්‍රමාණාත්මක ගැටළු
42 පාර්ශවකාර සම්බන්ධතා
44 උපායමාර්ගික ප්‍රමුඛතා

වාර්ෂික වාර්තාව බැලීමට මෙය ස්කෑන් කරන්න.
**Online** at https://www.srilankainsurance.com/en/about-us/annual-reports

tents

## 05 කළමනාකරණ අදහස් දැක්වීම


46 මෙහෙයුම් පරිසරය
48 මූල්‍ය ප්‍රාග්ධනය
52 නිෂ්පාදිත ප්‍රාග්ධනය
55 බුද්ධිමය ප්‍රාග්ධනය
57 මානව ප්‍රාග්ධනය
62 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
75 ස්වභාවික ප්‍රාග්ධනය


## 06 පාලනය හා අවදානම් අධීක්ෂණය


80 ආයතනික පාලන වාර්තාව
84 විගණන හා අනුකූලතා කමිටු වාර්තාව
86 ආයෝජන කමිටු වාර්තාව
88 අවදානම් කළමනාකරණ වාර්තාව
94 අනුකූලතා වාර්තාව
98 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය


## 07 මූල්‍ය වාර්තා


100 සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව
104 අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
105 අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
106 දරන ලද නමුත් වාර්තාකළ හිමිකම් (ප්‍රමාණවත්) පිළිබඳ සහතිකය
107 ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
110 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
111 ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
112 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
114 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
116 අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව


## 08 අතිරේක තොරතුරු


167 රක්ෂණ ව්‍යාපාරයේ කාර්යසාධනය
168 දශ වසරක සාරාංශය ආදායම ප්‍රකාශය
170 දශ වසරක සාරාංශය ශේෂ පත්‍රය
172 ශාඛා ජාලය
184 ආයතනික තොරතුරු
185 මහ සභා රැස්වීමේ නිවේදනය
පෙරකලාසි ආකෘතිය අමුණා ඇත.

# 01

# අප ගැන




5
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ගැන

6
අධ්‍යක්ෂ මණ්ඩලය

11
නායකත්ව කණ්ඩායම

21
මූල්‍යමය වැදගත් අවස්ථා

22
මූල්‍යමය නොවන වැදගත් අවස්ථා

# ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ගැන

රජයට අයත් සංස්ථාවක් ලෙස 1962 දී පිහිටුවන ලද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) රක්ෂණ ක්ෂේත්‍රයේ ජාතියේ පුරෝගාමියා වන අතර, රටේ වඩාත් පළපුරුදු රක්ෂණ සපයන්නා වීමේ ගෞරවයට හිමිකම් කියයි. වඩාත් හොඳින් ජනතාවට සේවය කිරීමේ එහි ප්‍රධාන මෙහෙවර සමඟ යමින්, මෙම සමාගම එහි සේවාවල ලඟාවීම පුළුල් කිරීමට කැප වී සිටින අතර, නවෝත්පාදනය, අගය එකතුකළ විසඳුම් අඛණ්ඩව ලබා දේ. ගනුදෙනුකාර පහසුව සහ සේවා අත්දැකීම කෙරෙහි මෙම නොසැලෙන අවධානය ක්ෂේත්‍රයේ මංසලකුණු අඛණ්ඩව තබන අතර රක්ෂණ වාතාවරණය තුළ සමාගමේ නායකත්වය ශක්තිමත් කරයි.

රක්ෂණ නියාමකගේ මාර්ගෝපදේශ හා රජයේ උපදෙස් සමඟ පෙළ ගැසෙමින්, මෙම සමාගම 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව නෛතික ප්‍රතිව්‍යුහගතකරණයක් සිදුකර ඇත. සමාගම හිමිකාර සමාගම් ව්‍යූහයක් යටතේ වෙනම නීතිමය ආයතන දෙකක් ලෙස වෙන් කරන ලද අතර, සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම් දෙකක් එනම් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් ලිමිටඩ් (SLIC ලයිෆ්) සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ජෙනරල් ලිමිටඩ් (SLIC ජෙනරල්) ස්ථාපිත කිරීමට හේතු විය. මෙම ප්‍රතිව්‍යුහගතකරණය එක් එක් සමාගමට අදාළ ව්‍යාපාරය කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කිරීම සඳහා කැපවීම ශක්තිමත් කරන අතර වඩා ඉහළ වටිනාකම් ලබා දීම සහ සිය ඉලක්කගත වෙළෙඳපොළ අංශවල අසමසම අවශ්‍යතා වඩාත් ඵලදායීව හඳුනා ගැනීම සිදු කරයි.

සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරියේ සිට මෙහෙයවමින්, සිය අත්‍යවශ්‍ය හා වෙනස්වන අවශ්‍යතා විසඳමින් සමාජයේ සෑම කොටසකටම ගැලපෙන ඉහළම ගණයේ නිෂ්පාදන අපි පිරිනමමු. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සහතික කළ මනාව පුහුණුව ලත් රක්ෂණ ප්‍රවීණයින්ගේ කණ්ඩායමම විවිධ නිෂ්පාදන කළඹක් තුළින් අවශ්‍යතාව පදනම් නිෂ්පාදන පිරිනමමින් ප්‍රජාවට සේවය කරන අතර ගනුදෙනුකාර දත්ත සහ රහස්‍යතාව ආරක්ෂා කිරීමට උපරිම සලකා බැලීම සමඟ හිමිකම් ගොනු කිරීමේදී සහය වේ.

බැංකුකරණය, මූල්‍ය, සෞඛ්‍යාරක්ෂාව, විදුලි බලය හා බලශක්තිය, සහ සත්කාර සේවාවන් කිහිපයක විචක්ෂණ ආයෝජනයන්ගෙන් ආයෝජන මත ඔරොත්තුදෙන ප්‍රතිලාභ, තිරසාර මෙහෙයුමට දායක වීම සහ වර්තමානයට අදාළ සහ අනාගතයට සූදානම්බව සහතික කරන අතර ජාතියේ ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා රජය සමඟ අපි අඛණ්ඩව හවුල් වී සිටිමු.

## අපගේ අරමුණ

සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සකස් කරන ලද රක්ෂණ විසඳුම් සමඟ, ඔවුන්ගේ ජීවිත ශක්තිමත් කරමින් සියලුදෙනාටම රක්ෂණය කරා එළඹීමට කටයුතු කරමු.

## අපගේ දැක්ම

අවදානම් ආරක්ෂාව තුළ ජාතියේ පළමු තේරීම බවට පත්වීම

## අපගේ මෙහෙවර

සියලුම පාර්ශවකරුවන් සඳහා මූල්‍ය සුරක්ෂිතතාව පෝෂණය කරමින් නවෝත්පාදන හා පුද්ගලගත විසඳුම් සපයමින් අපගේ සේවාදායකයින්ගේ අපේක්ෂාවන් ඉක්මවා යාම

## අපගේ වටිනාකම්

**අන්‍යෝන්‍ය විශ්වාසය හා ගරුත්වය:** ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය, කුලය, ආගම හෝ වෙනත් යම් වෙසත්වීම නොසලකා පුද්ගලයින් සහ තනතුරු සඳහා ගෞරවය විදහා දැක්වීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ. උසස් නිලධාරීන්, සගයන්, සමවයසේ මිතුරන්, යටත් නිලධාරීන්, ගණුදෙනු කරුවන් සහ සාමාජිකයින් ඇතුළුව ආයතනයේ සියලුම පාර්ශවකරුවන්ට මෙය අදාළ වේ. මෙම ආකල්පය පාර්ශවකරුවන් සමඟ සියලුම මැදිහත්වීම්වල දී පිළිබිඹු විය යුතුය.

**එකමුතු බව:** සියලුම පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමේදී සහ උපකාරී වැඩ කණ්ඩායමක් ගොඩ නැගීමේ අරමුණ සමඟ සහය, සම්පත්, සහ සහයෝගිතාව පුළුල් කිරීම මගින් සෑම අවස්ථාවකදීම පුද්ගල හෝ කණ්ඩායම් අපේක්ෂා කළ අරමුණු ඉටු කිරීම කරා වැඩ කිරීමේදී මෙම හැසිරීම විදහා දැක්වීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ.

**අවංකකම සහ සදාචාර චර්යාව:** සමාගම සේවකයින්ගේ ස්ථිර අවංකකම සහ ශක්තිමත් සදාචාරාත්මක චර්යාව ශක්තිමත්ව ප්‍රවර්ධනය කරන අතර, සෑම සේවකයෙකුගෙන්ම සෑම අවස්ථාවකදීම සදාචාරාත්මක සහ සමාජීය වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් ඔවුන්ගේ පුද්ගලික හා වෘත්තීමය රාජකාරි කරගෙන යනු ඇතැයි බලාපොරොත්තු වේ.

**වෘත්තීමය කැපවීම:** සමාජයට අයත් ඉහළ සදාචාරාත්මක සම්මත සමඟ පෙළ ගැසෙමින් සමාගමේ පාර්ශ්වකරුවන් සමඟ පුද්ගලික හා වෘත්තීමය මැදිහත්වීම් තුළ සාධාරණ, විධිමත් හා කාර්යක්ෂම හැසිරීම සහතික කිරීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ.

**නොනවතින විශිෂ්ඨත්වය:** සමාගමේ නියමිත නීති හා රෙගුලාසි සහ ප්‍රමිති පිළිපදිමින් පාර්ශවකාර අපේක්ෂාවන් ලබාදීම සහ ඉක්මවායාම කරා සියලුම උත්සාහයන් යොමු කළ යුතුය.

# අධ්‍යක්ෂ මණ්ඩලය



රොහාන් බුල්ජන්ස් මහතා | දුෂ්මන්ත තොටවත්ත මහතා | නුසිත් කුමාරතුංග මහතා



**රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා**

**නීල් උනම්බුව මහතා**
**ජනාධිපති නීතිඥ**

**රජීව් ධර්මේන්ද්‍ර මහතා**

**ශිරෝමි කෝදාගොඩ මිය**



**නුසිත් කුමාරතුංග මහතා**
අධ්‍යක්ෂ

නුසිත් කුමාරතුංග මහතා දශක තුනක අත්දැකීම සහිත කීර්තිමත් මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වතු කළමනාකරණය හා තාක්සේරුකරණය පිළිබඳ විශේෂවේදී උපාධියක් ඔහු සතුවේ. ඔහුගේ වෘත්තීය ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් හි ආරම්භ කළ අතර, 2000 වසර තුළ, නුසිත් කුමාරතුංග සමාගම නමින් ඔහුගේම සමාගමක් ආරම්භ කළේය. එය විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) කෙරෙහි අවධානය යොමුකළ විගණනය, බදු සැලසුම් කිරීම, සහ ව්‍යාපාර උපදේශන සේවා පිරිනමන මනාව පිළිගත් ආයතනයකි.

කුමාරතුංග මහතා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීමේදී ප්‍රධාන තැනැත්තෙක් වූ අතර ව්‍යවසායකයින්ට ඔවුන්ගේ මූල්‍ය කළමනාකරණ නිපුනතා වැඩිකර ගැනීමට ඔවුන්ට සහයවීමට ලෝක බැංකුව හා මුදල් අමාත්‍යාංශය විසින් අරමුදල් යොදන ලද පුහුණු වැඩසටහන් බොහොමයක් පවත්වා ඇත. එමෙන්ම ඔහු බදුකරණය සහ ආර්ථික ප්‍රතිපත්ති වර්ධනය කිරීමේ උපදේශක මණ්ඩලවල සේවය කරමින් ජාතික ආර්ථික සාකච්ඡාවන් හී මැදිහත් වී ඇත. වර්තමානයේ කුමාරතුංග මහතා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි සභාපතිවරයා වන අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්ද වේ.



**දුෂ්මන්ත තොටවත්ත මහතා**
අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 අගෝස්තු 22 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ඔහු කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ සහ එල්සීබී ෆිනෑන්ස් පීඑල්සි හි සභාපතිවරයාද වේ. තොටවත්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ උපාධියක් (විශේෂ උපාධිය) සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථිකයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි. ඔහු ප්‍රවීන නායකයෙක් වන අතර, ඔහුට මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ගික කළමනාකරණය සහ මහජන සම්බන්ධතා සමඟ රජයට අයත් ව්‍යවසාය සහ පුද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක යන තනතුරුවල සාර්ථක ගමන් වාර්තාවක් සමඟ විස්තීර්ණ පළපුරුද්ද ඇති අතර වසර 40කට වැඩි පළපුරුද්ද ඇත.



**රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා**
අධ්‍යක්ෂ

රවින්ද්‍ර පත්මප්‍රිය මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

පත්මප්‍රිය මහතා කීර්තිමත් රාජ්‍ය සේවකයෙක් වන අතර ඔහුට රාජ්‍ය අංශයේ විවිධ තනතුරුවල වසර 35කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු දැනට මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස සේවය කරයි.

ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත.



**රජීව් ධර්මේන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ

2019 මාර්තුවල, ධර්මේන්ද්‍ර මහතා මාස් සමූහයේ විශාලතම ව්‍යාපාර ඒකකය වන, මාස් ඉන්ටිමේට්ස් හි නායකත්වය භාරගන්නා ලදී. මාස් හි වසර 21කට වැඩි පළපුරුද්ද ලබාගනිමින්, ධර්මේන්ද්‍ර මහතා 2003 දී යුනිචෙලා පානදුර – සාමාන්‍යාධිකාරී ලෙස බැඳුණු අතර, 2004 දී MAS/Sara Lee Courtaulds හවුල් ව්‍යාපාරයේ අධ්‍යක්ෂ වෙළෙඳ භාණ්ඩ කාර්යභාරයට උසස් කරන ලදී. ඔහුගේ කාර්යභාරය 2006 දී එවකට ඉන්ටිමේට්ස් හී නිෂ්පාදන පෙළේ ප්‍රධාන ගනුදෙනුකරුවන් හතර දෙනෙකු කෙරෙහි අවධානය යොමු කළ මාස් ඉන්ටිමේට්ස් හි ව්‍යාපාර අධ්‍යක්ෂ දක්වා පුළුල් විය.

ඔහු 2010 දී Silueta හි ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කරන ලද අතර එහිදී ඔහු සාර්ථක ඇඟලුම් සහ තාක්ෂණික නව්‍යකරණ කේන්ද්‍රය ලෙස Silueta පරිනාමය මෙහෙය වීම සඳහා වගකීම දරා ඇත. ඉන්පසුව ඔහු මාස් ඉන්ටිමේට්ස් හි අධ්‍යක්ෂ – සීමිත සන්නාම ලෙස පත්කරන ලද අතර 2016 සිට ප්‍රධාන විධායක නිලධාරී ලෙස ඔහුගේ පරිනාමනය දක්වා මාස් ඉන්ටිමේට්ස් හි ප්‍රධාන අලෙවිකරණ නිලධාරීගේ කාර්යභාරය සිදුකරන ලදී. මාස් ඉන්ටිමේට්ස් හි ඔහුගේ වගකීම්වලට අමතරව, ධර්මේන්ද්‍ර මහතා මාස් නවෝත්පාදන මණ්ඩලයට නායකත්වය ලබා දුන් අතර එම මණ්ඩලය සමස්ත මාස් සමූහ සමාගම් අතර නවෝත්පාදන න්‍යාය පත්‍රය හා ගමන්මග තීරණය කරයි.

ඔහු ලන්ඩන් කින්ග්ස් කොලීජියෙන් ගණිතය හා ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය දරන අතර ලන්ඩන් ආර්ථික විද්‍යා පාසලෙන් මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. ඔහුගේ විධායක අධ්‍යාපනය හාවර්ඩ් සහ INSEAD හි ව්‍යාපාර පාසල්වලින් විය. ඔහු 2025 ජනවාරි 01 දින සිට ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරයාගේ භූමිකාව තුළ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.



**රොහාන් බුල්ජන්ස් මහතා**
අධ්‍යක්ෂ

ටෙලිකොම්, න්‍යෂ්ටික, ඉන්ධන හා ගෑස් මූල්‍ය සේවා, හා තොරතුරු තාක්ෂණ, අංශවල ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙක් වන, බුල්ජන්ස් මහතා ආයතනයේ උපායමාර්ගික වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ටෙලිකොම්, ඩිජිටල් පරිනාමනය, දත්ත විශ්ලේෂණ, සයිබර් ආරක්ෂාව, ඩිජිටල් වාණිජ්‍ය සහ මතුවන තාක්ෂණයන් හි ඉටුකිරීම් තුළින් නායකත්වය ලබාදීමට ස්ථානගත කර ඇත.

ඔහු ඕස්ට්‍රේලියාවේ රෝයල් මැල්බෝර්න් තාක්ෂණික ආයතනයෙන් තොරතුරු තාක්ෂණය (MBIT) පිළිබඳ ව්‍යාපාර ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. සේවා විශිෂ්ටත්වය, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම සහ ව්‍යාපාර විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා විශාල පරිවර්තනීය තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති මෙහෙයවීම කෙරෙහි අවධානය යොමු කරමින් තොරතුරු තාක්ෂණ උපාය මාර්ග හා බැඳුණු ව්‍යාපාර නිර්මාණය කිරීමේ අත්දැකීම් ඔහු සතුය.

බුල්ජන්ස් මහතා ව්‍යාපාර ඵලදායිත්වය සහ හැකියාව වර්ධනය කිරීමට ව්‍යාපාර නවෝත්පාදනය, ප්‍රශස්ත සේවා ලබාදීම, පාරිභෝගික සහභාගීත්වය සහ තොරතුරු තාක්ෂණ පරිවර්තන ව්‍යාපෘති ගෙන එන ව්‍යවසාය ගෘහ නිර්මාණ/ව්‍යාපාර ගෘහ නිර්මාණ ශිල්පය ස්ථාපිත කර ඇත. ඔහුගේ ප්‍රවීනත්වයට ආයතනයේ තරඟකාරී වාසිය ඇගයීම, ඩිජිටල් අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සහ ඩිජිටල් උපායමාර්ගයක නිශ්චිත තරඟකාරී තත්ත්වය ශක්තිමත් කිරීමේ හැකියාව ඇතුළත්ය.

සමස්ත ටෙලිකොම් වටිනාකම් දාමය සහ බැංකු ඩිජිටල් පරිවර්තන ගමන පුරා ව්‍යාපාර ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව මෙහෙයවීමේදී සහ ව්‍යාපාරයට වටිනාකමක් ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ආකෘති ස්ථාපිත කිරීමේදී ඔහු දක්ෂයෙකි.

ජාත්‍යන්තරව පළපුරුදු බුල්ජන්ස් මහතාගේ ප්‍රවීනතාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, ටැන්සානියාව, ඉන්දියාව, ඊජිප්තුව, සෞදි අරාබිය සහ ශ්‍රී ලංකාවේ බොහෝ සමාගම් විසින් ලබාගනී. විචක්ෂණ හා පිරිවැය ඵලදායී ආකාරයෙන් තාක්ෂණය භාවිතා කරමින් ලාභදායී ප්‍රතිඵල ලබාදීමේදී විචක්ෂකයෙක් වන අතර විශාල ව්‍යාපෘති කිහිපයක් හරහා බහුසංස්කෘතික කණ්ඩායම් මෙහෙයවයි. ඩිජිටල් තාක්ෂණය හා එහි බලපෑම (IoT, කෘතිම බුද්ධිය, ඩිජිටල් සේවා ස්ථානය, Cognitive Computing, Blockchain, Big Data, Cloud, සමාජ මාධ්‍ය යනාදිය) යන ක්ෂේත්‍රවල සුවිශාල දැනුම් සම්භාරයක් හා අවබෝධයක් ඔහු සතුය.



**නීල් උනම්බුව මහතා, ජනාධිපති නීතිඥ**
අධ්‍යක්ෂ

නීති ක්ෂේත්‍රයෙහි දශක තුනකට වැඩි පළපුරුද්ද සහිත නීති වෘත්තිකයෙක් වන, ජනාධිපති නීතිඥ උනම්බුව මහතා විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල් වේ. ඔහුගේ කාලසීමාව තුළ, ඔහුගේ ප්‍රවීනතාව ඉහළ පැතිකඩ නීති විමර්ශණ, නියාමන අනුකූලතාව සහ රජයේ උපදේශන කාර්යභාරයන් හී ආයෝජනය කර ඇත. බුද්ධිමය දේපළ නීතිය, වානිජ නීතිය සහ මූල්‍ය නීතිය පිළිබඳ විශේෂඥයෙක් වන, ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයෙන් සහ ඉතාලියේ ටියුරින් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධි දෙකක් ලබා ඇත. ඔහු සයිබර් නීතිය, ගුවන් නීතිය සහ න්‍යෂ්ටික ආරක්ෂණ ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර පුහුණුවක් ලබා ඇත.

නීතිපති දෙපාර්තමේන්තුවේ ඔහුගේ ධූරය තුළ, ඔහුගේ නීතිමය උපදේශය මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන ඇත. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා න්‍යෂ්ටික බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ රජයේ වෙනත් ආයතන කිහිපයක් සඳහා නීති උපදේශකයෙක ලෙස සේවය කර ඇත. ඔහු දැනට නීතිය ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින අතර ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් කම්පැනි ලිමිටඩ් හී අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරයි.



**ශිරෝමි කෝදාගොඩ මහත්මිය**
සමාගම් ලේකම්

2024 අප්‍රේල් 02 දින සිට, ශිරෝමි කෝදාගොඩ මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කිරීම මත සමාගම් ලේකම් ලෙස කටයුතු කරමින් සිටී. ඇය සමාගම් ලේකම් කාර්යාලයේ සුමට පරිපාලනය සහතික කිරිමේදී සහ සමාගම් පනතේ විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූලතාව දක්වමින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ඇය සතුව පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් (BA) ඇත. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට බැඳුණු ඇය 1992 දී නීතිඥවරියක් ලෙස සිය වෘත්තිය ආරම්භ කර ඇත.

මෙම සමාගම හා බැඳීමට පෙර, කෝදාගොඩ මහත්මිය වසර 30ක් සඳහා කොකාකෝලා බෙවරේජස් ශ්‍රී ලංකා ලිමිඩට් හි සේවය කර ඇත. එම සමාගමේ ඇයගේ වෘත්තිය තුළ අධ්‍යක්ෂ (නීතිය හා පාලනය) සහ දේශීය සදාචාර නිලධාරිණී (LEO) ලෙස ඇය කටයුතු කර ඇත. එම පත්වීමට පෙර, ඇය අභ්‍යන්තර පොදු නීති උපදේශකවරිය ලෙස මෙන්ම එම සමාගමේ නීති නිලධාරිනී සහ කළමනාකරු – නීති ලෙස කටයුතු කර ඇත. ඇය දශකයට වැඩි කාලයක් කොකාකෝලා බෙවරේජස් හි සමාගම් ලේකම් ලෙස සේවය ඇත.

කෝදාගොඩ මහත්මියට ආයතනික නීති කටයුතු, අනුකූලතාවය, පාලනය, සදාචාර, නිෂ්පාදන වගකීම් නඩු කීම, සහ සිවිල් සහ කාර්මික නඩුකීම යන ක්ෂේත්‍රවල වසර 30කට අධික වෘත්තීමය නීති පළපුරුද්ද ඇත. කොකාකෝලා බෙවරේජස් හී ඇයගේ වෘත්තීය කාලය තුළ, ඇය ආයතනික පාලන ක්‍රියාවලි, ව්‍යවස්ථාපිත අනුකූලතාව සහ අංශයේ අනුකූලතා පාලන තන්ත්‍ර සංවර්ධනය කර පුළුල් වශයෙන් දායක වී ඇත.

# නායකත්ව කණ්ඩායම

## විධායක කමිටුවේ සාමාජිකයින්



**චන්දන එල්. අලුත්ගම මහතා**
සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී
B.com (Sp), CMgr FCMI (UK), MBA, ANZIIF (ජ්‍යෙෂ්ඨ සාමාජික) CIP

අලුත්ගම මහතා 2018 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස රාජකාරි භාරගෙන ඇත. ඔහුට රක්ෂණ කර්මාන්තය තුළ විවිධ ක්ෂේත්‍රයන් හි වසර 33කට වැඩි පළපුරුද්ද ඇත. ඔහුගේ ගමන්මඟ සී ටී සී ඊගල් ඉන්ෂුරන්ස් කම්පැනි ලිමිටඩ් හි 1992 දී ආරම්භ කළ අතර, එහිදී ඔහුගේ වෘත්තිය ගොඩ නැගීම ඔහු ආරම්භ කර ඇත. වසර ගණනාවක් පුරා, ඊගල් ඉන්ෂුරන්ස් පීඑල්සී (සූරිච් මූල්‍ය සේවා සමූහයේ සාමාජික) සහ එච් එන් බී ඇෂුවරන්ස් පීඑල්සී වැනි පිළිගත් ආයතනවල ජ්‍යෙෂ්ඨ තනතුරු රාශියක් හොබවා ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඔහුගේ වර්තමාන තනතුර භාර ගැනීමට පෙර, අළුත්ගම මහතා එච් එන් බී ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ් හි ප්‍රධාන ව්‍යාපාර නිලධාරියා සහ ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කළේය. ඔහු සිය රක්ෂණ වෘත්තියට අමතරව, දේශීය හා ජාත්‍යන්තර සංගම් කිහිපයකම නායකත්ව තනතුරු දරා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි ප්‍රධාන නිලධාරියා වන අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ආසන්නතම හිටපු සභාපතිවරයා ද වේ.

ඔහුගේ වෘත්තිය ජයග්‍රහනයන්ට අමතරව, අලුත්ගම මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත් උපාධි ඒකකයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් පසුගිය දශක දෙකකට අධික කාලයක් අධ්‍යාපනය සඳහා වටිනා දායකත්වයන් සිදුකර ඇත.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිය ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ වරලත් කළමනාකරුවෙක් (CMgr FCMI) ද ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයේ රක්ෂණය හා මූල්‍ය ආයතනයේ (ANZIIF ජ්‍යෙෂ්ඨ සාමාජික) සාමාජිකයෙක් ද වේ. අලුත්ගම මහතා රක්ෂණය සහ බැංකු රක්ෂණය පිළිබඳ දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා රැසක් ඉදිරිපත් කර ඇති අතර ඔස්ට්‍රියාවේ වියානා හි General Insurance AG සහ සිංගප්පූරුවේ NUS Business School හි ඇතුළුව දේශීය හා විදේශීය ආයතන කිහිපයකින්ම සවිස්තර පුහුණුව ලබා ඇත.



**ප්‍රියන්ත පෙරේරා මහතා**

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
MBA, ACII, වරලත් රක්ෂණ
(2025 මැයි 20 දින සිට විශ්‍රාමගෙන ඇත.)

ප්‍රියන්ත පෙරේරා මහතා 2021 සැප්තැම්බර් 01 දින ප්‍රධාන නිලධාරී – පොදු රක්ෂණය ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක් විය. ඔහු පොදු රක්ෂණ ව්‍යාපාරය තුළ දිගුකාලීන වෘත්තිකයෙක් වන අතර මෙම ක්ෂේත්‍රය තුළ වසර 38කට වැඩි පළපුරුද්ද ඔහු සතුය. ඔහු 1985 දී මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි රක්ෂණ අංශයේදී සිය වෘත්තිය ආරම්භ කළ අතර, මෙම ක්ෂේත්‍රය තුළ විවිධ ආයතනවල වගකීම්සහගත තනතුරු කිහිපයක් ඔහු දරා ඇත.

ඔහුගේ මෙම කීර්තිමත් වෘත්තීය කාලය තුළ, ඔහු ප්‍රතිරක්ෂණය, හිමිකම්, ප්‍රාරක්ෂණය සහ කලඹ කළමනාකරණය ආවරණය කරමින් විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇති අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක්වීමට පෙර ෆෙයාර් ෆස්ට් රක්ෂණ සමාගමේ ප්‍රධාන තාක්ෂණික නිලධාරියා ලෙස ද සේවය කර ඇත.

ඔහු වරලත් රක්ෂකයෙක් වන අතර, එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සමාජිකත්වය ලබාගෙන ඇත. ඔහු එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් MBA ලබාගෙන ඇත.



**ආසිරි වික්‍රමාරච්චි මහතා**

FCII (UK), වරලත් රක්ෂක
(2025 මැයි 05 දින සිට පත්කර ඇත)

ආසිරි වික්‍රමාරච්චි මහතා බහු ජාතික හා දේශීය රක්ෂණ සමාගම්වල වසර 18කට වැඩි විවිධ පළපුරුද්ද සහිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි ඉහළ දක්ෂතා සහ පළපුරුදු වෘත්තිකයෙකි. ඔහුගේ ප්‍රවීනතාව ප්‍රතිරක්ෂණය, හිමිකම් හා ප්‍රාරක්ෂණය ඇතුළුව ප්‍රධාන තාක්ෂණික ක්ෂේත්‍ර කරා පැතිර යන අතර අංශය තුළ උපායමාර්ගික වර්ධනයන් සිදු කිරීමට ඔහු සවිබල ගන්වයි.

2011 දී, ආසිරි මහතා එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයෙන් (CII) සහය සාමාජිකත්වය (ACII) සහ "වරලත් රක්ෂක" තත්ත්වය ලබා ගෙන ඇති මෙම කීර්තිමත් සුදුසුකම ලබාගත් ශ්‍රී ලංකාවේ ලාබාලම පුද්ගලයා ලෙස ඔහු පිළිගනී. ඔහුගේ සුවිශේෂී ජයග්‍රහණය 2012 දී කොළඹ රක්ෂණ සම්මේලනයේ දී "වඩාත් කැපී පෙනෙන ශිෂ්‍ය සම්මානය" ඔහු අත්කර ගැනීමෙන් තවදුරටත් පෙන්වා ඇති අතර මෙය 2011 වසර සඳහා ඉහළ කාර්යසාධන ACII – සුදුසුකම් සහිත පුද්ගලයාට ගෞරවය පිළිගැන්වීමකි.

ශක්තිමත් පදනමක් මත ගොඩ නැගෙමින්, ආසිරි මහතා රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම මට්ටමේ වෘත්තීමය පිළිගැනීමක් වන එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයෙන් අධි සාමාජිකත්ව (FCII) සුදුසුකම ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි ප්‍රධාන නිලධාරී ලෙස ඔහුගේ වර්තමාන කාර්යභාරය භාර ගැනීමට පෙර, ඔහු කොන්ටිනන්ටල් රක්ෂණ ලංකා සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී – තාක්ෂණික ලෙස සේවය කර ඇති අතර එහිදී ලාභදායිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට විවිධ මෙහෙයුම් සහ තාක්ෂණික කාර්යයන් හි පෙරමුණ ගෙන ඇත.



**මාලක බණ්ඩාර මහතා**

ප්‍රධාන මූල්‍ය නිලධාරී/මූල්‍ය ප්‍රධානී SLIC සාමාන්‍ය
BSc – ගණකාධිකාරණ (Sp.), FCA, MBA (කොළඹ)

බණ්ඩාර මහතාට සේවා සහ නිෂ්පාදන අංශවල විගණනය, ගිණුම්කරණය, උපායමාර්ගික කළමනාකරණය, සහ කළමනාකරණ ගිණුම්කරණය තුළ වසර 26කට වැඩි පළපුරුද්ද ඇති ජ්‍යෙෂ්ඨ මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු දැනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස සේවය කරන අතර, ඒ තුළ ඔහු උපායමාර්ගික මූල්‍ය නායකත්වය හා දිගුකාලීන ආයතනික වටිනාකම ලබා දේ.

ඔහුගේ වෘත්තියේ මුල් කාලයේ දී, මාලක මහතා එයිට්කන් ස්පෙන්ස් ප්ලානටේෂන් පී එල් සී සහ එම් සැම්සන් සිල්වා ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් හී මූල්‍ය තනතුරු දරා ඇත. ඔහුගේ වෘත්තීය ගමන්මග අර්නස්ට් ඇන්ඩ් යන්ග් සහ නිහාල් හෙට්ටිආරච්චි ඇන්ඩ් කම්පැනි හි විගණනය තුළින් ආරම්භ කර ඇත.

මාලක මහතා 2007 දී ගණකාධිකාරිවරයෙක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක් වූ අතර, වසර 16ක කාලසීමාවක් තුළ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස පිළිවෙලින් උසස්වීම් ලබා ඇත.

බණ්ඩාර මහතා 2021 දී ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත් කරන ලද අතර 2023 දෙසැම්බර් ඔහුගේ ඉල්ලා අස්වීම දක්වා එම තනතුරේ සේවය කර ඇත. 2024 ජනවාරි සිට ජූනි දක්වා මාලක මහතා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ යූනියන් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රධාන අවදානම් නිලධාරී ලෙස සේවය කළේය. ඔහු නැවත 2024 ජූනි SLICG හා එක් වූ අතර ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස ඔහුගේ වගකීම් භාර ගනිමින් ආයතනයට හා එහි උපායමාර්ගික දිශානතියට සිය කල්පවත්නා කැපවීම තහවුරු කර ඇත.

බණ්ඩාර මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ BSc උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙකු (FCA) වේ.



**චමින්ද ගුණසිංහ මහතා**

ප්‍රධාන නිලධාරි, සහය සේවා
B.B.Mgt. (ගණකාධිකරණය) විශේෂ (ගෞරව), FCA, ACMA, MBA – මූල්‍ය (කොළඹ), ACCA, CERT (UK)
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)

චමින්ද ගුණසිංහ මහතා බැංකුකරණය, මූල්‍ය සහ රක්ෂණ අංශවල වසර 26කට වැඩි පළපුරුද්ද සහිත කැපී පෙනෙන මූල්‍ය, බදුකරණ, විගණන පරිපාලනය, මානව සම්පත් වෘත්තිකයෙකි. ඔහු 2007 දී ගණකාධිකාරිවරයෙක් ලෙස SLIC හා බැඳුණු අතර මූල්‍ය හැකියාවන් හී තනතුරු කිහිපයක සේවය කරමින්, ක්ෂේත්‍රය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමක සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ නව ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ආවරණය ක්‍රියාත්මක කිරීමට දායක වී ඇත.

එමෙන්ම ඔහු ශ්‍රී ලංකා රක්ෂණ නියාමක, දේශීය ආදායම් සහ මුදල් අමාත්‍යංශයේ නිලධාරීන් සමඟ 2018 දී ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා නව බදු යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ද දායක වි ඇති අතර එහිදී ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ මූල්‍ය තාක්ෂණික අනු කමිටුව යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ බදු කමිටුවේ සභාපති ලෙස සේවය කර ඇත.

ඔහු 2018 දි අභ්‍යන්තර විගණක තනතුර භාරගත් අතර, 2020 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන ලෙස සේවය කළේය. ඉන් පසුව ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පරිපාලන ලෙස රාජකාරි භාරගෙන ඇත. 2024 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජීවිත සහ සාමාන්‍ය ලෙස වෙන් කිරීමෙන් පසු, ඔහු නැවත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සේවා ලෙස නම් කළ අතර නෛතික, මානව සම්පත් හා පරිපාලනය යන ක්ෂේත්‍ර ඔහු වෙත පවරනු ලැබ ඇත.

ගුණසිංහ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ ද (එක්සත් රාජධානිය) සාමාජිකයෙකි. ඔහු එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයෙන් CERT-CII සුදුසුකම ලබාගෙන ඇත. ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය (ගණකාධිකරණය) විශේෂ ගෞරව උපාධිය ලබාගෙන ඇති අතර ඊට අමතරව ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ MBA උපාධිය ලබා ගෙන ඇත.

ඉහත කරුණුවලට අමතරව, ඔහු සිලෝන් ඇසට් මැනේජ්මන්ට ලිමිටඩ් හා සීඑල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හී විධායක නොවන අධ්‍යක්ෂ තනතුරුවල සේවය කර ඇත. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් හි සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමක් වන, කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් හී විගණන කමිටුවේ සාමාජිකයෙකි.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු



**ලලිත් ද සිල්වා මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/බෙදාහැරීම් ප්‍රධානී

MBA, PG. in Finance and Bus. Administration, Executive Dip. In Accountancy and Finance



**සරත් ප්‍රනාන්දු මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – හිමිකම්

BSc Engineering – (Mechanical) Sp., AMIE (SL)



**ආර් කතිර්කාමරූබන් මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ඩිජිටල් පරිනාමනය

MBA (UOC), BSc Engineering (UOP), Certified Lean Six Sigma Black Belt, (Dr Mikel J Harry Institute), MBCS, AMIESL



**නදීරා ගුණවර්ධන මහත්මිය**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රාරක්ෂණ

BSc (Hon), MBS (Col), MBA (PIM/University of Canbarra), FII, Sp. Dip in Marine (III), ACII (UK), Chartered Insurer

## සහකාර සාමාන්‍යාධිකාරිවරු



**රොෂාන් කොලස් මහතා**

සහකාර සාමාන්‍යාධිකාරී – විකල්ප බෙදාහැරීම සහ ව්‍යාපාර රඳවා ගැනීම
MBA, CMA (Aus), Dip. In Marketing (SLIM), MSLIM, FCPM, MIM (SL)



**සමන්ත පීරිස් මහතා**

ශාඛා ප්‍රධානී – සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර)
Dip. In Marketing (SLIM), CPM



**චන්දිම සුමනතුංග මහතා**

ප්‍රතිරක්ෂණ ප්‍රධානී
FCII (UK), MBA (Wales), AIII (India), ANZIIF (Senior Associate) CIP, LLM (Wales)



**සනත් ප්‍රනාන්දු මහතා**

ශාඛා ප්‍රධානී - සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර නොවන)



**අසංක ඒකනායක මහතා**

සහකාර සාමාන්‍යාධිකාරී – තාක්ෂණික
DBA MSC, MBA, NDES, MCP, G Dip in M.Eng.
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)



**ලලිත් ජයසිංහ මහතා**

සහකාර සාමාන්‍යාධිකාරී – මෝටර් රථ හිමිකම්
BA, Dip in Insurance, III
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)

## ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



**අනුර අබේගුණවර්ධන මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – විශේෂ ව්‍යාපෘති



**ඉන්ද්‍රානි ඔබඳමුදලිගේ මෙනවිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – මෘදුකාංග සංවර්ධන



**වරුණි නෝනිස් මෙනවිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – මෝටර් රථ ප්‍රාරක්ෂණ



**දිල්හානි පෙරේරා මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ණය පාලනය, සේවක සහ නියෝජිත ගෙවීම් සහ මෙහෙයුම්



**අරුණ සිරිමාන්න මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ව්‍යාපාර රඳවාගැනීම



**ජගත් මෛත්‍රීරත්න මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – හදිසි අනතුරු



**දිල්ශානි ඩෙප් මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – SHE සහ PA



**ඉඳුනිල් නවරත්න මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – සේවක සම්බන්ධතා



**චන්දන විතානගේ මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ප්‍රධාන කාර්යාලය ව්‍යාපාර සංවර්ධනය

## ජ්‍යෝෂ්ඨ කළමනාකරුවන්



**චතුර පෙරේරා මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – තාක්ෂණික ප්‍රාරක්ෂණය



**ධම්මික ගුණවර්ධන මහතා**
ජ්‍යෝෂ්ඨ මෝටර් රථ ඉංජිනේරු



**නාරද විජේසේකර මහතා**
ජ්‍යෝෂ්ඨ මෝටර් රථ ඉංජිනේරු



**තිවර උඩුරාවන මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – FBD



**ශිරෝමි කුමාරසිංහ මහත්මිය**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – නීති (හිමිකම් රක්ෂණය)



**දේශානි ජයතිලක මහත්මිය**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – නීති (නීතිකරණ)



**විබූෂාන් බුලත්සිංහල මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය අලෙවි පුහුණු



**මිලන්ත වීරක්කොඩි මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – බෙදාහැරීම් මෙහෙයුම් (පුද්ගල මාර්ග – පොදු)



**නලින් පටබැඳිගේ මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – සමාජ සාමාජික අලෙවි

## ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



**ලක්ෂ්මී පෙරේරා මහත්මිය**
වැඩබලන ප්‍රධානී – ආයතනික මාර්ග



**රවී මෙදිස් මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – රාජ්‍ය අංශය



**සිසිර කුමාර මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – අයවැයකරණය, බදුකරණය, ආදායම් සහතික කිරීම සහ ප්‍රතිරක්ෂණය



**මනීෂා ගුණසේකර මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – නාවික



**දුමින්ද කන්දේගම මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – IT දත්ත මධ්‍යස්ථානය



**ප්‍රියන්ත පීරිස් මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – කොළඹ කලාප ආයතනික ඒකකය



**හසිඳු ගල්බඩගේ මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – කළමනාකරණ තොරතුරු පද්ධතිය



**ටෙරාන් ජූරියන්ස් මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ගනුදෙනුකාර සේවා සහ අත්දැකීම



**එරන්ද චාමර මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ප්‍රසම්පාදන (2025 මාර්තු 17 දින සිට පත් කර ඇත)

## ජ්‍යෝෂ්ඨ කළමනාකරුවන්



**කෝසල අබේරත්න මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු –
නාවික ප්‍රතිරක්ෂණය
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)



**අනූෂා චන්ද්‍රරත්න මෙනවිය**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – SHE/PA හිමිකම්
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)



**තිළිණ අබේසිංහ මහතා**
ජ්‍යෝෂ්ඨ කළමනාකරු – ආයුගණක
(2025 අප්‍රේල් 01 දින සිට පත් කර ඇත)

## ප්‍රාදේශීය කළමනාකරුවන්



**අනුර බස්නායක මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
සාමාන්‍ය රක්ෂණය (වයඹ 2)



**කැලුම් ජයසිංහ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
සාමාන්‍ය රක්ෂණය (ඌව)



**ශ්‍රියන්ත කුමාර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
සාමාන්‍ය රක්ෂණය රත්නපුර)



**ජගත් මෙන්ඩිස් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
සාමාන්‍ය රක්ෂණය (දකුණ 1)



**උත්තරා දිසානායක මෙනවිය**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
රක්ෂණය (දකුණ 2)



**ඉන්දික වෙල්ගම මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය
රක්ෂණය (උතුරු මැද)

## ප්‍රාදේශීය කළමනාකරුවන්



**දීපාල් නවගමුව මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර 2)



**රංජිත් හේවාපතිරණගේ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර 3)



**රාසමානික්කම් ලිංගේෂ්වරන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (නැගෙනහිර)



**සුසන්ත දිසානායක මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර ඉහළ)



**සිවරත්නම් කර්නන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (බස්නාහිර 4)



**බණ්ඩාර වීරසූරිය මහතා**
ප්‍රාදේශීය කළමනාකරු – සාමාන්‍ය රක්ෂණය (වයඹ 1) (2025 මාර්තු 21 විශ්‍රාම ගොස් ඇත)

# මූල්‍යමය වැදගත් සිදුවීම්

2011 අංක 01 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ 53 වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් 2024 පෙබරවාරි 01 දින සිට වෙනම නෛතික ආයතන දෙකක් ලෙස වෙන් කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශවලින් 2024 පෙබරවාරි සිට 2024 දෙසැම්බර් දක්වා රක්ෂණ ව්‍යාපාරය සඳහා මාස 11ක් ආවරණය කරයි. කෙසේවෙතත්, සැසඳීමේ අරමුණ සඳහා, රක්ෂණ ව්‍යාපාරයේ සම්පූර්ණ වසර (ජනවාරි සිට දෙසැම්බර්) සඳහා මූල්‍ය තොරතුරු අතිරේක තොරතුරු යටතේ 167 පිටුවේ ඉදිරිපත් කෙරේ.

| | මැනීම් ඒකකය | 2024 | 2023 | වෙනස (%) |
|---|---|---|---|---|
| **මූල්‍ය කාර්යසාධනය** | | | | |
| මුළු ආදායම | රු. මිලියන | **22,986** | 21,100 | 8.9 |
| දළ ලිඛිත වාරික | රු. මිලියන | **25,333** | 23,145 | 9.5 |
| ශුද්ධ උපයන ලද වාරික | රු. මිලියන | **18,071** | 16,457 | 9.8 |
| දරන ලද ශුද්ධ හිමිකම් | රු. මිලියන | **10,510** | 10,018 | 4.9 |
| ප්‍රාරක්ෂණය හා ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය | රු. මිලියන | **293** | 755 | (61.2) |
| මෙහෙයුම් හා පරිපාලන වියදම්* | රු. මිලියන | **8,144** | 4,934 | 65.1 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසුහැරවීම රහිත මෙහෙයුම් හා පරිපාලන වියදම් | රු. මිලියන | **8,144** | 7,137 | 14.1 |
| ආයෝජන ආදායම් | රු. මිලියන | **5,321** | 5,796 | (8.2) |
| බදුකරණයට පෙර ලාභය (PBT) | රු. මිලියන | **4,039** | 5,412 | (25.4) |
| බදුකරණයට පසු ලාභය (PAT) | රු. මිලියන | **3,286** | 4,344 | (24.4) |
| ශුද්ධ හිමිකම් අනුපාතය | % | **58** | 61 | (4.5) |
| වියදම් අනුපාතය | % | **46** | 45 | 2.2 |
| ඒකාබද්ධ අනුපාතය | % | **104** | 106 | (1.6) |
| ස්කන්ධය මත ඉපැයීම් | % | **18** | 7 | 97.5 |

**රු. මිලියන 2,203ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) සඳහා හානිකරණ වෙන් කිරීම 2023 මූල්‍ය වසර තුළ සම්පූර්ණයෙන් ආපසු හරවන ලදී.*

| | මැනීම් ඒකකය | 2024 | 2023 | වෙනස (%) |
|---|---|---|---|---|
| **මූල්‍ය තත්ත්වය හා ස්ථාවරත්වය** | | | | |
| මූල්‍ය ආයෝජනය | රු. මිලියන | **36,982** | 45,550 | (18.8) |
| මුළු වත්කම් | රු. මිලියන | **51,134** | 93,387 | (45.2) |
| ස්කන්ධය | රු. මිලියන | **21,978** | 61,725 | (64.4) |
| රක්ෂණ ගිවිසුම් බැදීම් | රු. මිලියන | **20,441** | 20,496 | (0.3) |
| මුළු වගකීම | රු. මිලියන | **29,155** | 31,662 | (7.9) |
| ණය ශ්‍රේණිගතකරණය (ෆිච් ශ්‍රේණිගතකරණය)** | ෆිට්ච් (lka) | **A+(lka)** | A(lka) | |

**වෙන් කිරීමට පෙර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (SLIC) ෆිච් ශ්‍රේණිගතකරණ විසින් පවරන පරිදි (lka) හි ජාතික රක්ෂණ මූල්‍ය ශක්ති ශ්‍රේණිගතකරණය පවත්වා ගෙන ඇත. වෙන් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසුව, 2025 පෙබරවාරිවල ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) වෙත A+ (lka) හි ජාතික රක්ෂණ මූල්‍ය ශක්ති ශ්‍රේණිගතකරණය පවරා ඇත.*

| | මැනීම් ඒකකය | 2024 | 2023 | වෙනස (%) |
|---|---|---|---|---|
| **නියාමක අනුපාත/උත්තෝලනය** | | | | |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (CAR) | % | **277.3** | 226.6 | 22.4 |
| ලබාගතහැකි මුළු ප්‍රාග්ධනය (TAC) | රු. මිලියන | **21,286** | 46,464 | (54.2) |
| අවදානම පදනම් ප්‍රාග්ධන අවශ්‍යතාව (RCR) | රු. මිලියන | **7,675** | 20,504 | (62.6) |

*වෙන් කිරීම සහ ප්‍රාග්ධන ව්‍යුහයේ විස්තර සඳහා සටහන 39 බලන්න.*

*සැසඳීමේ අරමුණ සඳහා රක්ෂණ ව්‍යාපාරයේ පූර්ණ වසර සඳහා මූල්‍ය තොරතුරු මෙම පිටුවේ ඉදිරිපත් කෙරේ.*

# මූලයමය නොවන සුවිශේෂී අවස්ථා

## පිළිගැනීම්



ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගම විවිධ පිළිගත් සම්මාන හා සහතික කිරීම් තුළින් තත්ත්වය සහ විශිෂ්ටත්වය වෙනුවෙන් සිය කැපවීම සඳහා පිළිගනු ලැබ ඇති අතර ඒවාට පහත දෑ ඇතුළත්ය

ISO 9001:2015 – තත්ත්ව කළමනාකරණ පද්ධති සහතික කිරීම

තොරතුරු ආරක්ෂක කළමනාකරණ පද්ධති (ISMS) සඳහා ISO/IEC 27001:2013 – ප්‍රමිතිය අත්කර ගැනීම

ISO ප්‍රමිති ISO 14064-1:2018 ප්‍රමිතියට අනුකූලව හරිතාගාර වායු සහතික කිරීම සහ ISO 14064-3:2019 යටතේ සත්‍යාපන කිරීම

Global Brand විසින් ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය සඳහා විශිෂ්ට රක්ෂණ සමාගම – 2024 ශ්‍රී ලංකාව

MD Finance විසින් 2024 වඩාත් ආදරණීය සාමාන්‍ය රක්ෂණ සන්නාමය

## නව නිෂ්පාදන හා සේවා



- 2024 දෙසැම්බර් 04 දින පාසල් ගුරුවරුන් සඳහා “ගරු බුහුමන්” නිෂ්පාදනය දියත් කිරීම.
- Motor Third Party Total Loss Plus දියත් කිරීම. මෙය ඉහළම ප්‍රමිතියේ තෙවැනි පාර්ශව මෝටර් රථ රක්ෂණ ඔප්පුවක් මත පිරිනමන අගය එකතුකළ උසස් කිරීමකි. මූලික තෙවැනි පාර්ශව රක්ෂණයකියන් තෙවැනි පාර්ශවවල තුවාල, මරණ හෝ දේපල හානි පමණක් ආවරණය කරන අතර, “Total Loss Plus” මුළු අලාභ අවස්ථාවල එයට අයත් හානි ආවරණය සපයයි.
- Motor plus Pinnacle නිෂ්පාදනය බරපතල රෝග ආවරණය සමඟ ශක්තිමත් කර ඇත

## හවුල්කාරත්වයන්



- SLICGL සහ වෘත්තීමය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය (NIOSH)
- SLICGL සහ FoxHill
- SLICGL සහ නවලෝක හොස්පිටල්ස්
- SLICGL සහ ජේ එම් වික්‍රමාරච්චි
- SLICGL සහ රෝයල් පාසල
- SLICGL සහ SLARDAR
- SLICGL සහ SLIIT



## පාරිසරික ප්‍රමිති

- ISO 14064-1:2018 ජාත්‍යන්තර ප්‍රමිතිය සමග අනුකූලවීම සඳහා හරිතාගාර වායු සත්‍යාපන මතය ප්‍රදානය කරන ලදී.

## පාලනය, අවදානම හා අනුකූලතාව



- IFRS 17 ජාත්‍යන්තර ප්‍රමිති ඇතුළත් කර ගැනීම සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතිවලට අනුකූලවීම – ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් IFRS 17 ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම
- සංයුක්ත ආයතනයක් ලෙස 2023 දී ISO/IEC 27001 සහතික කිරීම අත්කර ගැනීම සහ ITSM 20000 සහතික කිරීම සමග 27001:2022 යාවත් කිරීමට 2024 දී සහතික කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- ESG රාමුව ඵලදායීව ක්‍රියාත්මක කිරීම
- නවතම අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරමින් SLICGL සඳහා ප්‍රතිපත්ති යාවත් කිරීම

## සිදුවීම්

- ජෙට්වින්ග් බ්ලූ හි GI සුමුළුව 2023 උත්සවය
- "මහනුවර පෙරහැර" සක්‍රියකරණය
- ප්‍රශ්න තරඟය
- කොළඹ BYD මෝටර් රථ දැක්ම 2024
- "කතරගම පෙරහැර" සක්‍රියකරණය
- සාමාන්‍ය රක්ෂණ Pinnacle Achiever Award (GIPA) සම්මාන උළෙල 2024 නොවැම්බර් මැලේසියාවේදී පවත්වන ලදී.



# 02

# නායකත්ව සමාලෝචනයන්

25
සභාපතිතුමාගේ පණිවිඩය

29
ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනය

# සභාපතිතුමාගේ පණිවිඩය

“මූල්‍ය ස්ථාවරත්වය මත පදනම් වූ පුළුල් ආවරණය 2024 දී අපගේ විශිෂ්ට ජයග්‍රහනයන් සඳහා මූලික විය. ඓතිහාසික දැනුම හා ඩිජිටල් පරිනාමනයේ මුසුවක් අපගේ වෙළෙඳපොල නායකත්වය රඳවා ගැනීමට සහ ඒ මත තවදුරටත් ගොඩ නැගීමට අසමසම ස්ථානයක අපව ස්ථානගත කර ඇත.”



2024 මූල්‍ය වසර සඳහා මෙයට පෙර ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් හි කොටසක්ව පැවති ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) වෙනුවෙන් ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2024 පෙබරවාරි ව්‍යාපාරයේ සාර්ථකව නීතිමය වෙන් කිරීම පිළිබඳ සාක්ෂියකි. ව්‍යාපාරය වෙන් කිරීම 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධිත) පනත සහ 2023 මාර්තු 17 දිනැති අංක 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ක්‍රියාවට නංවන ලදී.

මෙම වාර්තාව ඔබට ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටක් වන අතර ඉන් අපගේ වටිනා පාර්ශවකරුවන්ට සමාගමේ දිගුකාලීන වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය, තිරසාර වර්ධනය කරා උපායමාර්ගික රාමුව, පාලන දර්ශනය හා සමාගම එහි කටයුතු පවත්වා ගැනීමේ දි පාදක වූ මූලධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදේ.

## වෙළෙඳපොල නායකත්වය ඉදිරියට යාම

රජයට අයත් ආයතනයක් ලෙස, අපගේ සමාගම වත්කම සඳහා ආරක්ෂාව ලබාදීමේ විධානයක් සමඟ ක්‍රියාත්මක වන අතර ඒ තුළින් මූල්‍ය සුරක්ෂිතතාව සහ අනපේක්ෂිත සිදුවීම් අවදානම් අවම කිරීම සහතික කරයි. එමනිසාම, අපගේ මූල්‍ය ජයග්‍රහණ පුද්ගල ආරක්ෂාව සහ ඒ තුළින් ජාතික ආර්ථික ස්ථායිතාව ශක්තිමත් කරයි. ඉහළම වැඩ ආචාරධර්ම, පාලන මූලධර්ම සහ නියාමකට අනුකූල නුබුන්වත් කළමනාකරණය පිළිපදිමින් අපගේ ව්‍යාපාරය තුළ අපි නියැලෙමු. අපගේ ආයතනය මත මෙම ආයතනික වගකීමට සහ වගවීමට අනුකූලවෙමින්, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය තුළ පුරෝග ාමී බලකායක් ලෙස අප සමාගම (SLICGL) ස්ථානගත කිරීමට නිෂ්පාදන නව්‍යකරණය හා දත්ත පදනම් තීරණ ගැනීම සමඟ බැඳුණු ශක්තිමත් ආයුගණක රාමුවක් මත අපි අඛණ්ඩව ගොඩ නැගෙමු.

අපි අපගේ විදේශීය ව්‍යාපාර විශේෂයෙන් ප්‍රතිරක්ෂණ හවුල්කාරත්වයන්, සීමා හරහා ප්‍රතිරක්ෂණය, සහ ඩිජිටල් රක්ෂණ විසඳුම් පුළුල් කිරීම අපි ආරම්භ කළෙමු. සමාගමේ ශක්තිමත් මූල්‍ය තත්ත්වය, ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය තුළ වෙළෙඳපොල නායකත්වය, සහ අපගේ ඔප්පුකළ පළපුරුද්ද අවදානම් විවිධාංගීකරණය හා ප්‍රාග්ධන කාර්යක්ෂමතාව සඳහා ගෝලීය ප්‍රතිරක්ෂකයින් සමඟ උපායමාර්ගික සංධාන ගවේශණයේදී උපකාරි විය. තවද, විශේෂ රක්ෂණ නිෂ්පාදන ඉදිරිපත් කිරීමට දකුණු ආසියාව සහ මැද පෙරදිග ව්‍යාපාර අවස්ථා අපි හඹා ගියෙමු. ජාත්‍යන්තර රක්ෂණ වාතාවරණය තුළ තරගකාරී ආයතනයක් බවට පත්වීමට මෙය සමාගමට සහය වූ අතර වෙළෙඳපොල කොටසෙන් 19.4%ක් රඳවා ගනිමින් සහ 20%ක වෙළෙඳපොල කොටසක් සමඟ අපගේ මෝටර් රථ රක්ෂණය ප්‍රමුඛ ස්ථානයේ පවත්වා ගනිමින් අපගේ නායකත්ව ස්ථානය ශක්තිමත් කරයි.

## තීරණාත්මක වෙනස්වීමක්

2024 වසර SLICGL හි පරිනාමයට තීරණාත්මක විය. 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධිත) පනතේ 53 වගන්තියට අනුව, පෙර ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් 2024 පෙබරවාරි මස වෙනම නෛතික ආයතන දෙකක් බවට වෙන් කරන ලදී. SLICGL 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ මාස එකොළහක් සඳහා වෙනම සමාගමක් ලෙස සිය ව්‍යාපාර මෙහෙයවිය. කෙසේ වෙතත්, සැසැඳීමේ අරමුණ සඳහා, රක්ෂණ මෙහෙයුම්වල සම්පූර්ණ කාර්යසාධනය පිළිබිඹු කිරීමට ජනවාරි මාසය ඇතුළුව 2024 සම්පූර්ණ වසර සඳහා තොරතුරු ඉදිරිපත් කෙරේ. මෙය ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් යටතේ 2023 වසර සඳහා මාස 12ක ව්‍යාපාර කාර්යසාධනය අනුව සසඳා ඇත.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෙළෙඳපොල නායකයා ලෙස අපගේ ස්ථානය ශක්තිමත් කිරීමට මනාව සහයවූ අපගේ ආයතනික ගමන්මඟ, මූල්‍ය ඔරොත්තුදීම, සහ උපායමාර්ගික ගම්‍යතා පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි.

## මෙහෙයුම් පරිසරය

ප්‍රතිසාධන ගමන්මඟක් මත ශ්‍රී ලංකාවේ ගමන්මඟ එහි දුෂ්කර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා මූල්‍ය වගකීම තුළින් 2024 දි ආරම්භ විය. මේවා පසුකාලීන මූල්‍ය ස්ථාවරත්වයට, නිරුද්ධමනයට සහ විදේශ සංචිතවල සුවිශේෂී වර්ධනයට මඟ පාදන ලද අතර, එය උපකාරී ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කර ඇත. ස්වෛරී ණය අනුපාතවල යාවත් කිරීම්වලින් ඇති වූ සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණය ශ්‍රී ලංකා රජයේ මහත් උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කර ඇති අතර එය ආයෝජක විශ්වාසය ඇති කරමින් ආර්ථික සාමය නැවත ඇති කිරීමට කැප වී ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ත සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල ආර්ථික උච්ඡාවචනයන් හමුවේ 2024 දී මධ්‍යස්ථ වර්ධනයක් ලබා ගෙන ඇත.

## උපායමාර්ගික ප්‍රමුඛතා

වෙන් කිරීම සමඟ නව ආරම්භය හේතුවෙන්, අපි පස් වැදෑරුම් ආකාරයකින් අපි අපගේ උපායමාර්ග නියම කළෙමු.

ශුද්ධ ලිඛිත වාරික කෙරහි අවධානයක් සමඟ ඉහළම මාර්ගය මෙහෙයවීම ඉලක්කගත වෙළෙඳපොල පුළුල්වීම, නිෂ්පාදන විවිධාංගිකරණය සහ අවදානම ගලපන ලද ප්‍රතිරක්ෂණ උපායමාර්ග තුළින් දැඩිව හඹායන ලදී. ආයතන හා පාරිභෝගික අංශයට ගැලපෙන නව්‍යකරණ රක්ෂණ නිෂ්පාදන වෙළෙඳපොල කොටස පුළුල් කළ අතර, ඩිජිටල් වේදිකා ඇතුළුව බෙදාහැරීමේ මාර්ග ශක්තිමත් කිරීම ගනුදෙනුකරුවන්ට අපගේ නිෂ්පාදන රාමුව වෙත පහසු පිවිසීමට ඉඩ ලබා දේ.

ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය හා ලාභ ප්‍රශස්තකරණය කෙරෙහි අවධානය යොමු කරමින්, අපි පිරිවැය කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ අතර හිමිකම් කළමනාකරණය වැඩි කරමින් ප්‍රතිරක්ෂණය සඳහා උසස් තාක්ෂණය භාවිතා කරමින් අපගේ ක්‍රියාවලි සැලකියයුතු ලෙස ස්වයංක්‍රිය කළෙමු. ඒ අනුව, විවිධාංගීකරණ කළ ආයෝජන කළඹ ආයෝජනය මත ශක්තිමත් ප්‍රතිඵල ලබාගෙන ඇත.

ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සේවය සඳහා අපගේ පදනම වන බැවින්, විනිවිදභාවය හා ආරක්ෂාව සහතික කරමින් කාලීන හිමිකම් නිරවුල් කිරීම සහ ඔප්පු පරිපාලනය තහවුරු කිරීමට ඩිජිටල් පරිනාමන උපයාමාර්ග යොදා ගන්නා ලදී. අපි 24/7 ගනුදෙනුකාර සේවා මාර්ගය සහ ජංගම යෙදුම ඒකාබද්ධ කිරීම ස්ථාපිත කළෙමු.

පුද්ගලගත ගනුදෙනුකාර සහභාගිත්ව උපායමාර්ග, ලෝයල්ටි වැඩසටහන්, ගනුදෙනුකාර අවශ්‍යතා හඳුනා ගැනීමට පුරෝකත්‍ය විශ්ලේෂණ සහ බහුමාර්ග සන්නිවේදන ක්‍රම තුළින් අපගේ වටිනා ගනුදෙනුකරුවන් සමඟ සක්‍රීය සහභාගිත්වය ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සහ ඉහළ අලුත් කිරීමේ අනුපාත සහතික කර ඇත.

ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට සූදානම් සහ පුද්ගල සංවර්ධනය කෙරෙහි අවධානිත විශේෂ කණ්ඩායමක් ආයතනික සාර්ථකත්වය සඳහා තීරණාත්මකය. විවිධ උසස් පුහුණු වැඩසටහන්, පිරිනැමීම, සම්පත් වෙන් කිරීම ප්‍රශස්තකිරීම, කාර්යසාධනය හඹායන සහ ප්‍රධාන ලබාදෙන සුවිශේෂී කාර්යසාධනය පිරිනමමින් අපගේ මානව ප්‍රාග්ධනය තුළ අපි ආයෝජනය කළෙමු.

## මූල්‍ය කාර්යසාධනය

SLICGL හි දළ ලිඛිත වාරිකය වාර්ෂිකව 9.5%ක වැඩිවීමක් සමඟ රු. බිලියන 25.3දක්වා වැඩි වූ අතර ශුද්ධ ඉපැයුම් වාරිකය වාර්ෂිකව 9.8%ක ආකර්ශණීය වැඩිවීමක් සමඟ රු. බිලියන 18 දක්වා ඉහළ තොස් ඇත. SLICGL රු. බිලියන 4ක බදු පෙර ලාභයක් සහ රු. බිලියන 3.3ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර, එය වාර්ෂිකව පිළිවෙලින් 25.4%ක සහ 24.4%ක අඩුවීමකි. 2023 වසර සඳහා බදු පෙර ලාභය හා බදු පසු ලාභය රු. මිලියන 2,203ක එකෝචිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන් කිරීම් ආපසු හැරවීමක් මඟින් ධනාත්මකව බලපාන ලද අතර, එය එම වසර සඳහා ලාභදායිතාව සැලකියයුතු ලෙස ඉහළ දමා ඇත. මෙම පුනරාවර්තන නොවන ගැලපීම ඉහළ පදනමක් නිර්මාණය කළ අතර,

දැඩි මෙහෙයුම් කාර්යසාධනය හමුවේ 2024 මූල්‍ය වසර තුළ බදු පෙර ලාභය හා බදු පසු ලාභවල වාර්ෂික වර්ධන අනුපාතය පහත වැටීමකට හේතු විය.

අපගේ මුළු අදායම් ඉපැයීම් රු. බිලියන 23ක් වූ අතර, ඉන් වාර්ෂිකව 8.9%ක වර්ධනයක් පිළිබිඹු කරයි. ස්කන්ධය මත ඉපැයීම්වල 97.5%ක සුවිශේෂී වැඩිවීමක් තිබූ අතර අපගේ මූල්‍ය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරමින් වත්කම් පදනම රු. බිලියන 51.1 දක්වා ඉහළ ගියේය.

SLICGL හි කාර්යසාධනයට ශක්තිමත් ලාභදායිතාව, වත්කම් අවදානම් පැතිකඩ, ප්‍රාග්ධනනීයකරණය, විචක්ෂණ ආයෝජන උපායමාර්ග, මෙන්ම තිරසාර හා පාර්ශවකාර සහභාගිත්වය සඳහා අපගේ කැපවීම යනාදියේ සංයෝජනයක් හේතු විය.

ෆිච් ශ්‍රේණිගතකරණය විසින් සමාගමට CCC+ රක්ෂණ මූල්‍ය ශක්තිය (IFS) ශ්‍රේණිගතකරණය සහ අනාගත ස්ථාවර තත්ත්වය සමඟ A+(lka) ජාතික IFS ශ්‍රේණිගතකරණය පවරන ලදී.

## ආයෝජනය මත ඉපැයීම්

අවදානම් පදනම් ප්‍රාග්ධන වෙන් කිරීමේ මූලධර්ම පිළිපදිමින් රජයේ සුරැකුම්පත්, බැඳුම්කර සහ ස්කන්ධ වෙළෙඳපොළ ඇතුළුව විවිධාංගීකරණය කළ ආයෝජන කළඹක උපායමාර්ගික වත්කම් වෙන් කිරීම අපගේ ප්‍රධාන නියාමක වන, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් ක්ෂේත්‍රයේ ප්‍රතිමාන සමඟ සහතික කර ඇත.

## ඩිජිටල් පරිනාමනය

ප්‍රතිරක්ෂණය, හිමිකම් පිරිසැකසුම, සහ ගනුදෙනුකාර සහභාගිත්ව වේදිකාවල උසස් ස්වයංක්‍රියකරණය කරමින් අපගේ ඩිජිටල් පරිනාමනය අපි වේගවත් කළෙමු. වෙළෙඳපොළ වෙනස්වීම්වලට අපගේ කඩිසරකම සහ ප්‍රතිචාරාත්මකබව නව්‍යකරණ ඩිජිටල් හා තාක්ෂණික විසඳුම් විසින් ඇති කරන අතර ඉන් ඩිජිටල් නව්‍යකරණය තුළ ක්ෂේත්‍රය මෙහෙයවීමට අපගේ කැපවීම පිළිබිඹු කරමින් අපගේ සන්නාම කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් කරයි.

ශක්තිමත් මුදල් විශුද්ධිකරණ පාලන තන්ත්‍රයක් බලගැන්වීමේ අපේක්ෂාව සමඟ, මූල්‍ය අපරාධ අවදානම අවම කරමින් නවීන මෘදුකාංගයක් අපි ක්‍රියාත්මක කළෙමු. මෙම දත්ත පදනමට ත්‍රස්තවාදී කටයුතු සඳහා ප්‍රසිද්ධ දේශීය හා විදේශීය පුද්ගලයින්ගේ පුළුල් ලැයිස්තුවක් මෙන්ම දේශපාලන වශයෙන් නිරාවරණ (PEPs) පුද්ගලයින්ගේ ලැයිස්තුවක් ඇතුළත් කරන අතර අවශ්‍ය පරිදි යාවත් කිරීම් සිදු කෙරේ. අපගේ අභ්‍යන්තර පද්ධති සමඟ ඒකාබද්ධ වෙමින්, මෙම වේදිකාව ගනුදෙනු ස්වයංක්‍රීයව නිවාරණය කිරීම සහ පුද්ගලයින් පිළිබඳ නිසි සම්ප්‍රජන්‍ය ඉටුකිරීම සඳහා ඉඩ ලබා දේ.

මෙම ක්‍රියාමාර්ග මෙහෙයුම් කාර්යක්ෂමතාවන් ක්‍රමවත් කර වැඩි කරන අතර ගනුදෙනුකාර සේවා විශිෂ්ඨත්වය සහ අපගේ ගනුදෙනුකාර කළඹ තුළ යම් අනපේක්ෂිත කටයුතු සේවීම සහතික කර ඇත.

## උපායමාර්ගික ආයෝජන

වෙළෙඳපොළ ප්‍රවනතා සමඟ උපායමාර්ගිකව බැඳුණු විචක්ෂණ ආයෝජන උපායමාර්ග අවදානම් අවම කරමින් ප්‍රශස්ථ ප්‍රතිඵල ලබාදෙන ලාභදායී මූල්‍ය ආයෝජන අතර, බෙදාහැර ඇත. හරිත බැඳුම්කර සහ පාරිසරික, සමාජීය හා පාලන අනුකූල වත්කම් වැනි තිරසාර ආයෝජනවලට පුළුල්වීම තුළින් අපගේ මූල්‍ය කළමනාකරණය පිළිබිඹු කිරීම පමණක් නොව දිගුකාලීනව තිරසාර ව්‍යාපාරයක් ගොඩ නැගීමට අපගේ කැපවීම පිළිබඳ සාක්ෂියක් ද වේ.

## ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව

අපගේ ව්‍යාපාරයේ අවදානම අවම කිරීම කෙරෙහි අපගේ මූලික අවධානය තුළ, අපි අපගේ දැක්ම, මෙහෙවර සහ ප්‍රධාන වටිනාකම් සහ රු. බිලියන 10.5ක හිමිකම් ගෙවීම් බෙදාහරිමින් අපගේ ඔප්පු හිමියන් වෙත අපගේ කැපවීම අපි නගා සිටවමු. ගනුදෙනු කේන්ද්‍රීයතාව සහ අපගේ සන්නාම පොරොන්දු ලබාදීම තුළ අපගේ වෙළෙඳපොල නායකත්වය මේතුළින් තවදුරටත් වැඩි කරයි. ගනුදෙනු කේන්ද්‍රීයතාව තුළ ක්ෂේත්‍රයේ මංසලකුණු තබමින් පුද්ගලගත රක්ෂණ විසඳුම්, වේගවත් හිමිකම් නිරවුල් කිරීම, සහ බහු මාර්ගික සහභාගිත්වය අපි ප්‍රමුඛ කරමු.

වර්ධන උපායමාර්ග, වෙළෙඳපොල සංවර්ධනය, විනිවිදයාම සහ නව නිෂ්පාදන සංවර්ධනය පාරිභෝගික අවශ්‍යතා මත පදනම් වේ. අපගේ ක්‍රියාවලි, සේවක සංවර්ධනය, සහ සන්නාමය ගොඩනැගීමේ උත්සාහයන් හි මෙහෙයුම් විශිෂ්ඨත්වය පාරිභෝගික කේන්ද්‍රීයතාව සඳහා අපගේ කැපවීම වැඩි කරන අතර, අපගේ සියලුම ඇමතුම් ස්ථාන හරහා විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දේ.

## ආයතනික පාලනය

රජයට අයත් ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ශක්තිමත් අචාරධර්ම සංග්‍රහ සහ ශක්තිමත් මූල්‍ය පාලනයන් යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ 2022 අංක 2 නියෝගයට අනුකූලව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ 2017 (2023 සංශෝධිත) විධිවිධාන අපි පිළිපදිමු. තවද, ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ හා මුදල් අමාත්‍යංශය විසින් නිකුත් කළ රජයට අයත් ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත අපි අනුගමනය කරමු. මෙවැනි රාමු ආයතනික පාලනය ශක්තිමත් කිරීමට සහ වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අපගේ කැපවීමට සාමූහිකව සහය වේ.

ආයතනික පාලන රාමුව විශේෂ අවදානම් අවම කිරීමේ නියෝග මත පදනම් වන ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් සමඟ පවතී. 2024 දී අපගේ සැලකියයුතු ජයග්‍රහණයන් මත පදනම් වෙමින්, අල්ලස සහ දූෂණය, සහ යම් ආකාරයක හිරිහැර කිරීම සඳහා සදාචාර හා නෛතික ගනුදෙනු, ශූන්‍ය ඉවසීම කෙරෙහි සමාගමේ ප්‍රතිපත්ති, සාකච්ඡා නොකරන ස්ථාවරය අපි තවදුරටත් නගා සිටුවන බව තහවුරු කිරීමට මම කැමැත්තෙමු. අපි වෙනස් ලෙස නොසලකන, විවිධ හා සියලු දෙනා ඇතුළත් සේවා ස්ථානයක් ක්‍රියාත්මක කරන බවත් එය ශ්‍රමබලකායේ උපරිම හැකියාව සාක්ෂාත් කර ගැනීමට දිරි ගන්වන බවත් වාර්තා කිරීම අපට සතුටකි. රක්ෂණ සේවා සපයන්නෙක් හා වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් වශයෙන් අපට අවශ්‍ය ඉහළම සදාචාර නගා සිටුවමින් විනිවිදභාවය, නිරවද්‍යතාව සහ කාලීන බව සමඟ, සියලුම නියාමන අනාවරණ අවංකව සිදු කරන බව අපි සහතික කරමු.

## පාරිසරික, සමාජීය හා පාලනය සහ තිරසාරභාවය

අපගේ ව්‍යාපාරයේ ප්‍රතිමානය වන්නේ අවදානම අවම කරමින් වත්කම් සුරක්ෂිතකරණය කිරීමයි. රක්ෂණ ක්ෂේත්‍රයේ මනා පරිචයන් හා බැඳුණු පුළුල් පාරිසරික, සමාජීය හා පාලන (ESG) හා තිරසාර රාමුව ක්‍රියාත්මක කිරීමට අපගේ කැපවීම මෙයින් පෙන්නුම් කරයි.

අපගේ ව්‍යාපාර උපායමාර්ගය, දෛනික මෙහෙයුම්, තීරණ ගැනීම, සහ අවදානම් කළමනාකරණය මෙම තිරසාර රාමුව තුළ ක්‍රියාත්මක කරයි. අපගේ ව්‍යාපාරයේ සහ එහි පාර්ශවකරුවන්ගේ තිරසාර වර්ධනය සඳහා අදාළතාව සහ ප්‍රමාණතාව කෙරෙහි අවධානය යොමු කරමින් දිගුකාලීන වටිනාකම නිර්මාණය සිදු කරමු. SLFRS 1 සහ SLFRS 2 ක්‍රියාත්මක කිරීමේ සංක්‍රාන්තිය තුළ අපි සිටින බැවින්, අපි අපගේ මෙහෙයුම්වලට තිරසාරභාවය සඳහා අපගේ කැපවීම අපි තවදුරටත් ඒකාබද්ධ කරමු.

## දක්ෂයින් සංවර්ධනය

පුද්ගල සංවර්ධනය, නිපුනතා වර්ධනය, පුහුණුව හා නායකත්ව සංවර්ධනය හා බැඳුණු අපගේ සාකල්‍ය ප්‍රවේශය සේවක යහපැවැත්ම මුදුන් පත් කරයි. එය කැපවූ සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය කාර්යසාධනයකට ස්වභාවිකවම පරිවර්තනය කරන අතර 2024 දී අපි අත්කරගත් මූල්‍ය කාර්යසාධනය සාක්ෂාත් කර ඇත. විශිෂ්ඨ දක්ෂයින්

ආකර්ෂණය කර රඳවා ගැනීම සිදුකරමින්, විවිධ මානව සම්පත් මුලපිරීම් සහ ශුභසාධන ක්‍රියාමාර්ග තුළින් වෘත්තීමය ප්‍රගතිය හා පුද්ගල සංවර්ධනය සඳහා අපගේ කණ්ඩායමෙහි අපි අඛණ්ඩව ආයෝජනය කරමු. සමස්ත උපායමාර්ගික පරමාර්ථ සපුරාලන මූලික කාර්යසාධන දර්ශක පදනම් ආයතනයක් ලෙස, අපව පිළිගෙන ඇති අතර කාර්යසාධන පරතර ව්‍යුහගත පුහුණු මගින් විසඳනු ලබයි.

## ඔප්පුහිමියන්ගේ වටිනාකම

ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට සමාගමේ කැපවීම අපගේ මූල්‍ය කාර්යසාධනය තුළින් පෙන්නුම් කරයි. පුළුල් හා අවශ්‍යතාවට අදාළ නිෂ්පාදන කළඹක් සමඟ ඒකාබද්ධ වෙමින් හා විශිෂ්ඨ පාරිභෝගික සේවාවක් ලබා දෙමින්, කාලීන නිරවුල් කිරීම සහ ඔප්පුහිමි ආරක්ෂාව සහතික කරමින් රු. බිලියන 10.5ක හිමිකම් ගෙවීම් බෙදාහැරීම තුළින් 2024 දී අපි අපගේ ඔප්පුහිමියන්ගේ වටිනාකම පෙන්වා ඇත.

## බෙදාහරින්නන්ගේ වටිනාකම

5000කට වැඩි රක්ෂණ උපදේශකයින්, බැංකු හවුල්කරුවන් සහ තැරැව්කාර ආයතන සමඟ, 2024 දී ශ්‍රී ලාංකිකයින් මිලියන 1.4ට වැඩි පිරිසකට ආරක්ෂාව සැලසීමේදී අප සමඟ උනන්දුවෙන් කටයුතු කළ අතර, මෙය අප සමාගම් ඉතිහාසය තුළ ඉහළම මූල්‍ය කාර්යසාධනයට පරිවර්තනය කර ඇත. ඔවුන්ගේ කාර්යසාධනය සුවිශාල වශයෙන් හඳුනා ගනිමින්, වසර තුළ අපගේ බෙදා හරින්නන්ගේ ජාලය වෙත කොමිස් මුදල් හා දිරිදීමනා ලෙස රු. බිලියන 2.6ක් අපි ගෙවා ඇත.

## අනාගත අවධානය

ආරක්ෂාව ලබාදීමට හා අවදානම් අවම කිරීමට ප්‍රධාන වන – ශක්තිමත් ගනුදෙනුකාර සහභාගිත්වය පවත්වා ගනිමින් ප්‍රජා දැනුවත්කම අවධාරණය කරමින් ප්‍රමුඛ තාක්ෂණික රක්ෂක ලෙස මතුවීමට අපව ස්ථානගත කර ඇත. ඉදිරියට යමින්, පුරෝකථනය කළ විශ්ලේෂණ ඇතුළත් වන දත්ත පදනම් අවදානම් තක්සේරු, ආයුගණක නිරවද්‍යතාව සහ උසස් ප්‍රාරක්ෂණ ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීමට අපි සැලසුම් කරමු. එබැවින් උත්සාහයන් විනිවිද, කාර්යක්ෂම සහ ගනුදෙනුකාර අවධානිත රක්ෂණ විසඳුම් ලබාදීමට අපව ශක්තිමත් කරන අතර අපගේ සේවා විශිෂ්ඨත්වය හා ගනුදෙනුකාර විශ්වාසය තවදුරටත් ශක්තිමත් කරයි.

රජයට අයත් ආයතයක් ලෙස, ශ්‍රී ලංකාව නැවත ගොඩ නැගීමේ රජයේ මෙහෙවර සහ ඩිජිටල් යටිතලපහසුකම් උසස් කිරීමට එහි අපේක්ෂාවන් සමඟ සමාගම පෙලගැස්වීමට අපි කැපවී සිටින අතර ජාතික සංවර්ධනය සඳහා බදු ගෙවීම සහ රජයේ ගාස්තු මගින් සැලකියයුතු දායකත්වයක් සිදු කරයි. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණය තුළ වෙළෙඳපොල නායකයා ලෙස, අපි අපගේ ස්ථානය වැඩිකර, අපගේ විදේශීය විනිවිදයාම පුළුල්කර, සහ රටේ වර්තමාන සහ ඉදිරි පරම්පරාවන් සඳහා ශක්තිමත් තිරසාර ව්‍යාපාර ආයතනයක් මෙහෙයවමු.

## අගය කිරීම

අවසාන වශයෙන්, කැපවීමෙන් සහ උනන්දුවෙන් අපගේ සාර්ථකත්වයට සහ තිරසාරභාවයට දායක වූ සියලුම දෙනා වෙත ස්තුති කිරීමට මම කැමැත්තෙමි. ව්‍යාපාරයට කිසිඳු බාධාවක් නොමැතිව පහසු වෙන් කිරීමකට සහය වූ අධ්‍යක්ෂ මණ්ඩලයට හා සමූහයේ ප්‍රධාන විධායක නිලධාරිට සහ අනුකූලතා ගැටළුවලදී ඉහළින් අප වෙත සහය වූ නියාමකයින්ට මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කර සිටිමු.

අපගේ ව්‍යාපාරයේ හැරවුම අඛණ්ඩව තබාගැනීමට උපකාරී වූ අපගේ නියෝජිතයින්ට මෙන්ම අපගේ කාර්ය මණ්ඩලයට සිය කැපවීම සහ බැඳීම වෙනුවෙන් මාගේ ස්තුතිය ප්‍රකාශ කර සිටිමු. අවසාන වශයෙන්, නමුත් කෙටියෙන්, දිවයින පුරා ශ්‍රී ලාංකීය ජනතාවගෙන් විශාල කොටසකට තිරසාර දිගුකාලීන වටිනාකම ලබාදීමට අපව පෙළඹවීමේදී අප කෙරෙහි විශ්වාසය තබන ලද අපගේ පාරිභෝගිකයින්ට ස්තුතිවන්ත වෙමි.



**නුසිත් කුමාරතුංග**
සභාපති

2025 ජූනි 03

# සමූහයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය

"2024 වසර නෛතික වෙන් කිරීම සාක්ෂාත් කරගනිමින් හා දළ ලිඛිත වාරිකය තුළ 9.5%ක වැඩිවීමක් සමඟ ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය පෙන්වමින් SLICGL සඳහා අත්‍යවශ්‍ය පරිනාමයක් සනිටුහන් කරයි. අඛණ්ඩව වෙළෙඳපොල නායකත්වය සහතික කරමින් හා ජාතික සංවර්ධන අරමුණු සමඟ පෙළ ගැසෙමින්, උපායමාර්ගික ආයෝජන හා ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව කෙරෙහි දැඩි අවධානය තුළින් තිරසාර වර්ධනයට අපි කැප වී සිටිමු."



ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගමේ ("SLICGL") 2024 වාර්ෂික වාර්තාව වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මට ගෞරවයක් වන අතර, 2024 මුලදී විධිමත් වෙන්වීමෙන් පසු අපි ස්වාධීනව පාලනය වන නීතිමය ආයතනයක් ලෙස සංක්‍රාන්ති වූ බැවින් අපගේ ගමන්මග තුළ සැලකියයුතු සංධිස්ථානයක් මෙම වසර සනිටුහන් කරයි. මෙම වෙනස අපගේ මෙහෙයුම් හැඩගැස්වීමට, අපගේ වෙළෙඳපොල පැවැත්ම ශක්තිමත් කිරීමට සහ කඩිසරකම හා ඔරොත්තුදීම සමඟ වර්ධනය ඇති කිරීමට අපව සවිබල ගන්වමින් අලුත්කළ උපායමාර්ගික අවධානයක් අපට ලබා දේ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය සමාගම 2024 පෙබරවාරි සිට තනි සමාගමක් ලෙස මෙහෙයුම් ආරම්භ කරනු ලැබූවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ වාර්තා කරන ලද පෙර වසරේ ප්‍රතිඵල සමඟ අනුරූපතාව සහ සමානතාව සහතික කිරීම සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සම්පූර්ණ වසරේ කාර්ය සාධනය මෙම වාර්තාව මඟින් පිළිබිඹු කරයි.

වසර පුරාම, ශ්‍රී ලංකාව පුරා පුද්ගලයින්, ව්‍යාපාර හා දේපල ආරක්ෂා කිරීමේ අපගේ මූලික පොරොන්දුව ලබාදිම කෙරෙහි අපි අවධානයෙන් සිටියෙමු. අපි අපගේ ඩිජිටල් පරිනාමන වැඩසටහන් උසස් කළ අතර, ප්‍රායෝගික හා ගනුදෙනුකාර කේන්ද්‍රිය විසඳුම් හඳුන්වා දී, අපගේ පාර්ශවකරුවන්ගේ වෙනස්වන ඉල්ලුම සපුරාලීමට අපගේ අවදානම් කළමනාකරණ හැකියාවන් අපි ශක්තිමත් කළෙමු. සංකීර්ණ සාර්ව ආර්ථික වාතාවරණය හා ඉහළ යන අවදානම් නිරාවරණ හමුවේ, අපගේ ශක්තිමත් මූලිකාංග හා පැහැදිලි උපායමාර්ගික දිශානතිය ස්ථාවරත්වය පවත්වා ගැනිමට සහ සියලුම ප්‍රධාන අංශ හරහා වටිනාකම ලබාදීමට අපට ඉඩ ලබා දී ඇත.

සේවා විශිෂ්ටත්වය නගාසිටුවමින් ගතික වෙළෙඳපොල තත්ත්වයන්ට ඉක්මණින් ප්‍රතිචාර දැක්වීමට අපට ඇති හැකියාව අපගේ සේවකයින්ගේ ශක්තිය, අපගේ ගනුදෙනුකරුවන්ගේ ලැදියාව සහ අපගේ හවුල්කරුවන්ගේ සහයෝගිතාව පිළිබඳ සාක්ෂියකි.

## මූල්‍ය කාර්යසාධනය හා වර්ධනය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් 2024 දි ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් ලබා දී ඇති අතර, සංකීර්ණ හා වෙනස්වන සාර්ව ආර්ථික වාතාවරණය හමුවේ සිය වෙළෙඳපොල නායකත්වය සහ ඔරොත්තු දීම ශක්තිමත් කර ඇත. සමාගම රු. බිලියන 4ක බදු පෙර ලාභයක් සහ රු. බිලියන 3.3ක බදු පසු ලාභයක් වාර්තා කර ඇති අතර ඉන් යහපත් මූල්‍ය කළමනාකරණය හා උපායමාර්ගයේ අවධානිත ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි. අපගේ දළ ලිඛිත වාරිකය වාර්ෂිකය 9.5%ක වැඩිවීමක් සමඟ රු. බිලියන 25.3 දක්වා වර්ධනය වූ අතර ඉන් 19.4%ක වෙළෙඳපොල කොටස සුරක්ෂිත කර ක්ෂේත්‍රයේ සාමාන්‍ය ඉක්මවා ඇත.

වත්කම් පදනම රු. බිලියන 51.1 දක්වා පුළුල් වූ අතර ඉන් ශ්‍රී ලංකාවේ මූල්‍යමය වශයෙන් වඩාත් ස්ථාවර රක්ෂකයෙක් ලෙස අපගේ ස්ථානය සුරක්ෂිත කර ඇත. සමාගම ශක්තිමත් හිමිකම් ගෙවීමේ හැකියාවත් පවත්වා ගෙන ඇති අතර, අපගේ කල්පවත්නා විශ්වාසය සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය අවධානය පිළිබිඹු කරමින් 2024 දී රු බිලියන 10.5ක මුළු හිමිනම් නිරවුල් කිරීම මගින් එය පෙන්නුම් කරයි.

අපගේ මූල්‍ය කාර්යසාධනයට මෝටර් රථ සහ මෝටර් රථ නොවන කළඹවල තුළනාත්මක දායකත්වයන් මගින් සහය වී ඇති අතර ඒවා පිළිවෙලින් රු. බිලියන 14.2ක සහ රු. බිලියන 11.1ක දළ ලිඛිත වාරික උත්පාදනය කර ඇත. මෝටර් රථ කළඹ සිය වෙළෙඳපොල නායකත්වය දරණ අතර, මෝටර් රථ නොවන ව්‍යාපාරය වාර්ෂිකව 15.3%ක ක්ෂේත්‍රයේ වර්ධනයක් පෙන්වා ඇත. මෙය විවිධාංගීකරණය කළ අවදානම් විසඳුම් සහ උපායමාර්ගික බෙදාහැරීම පුළුල් කිරීම තුළින් ඇති වී ඇත. දැඩි ප්‍රතිරක්ෂණ පාලනයන්, වැඩිකළ ඩිජිටල් හැකියාවන්, විචක්ෂණ ප්‍රතිරක්ෂණ උපායමාර්ග ලාභදායිතාවයට සහය වූ අතර සංකීර්ණ ආර්ථික වාතාවරණයන් තුළ වුවද පාර්ශවකාර වටිනාකම නිර්මාණය කිරීමට අපගේ අඛණ්ඩ හැකියාව සහතික කරයි.

## උපායමාර්ගික ප්‍රමුඛතා

2024 දී, අපගේ උපායමාර්ගය ප්‍රධාන ප්‍රමුඛතා පහක් මත කේන්ද්‍ර විය. ඒවා නම්: ශුද්ධ ලිඛිත වාරික වර්ධනය ඇති කිරීම, ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය වර්ධනය, සේවා තත්ත්වය වැඩි කිරීම, ගනුදෙනුකරුවන් රඳවා ගැනීම උපරිම කිරීම සහ මානව සම්පත ප්‍රශස්ත කිරීමයි. මෙම පෙරමුණු සියල්ල තුළ අපි සැලකියයුතු ප්‍රගතියක් සිදුකර ඇත. වැඩිකළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඩිජිටල් ඒකාබද්ධ කිරීම සමඟ දළ ලිඛිත වාරිකය තුළ 9.5%ක වර්ධනය 19.4%ක ප්‍රමුඛ වෙළෙඳපොල කොටස පවත්වා ගැනීමට අපව ස්ථානගත කර ඇත. ලෝයල්ටි වැඩසටහන්වල සිට 24/7 ඩිජිටල් සේවාකරණය දක්වා අපගේ ගනුදෙනුකාර අවධානිත පරාශය කල් පවත්නා සම්බන්ධතා ගොඩ නැඟීමට හා රඳවා ගැනීම වැඩි කිරීමට සහය විය. මෙවැනි ජයග්‍රහනයන් අඛණ්ඩ වර්ධනය, ශක්තිමත් පාලනය සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය කෙරෙහි අවධානිත සවිබලගන්වන ලද කණ්ඩායම්වල සංස්කෘතියක් විසින් තහවුරු කර ඇත.

## පරිවර්තනීය තාක්ෂණය හා ඩිජිටල්කරණය

2024 දී, SLICGL විසින් ගනුදෙනුකාර අත්දැකීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට කෘතිම බුද්ධිය හා ස්වයංක්‍රීයකරණය යොදා ගනිමින් සිය ඩිජිටල් පළමු උපායමාර්ගය උසස් කරන ලදී. ස්වයං සේවා හැකියාවන් සමඟ වඩා ඉක්මන් පිරිසැකසුම සඳහා ඉඩ දෙමින් හා ගනුදෙනුකරුවන් සවිබල ගන්වමින් අපි අපගේ මෝටර් රථ රක්ෂණ තත්‍ය පරීක්ෂණ පද්ධතිය උසස් කළෙමු. කෘතිම බුද්ධි මෙවලම් හිමිකම් තක්සේරු කිරීම, ප්‍රතිරක්ෂණය හා ගනුදෙනුකාර සහය තුළ යොදා ගන්නා ලද අතර, ඉන් නිරවද්‍යතාව, අනුරූපතාව සහ අඩුකළ පිරිසැකසුම් කාලය සහතික කරයි. සත්‍ය-කාලීන හිමිකම් පසුවිපසුරම, ඩිජිටල් ප්‍රතිපත්ති නිකුතුව, සහ වට්ස්ඇප් වැනි වේදිකා තුළින් සේවා පහසු ගනුදෙනුකාර මැදිහත්වීම් සවිමත් කළ අතර, රක්ෂණ සේවා වඩාත් පිවිසිය හැකි බවට පත් කර ඇත. මෙම ඩිජිටල් නව්‍යකරණ තෘප්තිය, විනිවිදභාවය සහ සමස්ත සහභාගිත්වය සැලකියයුතු ලෙස වර්ධනය කරන ලදී.

## නිෂ්පාදන ආධිපත්‍ය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි "Motor Plus" අපගේ කළඹ තුළ ප්‍රධානම නිෂ්පාදනය ලෙස පවතින අතර, 2024 දී වාරික ආදායම තුළ රු. බිලියන 14.2 ලබාදෙමින්, 5.3%ක වර්ධනයක් වාර්තා කර ඇත. අඛණ්ඩව හයවන වරටත්, ශ්‍රී ලංකාව තුළ වෙළෙඳපොල ප්‍රමුඛ මෝටර් රථ රක්ෂණ විසඳුම් ලෙස සිය තත්ත්වය රඳවාගෙන ඇති අතර, එය සිය සුපිරි වටිනාකම් කොටස, ගනුදෙනුකාර කේන්ද්‍රීය ලක්ෂණ සහ ප්‍රතිචාරාත්මක සේවාවල පිළිබිඹුවකි.

නිෂ්පාදනයේ ශක්තිය අපගේ ලාභදායිතාවට සැලකියයුතු ලෙස දායක වී ඇති අතර, වඩා ඉහළ තරඟකාරී මෝටර් රථ රක්ෂණ අංශය තුළ විශ්වාසී සහ ආරක්ෂිත රක්ෂකයෙක් ලෙස අපගේ සන්නාමය සවිමත් කරයි.

Motor Plus හි සාර්ථකත්වය ඇති කරනු ලැබූවේ එහි පුළුල් ආවරණය සහ ඉක්මන් හිමිකම් ප්‍රතිචාරය තුළින් පමණක් නොව වසර තුළ හඳුන්වා දුන් සම්පූර්ණ වර්ධනයන් මගින්ය. 2024 දී, ලෝයල්ටි වැඩසටහන්, සුවිශේෂී වෙළෙඳ වට්ටම් සහ සම සන්නාම සේවා වර්ධනයන් සමඟ අපි නිෂ්පාදනය ශක්තිමත් කර ඇත. මෙවැනි එකතු කිරීම්වලින් සම්ප්‍රදායික රක්ෂණයෙන් ඔබ්බට යන සාකල්‍ය, අගනා ප්‍රතිඵල ලබාදෙන ගනුදෙනුකාර අත්දැකීම පිරිනැමීම කරා අපගේ කැපවීම පිළිබිඹු කරයි. වේගවත් නිෂ්පාදන ප්‍රගුණකය තුළ අපගේ අඛණ්ඩ වර්ධනය සඳහා උපායමාර්ගයට අනුකූලව, අපි සම්පූර්ණයෙන් නව නිෂ්පාදන දියත් කිරීම හැර ප්‍රධාන පිරිනැමීම් නිවැරදි කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු. දිගුකාලීන ඔප්පුහිමි වටිනාකම සහ සහභාගිත්වය වැඩි කරමින් වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් සමඟ අපි බැඳී සිටින බව මෙම ප්‍රවේශයෙන් සහතික කරයි.

## ඔප්පුහිමියන්ට වටිනාකම ලබාදීම

ඔප්පුහිමියන්ට අර්ථවත් වටිනාකමක් ලබා දීම සඳහා අපගේ කැපවීම 2024 දී අපගේ මෙහෙයුම්වල මාධ්‍යයේ පැවතුණි. අපි බහු සේවා වර්ධනයන් හඳුන්වා දුන් අතර, එයට වඩා වේගවත් නිරවුල් කිරීම සඳහා හිමිකම් ක්‍රියාවලි ක්‍රමවත් කිරීම, ඔප්පු සේවා සඳහා 24/7 ඩිජිටල් ප්‍රවේශය, සහ WhatsApp සහ Meta වැනි වේදිකා තුළින් ශක්තිමත් කළ සහභාගිත්වය, වඩා ඉහළ පිවිසීම සහ ප්‍රතිචාරාත්මකබව සහතික කිරීම ඇතුළත්ය. එමෙන්ම අපි දිවයින පුරා ඔප්පුහිමියන්ට රඳාපවතින හිමිකම් සහය ලබාදීම හරහා තීරණාත්මක අවස්ථාවල දී අපගේ පොරොන්දුවට අපි අඛණ්ඩව ගරු කළෙමු. ඊට අමතරව, අපගේ ලෝයල්ටි වැඩසටහන දිගුකාලීන ගනුදෙනුකරුවන්ට සුවිශේෂී ප්‍රතිලාභ ලබා දෙමින්, ගැඹුරු සබඳතා පෝෂණය කරමින් සහ විශ්වාසය ශක්තිමත් කරමින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සමඟ ගනුදෙනුකරුවන්ගේ ගමන පුරා කාලීන සහයෝගය, විනිවිදභාවය සහ වටිනාකම ඔවුන්ට ලැබෙන බව සහතික කරමින් සමස්ත අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා සෑම මුලපිරීමක්ම නිර්මාණය කරන ලදී.

## ආයතනික පාලනය හා අනුකූලතාව

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) අඛණ්ඩතාව, වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ශක්තිමත් සංස්කෘතියක් තුළින් සදාචාර ව්‍යාපාර ව්‍යවහාර නගා සිටුවයි. සියලුම ගනුදෙනුකාර ස්පර්ශක ස්ථානවල වෘත්තීමය හැසිරීම සහතික කිරීමට නිතිපතා පුහුණුව සහ නියාමනය සමඟ මානව ස්ථාපිත චර්යාධර්ම සංග්‍රහ මඟින් සියලුම සේවකයින් හා අලෙවි කණ්ඩායම් මෙහෙයවනු ලබයි. මානව සම්පත් අනුකම්ටුව සහ අභ්‍යන්තර විගණන අධීක්ෂණය සදාචාර සහ නියාමන ප්‍රමිතිවලට අනුකූලතාව තවදුරටත් බලගන්වයි. මෙවැනි ක්‍රියාමාර්ග සේවා ලබාදීමේ අනුරූපතාව පවත්වා ගැනිමට හා ගනුදෙනුකාර විශ්වාසය පෝෂණය කිරීමට උපකාරී වේ.

අවදානම් කළමනාකරණය ආයතනික පාලන තන්ත්‍රයේ ප්‍රධාන කුළුණක් වන අතර, උපායමාර්ගික, මූල්‍ය, මෙහෙයුම් සහ උපද්‍රව අවදානම් විසඳීමට පුළුල් ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවක් SLICGL යොදා ගනී. අවදානම් කළමනාකරණ කමිටුව විසින් ව්‍යාපාරයේ පරිමාව සහ සංකීර්ණතාවයට සමානුපාතිකව ඵලදායී පාලනයන් ක්‍රියාත්මක වන බවට සහතික කරයි. ප්‍රතිරක්ෂණ ව්‍යවහාර අවදානම් තෝරා ගැනීම සහ අනුකූලතාවය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, මනා තාක්ෂණික ප්‍රමිතීන්, දත්ත අවබෝධයන් සහ වෙළඳපොළට අනුකූල මිලකරණය මගින් මෙහෙයවනු ලැබේ. මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සහ දිගුකාලීන ස්ථාවරත්වය වැඩි කිරීම සඳහා ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල මෙම ව්‍යවහාරවලට අනුපූරක වේ.

## අපගේ සේවකයින්

අපගේ කැපවූ, මනාව පුහුණුව ලත්, සහ මනාව දක්ෂ වෘත්තිකයින් කණ්ඩායම් ක්ෂේත්‍රය තුළ විශේෂ සහ නියාමක දක්වා ඇති වටිනාකමක් සහ ප්‍රතිමානයන් තුළ සුපිරි ගනුදෙනුකාර සේවාව ලබාදීමට කැපවී සිටී. වසරේ මුල්කාලය තුළ බුද්ධි ගලනය අභියෝගයක් වුවද, අපගේ ගනුදෙනුකරුවන්ට බාධාරහිත සේවාවක් ලබාදීමට නව බඳවාගැනීම් අපගේ කණ්ඩායම්වල ශක්තිය වැඩි කර ඇත. SLICGL වෘත්තීය වර්ධනය හා පුද්ගල සංවර්ධනය සඳහා අවස්ථාවන් සහිත ප්‍රසන්න, ආරක්ෂිත හිතකර සේවා ස්ථානයක් බව බොහෝ මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බව සහතික කරයි.

## තිරසාරභාවය හා CSR

තිරසාරභාවය සමාගමේ මෙහෙයුම්වල මඟපෙන්වන මූලධර්මය වන අතර, උපායමාර්ගික සැලසුම් කිරීමේ සිට එදිනෙදා ක්‍රියාවට නැංවීම දක්වා තීරණවලට එය බලපායි. 2024 දී, තොරතුරු ආරක්ෂාව සඳහා ISO/IEC 27001:201, තත්ත්ව කළමනාකරණය සඳහාල ISO 9001:2015 සහ හරිතාගාර වායු සත්‍යාපනය සඳහා ISO 14064-1:2018 වැනි සහතික කිරීම් තුළින් ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිති අපි රැකගෙන ඇත. මෙවැනි සහතික කිරීම් මගින් පාරිසරික භාරකාරත්වය සහ වගකිම්සහගත පාලනය සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරයි. සමාජ වගකීම් පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරන සමාගම තුළ ලේ දන්දීම වැනි ප්‍රජා සත්කාර වැඩසටහන්වල සක්‍රිය සහභාගිත්වය තුළින් සේවක දැනුවත්කම ශක්තිමත් කරන ලදී. ඩිජිටල් ක්‍රියාවලිය සඳහා අපගේ මාරුවීම කඩදාසි භාවිතය සහ කඩදාසි අඩුකර ඇති අතර අපගේ මෙහෙයුම් වඩාත් පරිසර හිතකාමී කරමින් දිගුකාලීන තිරසාර අරමුණු කර පෙළ ගැසී ඇත.

2024 දී ප්‍රධාන සමාජ සංවර්ධන මුලපිරීම් තුළින් ප්‍රජාව නගා සිටුවීම සඳහා සක්‍රිය කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකාව පුරා පාසල් ළමුන්ට රක්ෂණ ආවරණයක් ලබා දෙමින්, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය කළමනාකරණය කරමින් අපි ජාතික අධ්‍යාපන අංශයට සහාය වී ඇත. මෙම මුලපිරීම අධ්‍යාපනය සහ ළමා ආරක්ෂාව සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරයි. විනාශකාරී ගංවතුර අවස්ථාවේදී, ගම්පහ, රත්නපුර සහ මාතර යන ප්‍රදේශවල විපතට පත් පවුල් 1,100 කට අධික සංඛ්‍යාවකට වියළි සලාක පැකට් ලබා දීම සඳහා අපි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ හවුල් වුණෙමු. අපගේ වාර්ෂික කාර්ය මණ්ඩලය විසින් මෙහෙයවන ලේ දන්දීමේ වැඩසටහන තුළින් ජාතික සෞඛ්‍යාරක්ෂක සේවා සඳහා සහාය වීම සහ දයානුකම්පාව සහ සිවිල් වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම තුළ අපගේ කාර්යභාරය ද අවධාරණය කරන ලදී.

## අනාගත අවධානය

අප සුවිශේෂී ජයග්‍රහණයක් සමඟින් සුවිශේෂී වසරක් ගත කර ඇත. වැඩිවන ගතික සහ තරඟකාරී රක්ෂණ පරිසරයක් තුළ අපගේ වෙළෙඳපොල නායකත්වය පවත්වා ගැනීම සඳහා, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් නැගී එන වෙළෙඳපොල ඉල්ලුම සපුරාලීම සඳහා පරිණාමනය වෙමින් එහි මූලික ශක්තීන් අඛණ්ඩව භාවිත කරමින් සිටී. සියලුම ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන හරහා සේවා විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, සමාගම නව්‍යකරණ, පාරිභෝගික කේන්ද්‍රීය රක්ෂණ විසඳුම් ලබා දීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. අවදානම් කළමනාකරණ ව්‍යවහාර ශක්තිමත් කිරීමෙන් සහ එහි අඛණ්ඩ ඩිජිටල් පරිවර්තනය හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමෙන්, SLICGL වෙනස්වීම තුළ ඔරොත්තු දීමේ හැකියාව සහ කඩිසර බව සහතික කරයි. විනයවත් පිරිවැය කළමනාකරය සහ වැඩිකළ ව්‍යාපාර කාර්යක්ෂමතාවන් තුළින් මෙහෙයුම් කාර්යසාධනය වර්ධනය කෙරෙහි අපි අවධානය යොමු කර ඇත. උපයාමාර්ගික සහයෝගිතාවන් සහ හවුල්කාරත්වයන් ද වෙළෙඳපෙල පැවැත්ම පුළුල් කිරීමේදී හා නව හැකියාවන් කරා පිවිසීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. කඩිසරකම, වගවීම සහ කාර්යසාධනය පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීම ක්ෂේත්‍රයේ වෙනස්වීම්වලට කඩිසරව ප්‍රතිචාර දැක්වීමට සමාගම ශක්තිමත් කරන අතර, ඒ තුළින් සිය නායකත්ව ස්ථානය දරා ගනිමින් අපගේ පාර්ශවකරුවන්ට කල් පවත්නා වටිනාකම ලබා දේ.

2025 සහ ඉන් ඔබ්බට බැලීමේදී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් තිරසාර වර්ධනය සාක්ෂාත් කර ගැනිම සඳහා කැපවී සිටින අතර, මෝටර් සහ මෝටර් රථ නොවන අංශ කරා තෝරා ගන්නා රක්ෂකයා ලෙස සිය ස්ථානය තවදුරටත් සුරක්ෂිත කර ගනී. ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම, උසස් මෙහෙයුම් හැකියාවන් හී ආයෝජනය, සහ කල්පවත්නා විශ්වාසය හා පක්ෂපාතිත්වය ගොඩ නැගීමට ගනදෙනුකාර අත්දැකීම වැඩි කිරීම ඇතුළත්ය. සමාගම නව්‍යකරණය හා කාර්යක්ෂමතාව ඇතිකරන අර්ථවත් උපායමාර්ගික හවුල්කාරත්වයන් අඛණ්ඩව හඹා යයි. දක්ෂයින් සංවර්ධනය ප්‍රධාන වන අතර, එහි අරමුණ වන්නේ ආයතනයේ දිගුකාලීන දක්ම සමඟ බැඳුණු දක්ෂ හා අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් පෝෂණය කිරීමයි. මෙම පරමාර්ථ අනුව යමින්, SLICGL සිය පාර්ශවකරුවන්ට බලපෑම්සහගත ප්‍රතිඵල අත්කර දීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයෙහි වර්ධනය සඳහා සැලකියයුතු ලෙස දායක වීමට ස්ථානගත කරයි.

## පිළිගැනීම

තවත් එක් බලපෑම්සහගත වසරක් අප නිමකරන බැවින්, 2024 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අඛණ්ඩ ප්‍රගතිය හා සාර්ථකත්වයට දායක වූ සියලුම දෙනා වෙත මගේ හෘදයංගම කෘතඥතාව පළ කරමි.

අපගේ කැපවූ සේවකයින්ගේ වෙත, ඔබගේ ලැදියාව, වෘත්තීමයභාවය සහ අනුවර්තනය වීමේ හැකියාව සඳහා ස්තුතිය පුදකර සිටිමි. විවිධ නිෂ්පාදන හා සේවා පරාශයක ආරක්ෂාව, දක්ෂතාව සහ අනුරූපතාව සමඟ අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඔබ විසින් වෙහෙස නොබලා සිදුකළ උත්සාහයන් අපව ශක්තිමත් කර ඇත.

අපගේ පක්ෂපාතී ගනුදෙනුකරුවන් වෙත, වඩාත් වැදගත් වන ආරක්ෂාව සඳහා අප කෙරෙහි ඔබ තබන ලද අඛණ්ඩ විශ්වාසය සඳහා ඔබට අතිශයින් කෘතඥ වෙමු. ඔබගේ විශ්වාසය ස්ථිරව නවෝත්පාදනයවීමට හා අපගේ පිරිනැමීම් හා සේවා ලබාදීම වර්ධනය කිරීමට අපව මෙහෙයවා ඇත.

අපගේ විකුණුම් බලකාය, තැරැව්කරුවන් නියෝජිතයින්, මෝටර් රථ තක්සේරුකරුවන්, ගරාජ හවුල්කරුවන් සහ ආයතනික අතරමැදියන් ඇතුළු අපගේ බෙදාහැරීම් ජාලය විසින් ඉටුකළ තීරණාත්මක කාර්යභාරය පිළිගැනීමට මම කැමැත්තෙමි. ඔවුන්ගේ කැපවීම සහ හවුල්කාරත්වය අපගේ ලඟාවීම පුළුල් කිරීමේදී සහ රටපුරා අපගේ සේවා හැකියාවන් ශක්තිමත් කිරීමේදී අත්‍යවශ්‍ය වී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ මුදල්, ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද අඛණ්ඩ මඟපෙන්වීම සහ සහයෝගය අපි අගය කොට සලකමු. ඔවුන්ගේ උපකාරී සහභාගිත්වය වෙනස්වන නියාමන වාතාවරණයක් තුළ විශ්වාසයෙන් හා පැහැදිලිතාවයෙන් ක්‍රියාත්මකවීමට අපව සවිබල ගන්වා ඇත.

අවසාන වශයෙන්, වසර පුරාම ස්ථිර නායකත්වය, උපායමාර්ගික අධීක්ෂණය, නොසැලෙන සහයෝගය වෙනුවෙන් සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුදකරමි. ඔවුන්ගේ දූක්ම අරමුණ හා විශ්වාසය ඇතිව පෙරට යාමට අපව ශක්තිමත් කර ඇත.

අනාගතය දෙස බැලීමේදී, නවෝත්පාදනය, මෙහෙයුම් විශිෂ්ටත්වය, සහ ගනුදෙනුකාර කේන්ද්‍රියතාව මගින් මෙහෙයවමින් ශ්‍රී ලංකාවේ වඩාත් විශ්වාසී, සහ ඔරොත්තුදෙන සාමාන්‍ය රක්ෂණ සපයන්නා ලෙස අපගේ ස්ථානය අපි අඛණ්ඩව ශක්තිමත් කරන්නෙමු.

**චන්දන එල් අලුත්ගම**
සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී

2025 ජූනි 03

# 03

# වාර්තාවේ පැතිකඩ

**2024 පෙබරවාරි සිය මෙහෙයුම් වෙන් කිරීමේ සිට සමාගමේ පළමු වාර්ෂික වාර්තාව සලකුණු කරමින් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් "සමාගම" වෙනුවෙන් 2024 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම අපට සතුටකි. ඉන් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ සමාගමේ කාර්යසාධනය පිළිබඳ පුළුල් නමුත් පැහැදිලි සමාලෝචනයක් සපයයි. වාර්තාවෙන් අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය හා උපායමාර්ග විස්තර කරන අතර, අපගේ මෙහෙයුම් වාතාවරණයේ සන්දර්භය තුළ මූල්‍ය, සමාජ, පාරිසරික සහ පාලන ක්ෂේත්‍ර අතර, අදාළ තොරතුරු ඉදිරිපත් කරයි. තවද, අපි අපගේ ඉදිරි දැක්ම පිරිනමන අතර මූල්‍ය වසරේ ආර්ථික සත්‍යතාවන් විසින් මේවා හැඩගන්වනු ඇති බවට පිළිගනිමින් අනාගතය සඳහා අපගේ අපේක්ෂාවන් හුවමාරු කරමු.**

වාර්තාවේ මූලික විෂයපථයෙන් සමාගමේ ප්‍රධාන උපායමාර්ගය ආවරණය කරන අතර එය අංශයට අදාළ නීතියෙහි දක්වා ඇති පැහැදිලි නිර්ණායක යටතේ සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන පිරිනැමීමකි. මෙම වාර්තාවෙන් ඒකාබද්ධ වාර්තාකරණය අනුව විවිධ කාර්යයන් අතර අන්තර් සම්බන්ධතා මනාව පිළිබිඹු කරමින් සමාගමේ උපායමාර්ගය හා කාර්යයන් පිළිබඳ ගැඹුරු දළ විශ්ලේෂණයක් ලබා දේ. එමෙන්ම එය යහපාලන සහ තිරසාර මූලධර්ම මත පදනම් වටිනාකම් නිර්මාණයට සමාගමේ ප්‍රවේශය සහ දිගුකාලීනව ආර්ථිකය, පරිසරය සහ සමාජය කෙරෙහි මේවා බලපාන ආකාරය ඉන් ඉස්මතු කරයි.

## විෂයපථය හා සීමාව

මෙම වාර්තාවෙන් සමාගමේ මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යසාධනය ආවරණය කරයි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා අපගේ පෙර වාර්තාවෙන් මෙය ගොඩ නංවා ඇති අතර එයට අපගේ ව්‍යාපාර උපායමාර්ගයෙන් ඇතිවන අවදානම් හා අවස්ථා, විවිධ පාර්ශවකරුවන්, අපගේ ව්‍යාපාර කටයුතු තුළින් අපි වටිනාකම නිර්මාණය, ආරක්ෂා කිරීම සහ එය අඩුවන ආකාරය පෙන්වා දේ.

මෙවැනි සංකීර්ණ ව්‍යාපාර සම්බන්ධතා කළමනාකරණය කිරීමට අපි අරමුණු කරන අතර, අපගේ සාර්ථකත්වය පැහැදිලි කරන ප්‍රමාණාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කරමු. ඒවානම්:

| | | | | | |
|---|---|---|---|---|---|
| අපගේ ව්‍යාපාර ආදර්ශය – පිටුව 38 | අපගේ උපායමාර්ගය – පිටුව 44 | අපගේ මෙහෙයුම් සන්දර්භය – පිටුව 46 | අපගේ ප්‍රමාණාත්මක ගැටළු – පිටුව 40 | අපගේ මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණ සීමාව හා බැඳුණු මූල්‍ය වාර්තාකරණ සීමාව | අපගේ පාර්ශවකාර සම්බන්ධතා – පිටුව 42 |

අපි ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රමිති සභාවේ (IIRC) රාමුවට යොමු වෙමින් වාර්තාකරණ අතර එම රාමුව සය වැදෑරුම් ප්‍රාග්ධනය හා සම්බන්ධිත නිමැවුම ඇතුළත් වේ. මෙයින් සමාගමේ සහ වඩා පුළුල්ව ප්‍රජාවගේ තිරසාරතාව සහතික කරන අතර වගවන ඒකාබද්ධ වාර්තාකරණ ව්‍යහාර කරා අපගේ කැපවීම පිළිබිඹු කරමින් වටිනාකම නිර්මාණය කරමින් විනිවිද ආකාරයකින් අපගේ පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය සිදුකරයි.

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය |
| මානව ප්‍රාග්ධනය | ස්වාභාවික ප්‍රාග්ධනය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය |

**රජයට අයත් ආයතනයක් ලෙස, වාර්තාකරණය සඳහා අපගේ ප්‍රවේශය විවිධ වාර්තාකරණ පාලන තන්ත්‍ර අතර පහත ප්‍රධාන සඳහන් රාමු, ප්‍රමිති, සහ රෙගුලාසිවලින් මෙහෙයවනු ලබයි:**

| රෙගුලාසිය | අභ්‍යන්තර සහතික වීම | බාහිර සහතික වීම |
|---|---|---|
| මූල්‍ය වාර්තාකරණය, පාලනය, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් | | |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන හා අනුකූලතා කමිටුවට වාර්තා කිරීම | වාර්ෂික මූල්‍ය ප්‍රකාශවල සාධාරණ සහතික කිරීම විගණකාධිපති ලබා දේ. 107 පිටුව බලන්න. |
| ශ්‍රී ලංකා රජයට අයත් රක්ෂණ සමාගම් සඳහා අදාළ නෛතික සහ රෙගුලාසි රාමු | | |
| ආයතනික පාලන රෙගුලාසි | | |
| ඒකාබද්ධ වාර්තාකරණය | | |
| ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රමිති සභාවේ (IIRC) ජාත්‍යන්තර රාමුව | | |
| එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු (UN SDGs) | | |

## ප්‍රමාණතාව

ව්‍යුහගත, සංවිධාන මට්ටමින් ප්‍රමාණතාව තක්සේරු ක්‍රියාවලියක් මඟින් සමාගමට වැදගත් වන ගැටළු හඳුනා ගනී. ද්විත්ව ප්‍රමාණාත්මක මූලධර්මය මත පදනම්ව, මෙම ක්‍රියාවලිය සමාගම කෙරෙහි ඇති විය හැකි බලපෑම් සහ සේවකයින්ට සහ පරිසරයට එහි බලපෑම් යන දෙකම ආමන්ත්‍රණය කරයි. මෙම තක්සේරුව මඟින් ප්‍රාග්ධනයන්ට සම්බන්ධ ප්‍රමාණතාව කෙරෙහි සහ සිය පාර්ශවකරුවන්ට වටිනාකම ලබාදීම සහ අඩුවීම අවම කිරීමට සමාගමට ඇති හැකියාව කෙරෙහි බලපාන අවදානම්, සාර්ව ආර්ථික ප්‍රවණතා, සහ වෙනත් අංග ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරයි. රක්ෂණ සේවා සපයන්නෙක් ලෙස, මෙම වාර්තාවේ 40 පිටුවේ දක්වා ඇති ප්‍රධාන ප්‍රමාණාත්මක අංග හඳුනා ගැනීමට ශක්තිමත්, මනාව දැනුවත් සහ සාකල්‍ය ප්‍රවේශයක් අපි යොදා ගනිමු. කාර්ය සාධනය වැඩි කිරීම, අපගේ තිරසාර රාමුව ශක්තිමත් කිරීම, ශක්තිමත් පාලන මූලධර්මවලට අනුගත වීම සහ අපගේ නියාමන අනුකූලතාවය තුළින් වගවීම පෙන්නුම් කිරීම සඳහා මෙම ගැටළු අපි සියුම්ව පරීක්ෂා කරමින් විසඳා ගනිමු.

## ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශන සහ දත්ත ප්‍රකාශනය කිරීම සඳහා අයිතිය අත්හැරීම

මෙම වාර්තාවේ සමාගමේ විභව අනාගත කාර්යසාධනය හා දර්ශනයන් සම්බන්ධයෙන් ඉදිරි දැක්මේ ප්‍රකාශයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශනවලින් අනාගත ප්‍රතිඵල පිළිබඳව සහතික කිරීම් නොමැති අතර, අනපේක්ෂිත සිදුවීම්, වෙනස්වන ආර්ථික හා දේශපාලන තත්ත්වයන්, සහ අපගේ පාලනයෙන් තොර වෙනත් සාධක ඇතුළුව විවිධ අවදානම් සහ අවිනිශ්චිතතාවන්ට යටත් වේ. සැබෑ ප්‍රතිඵල වර්තමාන අපේක්ෂාවන්ගෙන් සැලකියයුතු ලෙස වෙනස්විය හැකිය. එවැනි සියලුම අංග පිළිබඳව ප්‍රවීන වෘත්තීමය උපදේශය ලබාගන්නා මෙන් පාඨකයින්ට අවවාද කරනු ලබයි.

## වටිනාකම් නිර්මාණය

අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය ව්‍යාපාර ආදර්ශය තුළ පුළුල් වශයෙන් විස්තර කෙරේ. (38 පිටුව බලන්න). වටිනාකම නිර්මාණයේදී ප්‍රාග්ධනයේ යෙදවුම්, නිමැවුම්, සහ ප්‍රතිඵල මෙන්ම ඒවායේ වගකීම්සහගත කළමනාකරණය ඉන් විස්තර කරයි. මූල්‍ය ප්‍රාග්ධනයේ උත්පාදනය සමාගමට සහ එහි පාර්ශවකරුවන්ට වටිනාකම නිර්මාණය කිරීමට මූල්‍ය සහ මූල්‍ය නොවන මැදිහත්වීම් අතර අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින සංයුක්තතාවය මගින් මෙහෙයවන බව ඒකාබද්ධ වාර්තාකරණය කරා අපගේ යොමුව තුළින් සහතික කරන අතර ක්‍රියාවලීන් තුළ මෙවැනි ප්‍රාග්ධනයන් භාවිතය සංවර්ධනය හා පරිවර්තනය සිදු කරයි.

## පූර්වාරක්ෂක මූලධර්මය

අපගේ මෙහෙයුම්වල දිගුකාලීන ශක්තිය සහතික කිරීමට සම්පූර්ණ සාක්ෂි සහ තොරතුරු නොමැති වුවද විභව අවදානම් කාර්යය අවම කරමින් සමාජීය හා පාරිසරික තීරණ ගැනීම කරා අප කැපවන බැවින් අපි පූර්වාරක්ෂක මූලධර්මය භාවිතා කරමු. අප බලපෑම් කරන අපගේ පාර්ශවකරුවන්, පරිසරය සහ ප්‍රජාව සුරක්ෂිත කරමින් වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපට ක්‍රියාත්මක වීමට මින් ඉඩ ලබා දේ. මෙම පූර්වාරක්ෂක මූලධර්මය ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත අභියෝගවලදී අපට සහයවන අතර අපගේ පාර්ශවකරුවන් අතර විශ්වාසය ප්‍රවර්ධනය කරමින් අපගේ ඔරොත්තුදීම සවිබල ගන්වන විසඳුම් ඇති කරයි.

## ඒකාබද්ධ සහතික කිරීම

මෙම ඒකාබද්ධ වාර්තාවේ ඇතුළත් අන්තර්ගතය සඳහා සහතික කිරීම අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍ර පිළිබඳ පරීක්ෂාකාරීව සිදුකළ සංයෝජනයක් මඟින් සවිබල ගන්වයි. මෙම වාර්තාවේ ඇතුළත් තොරතුරුවලට අදාළ ව්‍යාපාර ඒකකවල නායකයින්ගේ අනුමැතිය ලැබී ඇති අතර, අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර ආයතනික කළමනාකරණ කණ්ඩායම විසින් සියුම්ව පරීක්ෂා කර ඇත. ගිණුම්වලට සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අත්‍යවශ්‍ය ස්වාධීන සමාලෝචනය ශ්‍රී ලංකාවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර, දෙපාර්තමේන්තුවේ සමාලෝචනය මෙම වාර්තාවේ 116 සිට 165 දක්වා පිටුවල විස්තරාත්මකව දක්වා ඇත. මෙම බාහිර වලංගුකිරීම තුළින් මෙම වාර්තාවේ ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය හා විනිවිදභාවය ශක්තිමත් කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් ප්‍රකාශය

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මඟින් 2024/25 දී සිය කාර්යසාධනය පිළිබඳ තුලනාත්මක දැක්මක් ලබාදෙන බව සහතික කිරීමට ඇති සිය වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගන්නා අතර, කෙටිකාලීනව වටිනාකම නිර්මාණය කිරීමට සමාගමේ හැකියාව මත සම්බන්ධයක් ඇතැයි විශ්වාස කරන සියලුම ප්‍රමාණත්මක ගැටළු ආමන්ත්‍රණය කර ඇතැයි යන මතය තුළ ඔවුන් සිටී. ආයතනික කළමනාකරණ කණ්ඩායම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සකස් කර සහ සමාලෝචනය කර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර, ඔවුන් බලතල පැවරීමට අනුකූලව අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාව නිර්දේශ කර ඇත. මෙම වාර්තා 2025 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

## මෙහෙයුම් මූලධර්ම

අපගේ කාර්යසාධනය හා මෙහෙයුම් පිළිබඳ විශ්වාසනීය සමාලෝචනයක් ලබාදීමට මෙම වාර්තාව සකස් කිරීමේදී පහත සඳහන් මූලධර්ම යොදා ගන්නා ලදී.

- **විශ්වාසනීයත්වය** – මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරුවල විශ්වාසනීයත්වය ලබාදීමට දැනට ක්‍රියාත්මක කළ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාවලි
- **සංක්ෂිප්තබව** – අපි සියලුම වැදගත් කරුණු සම්පූර්ණ නමුත් සංක්ෂිප්ත ආකාරයෙන් ආවරණය කර ඇත.
- **සත්‍ය ඉදිරිපත් කිරීම** – ධනාත්මක හෝ සෘණාත්මක ප්‍රතිඵල මත පදනම් වූ තුලනාත්මක දැක්මක් විශ්වාසනිය ආකාරයෙන් වාර්තා කිරීම.
- **ප්‍රමාණතාව** – ප්‍රමාණතා කරුණු වගකීම්සහගත අයුරින් හඳුනාගෙන වාර්තා කර ඇත.
- **ඒකාබද්ධ වාර්තාකිරීම සහතික කිරීම** – තොරතුරුවල සම්බන්ධතාව වාර්තාකරමින් හා ලබාදෙමින් විවිධ මාතෘකා ඒකාබද්ධ කිරීමට අයිකන් (Icons) භාවිතා කර ඇත.

## තොරතුරු ප්‍රතිප්‍රකාශය

2024/25 මෙහෙයුම්වලට අදාළවේනම් මිස පසුගිය වසරේ විගණනය කරන ලද මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු පිළිබඳ ප්‍රතිප්‍රකාශ නොමැත.

## ප්‍රතිපෝෂණය

වාර්තාකරණ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා එහි අඛන්ඩ කැපවීමේ කොටසක් ලෙස මෙම වාර්තාව සහ අනෙකුත් කරුණු පිළිබඳව කොටස්හිමියන්ගේ ප්‍රතිපෝෂණ අපි සාදරයෙන් පිළිගනිමු.

**සමාගම් ලේකම්**
ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්
"රක්ෂණ මන්දිරය",
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
දුරකතනය: +94 11 235 7741

# 04

# උපායමාර්ගය හා අවධානය

38
ව්‍යාපාර ආදර්ශය

40
ප්‍රමාණාත්මක ගැටළු

42
පාර්ශවකාර සම්බන්ධතා

44
උපායමාර්ගික ප්‍රමුඛතා

# ව්‍යාපාර ආදර්ශය

## දැක්ම

| යෙදවුම් මූලාශ්‍ර | යෙදවුම් |
|---|---|
| **කොටස්හිමියන්**<br>100% – SLIC<br>99.97% – ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා රජයෙ භාණ්ඩාගාරයේ ලේකම් | **මූල්‍ය ප්‍රාග්ධනය**<br>කොටස්හිමි අරමුදල, ආයෝජනය |
| **පාරිභෝකයින්**<br>1,400,446<br>සාමාන්‍ය රක්ෂණ ඔප්පු | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – ගනුදෙනුකරුවන්**<br>නිෂ්පාදන පිළිගැනීම<br>වාරික ගෙවීම්<br>ඔප්පු අලුත් කිරීම |
| **සේවකයින්**<br>පිරිමි 1,122<br>කාන්තා 721<br>එකතුව 1,843 | **මානව ප්‍රාග්ධනය**<br>පාරිභෝගික මැදිහත්වීම්<br>ඵලදායිතාව, මනා පරිචයන්<br>අලෙවියෙන් පසු සේවා<br>මෙහෙයුම් |
| **ව්‍යාපාර හවුල්කරුවන්**<br>ප්‍රතිරක්ෂක නියෝජිතයින්/ රක්ෂණ තැරැව්කරණ ආයතන/ බැංකු/කාර්යාලය සඳහා සැපයුම් දාමය | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ව්‍යාපාර හවුල්කරුවන්<br>සහතික කිරීමේ සේවා<br>සහයෝගිතා සහ සන්ධාන<br>සේවා සහ සැපයීම්<br>උපයෝගිතා |
| **පරිශ්‍ර/ශාඛා ජාලය** | **නිෂ්පාදිත ප්‍රාග්ධනය**<br>දේපල, පිරියත හා උපකරණ<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය<br>ස්ථාවර වත්කම්වල රු. මිලියන 147ක් ආයෝජනය |
| **ආයතනික දැනුම** | **බුද්ධිමය ප්‍රාග්ධනය**<br>සාමූහික ප්‍රවීනතාව<br>ආයතනික දැනුම<br>දත්ත විශ්ලේෂණ<br>සමීක්ෂණ සොයාගැනීම් හා කාර්යය |
| **ප්‍රජා මැදිහත්වීම** | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – ප්‍රජාව**<br>CSR කටයුතුවල ආයෝජනය |
| **නියාමකයින් – IRCSL, DROC, FIU – CBSL** | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – නියාමකයින්**<br>නීති හා රෙගුලාසිවලට අනුකූලවීම<br>කාලීන වාර්තාකරණය |
| **පරිභෝජනය** | **ස්වභාවික ප්‍රාග්ධනය**<br>බලශක්තිය<br>විදුලිය<br>ජලය |

## මෙහෙවර

### ක්‍රියාවලි/කටයුතු

නිෂ්පාදන හා සේවා

සේවා ප්‍රමිති

මානව ප්‍රාග්ධනය පුහුණුව සහ සංවර්ධනය

අවදානම් කළමනාකරණය

ප්‍රාරක්ෂණය හා ක්‍රියාවලි සේවාකරණය

ද්‍රවශීලතා කළමනාකරණය

*සටහන: අනුරූපතාව සහ තුලනාත්මකභාවය සහතික කිරීමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සම්පූර්ණ වසරේ කාර්යසාධනය මෙම වාර්තාවෙන් පිලිබිඹු වේ.*

මෙහෙයුම් පරිසරය




නියාමන පරිසරය

## පරමාර්ථ

| නිමැවුම් | ප්‍රතිඵල |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය<br>ආයෝජන මත ඉපයීම **11%**<br>බදු පෙර ලාභය රු. මිලියන **4,039**<br>නුබුන්වත් අනුපාතය **277.3%**<br>වෙළෙඳපොල කොටස **19.4%** | ලාභාංශ ලෙස රු. මිලියන 250 යෝජනා කර ඇත.<br>බදු ලෙස රු. මිලියන 3,481ක් ගෙවා ඇත. |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පාරිභෝගිකයින්<br>**483,934** නව ඔප්පු<br>**6.3%** වාර්ෂික වර්ධනය<br>**65.8%** ගනුදෙනුකරුවන් රඳවා ගැනීමේ අනුපාතය | හිමිකම් ලෙස රු. මිලියන 10,510ක් පියවන ලදි. |
| මානව ප්‍රාග්ධනය<br>**293** නව බඳවාගැනීම/ස්ථිර සේවක පද්ධතිය<br>**88.6%** සේවක රඳවා ගැනීමේ අනුපාතය | වැටුප් හා ප්‍රතිලාභ ලෙස රු. මිලියන 5,337ක් ගෙවා ඇත.<br>විශ්‍රාම ප්‍රතිලාභ ලෙස රු. මිලියන 84ක් ගෙවා ඇත.<br>පුහුණුව තුළ රු. මිලියන 29ක් ආයෝජනය කර ඇත. |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – ව්‍යාපාර හවුල්කරුවන්<br>නව ව්‍යාපාර සම්බන්ධතා – 07 | ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ප්‍රමාණ ඇතුළුව ප්‍රතිරක්ෂණ වාරිකය ලෙස රු. මිලියන 7,253ක් ගෙවා ඇත<br>උපයෝගිතා පරිභෝජන ලෙස රු. මිලියන 193ක් ගෙවා ඇත |
| නිෂ්පාදන ප්‍රාග්ධනය<br>ශාඛා 2ක් යාවත් කරන ලදි<br>අත්කරගත් නව තාක්ෂණය/ඩිජිටල්කරණ වේදිකා<br>වඩා ඉහළ සන්නාම දෘශ්‍යතාවයට දායකවීම | ඉහළ දෘශ්‍යතාව, දිවයින පුරා පැවැත්ම, සන්නාම විශ්වාසය |
| බුද්ධිමය ප්‍රාග්ධනය<br>රක්ෂණ නිෂ්පාදන සඳහා පහසු හා බාධාරහිත ප්‍රවේශයට දායක වන ඩිජිටල්කරණය<br>කාලීන කාර්යක්ෂම පිරිසැකසුම | ප්‍රතිචාරාත්මකබව, නිර්මාණශීලී නව්‍යකරණය, ඉක්මන් ගතවන කාලය |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – ප්‍රජාව<br>ක්‍රියාත්මකවීමට සමාජීය බලපත්‍රය<br>වැඩි කිරීමට දායක වන CSR කටයුතු | ප්‍රජා ප්‍රතිලාභී CSR කටයුතු, රඳවාගත් හා වැඩිකළ ආයතනික සමාජීය වටිනාකම |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – නියාමකයින්<br>බාධාරහිත මෙහෙයුම් | විගණකවරුන්ගේ වාර්තාවේ අනාවරණය කරන දෑ හැර සියලුම අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම |
| ස්වභාවික ප්‍රාග්ධනය<br>පරිසරය සංරක්ෂණයට දායක වන ප්‍රතිචාරාත්මක පරිභෝජනය | UN SDGs හා බැඳුණු ජාතික අරමුණු අත්කර ගැනීමට දායක වන ශක්තිමත් ප්‍රජාවන්, තිරසාරභාවය |

# ප්‍රමාණාත්මක ගැටළු

**වටිනාකම නිර්මාණයට හා සිය ගමන්මඟ වෙනස් කිරීමට SLICGL හි හැකියාවට සැලකියයුතු ලෙස බලපෑම් කරන ගැටළු මගින් ප්‍රමාණතාව නියෝජනය කෙරේ. ප්‍රමාණාත්මක ගැටළු සහිත අපගේ උපායමාර්ගය, පාලනය හා වාර්තාකරණ ක්‍රියාවලි හඳුනාගැනීම හා ඒ හා පෙළ ගැසීම සමාගමට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට හා වැඩිවන දැනුම් තේරුම් සහිත පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීමට උපකාරි වේ.**

## අපගේ ප්‍රවේශය

යෙදවුම් හඳුනාගෙන රැස්කිරීම, බලපෑම් තක්සේරු කිරීම සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ පාර්ශවකරුවන්ට බලපාන ප්‍රධාන ගැටළු සම්බන්ධවන උපායමාර්ගය සංවර්ධනය කිරීම සිදු කරමු. මෙයට සාර්ව ආර්ථික වාතාවරණය ඇගයීම, නියාමන අවශ්‍යතා සහ අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ගෙන් ඇතිවන අපේක්ෂාවන් හා අදහස් ඇතුළත්ය. එමනිසා, අපි ව්‍යුහගත සහ ක්‍රමානුකූල ආකාරයෙන් ප්‍රමාණාතා තීරණයට එළඹෙන අතර එයට දැඩි තක්සේරු කිරීම, සියුම් විශ්ලේෂණ,සහ හඳුනාගත් ගැටළු ඵලදායි ලෙස ශ්‍රේණිගතකරණය සම්බන්ධ වේ.

## ප්‍රමාණතාව තීරණය කිරීම

තිරසාරභාවය කෙරෙහි අපගේ අවධානය ශක්තිමත් වී ඇති බැවින්, ප්‍රමාණාත්මක ගැටළු හඳුනා ගැනීමේ අපගේ ප්‍රවේශය වසර ගණනාවක් පුරා පරිනාමනය වී ඇත. ප්‍රමාණාත්මක අංග තීරණය කිරිමේදී අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් අපි සලකා බලමු. මොවුන් අපගේ මෙහෙයුම් කටයුතු හා උපායමාර්ගික අරමුණු හැඩගැස්වීමේදී සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. එයට හේතුව ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පිරියත, දේපල හා පරිශ්‍ර ආරක්ෂා කර ගැනිමේ දී ඔවුන් භාවිතා කිරීමට කැමති ව්‍යවස්ථාපිතව අවශ්‍ය වන අවදානම් අවම කිරිමේ ව්‍යාපාරයක අප යෙදී සිටීමයි.

## ප්‍රමාණතාව තීරණය කිරීමේ ක්‍රියාවලිය

ප්‍රමාණාතාව තීරණය කිරීමේ ක්‍රියාවලිය තුළින් වටිනාකම නිර්මාණය කිරීමට විභව හැකියාව මත පදනම් වී ප්‍රධාන මාතෘකා විසඳීමට උත්සාහ දරයි. මෙම වැදගත් අවශ්‍යතාව කාර්යසාධනය ඇති කර තිරසාර ව්‍යවහාර කරා අපගේ බැඳීම ශක්තිමත් කරයි. එය අපගේ පාර්ශවකාර සහභාගිත්ව ක්‍රියාවලිය තුළින් අපි හඳුනා ගන්නා සියලුම පාර්ශවකාර කණ්ඩායම් සමඟ ඵලදායී සහභාගිත්වය සමඟ ආරම්භ වන අතර බලපෑම නැවත සිදුවීමේ සහ විශාලනය විමේදී ඔවුන්ගේ අදහස් තවදුරටත් විශ්ලේෂණය කෙරේ. ක්‍රියාවලිය තුළ, සමාගමට හා පාර්ශවකරුවන්ට මූලිකවම වැදගත්වන වන ගැටළු අපි ඉතා සූක්ෂම ලෙස වෙන් කර ගනිමු.




| අංකය | ප්‍රමාණාත්මක මාතෘකාව | SLICGLට ඇති වැදගත්කම | පාර්ශවකරුවන්ට ඇති වැදගත්කම | වාර්තාව තුළ යොමුව |
|---|---|---|---|---|
| 01. | ආර්ථික කාර්යසාධනය | ඉතා ඉහළ | ඉතා ඉහළ | මෙහෙයුම් පරිසරය – පිටුව 46 |
| 02. | වෙළෙඳපොල පැවැත්ම | ඉතා ඉහළ | ඉතා ඉහළ | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 62 |
| 03. | දූෂණ විරෝධී වීම | ඉතා ඉහළ | ඉතා ඉහළ | ආයතනික පාලනය – පිටුව 80 |
| 04. | තරඟ විරෝධී හැසිරීම | ඉහළ | ඉහළ | ආයතනික පාලනය – පිටුව 80 |
| 05. | රැකියා නියුක්තිය | ඉතා ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 06. | වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව | ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 07. | පුහුණුව සහ සංවර්ධනය | ඉතා ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 08. | විවිධත්වය, ඇතුළත්වීම සහ සමාන අවස්ථාව | ඉතා ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 09. | වෙනස් ලෙස නොසැලකීම | ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 10. | රැස්වීමේ නිදහස හා සාමුහික කේවල් කිරීම | ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 57 |
| 11. | දේශීය ප්‍රජාවන් | ඉහළ | මධ්‍යම | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 62 |
| 12. | ගනුදෙනුකාර ධනය සහ ආරක්ෂාව | ඉහළ | ඉහළ | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 62 |
| 13. | අලෙවිකරණය සහ ලේබල්කරණය | ඉහළ | මධ්‍යම | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 62 |
| 14. | සමාජ ආර්ථික අනුකූලතාව | ඉහළ | ඉහළ | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 62 |
| 15. | සාර්ව ආර්ථික සංවර්ධනයන් | ඉතා ඉහළ | ඉහළ | මෙහෙයුම් පරිසරය – පිටුව 46 |


ඉතා ඉහළ
ඉහළ
මධ්‍යම
පාර්ශ්වකරුවන්ට ඇති වැදගත්කම
1, 2, 5, 7, 8
4, 6, 9, 10, 12, 14
3, 15
11, 13
මධ්‍යම
ඉහළ
ඉතා ඉහළ
SLICGLට ඇති වැදගත්කම

# පාර්ශවකාර සහභාගිත්වය

**පාර්ශවකාර සහභාගිත්වය අප රටේ උපායමාර්ගික දිශානතියේ තීරණාත්මක අංගයක් වන අතර පාර්ශවකාර සම්බන්ධතාවල ජීව කාලය පුරා විවෘත සන්නිවේදනය තුළ සැලසුම් කිරීම, සහභාගිවීම සහ අපගේ සහභාගිත්ව ක්‍රමවලට අනුවර්තනයවීම හා සම්බන්ධ වේ. අපි පාර්ශවකාර අනුරූපන ව්‍යවහාරයක් පවත්වන බැවින් හා එක් එක් පාර්ශවකරුගේ අවශ්‍යතාවන්ට ගැලපීමට අපගේ උපායමාර්ග සකස් කරන බැවින් අපගේ පාර්ශවකරුවන්ගේ බොහෝ අවශ්‍යතා හඳුනාගැනීම, වර්ගීකරණය හා අවබෝධකර ගැනීම ප්‍රමුඛ වේ.**

## කළමනාකරණ ප්‍රවේශය

අපගේ ව්‍යාපාරය විනිවිදභාවය හා අන්‍යෝන්‍ය වටිනාකම එකතු කිරීම, දිගුකල් පවත්නා සම්බන්ධතා අගය කිරීම සහ අන්‍යෝන්‍ය වටිනාකම ඇති කිරීමට පෝෂණය කළ හැකි නව සම්බන්ධතා ගොඩ නැගීමට සක්‍රීයව උත්සාහ කරන අතර එය මෙම අංශවලට අපි ප්‍රවේශවන මාර්ග වෙති. එමනිසාම, අපි ප්‍රධාන පාර්ශවකරුවන් කිහිපයක් හඳුනාගෙන ඇති අතර, ඒවායේ යෙදවුම සහ සහභාගිත්වය සමාගමේ ලාභය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන බැවින් ඒවා පහත අනුකෘතිවල සිතියම් ගත කෙරේ.

## පාර්ශවකාර සහභාගිත්ව රාමුව




| | | | | |
|---|---|---|---|---|
| මෙම සබඳතාවල තිරසාරභාවය සහතික කිරීම සඳහා මනාව ව්‍යුහගත ආකාරයකින් ස්ථාපිත කිරීමට අප උත්සාහ කරන ප්‍රධාන සබඳතා හඳුනා ගැනීම කෙරෙහි අපි ආක්‍රමණශීලීව අවධානය යොමු කරමු. | ඇගයීමේ ක්‍රියාවලියට සමාග මේ ව්‍යාපාර හැසිරීම් SLICGL ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අපේක්ෂිත සම්බන්ධතා පිළිබඳ තොරතුරු රැස් කිරීම සම්බන්ධ වේ. | ඉන්පසු අපි වෙනස්ව නොසලකන ප්‍රවේශයක් සම්බන්ධවන සබඳතා ස්ථාපිත කරමු. | මෙම සබඳතා පෝෂණය කිරීම සහ වර්ධනය කිරීම සඳහා අපි මහත් සැලකිල්ල, විනිවිදභාවය සහ විවෘත සන්නිවේදනය සේවයේ යොදවමු. | දිගු කාලීනව වටිනාකම ලබා දෙමින් ව්‍යුත්පන්න කිරීමේ අරමුණින් අපි මෙම සබඳතා ප්‍රවේශමෙන් නියාමනය කරමු. |

## පාර්ශවකාර සහභාගිත්ව මූලධර්ම

සහභාගිත්ව මාර්ගය පාර්ශවකාර වර්ගය සහ සම්බන්ධතාවය අනුව වෙනස් වේ. කෙසේවෙතත්, ක්‍රමවේදය සියලු සම්බන්ධතා හරහා ක්‍රියාත්මක වන ප්‍රධාන ප්‍රතිෂ්ඨා තුනක් මත රඳා පවතී.

උපදේශන සාකච්ඡාව පෝෂණය කිරීම සඳහා විවෘතභාවය සහ විනිවිදභාවය තොරතුරු වල කාලෝචිතභාවය, නිරවද්‍යතාවය සහ අදාළත්වය ප්‍රතිචාරාත්මක බව වැඩි කිරීම සඳහා අඛණ්ඩ සහ ඉදිරියට යන සමාලෝචනය.

තවද, පාර්ශවකාර සහභාගිත්වය රාමුව තුළ අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා කළමනාකරණය කිරීමට වගකියන සෑම සේවකයෙක් සමඟ විමධ්‍යගත කෙරේ. ස්ථාපිත අභ්‍යන්තර සන්නිවේදන මාර්ග තුළින් ප්‍රධාන ගැටළු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සිදු කෙරේ. උසස් මට්ටමේ තීරණ ගැනීම සඳහා ප්‍රධාන යෙදවුමක් ලෙස මෙම වටිනා දර්ශන සේවය කරයි.

| පාර්ශවකාර වර්ගය | පාර්ශවකරුවන්ට අදාළවන ප්‍රමාණාත්මක ගැටළු | සහභාගිත්ව යාන්ත්‍රණය | වාරගණන | ප්‍රමුඛතාව |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා රජය** | ආයෝජනය. ව්‍යාපාර සංවර්ධනය, ප්‍රතිලාභ, නව්‍යකරණය, සහ ක්ෂේත්‍රයේ වර්ධනය, අනුකූලතාව | අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ රැස්වීම් සහ සාකච්ඡා | අවශ්‍යතාව පරිදි | ඉහළ |
| | | පුවත් නිවේදන | අවශ්‍යතාව පරිදි | |
| | | වාර්ෂික වාර්තාව | වාර්ෂික | |
| **වෙනත් නියාමකයින්** | නීති සහ රෙගුලාසි, යහපාලනය, ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, සදාචාර හැසිරීමට අනුකූලතාව | නියාමන අධිකාරීන් සමඟ රැස්වීම් | අවශ්‍යතාව පරිදි | ඉහළ |
| | | වාර්ෂික වාර්තාව | වාර්ෂික | |
| | | පුවත් නිවේදන | අවශ්‍යතාව පරිදි | |
| | | කර්මාන්ත සංසද | අවශ්‍යතාව පරිදි | |
| | | ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සහ තත්ත්ව වාර්තා | කාර්තුමය/වාර්ෂික | |
| **ගනුදෙනුකරුවන්** | ගනුදෙනුකාර සම්බන්ධතාවය, රඳවා ගැනීම, අදාළ නිෂ්පාදන, නිෂ්පාදන තොරතුරු,රක්ෂණාවරණ ප්‍රසාද දීමනා, ඔප්පු හිමිකම්, වෙනත් නියාමකයින් | ඇමතුම් මධ්‍යස්ථානය | නිරන්තර | ඉහළ |
| | | ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සමීක්ෂණ | අවශ්‍යතාව පරිදි | |
| | | මුහුණට මුහුණ අන්තර්ක්‍රියා | නිරන්තර | |
| | | වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය | නිරන්තර | |
| | | ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ | නිරන්තර | |
| **ව්‍යාපාර හවුල්කරුවන්** | සැපයුම් දාම කළමනාකරණය, ක්ෂේත්‍රයට සම්බන්ධ සංසද, තෙවැනි පාර්ශව බැඳීම් | රැස්වීම් | අවශ්‍යතාව පරිදි | මධ්‍යම |
| | | විද්‍යුත් තැපෑල/දුරකථනය/ලිපි | | |
| **සේවකයින්** | සේවක සුභසාධනය, තෘප්තිය, රඳවා ගැනීම, පුහුණු සහ සංවර්ධනය, පිළිගැනීම සහ ප්‍රදාන, වෘත්තීය ප්‍රගතිය, රැකියා සුරක්ෂිතභාවය | රැස්වීම් | නිරන්තර | ඉහළ |
| | | විද්‍යුත් තැපෑල/ දුරකථනය/ මාර්ගගත වේදිකා | අවශ්‍යතාව පරිදි | |
| | | අනුප්‍රාප්ත සැලැස්ම | වාර්ෂික/අවශ්‍යතාව පරිදි | |
| | | පුහුණු හා සංවර්ධනය | අවශ්‍යතාව පරිදි | |
| | | සම්මාන උත්සව | වාර්ෂික | |
| | | ප්‍රජා ව්‍යාපෘතිවල සහභාගිත්වය | අවශ්‍යතාව පරිදි | |
| | | මැසිවිලි මෙහෙයවීම | අර්ධ වාර්ෂික | |
| | | අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරුවල B-Connect App | නිරන්තර | |
| | | පරමාර්ථ/මූලික කාර්යසාධන දර්ශක සැකසීම | වාර්ෂික | |
| | | කාර්යසාධන ඇගයීම් | වාර්ෂික | |
| **ප්‍රජාව සහ පරිසරය** | ප්‍රජා ආයෝජන, ආයතනික සමාජ වගකීම් වැඩසටහන් | ප්‍රජා ව්‍යාපෘති | නිරන්තර | මධ්‍යම |
| | | පුවත් නිවේදන | අවශ්‍යතාව පරිදි | |
| | | වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය | නිරන්තර | |
| | | උත්සව | අවශ්‍යතාව පරිදි | |
| | | CSR ව්‍යාපෘති | නිරන්තර | |
| | | තිරසාර වැඩසටහන් | නිරන්තර | |

# උපායමාර්ගික ප්‍රමුඛතා

**2024 වසර තුළ, SLIC සාමාන්‍ය රක්ෂණය විසින් සැලකියයුතු අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගතකරණය සිදුකිරීම හා රටතුළ ආර්ථික අවිනිශ්චිතතාව, සංකීර්ණ සමාජ ගතිකතා සනිටුහන් කළ කාලසීමාවක් හරහා ඉදිරියාම හමුවේ සිය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ශක්තිමත් හා තිරසාර වර්ධනය පෙන්වා ඇත. මෙම කාර්යසාධනයෙන් සමාගමේ ඔරොත්තු දීම, උපායමාර්ගික දක්ම සහ සිය පාර්ශවකරුවන්ට වටිනාකම ලබාදීමට කැපවීම පිළිබිඹු කරයි.**

2024 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ප්‍රධාන උපායමාර්ග පහත දක්වා ඇත:

## සාමාන්‍ය රක්ෂණය

1. ශුද්ධ ලිඛිත වාරිකය කෙරෙහි අවධානය සමඟ ඉහළම මට්ටම මෙහෙයවීම
2. COR සහ ලාභ ප්‍රශස්තකරණය වර්ධනය
3. සේවා මට්ටම් හා ප්‍රමිති වැඩි කිරීම්
4. ගනුදෙනුකරුවන් රඳවා ගැනීම ප්‍රශස්ත කිරීම
5. මානව ප්‍රාග්ධනය ප්‍රශස්ත කිරීම

# 05

# කළමනාකරණ අදහස් දැක්වීම


46 මෙහෙයුම් පරිසරය

48 මූල්‍ය ප්‍රාග්ධනය

52 නිෂ්පාදිත ප්‍රාග්ධනය

55 බුද්ධිමය ප්‍රාග්ධනය

57 මානව ප්‍රාග්ධනය

62 සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

75 ස්වභාවික ප්‍රාග්ධනය

# මෙහෙයුම් පරිසරය

## ගෝලීය ආර්ථිකය - ඔරොත්තුදීම හා නැවත සකස් කිරීම

වෙළෙඳාමට බාධා ඇතිකළ සහ උද්ධමනයේ සුවිශේෂී වැඩිවීමකට මඟ පාදන ලද, කොවිඩ් 19 වසංගතය, භූදේශපාලනික අර්බුද වැඩි වීම, සහ අතිශය හා අහිතකර කාලගුණ විපර්යාස වලින් ඇති කළ පෙරනොවූ විරූ දුෂ්කරතා මගින් ගෝලීය ආර්ථිකය ආරක්ෂා කර ඇත. ලෝක ආර්ථික සංසදයේ සංඛ්‍යාලේඛණවලට අනුව, ගෝලීය සහයෝගිතාවයෙන් 91%කට භූදේශපාලනික පීඩනයෙන් සහ 83%කට දේශීය දේශපාලන පීඩනයෙන් බලපෑම් කර ඇත. අභියෝග හමුවේ, ගෝලීය ආර්ථිකය ස්ථාවරව පැවති අතර 2024 සඳහා වර්ධනය 3.2%ක් හා 2025 සඳහා 3.3%ක් පුරෝකථනය කරයි. වසර හතරක අඛණ්ඩව වැඩි වූ උද්ධමනයෙන් පසුව ශීර්ෂ උද්ධමනය 2025 දී 4.2% දක්වා අඩුවන බවට පුරෝකථනය කෙරේ. මුදල් පාලනය දැඩි කරන ගෝලීය ආර්ථික වාතාවරණය තුළ මහ බැංකුවලට මෙය අදාළ වන අතර සැපයුම් දාම බාධාවන් තුළ මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කරයි. 2024 දී 5.4% සිට 2025 දී 3.8% දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කරන ධෛක රටවල උද්ධමනය සමඟ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශම් සහගත ශුභවාදී හැඟීමක් පවතී.

ඉන්දියාව ආර්ථික වර්ධනය සඳහා ප්‍රාචරණය දරන අතර 2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකතනය කළ 6.5%ක පුළුල් කිරීමක් ආරක්ෂා කර ඇත. එය 2025 දී තවදුරටත් 0.3%කින් වර්ධනය වනු ඇති බවට පුරෝකථනය කෙරේ. ඉන්දියාවට පසුව ඉන්දුනීසියාව, චීනය සහ තුර්කිය සිටින අතර, දියුණු ආර්ථිකයන් 2024 දී පහළ වර්ධන පොරොන්දුවක් පෙන්නුම් කරයි. දියුණු ආර්ථිකයන් සමස්තයක් ලෙස 1.7% කින් වර්ධනය වූ අතර, ඇමරිකා එක්සත් ජනපදය ආර්ථිකයේ ශක්තිමත් ප්‍රසාරණයක් පෙන්නුම් කරයි.2024 දී ආර්ථිකය සුළු වශයෙන් වර්ධනය වූ ජපානයට ප්‍රතිවිරුද්ධව යුරෝපය ආර්ථික වර්ධනය සුළු වශයෙන් ඉහළ දමා ඇත.

ආර්ථිකය -
වර්ධනය හා ප්‍රක්ෂේපන




*මූලාශ්‍රය: ලෝක ආර්ථික දැක්ම IMF ජනවාරි 2025*

වැටුප් නැවත පහළයාමේ සංඥා පෙන්නුම් කලද, ස්වයං නිෂ්පාදන පිරියත වසා දැමීම, පරිභෝජනයේ සුළු ප්‍රතිසාධනය, අඩු ගනුදෙනුකාර විශ්වාසය හේතුවෙන් ජපානය විශේෂයෙන් පීඩනයට ලක් කරන ලදී. චීනය 2024 දී 4.9%ක වර්ධනය පෙන්නුම් කළ අතර එක්සත් ජනපද ආර්ථිකය පළමු කාර්තු දෙක තුළ වඩා ශක්තිමත් වර්ධනය පෙන්නුම් කර ඇත.

## ශ්‍රී ලංකා ආර්ථිකය

ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව වසර දෙකක ආර්ථික සංකෝචනයෙන් පසුව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය තුළ 5%ක ස්ථිර වර්ධනයක් වාර්තා කරමින් ශක්තිමත් යලි නැගිටීමක් අත් විඳින ලදී. මෙම ප්‍රතිසාධනය වසර පුරාම ස්ථාවර වූ අතර සියලුම කාර්තු සඳහා ධනාත්මක දළ දේශීය නිෂ්පාදිතයක් වාර්තා කළ 2017 සිට මෙය පළමුවරට සිදුවීමකි. නිෂ්පාදන හා ඉදිකිරීම් කටයුතුවල යලි පුබුදුව මගින් සනාථ කළ කර්මාන්ත අංශය විසින් සමස්ත ආර්ථික ප්‍රසාරණය මූලිකවම මෙහෙයවා ඇත. සේවා අංශ ද නවාතැන් හා ප්‍රවාහන සේවාවල අඛණ්ඩ වර්ධනය මගින් සහය ලබමින් සැලකියයුතු ලෙස දායක වී ඇත. තවද, කෘෂිකාර්මික අංශය සමස්ත ආර්ථික කාර්යසාධනයට ධනාත්මක දායකත්වයක් සිදු කර ඇත. මෙම ප්‍රවනතාවලින් අනාගතය සඳහා හිතකර දැක්මක් පෙන්නුම් කරයි.

2024 දී, කෘෂිකර්මය 2023 දී පැවති 1.6% සිට සුළු අඩුවීමක් වන 1.2%කින් වර්ධනය වූ අතර පොල් නිෂ්පාදනය අඛණ්ඩව පහත වැටීමක් තුළින් සත්ත්ව නිෂ්පාදනය පළතුරු වගාව තුළ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. කර්මාන්ත අංශය 2023 දී 9.2%ක සංකෝචනයෙන් පසු 11.0%කින් ප්‍රසාරණය වෙමින් ශක්තිමත් ප්‍රතිසාධනයක් පෙන්වා ඇත. එය ගෘහස්ථ හා බාහිර ඉල්ලුම ඉහළයාම සහ ඉදිකිරීම් ව්‍යාපෘතිවල පුබුදුවක් මගින් ඇති කරන ලදී. සේවා අංශය පසුගිය වසරේ 0.2%ක පහත වැටීමක සිට 2.4% කින් වර්ධනය වූ අතර සංචාරක වර්ධනය, වර්ධිත මූල්‍ය සහ නිශ්චල දේපල සේවා සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනයේ අත්කරගැනීම්වලින් එයට සහය විය.

මූල්‍ය ප්‍රතිපත්ති වසර පුරාම උපකාරිව පැවති අතර 2023 මැදදී ආරම්භ කළ වඩා පුළුල් 775ක පදනම් ලකුණු ලිහිල් කිරීමේ චක්‍රයේ කොටසක් ලෙස 2024 දී පදනම් ලකුණු 125ක මුළු ප්‍රමාණයකින් මහ බැංකුව ප්‍රතිපත්ති අනුපාත අඩු කරන ලදී. තනි ප්‍රතිපත්ති අනුපාත රාමුවක් සහිත පෙර ද්විත්ව අනුපාත පද්ධතිය වෙනුවට එක් දින ප්‍රතිපත්ති අනුපාතය හඳුන්වාදීම සමඟ ප්‍රධාන ප්‍රතිපත්ති වෙනසක් නොවැම්බර්වල සිදුවිය. වර්ධිත ද්‍රවශීලතා තත්ත්වයන් සහ පහළයන උද්ධමනය සමඟ මෙම සංක්‍රාන්තිය වෙළෙඳපොල පොලී අනුපාතවල අඛණ්ඩ පහත වැටීමකට දායක විය.

සාමාන්‍ය බරතබන ලද ඇමතුම් මුදල් අනුපාතය (AWCMR) වසර තුළ ක්‍රමයෙන් පහත වැටුන අතර දෙසැම්බර් වන විට ආසන්න වශයෙන් 8.00% හි ස්ථාවර විය. 2024 මැදදී රජයේ සුරැකුම්පත් ඉපයීම්වල තාවකාලික ඉහළයාමක් හමුවේ, ණය හා තැන්පතු අනුපාත වසර අගදී පහළ වැටීමේ ප්‍රවනතාව ආරම්භ කළේය. 2025 දී වර්ධනීය මූල්‍ය තත්ත්වයන්, ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය හමුවේ අඩු වූ අවදානම් වාරික සහ වඩාත් උපකාරී පරිසරය ණය වර්ධනයේ මෙවැනි සංවර්ධනයන් තුළින් පිළිබිඹු වේ.

2024 දී, බාහිර අරමුදල් කරා සීමිත පිවිසීම පිළිබිඹු කරමින් අයවැය හිඟය මූල්‍යකරණය සඳහා දේශීය මූලාශ්‍ර කෙරෙහි රජය මූලිකව විශ්වාසය තබන ලදී. ශුද්ධ දේශීය මූල්‍යකරණයේ බහුතරය රජයේ සුරැකුම්පත් නිකුතුව තුළින් ලබා ගන්නා ලදී.

2025 දී, වෙළෙඳ භාණ්ඩ හිඟය පුළුල් වනු ඇති බවට අපේක්ෂා කරන අතර, ආනයන සීමා ලිහිල් කිරීමෙන් ඇතිවන වැඩි වූ ආනයන ඉල්ලුම, උපකාරී මූල්‍ය තත්ත්වයන් මගින් සහයවන ශක්තිමත් ආර්ථික කටයුතු, සහ ව්‍යාපාර හා ගෘහස්ථ අතර වැඩිකළ වියදම් කිරීමේ හැකියාව එයට මූලිකවම හේතු වේ. කෙටි කාලීනව මෝටර් රථ ආනයන සඳහා ඉල්ලුම අපේක්ෂාවන්ට පහළින් පවතින අතර, මෙම අංශය තුළ ක්‍රමානුකූල ප්‍රතිසාධනය සිදුවිය හැකිය.

ගෝලීය බොර තෙල් මිලගණන් 2025 දී සාපේක්ෂව අඩුවෙන් පවතිනු ඇති බව පුරෝකථනය කර තිබුනද, පෙට්‍රෝලියම් ආනයන වියදම 2024ට සාපේක්ෂව මධ්‍යස්ථ ඉහළයාමක් පුරෝකථනය කෙරේ. අපේක්ෂිත දේශීය ආර්ථික ප්‍රතිසාධනය හා බැඳුණු වැඩි වූ ආනයන පරිමාවන් සහ මිල උච්ඡාවචනය මත භූදේශපාලනික අවදානම්වල විභව බලපෑම එයට හේතු වේ. එයට සමානම, වෙනත් අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම ආර්ථික කටයුතුවල ඉදිරියට යන පුනර්ජීවය සමඟ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, අඛණ්ඩ ආනයන ප්‍රසාරණය මධ්‍ය කාලීනව අපනයනවල ස්ථාවර වර්ධනයක් මගින් සහාය ලබමින්, වෙළෙඳ හිඟය මධ්‍ය කාලීනව කළමනාකරණය කළ හැකි මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. සංචාරක ආදායම ඉහළ යාම සහ අනෙකුත් සේවා අපනයනවල තරඟකාරීත්වය වැඩි වීම හේතුවෙන් 2025 සහ ඉන් ඔබ්බට සේවා ගිණුම් අතිරික්තය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ව්‍යූහගත, නෛතික හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල පුළුල් එකතුවක් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීමට අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකාව 2026 දි තෙවැනි අන්‍යෝන්‍ය ඇගයීම (ME) සඳහා සූදානම් වෙමින් සිටින අතර, ගෝලීය ප්‍රමිතිවලට අනුකූල වෙමින් මුදල් විශුද්ධිකරණ විරෝධී හා ත්‍රස්තවාදයට මූල්‍යකරණය වැළැක්වීමේ රාමු ශක්තිමත් කිරීමට එහි කැපවීම තහවුරු කරයි.

ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික දර්ශනය දැඩිව උපයාගත් සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම සහ ඵලදායී, වර්ධනයට යොමු වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මත විශාල වශයෙන් රඳා පවතිනු ඇත. නිතරම ප්‍රතිපත්ති නොගැලපීම් සහ ආපසු හැරවීම් සෑමවිටම ලාභ ආපසු හරවමින් වසර ගණනාවක් පුරා රටේ ආර්ථික ප්‍රගතියට බාධා කර ඇත. මෑතකාලීන ආර්ථික පහත වැටීම, අර්බුදය තුළ පුරවැසියන් මුහුණ දුන් දුෂ්කරතා, සහ සමුච්චිත හානිකරබව අනාගත ප්‍රතිපත්ති වැරදීම් සඳහා ඉඩ සලස්වනු ඇත. අඛණ්ඩ ප්‍රතිසංස්කරණ මුලපිරීම් මූල්‍ය සහ ණය තිරසාරභාවය සඳහා තීරණාත්මක වන අතර ආර්ථික ස්ථායිතාව සහ වර්ධනය රඳවා ගැනිමට ඇති දිගුකාලීන ව්‍යූහගත බාධාවන් විසඳනු ඇත.

## සාමාන්‍ය රක්ෂණ අංශය

2024 වසර තුළ, සාමාන්‍ය රක්ෂණ අංශය මුළු වත්කම්වල පුළුල් වැඩිවීමක් තිබුනද, මිශ්‍ර කාර්යසාධනයක් පෙන්වා ඇත. 2024 වසර අවසානයට, සාමාන්‍ය රක්ෂණ අංශය සාමාන්‍ය රක්ෂණ අංශවල ක්‍රියාත්මක සමාගම් 14කින් හා රක්ෂණ තැරැව්කාර සමාගම් 81කින් සමන්විත විය. 2023 වසරට සාපේක්ෂව මෙම වසර තුළ සාමාන්‍ය රක්ෂණය 11.7%ක වාර්ෂික වර්ධන අනුපාතයක් සාක්ෂාත් කර ගනිමින්, දළ ලිඛිත වාරිකවල වර්ධනයක් අංශය විසින් වාර්තා කර ඇත. කෙසේවෙතත්, සාමාන්‍ය රක්ෂණයේ වත්කම් 5.3%ක සංකෝචනයකට මුහුණ දුන්හ. ලාභදායිතාව අනුව සාමාන්‍ය රක්ෂණ උපඅංශය බදු පෙර ලාභයෙහි 2.4%ක පහත වැටීමක් පිළිබිඹු කළේය. පසුගිය වසරට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ අංශයේ හිමිකම් 2.2%කින් වැඩි වී ඇත. සමස්තයක් වශයෙන්, ලාභදායිතාව සහ ප්‍රාග්ධණ කාර්යක්ෂමතාව කෙරෙහි පීඩනයන් හමුවේ මෙම අංශය ඔරොත්තු දෙමින් පැවතුණි.

### මූලාශ

*(1) ලෝක ආර්ථික දැක්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2025 ජනවාරි*

*(2) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික ආර්ථික සමාලෝචනය - 2024*

*(3) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, කාර්තුමය ප්‍රකාශ*

# මූල්‍ය ප්‍රාග්ධනය

ආර්ථික අවිනිශ්චිතතා සහ වෙනස්වන නියාමන අවශ්‍යතා මගින් හැඩගස්වන මෙහෙයුම් පරිසරයක් තුළ, ප්‍රමාණවත් ද්‍රවශීල ස්වාරක්ෂක පවත්වා ගැනීම, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා සීමා සපුරාලීම සහ මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම සඳහා අපි කැපවී සිටිමු. පරීක්ෂාකාරී අවදානම් කළමනාකරණය හා ඉදිරිය දකින මූල්‍ය සැලසුම් කිරීම මගින්, අපගේ මූල්‍ය ප්‍රාග්ධනය පාර්ශවකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමේ අඛණ්ඩ ශක්තිමත් සක්‍රියකරුවෙක් වන බව අපි සහතික කරමු.

## කළමනාකරණ ප්‍රවේශය

මූල්‍ය ප්‍රාග්ධයේ විචක්ෂණ හා උපායමාර්ගික කළමනාකරණය තිරසාර වටිනාකම නිර්මාණය කිරීමට හා දිගුකාලීන මූල්‍ය ඔරොත්තුදීම සහතික කිරීමට අපට ඇති හැකියාවට ප්‍රධාන වේ. අපගේ ප්‍රවේශය විධිමත් මූල්‍ය කළමනාකරණය, යහපත් ආයෝජනය ව්‍යවහාර, සහ නියාමන අනුකූලතාවයට කැපවීම මත පදනම් වන අතර අනාගත වර්ධනය ඇති කරමින් අපගේ බැඳීම් ඉටු කිරීමට එය අපව ශක්තිමත් කරනු ඇත.

ද්‍රවශීලතාව, නුබුන්වත්කම සහ ලාභදායිතාව සඳහා අවශ්‍යතාව තුළනය කරමින් මූල්‍ය ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී අපි සක්‍රීය උපායමාර්ගයත් යොදා ගතිමු. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පවත්වා ගැනීමට, ව්‍යාපාර අඛණ්ඩතාවයට සහයවීමට සහ පාර්ශවකාර ධනය වැඩි කිරීමට මෙහෙයම් හා උපායමාර්ගික ප්‍රමුඛතාවන් හරහා මූල්‍ය සම්පත් පරීක්ෂා කිරීම වෙන් කිරීම මෙයට ඇතුළත්ය.

මූල්‍ය ප්‍රාග්ධනය අධීක්ෂණය හා පාලනය විගණන කමිටුව, ආයෝජන කමිටුව, සහ අවදානම් කළමනාකරණ කමිටුව වැනි විශේෂිත කමිටු මගින් සහය ලබන ශක්තිමත් රාමුවක් තුළ ඇතුළත් කර ඇත. මෙම කමිටු විනිවිදභාවය, වගවීම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ වෙනත් අදාළ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ පෙළ ගැසීම සහතික කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

ආර්ථික අවිනිශ්චිතතා සහ වෙනස්වන නියාමන අවශ්‍යතා මගින් හැඩගස්වන මෙහෙයුම් පරිසරයක් තුළ, ප්‍රමාණවත් ද්‍රවශීල ස්වාරක්ෂක පවත්වා ගැනීම, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා සීමා සපුරාලීම සහ මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම සඳහා අපි කැපවී සිටිමු. පරීක්ෂාකාරී අවදානම් කළමනාකරණය හා ඉදිරිය දකින මූල්‍ය සැලසුම් කිරීම මගින්, අපගේ මූල්‍ය ප්‍රාග්ධනය පාර්ශවකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමේ අඛණ්ඩ ශක්තිමත් සක්‍රියකරුවෙක් වන බව අපි සහතික කරමු.

## මූල්‍ය කාර්යසාධනය

### දළ විශ්ලේෂණය

SLICGL සිය පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකම ලබාදීමට සිය මූල්‍ය ප්‍රාග්ධනයේ විචක්ෂණ කළමනාකරණය ස්ථිරව ප්‍රමුඛ කර ඇත. සමාගම සිය ඔප්පුහිමියන්ට හා පාර්ශවකරුවන්ට සිය බැඳීම් එක සමානව සපුරාලීමට ඔරොත්තු දෙමින් සිටින බව සහ එයට හැකියාව ඇති බවට ප්‍රාග්ධන කළමනාකරණය මගින් සහතික කර ඇත. අපගේ මූල්‍ය ප්‍රාග්ධනය අඛණ්ඩ වර්ධනය උපායමාර්ගික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට ප්‍රදාන වන අතර, එය අපගේ මෙහෙයුම් ශක්තිමත් කරමින් වඩා පුළුල් ආර්ථික වාතාවරණයකට ධනාත්මකව දායක වේ.

මෙම වාර්තාවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් යටතේ පසුගිය වසරේ ප්‍රතිඵල සමඟ අනුරූපතාව සහ තුලනාත්මකබව සහතික කිරීමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සම්පූර්ණ වසරේ කාර්යසාධනය පිළිබිඹු කරයි.

## මූල්‍ය කාර්යසාධනය

### දළ ලිඛිත වාරිකය (GWP)

2024 මූල්‍ය වසර තුළ, සමාගමේ අඛණ්ඩ වෙළෙඳපොල ශක්තිය ඉස්මතු කරමින් පිළිවෙලින් 8.9%ක හා 9.5%ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් රු. මිලියන 22,986ක ආදායමක් සහ රු. මිලියන 25,333ක දළ ලිඛිත වාරිකයක් සාක්ෂාත් කර ගෙන ඇත. 2019 සිට 2024 දක්වා පස් වසරක කාලසීමාව තුළ, සමාගම දළ ලිඛිත වාරිකය තුළ 5.95%ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයක් පෙන්වා ඇත. වසර තුළ, SLICGL සමස්ත සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ වෙළෙඳපොල නායකත්ව ස්ථානය රැකගෙන ඇත.



2024 දී, මුළු දළ ලිඛිත වාරිකය පහත ව්‍යාපාර පන්ති අතර බෙදන ලදී.

| වර්ගය | දළ ලිඛිත වාරිකයේ ප්‍රමාණය (රු.මි.) |
|---|---|
| ගිනි හා ඉංජිනේරු | 2,963 |
| මෝටර් රථ | 14,218 |
| නාවික | 1,004 |
| සෞඛ්‍ය | 3,803 |
| විවිධ | 3,343 |
| **මුළු දළ ලිඛිත වාරිකය** | **25,333** |




## මෝටර් රථ රක්ෂණයේ දළ ලිඛිත වාරිකය

SLICGL පසුගිය වසරේ රු. මිලියන 13,508 ට සාපේක්ෂව 2024 මූල්‍ය වසර තුළ රු. මිලියන 14,218ක් වන දළ ලිඛිත වාරික සමඟ මෝටර් රථ රක්ෂණ අංශය තුළ අඛණ්ඩ පෙරමුණේ විය. මෙයින් 5.3%ක වර්ධනයක් නියෝජනය කරන අතර මෙම තරඟකාරී වෙළෙඳපොළ අංශය තුළ සමාගමේ ප්‍රමුඛ ස්ථානය තවදුරටත් ස්ථිර කරයි.




## මෝටර් රථ නොවන රක්ෂණයේ දළ ලිඛිත වාරිකය

මෝටර් රථ නොවන රක්ෂණ අංශය 2023 මූල්‍ය වසරේ රු. මිලියන 9,637 ට සාපේක්ෂව 15.3%ක වැඩිවීමක් පෙන්වා දෙමින් 2024 මූල්‍ය වසර තුළ රු. මිලියන 11,114ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කළේය.




## ප්‍රතිරක්ෂකයින්ට පවරා දෙන වාරිකය

ප්‍රතිරක්ෂණය සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව අත්‍යවශ්‍ය සංරචකයක්ව පවතින අතර එය ගතික ව්‍යාපාර පරිසරයක් තුළ අවදානම් ඵලදායී අයුරින් මාරු කිරීම හා ප්‍රාග්ධනයේ ආරක්ෂාව ඇති කරයි. 2024 මූල්‍ය වසර තුළ, ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් වාරිකය පසුගිය වසරේ රු. මිලියන 5,701 ට සාපේක්ෂව 27%ක වැඩිවීමක් පිළිබිඹු කරමින් රු. මිලියන 7,253ක් විය.

ප්‍රතිරක්ෂණ වාරිකවල වැඩි කොටස මෝටර් රථ නොවන අංශයෙන් වන අතර එය පවරන ලද වාරිකවල රු. මිලියන 5,103ක් විය. මෝටර් රථ රක්ෂණ පවරාදීම් වසර තළ රු. මිලියන 2,150 දක්වා වැඩි වූ අතර 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලට වැඩවර්ජන, කෝලහල, සිවිල් නැගිටීම, සහ ත්‍රස්තවාදී ආවරණවල 100%ක පවරාදීම එයට මූලික වශයෙන් හේතු විය. මෙය පෙර වැඩසටහනෙන් සැලකියයුතු වෙනසක් සලකුණු කරන අතර ඒ යටතේ මෙම වාරිකවලින් 12%ක් පමණක් පවරන ලදී.

## ශුද්ධ ප්‍රතිලාභ, හිමිකම් සහ මෙහෙයුම් හා පරිපාලන වියදම්

ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයේ වෙළෙඳපොළ නායකයෙක් ලෙස, SLIGL 2024 දී රු. මිලියන 10,510ක හිමිකම් වාර්තා කරමින් ඔප්පුහිමියන්ට සිය අඛණ්ඩ බැඳීම පෙන්වා ඇත. බැඳීම් ඉටු කිරීමේදී හා විශ්වාසදායක ආරකෂාව ලබාදීමේදී සමාගමේ විශ්වසනීයත්වය මින් පිළිබිඹු කරයි සමාගම විශ්වසනීයත්වය සහ ගනුදෙනුකාර ලැදියාව සඳහා සිය කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් කරමින් කඩිනමින් හිමිකම් ගෙවීම අඛණ්ඩව සිදුකර ඇත.

මෙහෙයුම් වියදම් 2023 මූල්‍ය වසරේ රු. මිලියන 7,137 ට (2023 මූල්‍ය වසර තුළ, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසු හැරවීම හැර) සාපේක්ෂව 2024 මූල්‍ය වසර තුළ, රු. මිලියන 8,144 දක්වා 14.1%කින් වැඩි වී ඇත. ඉහළ වැටුප් වියදම්, ව්‍යාපාර අත්කර ගැනීමේ පිරිවැය සහ වෙනත් පරිපාලන වියදම් මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

### දරන ලද ශුද්ධ හිමිකම්




### බදු පසු ලාභය




## ලාභදායිතාව

සමාගම අඛණ්ඩ මූල්‍ය ස්ථාවරත්වය පිළිබිඹු කරමින් රු. මිලියන 4,039ක බදු පෙර ලාභයක් සහ රු. මිලියන 3,286ක බදු පසු ලාභයක් වාර්තා කළේය. කෙසේවෙතත්, බදු පසු ලාභය පසුගිය වසරේ රු. මිලියන 4,344ක ලාභයට සාපේක්ෂව 24,4%ක පහත වැටීමක් පෙන්නුම් කරයි. මෙම පහත වැටීමට මූලික වශයෙන් ප්‍රාග්ධන ව්‍යුහය තුළ වෙනස්වීම් හේතු වූ අතර එය රු. මිලියන 475කින් ආයෝජන ආදායම තුළ අඩුවීමකට හේතු විය. ඊට අමතරව, 2023 මූල්‍ය වසරේ රු. මිලියන 2,203ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හානිකරණ වෙන් කිරීම ආපසු හැරවීම ද වාර්ෂික සැසැඳීමට බලපාන ලදී.

### බදු පෙර ලාභය




## ගෙවන ලද බදු

SLICGL ජාතික ආර්ථිකයටට අඛණ්ඩ දායකත්වය සහ සිය මූල්‍ය බැඳීම්වලට අනුකූලතාව පෙන්නුම් කරමින් 2024 පෙබරාවරි 01 දින සිට ආරම්භවන මාස 11ක කාලසීමාව සඳහා ශ්‍රී ලංකා රජයට බදු ලෙස රු. මිලියන 3,481ක් ගෙවන ලදී.

## මූල්‍ය තත්ත්වය වත්කම් හා වගකීම්

2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව, 2024 පෙබරවාරි 1 දින සිට ක්‍රියාත්මකව සමාගම වෙනම නෛතික ආයතන දෙකකට වෙන් කර ඇත. (කරුණාකර වැඩිදුර තොරතුරු සඳහා සටහන 39 බලන්න). එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු වත්කම් 2023 දී පැවති රු. මිලියන 93,387ට සාපේක්ෂව 2024 දී 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව, 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව සමාගම වෙනම නෛතික ආයතන දෙකකට වෙන් කර ඇත. (කරුණාකර වැඩිදුර තොරතුරු සඳහා සටහන 39 බලන්න).

එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු වත්කම් 2023 දී පැවති රු. මිලියන 93,387ට සාපේක්ෂව 2024 දී රු. මිලියන 51,134 දක්වා 45.2%කින් අඩු වී ඇත. මෙම අඩුවීම වෙන් කිරීමේ සෘජු ප්‍රතිඵලයක් වන අතර, ඒ තුළ ප්‍රාග්ධන ව්‍යුහය ගලපන ලද අතර වැඩපිළිවෙල යෝජනා ක්‍රමය මත පදනම් වී අලුතින් ව්‍යුහගත ආයතන දෙක අතර වත්කම් වෙන් කරන ලදී.

### මුළු වත්කම්



මුළු වගකීම් 2023 දී පැවති රු. මිලියන 31,662 සිට 2024 දී රු. මිලියන 29,155 දක්වා අඩු වූ අතර එයට ප්‍රධාන වශයෙන් සමාගම වෙන් කිරීමෙන් පසු ව්‍යුහගත වෙනස්වීම් හේතු විය. 2024 දී රක්ෂණ ගිවිසුම් වගකීම් රු. මිලියන 20,441ක් වූ අතර, එය 2023 දී පැවති රු. මිලියන 20,496ක වඩා සුළු අඩුවීමකි. වෙනත් වගකීම් 2023 දී පැවති රු. මිලියන 11,160ට සාපේක්ෂව 2024 දී රු. මිලියන 8,714ක් විය.

## මූල්‍ය ආයෝජන

2024 මූල්‍ය වසර තුළ, සමාගමේ ස්කන්ධය මත ඉපයීම 2023 මූල්‍ය වසරේ වාර්තා කළ 7% සිට සැලකියයුතු වර්ධනයක් පිළිබිඹු කරමින් 18%ක් විය. කෙසේවෙතත්, පසුගිය වසරට සාපේක්ෂව වත්කම් ව්‍යුහය තුළ වෙනස්වීම් හේතුවෙන්, මූල්‍ය වත්කම්වලින් ආයෝජන ආදායම වාර්ෂිකව 7.8%කින් අඩු වූ අතර එය 2023 දී පැවති රු. මිලියන 5,777ට සාපේක්ෂව 2024 දී රු. මිලියන 5,321ක් විය.

| මූල්‍ය උපකරණ | ප්‍රමාණය (රු. මිලියන) |
|---|---|
| රජයේ සුරැකුම්පත් | 11,228 |
| ස්ථිර තැන්පතු | 3,310 |
| ණයකර | 5,852 |
| ලැයිස්තුගත/ලැයිස්තුගත නොකළ කොටස් | 10,320 |
| වාණිජ පත්‍රිකා | 1,718 |
| ඒකක භාර | 3,096 |
| **මුළු මූල්‍ය ආයෝජනය** | **35,524** |

### ආයෝජන සංයුතිය




### මූල්‍ය ආයෝජනයේ ආයෝජන ආදායම




## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ස්ථායිතාව

රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ 26 (1) වගන්තියට අනුව, සියලුම රක්ෂකයින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා යහපත් නුබුන්වත් හා අවදානම පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පවත්වා ගැනීම අවශ්‍යය.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අපගේ මූල්‍ය ස්ථාවරත්වය තුළ පාර්ශවකාර විශ්වාසය සහ ලැදියාව ශක්තිමත් කරමින් පසුගිය වසර පහ තුළ අවම නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් සිය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය ස්ථිරව පවත්වාගෙන ඇති. 2024 මූල්‍ය වසර සඳහා, සමාගම 277%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් වාර්තා කළ අතර එය 2023 මූල්‍ය වසරේ වාර්තාකළ 226%ට වඩා සැලකියයුතු වර්ධනයකි.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## SLICGL හි උපායමාර්ගික අවධානය තිරසාර වටිනාකම නිර්මාණය කරන, ආර්ථික වර්ධනයට දායකවන සහ දිගුකාලීන ස්ථාවරත්වයට බැඳීම සවිබලගන්වන වත්කම්වල ආයෝජනය කෙරෙහි යොමු වේ.

### අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය හා එහි වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය.

SLICGL හි නිෂ්පාදිත ප්‍රාග්ධනයට එහි කාර්යාල, ශාඛා, පරිගණක සහ උපකරණ, ඩිජිටල් මාර්ග, සහ ජාල යටිතල පහසුකම් ඇතුළත් වේ. භෞතික ජාලය ශාඛා 142 ක් නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs) 59 ක් සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී හි එක් කවුළුවක් දක්වා විහිදේ. අපගේ ජාලය ශ්‍රී ලංකාවේ සියලුම පළාත් 9 සහ දිස්ත්‍රික් 25 ආවරණය කරයි.

අපි පුද්ගලික මැදිහත්වීම් අපි අගය කරන අතර, අපි අපගේ ගනුදෙනුකරුවන් වෙත පහසු පිවිසීම සහතික කිරීමට තාත්ත්වික සන්නිවේදන මාර්ග ද ලබා දෙන්නෙමු. අපගේ පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය ගනුදෙනුකරුවන්ට සහය සපයන අතර, අපගේ 24X7 පැය ඇමතුම් මධ්‍යස්ථානය ගනුදෙනුකාර සහය සඳහා ලබාගත හැකි අතර, අපගේ ආයතනික වෙබ් අඩවිය ද අපගේ නිෂ්පාදන හා සේවාවල තොරතුරු හා එයට පිවිසීම ලබාදෙමින් 24X7 ලබාගත හැකිය.

පහසුව සහ තරඟකාරීත්වය තවදුරටත් වැඩි කිරීම සඳහා, වර්තමාන ගතික වෙළෙඳපොල තුළ අපගේ සේවා කරා පහසු පිවිසීම සහතික කරමින් අපි ජංගම ගෙවීම් විසඳුම් සහ වෙනත් ඒකාබද්ධ මාර්ග අපි පිරිනමමු.

**ප්‍රධාන වැදගත් සිදුවීම්**

**4**
ABDCs විවෘත කිරීම

**1**
නැවත ස්ථානගත කිරීම

**1**
ශාඛා අලුත්වැඩියා කිරීම

### වටිනාකම් නිර්මාණ පරමාර්ථ සපුරාලීම ශාඛා ව්‍යාප්තිය හා නැවත ස්ථානගත කිරීම

SLICGL වෙත ව්‍යාපාර විභවතා කෙරෙහි අවධානය යොමු කරන ශාඛා ව්‍යාප්තිය සඳහා මනාව සකස් කළ උපායමාර්ගයක් ඇත. ශාඛා පුළුල්කිරීම සඳහා වේගවත් නාගරීකරණය සහිත මතුවන සුළු හා මධ්‍ය පරිමාණ නගර අපි ඉලක්ක කරමු. ප්‍රශස්ථ ශාඛා ව්‍යාප්ති අනුපාතය, ප්‍රමාණවත් ජනගහන ඝනත්වය, සහ ප්‍රමාණවත් ආදායම් මට්ටම් සහිත ප්‍රදේශවල නව ශාඛා සහ ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අපගේ ප්‍රවේශය සම්බන්ධ වේ. මෙය පිරිවැය තුළනය සහ නව ව්‍යාපාර අවස්ථා සඳහා උපකාරි වේ. 2024 වසර තුළ නගර කාර්යාල ශාඛාව නැවත ස්ථාන ගත කළ පදනම මත ශාඛා නැවත ස්ථානගත කිරීම සඳහා මෙම උපායමාර්ගය අපි අනුගමනය කරමු.

### ශාඛා කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම

අපගේ ශාඛා ජාලයේ ඵලදායිත්වය වැඩි කිරීමේදී, අපි ශාඛා පුළුල් කිරීම කෙරෙහි පමණක් නොව, අපගේ ශාඛාවල කාර්යක්ෂමතාව සහ භෞතික පෙනුම වර්ධනය කිරීම කෙරෙහි ද අපි අවධානය යොමු කරමු. අපගේ ශාඛා පහක් අපි මෑතදී උසස් කර ඇති අතර එයට නව SLICGL ට අයත් පුත්තලම ගොඩනැගිල්ල නව නැවුම් පෙනුමක් ලබාදෙමින් ඉදිකිරීම ඇතුළත් වේ. මෙම අළුත්වැඩියාවන් 2024 වසර තුළ සම්පූර්ණ කරන ලදී.

## ස්ථාවර වත්කම්වල ආයෝජනය

| | 2024 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 | 2021 රු. '000 | 2020 රු. '000 |
|---|---|---|---|---|---|
| ස්ථාවර වත්කම්වලට එකතුකිරීම් | 147,144 | 371,582 | 515,245 | 256,147 | 231,437 |
| ස්ථාවර වත්කම්වල ශුද්ධ ගිණුම් පොත් අගය | 611,198 | 12,644,259 | 12,763,092 | 12,737,635 | 10,867,358 |

සටහන: 2024 සංඛ්‍යා SLICGL සඳහා වන අතර (වෙන් කිරීමේ තොරතුරු සඳහා සටහන 39 වෙන් කිරීම බලන්න) තුලනාත්මක සංඛ්‍යා SLIC සඳහා වේ.

## ශාඛා ව්‍යාප්තිය හා ජනගහණ සනත්වය

| පළාත | 2024 රු. '000 ශාඛා ව්‍යාප්තිය (ABDCs, සහ LHC කවුළුව ඇතුළුව ශාඛා ගණන) | 2023 රු. '000 (ශාඛා ගණන/ ABDCs ඇතුළුව ශාඛා ව්‍යාප්තිය) | 2022 රු. '000 (ශාඛා ගණන/ CSCs ඇතුළුව ශාඛා ව්‍යාප්තිය) |
|---|---|---|---|
| බස්නාහිර | 64 | 65 | 69 |
| දකුණ | 32 | 32 | 32 |
| මධ්‍යම | 15 | 18 | 17 |
| උතුරු | 18 | 14 | 10 |
| උතුරු මැද | 15 | 13 | 12 |
| නැගෙනහිර | 11 | 11 | 11 |
| වයඹ | 25 | 25 | 25 |
| සබරගමුව | 12 | 13 | 13 |
| ඌව | 10 | 10 | 09 |

## 2024දී අවසන්කළ ව්‍යාපෘති සහ 2025 වසර සඳහා සැලැස්ම




### 2024 දී නිමකළ ව්‍යාපෘති

- නව ABDCs – මුලන්කාවි, මනිපායි, පල්ලෙය, සහ නයිවල
- නගර කාර්යාල ශාඛා නැවත ස්ථානගත කරන ලදී
- පුත්තලම ශාඛාව අලුත්වැඩියා කරන ලදී

### ඉදිරි දැක්ම – 2025 වසර සඳහා සැලැස්ම

- නැවත ස්ථානගත කිරීම් – 0
- නැවත ස්ථානගත කිරීම් – 5 (කඹුරුපිටිය, හම්බන්තොට, කලවාන, වත්තල, ගිරිඋල්ල)
- අලුත්වැඩියා කිරීම් – 2 (රිකිල්ලගස්කඩ – සමාගමට අයත්ල බකමූණ – කුලී ගොඩනැගිල්ල)
- SLIC අයත් දේපලවල නව ඉදිකිරීමේ ව්‍යාපෘති – 5 (නුවරඑළිය, බදුල්ල, නගර කාර්යාලය කොළඹ, කලුතර හා යාපනය)
- ABDCs වැඩිකිරීම – SLICLL හි දිවයින පුරා විනිවිදයාම වැඩි කිරීමට සුවිශේෂී ක්‍රමවේදයක් යොදා ගනිමින් හඳුනාගත් ප්‍රදේශවල නව නියෝජිතායතන සංවර්ධන මධ්‍යස්ථාන 29ක් ස්ථාපිත කරමින් තවදුරටත් අපගේ ශාඛා ජාලය පුළුල් කිරීමට අපි සැලසුම් කරමු.

## SLIC ප්‍රාදේශීය සිතියම – 2024




**මධ්‍යම**

| | |
|---|---|
| ශාඛා – 12 | දිගන, ගම්පොළ, නුවර නගරය, නුවර ප්‍රධාන, කටුගස්තොට, කෑගල්ල, මාතලෙ, මාවනැල්ල, මාවතගම, නාවලපිටිය, පිළිමතලාව, රිකිල්ලගස්කඩ |
| ABDCs – 5 | අරණායක, බුලත්කොහුපිටිය, ගලගෙදර, පේරාදෙනිය, වත්තේගම |

**නැගෙනහිර**

| | |
|---|---|
| ශාඛා – 5 | මඩකලපුව, අක්කරෙයිපත්තු, කල්මුනෙයි, කන්තලෙ, ත්‍රිකුණාමලය |
| ABDCs – 3 | කලවන්චිකුඩි, මුතූර්, පොතුවිල් |

**නැගෙනහිර 02**

| | |
|---|---|
| ශාඛා – 2 | අම්පාර, සමන්තුරේ |

**උතුරු මැද**

| | |
|---|---|
| ශාඛා – 10 | අනුරාධපුරය, අරලගන්විල, බකමූණ, දෙහිඅත්තකණ්ඩිය, හිඟුරක්ගොඩ, හොරොව්පතාන, කඳුරුවෙල, කැකිරාව, මැදවච්චිය, පදවි පරාක්‍රමපුර |
| ABDCs – 3 | හබරණ, මහඔය, මැදිරිගිරිය |

**නැගෙනහිර**

| | |
|---|---|
| ශාඛා – 8 | චන්කනෙයි, චාවාකච්චේරි, යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව්, නෙල්ලිඅඩි, වවුනියාව |
| ABDCs – 5 | චුන්නාකම්, මල්ලවි, කයිතඩි, විසුවමඩු, කොඩිකාමම්, |

**රත්නපුර**

| | |
|---|---|
| ශාඛා – 9 | අවිස්සාවේල්ල, බලංගොඩ, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය, කහවත්ත කලවාන, පල්ලේබැද්ද, රත්නපුර, රුවන්වැල්ල |
| ABDCs – 2 | දූරණියගල, හංවැල්ල |

**දකුණු 1**

| | |
|---|---|
| ශාඛා – 12 | අලුත්ගම, අම්බලන්ගෙ ාඩ, බද්දේගම, බණ්ඩාරගම, ඇල්පිටිය, ගාල්ල, හොරණ, කලුතර, මතුගම, පානදුර, තල්ගස්වල, උඩුගම |
| ABDCs – 6 | හදුරලිය, හබරාදුව, කරාපිටිය, පිටිගල, තනිපොල්ගහ, ඌරගහ |

**දකුණ 2**

| | |
|---|---|
| ශාඛා – 7 | අකුරැස්ස, කඹුරුපිටිය, දෙනියාය, දික්වැල්ල, හක්මන, මාතර, වැලිගම |
| ABDCs – 9 | දෙයියන්දර, ඉමදූව, කඹුරුපිටිය, කැකනදුර, මිද්දෙනිය, මොරවක, සූරියවැව, ඌරුබොක්ක, වලස්මුල්ල |

**දකුණ 2**

| | |
|---|---|
| ශාඛා – 6 | තංගල්ල, බෙලිඅත්ත, අම්බලන්තොට, නෙලුව, තිස්සමහරාමය, හම්බන්තොට |

**බස්නාහිර ඉහළ**

| | |
|---|---|
| ශාඛා – 11 | ගම්පහ, ජා-ඇල, කඳාන, කොච්චිකඩේ, මාරවිල, මිනුවන්ගොඩ, මීගමුව, නිට්ටඹුව, වේයන්ගොඩ, වෙන්නප්පුව, යක්කල |
| ABDCs – 11 | දන්කොටුව, දිවුලපිටිය, ගනේමුල්ල, කිරිල්ලවල, කිරිඳිවැල, මහබාගේ, මීරිගම, පූගොඩ, උඩුගම්පොල, ඌරාපොල, වැලිවේරිය, |

**ඌව**

| | |
|---|---|
| ශාඛා – 10 | බදුල්ල, බණ්ඩාරවෙල, බිබිල, හැටන්, මහියංගණය, මොනරාගල, නුවරඑළිය, වැලිමඩ, වැල්ලවාය |
| ABDCs – 3 | පස්සර, සියඹලාණ්ඩුව, හෙට්ටිපොල, |

**වයඹ 1**

| | |
|---|---|
| ශාඛා – 10 | ගිරිඋල්ල, කුලියාපිටිය, කුරුණෑගල ප්‍රධාන, කුරුණෑගල නගරය, මැල්සිරිපුර, නාරම්මල, පොල්ගහවෙල, රඹුක්කන, රිදීගම, වරකාපොළ |
| ABDCs – 5 | අලව්ව, හෙට්ටිපොල, ඉබ්බාගමුව, කටුපොත, පන්නල, පොල්පිතිගම |

**වයඹ 2**

| | |
|---|---|
| ශාඛා – 9 | ආනමඩුව, හලාවත, දඹුල්ල, ගලේවෙල, ගල්ගමුව, මහව, නිකවැරටිය, පුත්තලම, තඹුත්තේගම, වාරියපොල |
| ABDCs – 2 | ආනමඩුව, නොරොච්චෝලෙයි |

**බස්නාහිර 1**

| | |
|---|---|
| ශාඛා – 8 | බත්තරමුල්ල, කොළඹ නගර කාර්යාලය, දෙහිවල, කිරුලපොන, මොරටුව, නුගෙ 'ගොඩ, පිටකෝට්ටේ, රත්මලාන |
| ABDCs – 1<br>කවුළු – 1 | මොරටුමුල්ල, ලංකා හොස්පිට්ල් කවුළුව |

**බස්නාහිර 2**

| | |
|---|---|
| ශාඛා – 9 | කොළඹ මෙට්‍රෝ 1ල කොළඹ මෙට්‍රෝ 10ල කොළඹ මෙට්‍රෝ 11ල කොළඹ මෙට්‍රෝ 2ල කොළඹ මෙට්‍රෝ 3ල කොළඹ මෙට්‍රෝ 4ල කොළඹ මෙට්‍රෝ 6ල කඩවත, කිරිබත්ගොඩ |
| ABDCs – 0 | |

**බස්නාහිර 3**

| | |
|---|---|
| ශාඛා – 8 | අතුරුගිරිය, හෝමාගම, ඉංගිරිය, කඩුවෙල, කොට්ටාව, මහරගම, මාලඹේ, පිළියන්දල |
| ABDCs – 1 | පාදුක්ක |

**බස්නාහිර 4**

| | |
|---|---|
| ශාඛා – 7 | බම්බලපිටිය, බොරැල්ල, කොටහේන, කොටිකාවත්ත, පිටකොටුව, රාගම, වත්තල |
| ABDCs – 1 | වැල්ලවත්ත |

# බුද්ධිමය ප්‍රාග්ධනය

## තොරතුරු පදනම් රක්ෂණ සේවාවන් හී පුරෝගාමියෙක් ලෙස වෙළෙඳපොල තුළ අපගේ අඛණ්ඩ ඵලදායිත්වය සහ තරඟකාරිත්වය පවත්වා ගැනීමට SLICGL හි බුද්ධිමය ප්‍රාග්ධනය තීරණාත්මක වේ.

### UN SDGs වෙත අපගේ දායකත්වයි

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

- පසුගිය වසරට සාපේක්ෂව 2024 වසර සඳහා IT පද්ධති සංවර්ධනය සඳහා ආයෝජනය 30%කින් වර්ධනය විය
- GIPA සම්මාන (සාමාන්‍ය රක්ෂණ පිනකල් ජයග්‍රහක සම්මානය) දියත් කිරීම මගින් නව ගෝලීය පූර්වාදර්ශයක් සකස් කිරීම. අනිවාර්ය අලෙවිකරු හඳුනා ගනිමින් ස්ථිර මාත්‍රික 05ක සමඟ අලෙවිකරු ස්ථරය තුළ සාමාන්‍ය රක්ෂණ වෘත්තිකයන් සඳහා සුවිශේෂී පිළිගැනීම සහ ජයග්‍රාහක යෝජනා ක්‍රමය. ජීවිත වර්ගය තුළ MDRT යෝජනා ක්‍රමයේ පරතර සපුරාලීමට වෙන් කිරීම අනුව බෙදාහැරීමේ උපායමාර්ගය සඳහා මෙය අවශ්‍ය නව්‍යකරණයක් විය.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

- ක්ෂේත්‍රයේ අංක 01
- වඩාත් ආදරනීය රක්ෂණ සන්නාමය

### සංඛ්‍යාලේඛන වැදගත් සිදුවීම්

**තොරතුරු සන්නිවේදන තාක්ෂණය තුළ ආයෝජනය**

2024 වසර තුළ ICT මත CAPEX ආයෝජනය

**රු. මිලියන 192**

දක්වා වැඩි වූ අතර ICT මත මුළු වියදම

**රු. මිලියන 316**

දක්වා වැඩි විය.

*සටහන: සැසඳීමේ අරමුණ සඳහා සංඛ්‍යාලේඛනවලින් සම්පූර්ණ වසරේ කාර්යසාධනය පෙන්නුම් කරයි.*

### සන්නාම හිමිකම

ජාතියේ රක්ෂකයා යන නාමය දරන අතර වෙළෙඳපොල නායකයෙක් ලෙස, අහිතකර ආර්ථික හා සමාජ තත්ත්වයන් හමුවේ සමාගමේ විශිෂ්ඨ සේවය එහි සන්නාම වටිනාකම වැඩි කර ගෙන ඇත. සාමාන්‍ය රක්ෂණ සන්නාම වටිනාකම රු. බිලියන 3.2ක වන අතර එහි වත්කම් පදනම රු. බිලියන 51.1 දක්වා වැඩි වී ඇත. මෙම ජයග්‍රහනයන් ශ්‍රී ලංකාවේ විශාලතම සහ ශක්තිවන්තම සාමාන්‍ය රක්ෂණ සපයන්නා ලෙස සමාගමේ ස්ථානය තහවුරු කරයි.

### සන්නාම ජයග්‍රහණ

සන්නාමයක් ලෙස SLICGL වටිනාකම තුළ අඛණ්ඩව වර්ධනය වී ඇති අතර ප්‍රදාන සහ පිළිගැනීම් ගණනාවක් දිනා ගනිමින් එය පෙන්වා දී ඇත. 2024 දී, LMD Brand Finance විසින් වසරේ "වඩාත් ආදරණීය රක්ෂණ සන්නාමය" ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් සාමාන්‍ය රක්ෂණය පිළිගෙන ඇත. එය අඛණ්ඩව 6 වැනි වරටත් නැවත නැවතත් සිදු වූ පිළිගැනීමකි. එහි ශක්තිමත් ගමන් වාර්තාව, පසුගිය වසර පුරා ගොඩනගාගත් සන්නාම ප්‍රතිරූපය සහ ආයතනික දැනුම් සම්භාරය සමඟ, SLICGL සියලු පාර්ශවකරුවන්ට සිය සන්නාම පොරොන්දුව ලබාදීමට මනාව ස්ථාපිත කර ඇත. අපගේ ප්‍රමාණය, වෙළෙඳපොල, දැනුම, හැකියාවන් සමඟ, විවිධ වටිනාකම් යෝජනා තුළින් අපගේ සේවාදායක පදනම පුළුල් කිරීමට අපට හැකි වී ඇත. SLICGL වෙත එහි විවිධ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඉහළම සේවාවන්ගෙන් සහයවන පුළුල් නිෂ්පාදන කළඹක් ඇත.

SLICGL විසින් 2018 සිට ISO 9001:2015 සමඟ පෙළ ගැසුනු ගුණාත්මක ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇත. එය ISO/IEC 27001:2013 ප්‍රමිතිය දැඩිව ක්‍රියාත්මක කරන අතර SLICGL හි ගනුදෙනුකරුවන්, සේවකයින් සහ නියාමන ආයතනවල අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලයි.

මෙම ප්‍රතිපත්තිය මගින් "අප සිදුකරන සෑම දෙයකදීම ගනුදෙනුකරු ප්‍රමුඛය" යන සමාගමේ අරමුණ කෙටියෙන් දක්වයි. මෙම දර්ශනය සියලුම කණ්ඩායම් විසින් සමාග්‍රහනය කර ගනිමින් ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්තියෙන් අපගේ ව්‍යාපාරයේ සෑම ස්ථානයකදීම සියලුම නිෂ්පාදන, සේවා සහ ක්‍රියාවලි සඳහා අවම මෙහෙයුම් ප්‍රමිති පැහැදිලි කරයි. මෙම සහතික කිරීමේ විෂයපථයෙන් SLICGL හි ප්‍රතිරක්ෂණය, හිමිකම් පියවීම් සහ සහය සේවා ආවරණය කරයි.



Certificate LK08/02138.02

Sri Lanka Insurance Corporation General Limited

HO: 21, Vauxhall Street, Colombo 02, Sri Lanka

Has been assessed under the management system of the certified organisation defined in the main certificate LK08/02138 as meeting the requirements of

ISO 9001:2015

For the following activities

General insurance underwriting, claim settlement and support services in Sri Lanka Insurance Corporation General Limited head office and its branches.

This certificate is valid from 26 June 2024 until 31 December 2026 and remains valid subject to satisfactory surveillance audits.

Issue 1.

The validity of this certificate depends on the validity of the main certificate.

Authorised by
Jonathan Hall
Global Head - Certification Services

SGS United Kingdom Ltd
Rossmore Business Park, Ellesmere Port, Cheshire, CH65 3EN, UK
t +44 (0)151 350-6666 - www.sgs.com

Page 1/1

## ICT උපායමාර්ගය හා ප්‍රතිපත්තිය

SLICGL සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගය වෙළෙඳපොල වෙත වඩා වේගයෙන් නව නිෂ්පාදන පිරිනැමීමට, ගනුදෙනුකාර සහභාගිත්වය වැඩිකිරීමට, ඩිජිටල් මාර්ග ශක්තිමත් කිරීමට, මෙහෙයුම් ප්‍රශස්ත කිරීමට සහ අවදානම් අවම කිරීමට තාක්ෂණය යොදා ගැනීම මත ගොඩ නැගේ.

අපි ගනුදෙනුකාර හැසිරීම, හිමිකම් ප්‍රවණතා, සහ අවදානම් තක්සේරුව පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීමට දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණ ප්‍රමුඛ කරන අතර ඉන් පුද්ගලගත පිරිනැමීම් සහ සක්‍රිය අවදානම් කළමනාකරණ උපායමාර්ග ශක්තිමත් කරයි. මෙය ආයතනය තුළ දත්ත පදනම් තීරණ ගැනීමේ සංස්කෘතියක් කරා කළමනාකාරිත්වයට සහය වේ.

මතුවන තාක්ෂණයන් නිරන්තර නියාමනය හා එයට අනුවර්තනය අපගේ තාක්ෂණයට අත්‍යවශ්‍ය වන අතර එය ගතික හා ඉහළ තරඟකාරී රක්ෂණ වාතාවරණය තුළ අපි කඩිසරව හා තරඟකාරීව සිටින බව සහතික කරයි.

## අපගේ ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර සහ ජයග්‍රහනයන්

**ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම:**
ජංගම යෙදුම්, වෙබ් අඩවි, සහ සමාජ මාධ්‍ය අවකාශ වැනි ඩිජිටල් සපර්ශක ස්ථාන බාධාරහිත හා පුද්ගලගත ගනුදෙනුකාර අත්දැකීම ලබාදීමට අපව ශක්තිමත් කරයි. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ඔප්පු තොරතුරු කරා පිවිසීම, ගෙවීම් සිදුකිරීමට, හිමිකම් ගොනු කිරීමට, සහ ඉහළ තෘප්තිය හා පක්ෂපාතිත්වය කරා යමින් පහසුවෙන් මෙම ඩිජිටල් මාර්ග හරහා සහය ලබාගැනීමට හැකිය. ජංගම යෙදුම සහ මාර්ගගත බිහිදොර ඉක්මණින් ගෙවීම හා හිමිකම් තත්ත්වය ලබාගැනිම සඳහා 24X7 තුළ අපට නියැලීමට අපගේ වටිනා ගනුදෙනුකරුවන් සවිමත් කරයි. සමාලෝචිත වසර තුළ සංචාර හා මෝටර්රථ අලුත්කිරීම්වලින් ඔබ්බට අපගේ මාර්ගගත පිරිනැමීම අපි වැඩි කළ අතර, තෙවැනි පාර්ශව මෝටර් රථ ඔප්පු හා "Medi60" plus වැනි ඔප්පු මිලදී ගැනීම හඳුන්වා දුනිමු.

**උරුම පද්ධති නවීකරණය සහ මේඝ යොදා ගැනීම:**
අපි තොරතුරු තාක්ෂණ නවීකරණය තුළ ආයෝජනය කරන අතර එය අපට තරඟකාරීම සිටීමට, කාර්යක්ෂමතාව වර්ධනයට, ආරක්ෂාව වැඩි කිරීමට, සහ වර්තමානයේ වේගයෙන් වෙනස් වන ඩිජිටල් වාතාවරණය තුළ නව්‍යකරණය ඇති කිරීමට අත්‍යාවශ්‍යය. පහසු ඒකාබද්ධ කිරීම සහිත APIs හරහා වෙනත් පද්ධති සමඟ අපගේ ප්‍රධාන පද්ධතිය වර්ධනය කිරීමේ ආයෝජන අපි වැඩි කළෙමු. මෙය කරඩිසරකම, ප්‍රමාණහැකියාව සහ අන්තර් මෙහෙයුම් වර්ධනය කිරීමට අපට උපකාරී විය.

එමෙන්ම ප්‍රමාණහැකියාව, නම්‍යතාව සහ පිරිවැය කාර්යක්ෂමතාව සඳහා මේඝ වෙත අපගේ යෙදුම් සංක්‍රමණය කිරීම අපි ආරම්භ කළෙමු. අපේක්ෂිත ක්‍රියාකාරිත්වයට අනුව රාජ්‍ය, පුද්ගලික, හෝ දෙමුහුන් මේඝ සංවර්ධන ආදර්ශවල යෝග්‍යතාව සංක්‍රමණයට පෙර ඇගයීමට ලක් කරන ලදී.

**ඩිජිටල් පරිනාමනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව:**
වෙනස්වන වෙළෙඳපොල ගතිකතා, ගනුදෙනුකාර අපේක්ෂාවන් සහ මතුවන තාක්ෂණයන්ට අනුවර්තනය වීමට ඩිජිටල් පරිනාමන මුලපිරීම් කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. සියලුම පාර්ශවකරුවන්ට නව තාක්ෂනයන් හා ක්‍රියාවලි පහසු යොදා ගැනීම සහතික කිරීමට වෙනස කළමනාකරණ ක්‍රියාවලි ක්‍රියාත්මක කරන ලදී.

SLICGL ප්‍රවීනතාව, සම්පත් හා මනා පරිචයන් භාවිතා කිරීමට තාක්ෂණික වෙළෙන්දන්, රක්ෂණ තාක්ෂණ ආරම්භකරන්නන්, ක්ෂේත්‍රයේ සංවිධාන සහ නියාමන ආයතන සමඟ හවුල්කාරත්වයන් හා සහයෝගිතාවන් අපි පෝෂණය කළෙමු.

**දත්ත විශ්ලේෂණ සහ ව්‍යාපාරික තොරතුරු:**
අපි ගනුදෙනුකාර හැසිරීම පිළිබඳ අවබෝධය ලබා ගැනීමට, ප්‍රාරක්ෂණ නිරවද්‍යතාව වර්ධනය කිරීමට, වංචා සොයා ගැනීමට, සහ හිමිකම් ක්‍රියාවලිය ප්‍රශස්ත කිරීමට දත්ත විශ්ලේෂණ භාවිතා කරමු. නවතම IBM Cognos පදනම ව්‍යාපාරික තොරතුරු හා දත්ත විශ්ලේෂණ මෙවලම්වල පුළුල් රාමුවක් පිරිනමන අතර, එය වඩා යහපත් තීරණ ගැනීමට, ව්‍යාපාර කාර්යසාධනය වැඩි කිරීමට, සහ වර්ධනය ඇති කිරීමට SLICGL සවිබල ගන්වයි. එහි උසස් විශ්ලේෂණය. වාර්තාකරණය, සහ දෘෂ්ටිකල්පන හැකියාවන් ස්වයං සේවා ව්‍යාපාර තොරතුරු හා ජංගම පිවිසීම් සමඟ අපගේ අලෙවි කණ්ඩායම, නියෝජිතයින්, හිමිකම් නිලධාරීන්, කළමනාකරණ කණ්ඩායම සහ සහය කණ්ඩායම් සඳහා වටිනා වත්කමකි.

**තොරතුරු ආරක්ෂාව, පාලනය සහ අනුකූලතාව:**
අපි සංවේදී ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කිරීමට හා දත්ත කඩකිරීම් වැලැක්වීමට තොරතුරු හා සයිබර් ආරක්ෂක ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු. මෙම උත්සාහයේ කොටසක් ලෙස, වෙබ් යෙදුම්, වැඩිකළ Spam Gateway විසඳුම් හා අඛණ්ඩ උවදුරු හා විනිවිදයාමේ පරීක්ෂණ ආරක්ෂා කිරීමට මේඝ පදනම් WAF සහ අභ්‍යන්තර WAF වැනි විවිධ ආරක්ෂක විසඳුම් ක්‍රියාත්මක කර ඇත. මේ සියලු උත්සාහයන් සංයුක්ත ආයතනයක් ලෙස 2023 දී ISO/IEC 27001 සහතික කිරීම ආරක්ෂා කර ගැනිමට අපට සහය වූ අතර 27001:2022 දක්වා උසස් කිරීමට 2024 දී සත්‍යාපන ක්‍රියාවලිය අපි ආරම්භ කර ඇත. මෙය තොරතුරු ආරක්ෂාව පිළිබඳ විශිෂ්ටත්වය සඳහා අපගේ වෙහෙස නොබලා හඹායාමට සාක්ෂියකි.

අපගේ ගනුදෙනුකරුවන්ගේ සංවේදී තොරතුරු ආරක්ෂා කිරීමේ වැදගත්කම අපි හඳුනා ගන්නා අතර ඉහළම ප්‍රමිතියේ දත්ත ආරක්ෂා කිරීම සහතික කිරීම තුළ ප්‍රමාණවත් ලෙස අපි ආයෝජනය කර ඇත. 2024 දී, අපගේ සියලුම වත්කම් ඩිජිටල් වත්කම් නියාමනය කරන 24X7 SOC මෙහෙයුමක් සමඟ ශක්තිමත් පුළුල් සොයා ගැනීමේ සහ ප්‍රතිචාර විසඳුමක් අපි ක්‍රියාත්මක කර ඇත.

# මානව ප්‍රාග්ධනය

රක්ෂණ ක්ෂේත්‍රයේ දනුම් තීව්‍ර ස්වභාවය උසස් තත්ත්වයේ මානව සම්පත් පවත්වා ගැනීමේ වැදගත්කම තහවුරු කරයි. අපගේ අඛණ්ඩව නිපුනතාව යාවත් කරන, මනාව පුහුණුවලත් වෘත්තික කණ්ඩායම් රට පුරා අපගේ නිෂ්පාදනවල ශක්තිමත් දෘශ්‍යතාව සහතික කරයි.

## UN SDGs වෙත අපගේ දායකත්වයි

**3 GOOD HEALTH AND WELL-BEING**

සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තිය ඇතුළු සේවක භෞතික යහපැවැත්ම,

**4 QUALITY EDUCATION**

සේවක පුහුණු වැඩසටහන්

**5 GENDER EQUALITY**

ස්ත්‍රීපුරුෂ තුලනය පවත්වා ගැනිම – 55% සිට 45%

**8 DECENT WORK AND ECONOMIC GROWTH**

විවිධත්වය සහ ඇතුළත වර්ධනය

**10 REDUCED INEQUALITIES**

- සේවක වයස් විවිධත්වය පවත්වා ගැනීම
- ශ්‍රම බලකාය තුළ ශක්තිමත් නියෝජනය පවත්වා ගැනීම
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ අපක්ෂපාතීත්වය

### අපගේ මානව සම්පත් ව්‍යවහාර

මානව සම්පත් ආරක්ෂා කිරීම හා විවිධත්වය, සමානතාව සහ සියලු දෙනා ඇතුළත් වෙනස් ලෙස නොසලකන සේවා පරිසරයක් නිර්මාණය කිරීම අපගේ මානව සම්පත් ව්‍යවහාර සහ අපගේ මානව සම්පත් උපායමාර්ගවල මූලික ස්ථර වෙති.

### මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව

| | |
|---|---|
| **වෙනස් ලෙස නොසැලකීම සහ සමාන රැකියා අවස්ථාව** | බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා, සේවක ජීවන චක්‍රයේ සෑම අදියරකදීම වෙනස්ව නොසැලකීමේ ප්‍රතිපත්තියක් සමාගම පවත්වා ගනී. |
| **විවිධත්වය සහ ඇතුළත් කිරීම** | SLICGL සියලුම සේවකයින්ට ජාතිය, ආගම, ස්ත්‍රීපුරුෂභාවය හෝ වයස, නොසලකා සමානව සලකනු ලබන පරිසරයක් නිර්මාණය කර ඇත. අපි ආබාධිත පුද්ගලයින් සඳහා දියහැකි අවස්ථා ලබාදීමට උත්සාහ ගනිමු. |
| **සෞඛ්‍ය හා ආරක්ෂාව** | අපගේ ක්ෂේත්‍රයේ ස්වභාවය සලකා බැලීමේදී, සේවකයින් ප්‍රධාන වෘත්තීමය අවදානම්වලට නිරාවරණයවීම සිදු නොවේ. එසේ වුවත්, අපගේ සේවා පරිසරය අපි හැකි තරම් ආරක්ෂිත බවට පත් කරමු. සේවකයින්ගේ සෞඛ්‍ය පවත්වා ගැනීම පහසු කිරීමට ක්‍රියාත්මක විස්තීර්ණ සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රතිපත්තියක් SLICGL සතු වේ. බොහෝ පාර්ශවකරුවන් සමඟ උපදේශකත්වයෙන් අවදානම් තක්සේරු කිරීම් සිදු කෙරේ.<br><br>SLICGLs හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අවදානම් පිළිබඳ නිරන්තරව තක්සේරු කිරීම් සිදුකරන අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. මානව සම්පත් දෙපාර්තමේන්තුව, වෙනත් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණයෙන් සෞඛ්‍ය සහ ආරක්ෂක දැනුවත්කම වැඩි කිරීමට වැඩසටහන් පවත්වයි. |

### සදාචාරය සහ අවංකකම

අපගේ සේවකයින් තුළ වඩාත් සදාචාර ආකාරයෙන් ඔවුන්ගේ රාජකාරි කරගෙන යාමේ වැදගත්කම අපි අවධාරණය කරමු. අපගේ අචාර ධර්ම සංග්‍රහය සියලුම සේවකයින් වෙත බෙදාහරින අතර, ඔවුන් එය දැනගත යුතු අතර සියලුම දෙනාගෙන් එයට මෙන්ම ඔවුන්ගේ පත්වීම් ලිපිවල දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූලවීම අපේක්ෂා කෙරේ.

අපි සියලුම ආකාරයේ ළමා ශ්‍රමය, බලහත්කාර ශ්‍රමය සහ අනිවාර්ය ශ්‍රමය දැඩිව තහනම් කරමු.

### සේවක දුක්ගැනවිලි

සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා විස්තීර්ණ ක්‍රියාපටිපාටියක් SLICGL සතු වන අතර ඉන් අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ කිසිදු බියක් නොමැතිව යම් සේවකයෙකුට පැමිණිල්ලක් වාර්තා කළ හැකිය. මෙය පුද්ගලික සහ රාජකාරි දුක්ගැනවිලි සහ තනි පුද්ගල හෝ කණ්ඩායම් ගැටළු සම්බන්ධයෙන් භාවිතා කළ හැකිය.

දුක්ගැනවිලි වාර්තා කිරීම සහ දුක්ගැනවිලි සමඟ කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි පැහැදිලිව දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් අනු කමිටුව යටතේ දුක්ගැනවිලි නිරාකරණ කමිටුවක් මඟින් මැසිවිලි නිරාකරණය කරයි.

### බඳවාගැනීමේ උපායමාර්ග

සියලුම සේවකයින්ට අවශ්‍ය දැනුම, කුසලතා, පළපුරුද්ද, රුචිය සහ ආකල්ප ඇති බව සහතික කිරීමට බඳවාගැනීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියපටිපාටි මනාව සම්පාදනය කර ඇත. මෙය සහතික කිරීමට, අළුතින් බඳවාගන්නන්ට අභියෝග්‍යතා පරීක්ෂණ මාලාවක් සම්පූර්ණ කිරීමට ඇත. බඳවා ගැනීමේදී, සේවකයින් මත ක්ෂේත්‍රයේ තබන ස්වභාවයේ ඉල්ලුම් පිළිබඳ අපි දැනුවත්ය.

වඩා ඉහළ තනතුරු සඳහා බඳවා ගැනීමේදී, සෑම අවස්ථාවකදී ම පළමු වරණය අභ්‍යන්තර අයදුම්කරුවන්ට ලබා දේ. සුදුසු අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් බාහිර අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ.

බඳවා ගැනීමේ පරීක්ෂණ මණ්ඩලවලට විෂය කරුණ පිළිබඳ ප්‍රවීනයින් හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් ඇතුළත් වේ. සියලුම මණ්ඩල ඇගයීම් පූර්ව - නිශ්චිත ප්‍රමිති අනුගමනය කරයි. ක්‍රියාවලිය තුළ ප්‍රමිති හා විනිවිදභාවය අනුගමනය කිරීම සෑම සම්මුඛ පරීක්ෂණවලදී සහභාගිවන මානව සම්පත් නියෝජිතයෙක් විසින් සහතික කරනු ලබයි. අළුතින් බඳවාගන්නන්ට සමාගම සමඟ හුරුවීම සඳහා සහ SLICGL හි සංස්කෘතිය සමඟ ඒකාබද්ධවීමට සහයවන ප්‍රාරම්භක පුහුණුවක් පවත්වනු ලැබේ.

### රඳවාගැනීම සහ අනුප්‍රාප්තිය

රක්ෂණ අංශය තරඟකාරීත්වය සහ වේගයෙන් වෙනස්වන ස්වභාවය සහ සන්නාම ප්‍රතිරූපය පවත්වා ගැනීමේ අවශ්‍යතාව හේතුවෙන් දක්ෂ කාර්ය මණ්ඩලය රඳවා ගැනීම වඩාත් තීරණාත්මකය. අප ඔවුන් රඳවා ගැනීමට පමණක් උත්සාහ නොගන්නා අතර සමාගමේ අනාගත නායකයින් ලෙස ඔවුන් සංවර්ධනය කිරීමට ද උත්සාහ ගනිමු.

SLICGL ක්‍රමානුකූල අනුප්‍රාප්ත සැලැස්මක් ඇති අතර එය දක්ෂ හා කැපවූ සේවකයින් සඳහා අභිප්‍රේරණ සාධකයකි. අපගේ කාර්යසාධන ඇගයීම් ක්‍රමය මඟින් දක්ෂතා සංචිතයට ඇතුළත් කිරීම සඳහා මතු බලාපොරොත්තු සහිත සේවකයින් තෝරාගනී. දක්ෂතා සංචිතය යනු කැපීපෙනෙන ඉටුකරන්නන්ගේ කණ්ඩායමක් වන අතර, ඔවුන් ඇබෑර්තු ඇතිවන අවස්ථාවලදී ඒවා පිරවීම සඳහා විභව අපේක්ෂකයින් වනු ඇත. දක්ෂතා සංචිතයේ සාමාජිකයින් වෙත දෘඩ සහ මෘදු කුසලතා පුහුණු සහ උපදේශක වැඩසටහන්වල සහභාගිවීමට අවස්ථාව ලබා දේ.

### ප්‍රතිලාභ

සේවකයින් අභිප්‍රේරණ කර රඳවා ගැනීම සඳහා, වෙළෙඳපොලට පිරිනැමිය හැකි උපරිමය සහිත තරඟකාරි පාරිශ්‍රමික යෝජනා ක්‍රම අපි පිරිනමමු. එමෙන්ම අපි අපගේ සේවකයින්ට ඔවුන්ගේ මූලික පාරිශ්‍රමිකය හැර විවිධ ප්‍රතිලාභ පිරිනමමු.

සමාගම සේවකයින්ට මුහුණපෑමට සිදුවන දුෂ්කරතාවන් මනසට ගනිමින් එහි ව්‍යවහාර ගලපනු ලබයි. බලශක්ති අර්බුදය තුළ, සිද්ධියෙන් සිද්ධිය මත පදනම් වී අපි නම්‍යශීලී වැඩකරන පැය හඳුන්වා දුන්නෙමු.

SLICGL සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීමට වැඩ කිරීමේ කොන්දේසිවලට අදාළ සියලුම ව්‍යවස්ථාපිත විධිවිධානවලට පරීක්ෂාවෙන් අනුකූල වේ. මෙයට කාන්තා සේවිකාවන් සඳහා මාතෘත්ව ප්‍රතිලාභ ඇතුළත්ය. ගෙවීමක් නොමැතිව මාස දෙකක් දක්වා දීර්ඝකල කාලසීමාවක් ඉල්ලා සිටීමේ විකල්පය සේවකයින්ට ඇත. පීතෘ නිවාඩු සඳහා අව්‍යාජ ඉල්ලීම් හිතකර ලෙස සලකා බලනු ලබයි. සමාගම සියලුම සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වෛද්‍ය ආවරණය ලබා දේ.

අපගේ සේවකයින්ගේ වැඩ – ජීවිත සමබරතාව අප ඉතා උනන්දුවෙන් සලකා බලන ක්ෂේත්‍රයකි. ඔවුන්ගේ කායික සහ මානසික යහපැවැත්ව සඳහා, අපි සියල්ල සපිරි කායවර්ධන මධ්‍යස්ථානය සහ යෝග පන්ති ලබා දේ. මෙම කායවර්ධන මධ්‍යස්ථානය මඟ පෙන්වීම ලබාදෙන සුදුසුකම් ලත් උපදේශකයෙක් සමඟ ක්‍රියාත්මක කෙරේ.

සෑම සේවකයෙකුටම භාවිතය සඳහා ලබාගතහැකි නුවරඑළිය, අනුරාධපුරය සහ කතරගම නිවාඩු නිකේතන තුනක් අපි පවත්වාගෙන යන්නෙමු. මෙම නිවාස නවීන පහසුකම්වලින් සමන්විත වන අතර, මනාව පුහුණු කාර්ය මණ්ඩලයකින් යුක්ත වේ.

සමාගම සේවකයින්ගේ ළමුන්ට අධ්‍යාපනික සහය ලබාදෙන අතර එයට 5 වසර ශිෂ්‍යත්වයට ඉදිරිපත්වන සිසුන් සඳහා සම්මන්ත්‍රණ ඇතුළත්ය.

අපගේ තේමාව වන "පියෙකු මෙන් මවකු මෙන්", අනුව SLICGL වියෝවීමකදී ක්‍රමානුකූල ප්‍රවේශයක් ගන්නා අතර, උපකාරී දෑත් දිගු කරන්නෙමු. සමාගම සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත මරණ ප්‍රතිලාභ මෙන්ම චිත්තවේගී සහ මානසික සහය ලබා දේ.

අපගේ කාර්ය මණ්ඩලයට ප්‍රබන්ධ මෙන්ම ප්‍රබන්ධ නොවන පොත් 1,800ක පමණ පුස්තකාලයක භාවිතය ඇත. ප්‍රබන්ධ නොවන කොටසට රක්ෂණය, කළමනාකරණය, මූල්‍ය, අලෙවිකරණය, සහ විකුණුම්වලට අදාළ පොත් ඇතුළත්ය. මෙය සිය දැනුම පුළුල්කර ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසයි.

## ප්‍රධාන සංඛ්‍යාලේඛණ වැදගත් සිදුවීම් වර්ගය අනුව කාර්ය මණ්ඩලය

| | 2024 | 2023* | 2022* | 2021* | 2020* | 2019* |
|---|---|---|---|---|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 1,586 | 2,514 | 2,513 | 2,535 | 2,517 | 2,527 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 257 | 170 | 130 | 232 | 109 | 133 |
| එකතුව | 1,843 | 2,684 | 2,643 | 2,767 | 2,626 | 2,660 |

*තුලනාත්මක සංඛ්‍යා ජීවිත සහ සාමාන්‍ය සඳහා වේ.

## වයස් විශ්ලේෂණයි

| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා | ප්‍රතිශතය |
|---|---|---|---|
| 18-24 | 48 | 20 | 3.7 |
| 25-29 | 129 | 89 | 11.8 |
| 30-34 | 182 | 125 | 16.7 |
| 35-39 | 166 | 120 | 15.5 |
| 40-44 | 210 | 65 | 14.9 |
| 45-49 | 160 | 33 | 10.5 |
| 50-54 | 134 | 126 | 14.1 |
| 55 සහ ඉහළ | 93 | 143 | 12.8 |
| එකතුව | 1,122 | 721 | 100.0 |

## සේවා විශ්ලේෂණය

| SLICGL හි සේවය කළ වසර ගණන | පිරිමි | කාන්තා | ප්‍රතිශතය |
|---|---|---|---|
| 0-5 | 386 | 110 | 26.9 |
| 6-10 | 152 | 156 | 16.7 |
| 11-15 | 198 | 108 | 16.6 |
| 16-20 | 250 | 68 | 17.3 |
| 21 සහ ඉහළ | 136 | 279 | 22.5 |
| එකතුව | 1,122 | 721 | 100.0 |

## ශ්‍රේණිය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවා නියුක්තිය

| ශ්‍රේණිය | ගණන | | | සංයුතිය ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|
| | පිරිමි | කාන්තා | එකතුව | පිරිමි | කාන්තා |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | 44 | 11 | 55 | 80 | 20 |
| කළමනාකරණ | 146 | 45 | 191 | 76 | 24 |
| සහය කළමනාකරු | 63 | 31 | 94 | 67 | 33 |
| විධායක | 227 | 276 | 503 | 45 | 55 |
| ලිපිකාර | 379 | 346 | 725 | 52 | 48 |
| තාක්ෂණික | 171 | 0 | 171 | 100 | 0 |
| ලිපිකාර නොවන | 58 | 4 | 62 | 94 | 6 |
| සුළු සේවක | 34 | 8 | 42 | 81 | 19 |
| එකතුව | 1,122 | 721 | 1,843 | 61 | 39 |

## ශ්‍රමබලකායේ ඵලදායිතාව වැඩි කිරීමට

### වෘත්තීය සංවර්ධනය

අපගේ සේවක සංවර්ධන වැඩසටහන් SLICGL හි වර්ධනය සමඟ ගැලපෙන ආකාරයෙන් සකස් කර ඇත. සමාගමේ පුහුණු අවශ්‍යතා කාර්යසාධන ඇගයීම් ක්‍රමය මගින් හඳුනාගන්නා අතර මෙම පුහුණු අවශ්‍යතා ප්‍රමුඛකර ක්‍රියාත්මක කිරීමට අපි යාන්ත්‍රණයක් සංවර්ධනය කර ඇත. සංවර්ධනය කළ දක්ෂතා සහ හැකියාවන් අනුව ප්‍රතිඵල අපි නිරන්තරව ඇගයීමට ලක් කරමු.

අනුප්‍රාප්ත සැලැස්මක් සහ දක්ෂතා කළමනාකරණ සංචිත සැලැස්මක් ද අපට ඇති අතර, මෙයට සහයවීම සඳහා, එක් එක් දෙපාර්තමේන්තුවෙන් අනාගත නායකයින් සංවර්ධනය කිරීමට පුහුණු මොඩියුලයක් අප සංවර්ධනය කර ඇත. වැඩිදුර සුදුසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන සේවකයින් සඳහා මූල්‍ය සහය ලබාදෙමින් අපගේ කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට අපි සහය වෙමු. අපි අඛණ්ඩ වෘත්තීය වර්ධනය සඳහා සහයවීමට වෘත්තීය සාමාජිකත්ව ගාස්තු ද අපි ප්‍රතිපූරණය කරමු.

## පුහුණුව හා සංවර්ධනය තුළ ආයෝජනය

| වර්ගය | 2024 මිලියන |
|---|---|
| අභ්‍යන්තර පුහුණුව | 20.7 |
| බාහිර පුහුණුව | 0.7 |
| සම්මන්ත්‍රණ | 1.7 |
| විදේශීය පුහුණුව | 4.5 |
| රක්ෂණය සහ වෘත්තීය අධ්‍යාපනය | 1.4 |
| වෘත්තීය සාමාජිකත්ව | 1.0 |

## විභාග වියදම් ප්‍රතිපූරණය

| වර්ගය | 2024 රු. මිලියන | 2023* රු. මිලියන | 2022* රු. මිලියන | 2021* රු. මිලියන | 2020* රු. මිලියන | 2019* රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| සේවකයින් මත මුළු ආයෝජනය | 1.5 | 9.4 | 5.4 | 3.2 | 3.1 | 3.9 |

*තුලනාත්මක සංඛ්‍යා ජීවිත සහ සාමාන්‍ය සඳහා වේ.

## පුහුණු වැඩසටහන්

| වර්ගය | 2024 | 2023* | 2022* | 2021* | 2020* | 2019* |
|---|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 61 | 81 | 97 | 70 | 85 | 186 |

*තුලනාත්මක සංඛ්‍යා ජීවිත සහ සාමාන්‍ය සඳහා වේ.

## ප්‍රාරම්භක වැඩසටහන්

| වර්ගය | 2024 | 2023* | 2022* | 2021* | 2020* | 2019* |
|---|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 5 | 4 | 2 | 2 | – | 3 |

*තුලනාත්මක සංඛ්‍යා ජීවිත සහ සාමාන්‍ය සඳහා වේ.

## පිළිගැනීම් සහ ප්‍රදාන

අප කාර්යසාධනය ඇති කිරීම සඳහා, ප්‍රදාන ක්‍රමයක් ක්‍රියාවට නංවා ඇති අතර එය SLICGL හි වර්ධන හා සංවර්ධන අවශ්‍යතාවන් සමඟ පෙළ ගැසේ. මෙම පෙළගැසීම කාර්යසාධන ඇගයීම ක්‍රමයක් තුළින් සාක්ෂාත් කර ගන්නා අතර එම ක්‍රමය අරමුණු දෙකක් එනම්, ආයතනික සහ තනිපුද්ගල වර්ධන අවශ්‍යතා ලබාදීමට සංවර්ධනය කර ඇත. කාර්යසාධන ඇගයීම ක්‍රමය “විශිෂ්ඨත්වය සඳහා උත්සාහගැනීම” යන දර්ශනය මත ගොඩ නගයි. එය සියලුම සේවකයින් සාධාරණව සහ විනිවිදව ඇගයීමට ලක් කරයි. සියලුම සේවකයින් අර්ධ-වාර්ෂික ස්වයං ඇගයීමක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර, එහිදී නියමිත පූර්ව මූලික කාර්යසාධන දර්ශක අනුව තමාගේ කාර්යසාධනය ශ්‍රේණිගත කිරීමට ඔවුන්ට අවස්ථාව ඇත. ඉන්පසුව, සේවකයින් ඔවුන්ගේ රේඛීය කළමනාකරු සමඟ කාර්යසාධන ඇගයීමකට මුහුණ දේ. මෙය කාර්යසාධනය, පුහුණු අවස්ථා, සහ දිගුකාලීන වෘත්තීය අරමුණු පිළිබඳ විස්තරාත්මක සහ විවෘත සාකච්ඡාවකට අවස්ථාව ලබා දේ. පහළ ඇගයීමක් සහිත සේවකයින්ට වැඩිදුර සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රමිති ශ්‍රේණිගතකරණය ලබා දේ. එවැනි අවස්ථාවලදී, මානව සම්පත් දෙපාර්තමේන්තුව ආසන්න අධීක්ෂකයින් සමඟ සහයෝගයෙන් ගලපන ලද තනිපුද්ගල සංවර්ධන සැලැස්මක් ලබා දේ.

කාර්යසාධන ඇගයීමේ ප්‍රතිඵල මත පදනම් වී, ඔවුන්ගේ මූල්‍ය ජයග්‍රහනයන් මත පදනම් වී සේවකයින්ට වැටුප් වර්ධක පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන 2023 දී දියත් කරන ලද අතර, ආයතනය තුළ කාර්යසාධනය පදනම් සංස්කෘතියක් පෝෂණය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් සැලකියයුතු සාර්ථකත්වයන් සාක්ෂාත් කරගෙන ඇත.

මෙම අවස්ථාව ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවල අලෙවි වර්ගීකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හැර සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පිවිසිය හැකිය. එහි අරමුණ වන්නේ ව්‍යුහගත ආකාරයකින් සමාගමේ වටිනාකම් දාමය තුළ සේවක දායකත්වයන් වැඩි කිරීමයි. විවිධ මට්ටම්වල ආයතනයේ මානව ප්‍රාග්ධනය හඳුනාගනිමින් සහ අභිප්‍රේරණය කරමින්, කැපී පෙනෙන සේවක සම්මාන යෝජනා ක්‍රමය තුළින් අගනා ප්‍රතිඵල ලබාදෙන සහ සවිබලගැන්වීමේ ක්ෂේත්‍ර අතර පරතර ඉවත් කිරීම අරමුණු කරයි.

## වෙනත් වැදගත් සංඛ්‍යාලේඛණ කලාපය අනුව සේවකයින්

| කලාපය | ගණන |
|---|---|
| මධ්‍යම | 129 |
| නැගෙනහිර | 42 |
| ප්‍රධාන කාර්යාලය | 712 |
| උතුරු මැද | 64 |
| උතුරු | 34 |
| රත්නපුර | 68 |
| දකුණු 1 | 100 |
| දකුණු 2 | 53 |
| දකුණු 3 | 34 |
| බස්නාහිර ඉහළ | 120 |
| ඌව | 70 |
| වයඹ 1 | 83 |
| වයඹ 2 | 60 |
| බස්නාහිර | 23 |
| බස්නාහිර 1 | 81 |
| බස්නාහිර 2 | 46 |
| බස්නාහිර 3 | 66 |
| බස්නාහිර 4 | 58 |
| **එකතුව** | 1,843 |

## සේවක බඳවාගැනීම

| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 18-24 | 61 | 17 | 78 | 27 |
| 25-29 | 64 | 44 | 108 | 37 |
| 30-34 | 42 | 9 | 51 | 17 |
| 35-39 | 21 | 4 | 25 | 9 |
| 40-44 | 17 | 1 | 18 | 6 |
| 45-49 | 10 | – | 10 | 3 |
| 50-54 | 3 | – | 3 | 1 |
| 55 සහ ඉහළ | – | – | – | – |
| **එකතුව** | 218 | 75 | 293 | 100 |

## සේවක පිරිවැටුම

| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 18-24 | 20 | 2 | 22 | 10 |
| 25-29 | 32 | 12 | 44 | 20 |
| 30-34 | 39 | 9 | 48 | 22 |
| 35-39 | 25 | 8 | 33 | 15 |
| 40-44 | 20 | 5 | 25 | 11 |
| 45-49 | 9 | 2 | 11 | 5 |
| 50-54 | 3 | 2 | 5 | 2 |
| 55 සහ ඉහළ | 13 | 21 | 34 | 15 |
| **එකතුව** | 161 | 61 | 222 | 100 |

## සේවක රඳවාගැනීමේ අනුපාතය

| | **2024** | 2023* | 2022* | 2021* | 2020* | 2019* |
|---|---|---|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 1,843 | 2,684 | 2,643 | 2,767 | 2,626 | 2,660 |
| සේවක රඳවාගැනීමේ අනුපාතය | 88.6 | 91.4 | 95.4 | 96.2 | 98.0 | 91.5 |

*තුලනාත්මක සංඛ්‍යා ජීවිත සහ සාමාන්‍ය සඳහා වේ.

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

SLICGL හි සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය විවිධ පාර්ශවකරුවන් සමග ශක්තිමත් ජාලය මත ගොඩ නැගේ. මෙම වටිනා සම්බන්ධතා විශ්වාසය පෝෂණය කරන අතර සමාගම සහ අප සේවය කරන ප්‍රජාවන් සඳහා තිරසාර වටිනාකම ඇති කරමින් අනෝන්‍ය ප්‍රතිලාභ හවුල්කාරත්වයන් පෝෂණය කිරීමට අපව ශක්තිමත් කරයි.



# සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන කළඹ

SLIC GENERAL

## සෞඛ්‍ය රක්ෂණ විසඳුම්

MEDI 60 – Senior Citizen Health Insurance Plan
MEDI PLUS – Health Insurance Plan
HEALTH PLUS
නාගරාජ්

## ව්‍යාපාර රක්ෂණ විසඳුම්

Business Club – Trade Insurance Policy
Marine Cargo
Hull Insurance
Workmen's Compensation Insurance
Tea Factory Insurance

## මෝටර්රථ රක්ෂණ විසඳුම්

MotorPlus – The Best Option
MotorPlus Pinnacle
MotorPlus Ladies Only
MotorPlus Commercial
MotorPlus Tuk
MotorPlus Rider
MotorPlus Drive60

## නිවාස හිමිකරු රක්ෂණ විසඳුම්

Home Protect
Fire Insurance
Home Protect Lite

## සංචාරක රක්ෂණ විසඳුම්

Travel Protect

## පුද්ගල අනතුරු රක්ෂණ විසඳුම්

Guru Buhuman
Personal Accident Cover
Jana Rekuma – Individual Personal Accident Cover

| නිෂ්පාදන වර්ගය | ඉලක්කගත ගනුදෙනුකරුවන් | විසඳුම් | විස්තරය |
|---|---|---|---|
| තනි පුද්ගල වෛද්‍ය රක්ෂණය | මෙඩි 60 | වයස අවුරුදු 60 සහ 70 අතර ජ්‍යෙෂ්ඨ පුරවැසියන් | මෙඩි 60 ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා ලබාදීමට සැලසුම්කළ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවකි. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය ආයෝජනය මත පදනම් වී තෝරා ගැනීමට යෝජනා ක්‍රම තුනක් පිරිනමයි. |
| | මෙඩි ප්ලස් | වයස අවුරුදු 18-59 අතර ශ්‍රී ලංකා පුරවැසියන් | මෙය රෝගී සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා රාශියක් ආවරණය කරන තනි පුද්ගල සෞඛ්‍ය රක්ෂණ ආවරණයකි. මෙම රක්ෂණ ඔප්පුව වාර්ෂිකව අළුත් කළ හැකි අතර සෑම නෝ ක්ලේම් වසරකම ඔප්පුවේ රක්ෂිත වටිනාකම වැඩි කරන විශේෂ නෝ ක්ලේම් බෝනස් ඇතුළත්ය. |
| මෝටර් රථ | මෝටර් ප්ලස් ලේඩීස් ඔන්ලි | පුද්ගලික කාර් එකක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් හිමි කාන්තාවන් | ගනුදෙනුකරුවන්ගේ විශේෂිත මෝටර් රථ රක්ෂණ අවශ්‍යතා සපුරාලන විශේෂ විශේෂාංග අඩංගු මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි. |
| | මෝටර් ප්ලස් ටුක් | ටුක් රියදුරන් | ත්‍රිරෝද අංශයේ රක්ෂණ අවශ්‍යතා සැලසීමට සැලසුම්කළ මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි. |
| | මෝටර් ප්ලස් රයිඩර් | මෝටර් බයිසිකල් පදින්නන් | මෝටර් බයිසිකල් සඳහා සලසුම්කළ රක්ෂණ ඔප්පුවකි. |
| | මෝටර් ප්ලස් කොමර්ෂල් | වාණිජ මෝටර් රථ හිමිකරුවන් | ජාතික ආර්ථිකයට දායක වන වාණිජ වාහන (කුලී කාර්, ද්විත්ව කාර්යය වාහන, පුද්ගලික කුළී ලොරි) සඳහා සම්පූර්ණ මෝටර් රථ රක්ෂණ ආවරණය ලබා දේ. |
| | මෝටර් ප්ලස් ඩ්‍රයිව් 60 | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මෝටර් රථ රක්ෂණ ආවරණ | පහත විශේෂ ප්‍රතිලාභ ඩ්‍රයිව් 60 රක්ෂණ නිෂ්පාදනය යටතේ පිරිනමයි:<br>• රු. 10,000 දක්වා ඇදගෙන යාමේ ගාස්තු ආවරණය<br>• රුපියල් මිලියන 5 ට වැඩි රක්ෂණ මුදලකට රක්ෂණය කර ඇති වාහන සඳහා (පෞද්ගලික කාර් සහ පෞද්ගලික ද්විත්ව කාර්ය වාහන) කෝල් ඇන්ඩ් මූව් පහසුකම්<br>• SLIC ලියාපදිංචි ගරාජ වලින් මුදල් රහිත අලුත්වැඩියා පහසුකම<br>• රු. 100,000 ට පහළ හිමිකම් සඳහා කඩිනම් පියවීමේ පහසුකම<br>• රු. 100,000 ට පහළ හිමිකම් සඳහා අලුත්වැඩියාවෙන් පසු පරීක්ෂාව කපාහැරීම<br>• හිමිකම් සඳහා විශේෂ අලුත්වැඩියා පිරිනැමීම්<br>• රු. 50,000 ට අඩු හිමිකම් සඳහා මුක්තාවශේෂ කොටස් කපාහැරීම<br>• 75% දක්වා වට්ටම් (70% NCB සහ 5% MR) |
| | මෝටර් ප්ලස් පිනකල් | අධිමිල මෝටර් රථ හිමිකාර අංශය | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් මෝටර් ප්ලස් පිනකල් යනු පුළුල් පරාසයක අවදානම් වලට පුළුල් ආවරණයක් සපයන ප්‍රමුඛතම මෝටර් රථ රක්ෂණ නිෂ්පාදනයකි. ඉන් වැඩිදියුණු කළ පුද්ගලික අනතුරු ආවරණයක්, හදිසි බිඳවැටීම් සහය පිරිවැය ප්‍රතිපූරණය, හදිසි නවාතැන් පිරිවැය ප්‍රතිපූරණය, පහසු හිමිකම් ක්‍රියාවලියක් සහ වාරික ගැලපුම් විකල්ප ද පිරිනමයි. SLICGL මෝටර් ප්ලස් පිනකල් සමගින් ගනුදෙනුකරුවන්ට දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ නව මිණුම් සලකුණු තබමින් සියලු අපේක්ෂාවන් අභිබවා යන සේවාවක් අපේක්ෂා කළ හැක. |
| නිවාස | සොරබිය රක්ෂණය | | කඩාවැදීම මගින් ඇතිවන දේපල හානි හෝ අලාභවලින් ඔබගේ නිවාසය සහ පවුල ආරක්ෂා කරයි. |
| | පදිංචි නිවාස සඳහා ගිනි රක්ෂණය | | ගිනි සහ ගිනි ආශ්‍රිත විවිධ අවදානම් රාශියකින් ඔබගේ නිවස සම්පූර්ණ කර තිබුනද, පදිංචි වී සිටියද, ඉදිකිරීම් මට්ටමේ තිබුනද හෝ එසේ නොවනුවද ඔබගේ නිවස ආරක්ෂා කරයි. |
| | නිවාස ආරක්ෂණ රක්ෂණය | | ආපදා සිදුවීමකින් ඔබගේ නිවාසය සහ පවුල, ඔබගේ වටිනා භාණ්ඩ සහ ඔබගේ ගෘහස්ථ භාණ්ඩ ආවරණය කරයි. |
| | හොම් ප්‍රොටෙක්ට් ලයිට් | | පළමු අලාභ පදනමට පූර්ව ප්‍රතිරක්ෂණ ගෘහස්ථ රක්ෂණ ඔප්පුවකි. මෙය කවුන්ටරයෙන් මිලදී ගත හැකිය. |

| නිෂ්පාදන වර්ගය | ඉලක්කගත ගනුදෙනුකරුවන් | විසඳුම් | විස්තරය |
|---|---|---|---|
| චාරිකාව | සංචාර ආරක්ෂාව | සියලුම සංචාරකයින් | සෞඛ්‍ය අවදානම් අවස්ථා, සංචාර අවලංගුවීම, ගමන් මළු අහිමිවීම, පෙර නොදුටු සංචාරක බිඳවැටීම්වලට ආවරණය ලබා දෙන අතර සංචාරකයින්ට කිසිදු බාධාවක් නොමැතිව සිය සංචාරය භුක්ති විඳීම කෙරෙහි සංචාරකයින්ගේ අවධානය සහතික කරයි. |
| පුද්ගල අනතුරු | ජන රැකුම | ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය | ඕනෑම ස්ථානයක ඕනෑම වේලාවක සිදුවියහැකි අනතුරුවලින් පුද්ගලයින් සඳහා පුළුල් ආවරණය ලබා දේ. (24x7 ලොව පුරා) |
| **ව්‍යාපාරය** | | | |
| දේපල | ව්‍යාපාර පරිශ්‍ර සඳහා රක්ෂණය | ව්‍යාපාර හිමිකරුවන් | ඔබගේ කර්මාන්ත හෝ වාණිජ දේපල හානි හෝ අලාභ සඳහා ආවරණය ලබා දේ. |
| | ශ්‍රී ලංකා රක්ෂණ ව්‍යාපාරික සමාජ වෙළෙඳුන් ඒකාබද්ධ රක්ෂණය ප්‍රතිපත්තිය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය | ගිනි හා ගිනි ආශ්‍රිත උවදුරු, වීදුරු, මුදල්, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ ගබඩා විනාශවීමේ රක්ෂණය සහ වෙනත් අදාළ හානි ඇතුළුව එක් ඔප්පුවකින් පුළුල් රක්ෂණාවරණයක් ලබා දේ. |
| | තේ කර්මාන්තශාලා රක්ෂණය | ශ්‍රී ලංකාවේ වැවිලි අංශය | තේ වැවිලි කර්මාන්තශාලා සහ ගබඩා මෙන්ම ඒවායේ යන්ත්‍ර, ව්‍යූහ, තොග සහ පවත්නා කටයුතු සඳහා අවදානම් ඇතුළත්ය. |
| | හෝටල්කරුවන්ගේ පුළුල් රක්ෂණය | ශ්‍රී ලංකාවේ හෝටල්හිමියන් | කාලය සමඟ සංචාරක ව්‍යාපාරය අසමසම බාධාවන්ට මුහුණ දුන් බැවින් ශ්‍රී ලංකාවේ හෝටල්හිමියන් සඳහා පුළුල් රක්ෂණ ආවරණයකි. |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් රක්ෂණය | කොන්ත්‍රාත්කරුවන් භාරගත් ඉදිකිරීම් ව්‍යාපෘති | වර්තමාන වේගයෙන් ගමන් කරන සහ ඉහළ ඉල්ලුමක් ඇති ඉදිකිරීම් ව්‍යාපාරය සමඟ සම්බන්ධ වන විවිධ අවදානම් ආමන්ත්‍රණය කිරීමට කොන්ත්‍රාත්කරුවන් සඳහා පුළුල් රක්ෂණ ආවරණයකි. |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ සියලුම අවදානම් රක්ෂණය | ඉදිකිරීම් ව්‍යාපෘති | යන්ත්‍ර සහ උපකරණ ස්ථාපන ආවරණය කරයි. |
| | විද්‍යුත් උපකරණ රක්ෂණය | ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා | ඔබගේ ඉලෙක්ට්‍රොනික උපකරණ සහ මෙවලම්වලට හානිවියහැකි අවදානම්වලින් සමාගම ආරක්ෂා කරන සුදුසු ආවරණයකි. |
| | යන්ත්‍ර බිඳවැටීම් සඳහා රක්ෂණය | ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා | හදිසි අළුත්වැඩියාන් සහ/හෝ ප්‍රතිෂ්ඨාපනයන්ට ඉඩදෙමින් රක්ෂිත අයිතමවලට සිදුවන අනපේක්ෂිත සහ හදිසි භෞතික හානි හෝ අලාභ සඳහා ආවරණයකි. |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ පිරියත සහ යන්ත්‍ර රක්ෂණය | ඉදිකිරීම් ව්‍යාපෘති | රැකියා භූමියේදී මුහුණදෙන සියලුම වර්ගයේ අවදානම්වලින් කොන්ත්‍රාත්කරුවන්ගේ පිරියත සහ යන්ත්‍ර සඳහා ආරක්ෂාව ලබා දේ. |
| | තොග නරක්වීම සඳහා රක්ෂණය | ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා | යාන්ත්‍රික ගැටළු හේතුවෙන් ආහාර, ඖෂධ වැනි අයිතම සඳහා ශීත ගබඩාවල සුළු උෂ්ණත්ව වෙනස්වීම්වල මෙන්ම, අනපේක්ෂිත තත්ත්වයන් යටතේ එවැනි පාරිභෝගික භාණ්ඩ ඉක්මනින් පිරිහීමේ අවදානම ආවරණය කරයි. |
| | යන්ත්‍ර අහිමිවීමේදී ලාභ රක්ෂණය | ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා | යන්ත්‍ර සූත්‍ර නිසා ඇති වූ බිඳවැටීම් (යම් නිෂ්පාදනයක යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීම හෝ කාර්මික පහසුකම සාමාන්‍ය මෙහෙයුම්වලට බාධා කරමින් ආදායම් මාර්ගවලට හානි කිරීම) හේතුවෙන් සිදු වූ දළ ලාභයේ සැබෑ පාඩුව ආවරණය කරයි. |
| මුහුදු | මුහුදු නැව්කඳ සහ යන්ත්‍ර රක්ෂණය | ධීවර බෝට්ටු හිමිකරුවන් සහ යාත්‍රා හිමිකරුවන් | විවිධ වර්ගයේ අවදානම් හේතුවෙන් සිදුවන හානිවලින් සාගරයේ ගමන් කරන සහ ජල මාර්ගවල ක්‍රියාත්මක වන අනෙකුත් බෝට්ටු/යාත්‍රාවල බඳ සහ යන්ත්‍ර සූත්‍ර සඳහා පූර්ණ ආරක්ෂාව සපයයි. |
| | නැව් බඩු රක්ෂණය | අපනයනකරුවන් සහ ආනයනකරුවන් | අපනයනකරුවන්ගේ සහ ආනයනකරුවන්ගේ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. |
| රැකියාවට අදාළ | සේවක වන්දි රක්ෂණය | කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල | 2005 අංක 10 දරණ මෑතකදී යාවත්කාලීන කරන ලද සේවක වන්දි පනත යටතේ සේවා යෝජකයාගේ වගකීම් ඉස්මතු කරන අතර ඉන් රැකියාවේ යෙදී සිටියදී තුවාල වූ කම්කරුවන්ට වන්දි ලබා දේ. |
| | පුද්ගල අනතුරු ආවරණය | කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල | පහරදීම්, හදිසි අනතුරු හෝ වෙනත් බාහිර හා දෘශ්‍ය ක්‍රම නිසා සිදුවන මරණ සහ ශාරීරික තුවාල සඳහා වන්දි ලබා දෙන අතර එවැනි අනපේක්ෂිත සිදුවීම් වලදී රක්ෂණ ඔප්පුහිමියා ආරක්ෂා කරයි. |

| නිෂ්පාදන වර්ගය | ඉලක්කගත ගනුදෙනුකරුවන් | විසඳුම් | විස්තරය |
|---|---|---|---|
| | සමූහ වෛද්‍ය රක්ෂණය | සියලුම වර්ගයේ ආයතන/සමාගම් | වෛද්‍ය හා සෞඛ්‍ය ආශ්‍රිත අනතුරුවලදී සේවකයා, කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ආවරණය සමූහ වෛද්‍ය රක්ෂණය මගින් ලබා දේ. |
| විශේෂ මෝටර් වර්ගීකරණ | මෝටර් ෆ්ලීට් විසඳුම් | පුද්ගලයින්ට සහ සමාගම්වලට - අයත් කාර් සමුදාය | ආයතනයට අයත් මෝටර් රථ ඇණිය සඳහා අනතුරු අවදානම සහ හානි ආවරණය. |
| | කෘෂිකර්ම වාහන සහ විශේෂ වාහන | පුද්ගලයින්ට සහ සමාගම්වලට අයත් කෘෂිකර්ම වාහන සහ විශේෂ වාහන වර්ග | වාහනයේ භාවිතයේ ස්වභාවය සහ වාහන වර්ගය සැලකිල්ලට ගනිමින් අදාළ කාණ්ඩයේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකාර්මික සහ විශේෂ මෝටර් රථ රක්ෂණ විසඳුම් සැලසුම් කර ඇත. |

## වෙනත් ඔප්පු

- බැංකුරුවන්ගේ හානි රක්ෂණය
- රබර් කර්මාන්තශාලාව
- වෘත්තිකයන්ගේ හානි රක්ෂණය
- ගුවන්යානා රක්ෂණය
- පොදු වගකීම
- නිෂ්පාදන වගකීම

## 2024 මූල්‍ය වසරේ වෙළෙඳපොලට දියත්කළ නව නිෂ්පාදන

සිය මෙහෙයුම් පුළුල් කිරීමේ SLICGL හි අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස 2024 මූල්‍ය වසර තුළ පහත සඳහන් නව නිෂ්පාදන හඳුන්වාදෙන ලදී.

## අනාගතය සුරක්ෂිත කිරීම – "සුරක්ෂා" නොමිලේ පිරිනමන රක්ෂණ යෝජනා ක්‍රමය




ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගම ශ්‍රී ලංකාවේ සිසුන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව අධ්‍යාපන අමාත්‍යංශය විසින් සිදුකරන මුලපිරීමක් වන "සුරක්ෂා" රක්ෂණ යෝජනා ක්‍රමයට සහයවීම.

සුරක්ෂා යනු ශ්‍රී ලංකා රජය විසින් නොමිලේ ලබාදෙන රක්ෂණ ආවරණයක් වන අතර, ඉන් රජයේ පාසැල්, රජය අනුමත පුද්ගලික පාසල්, උපකෘත විශේෂ පාසල් හා පිරිවෙනහි ලියාපදිංචි සිසුන් ආවරණය කෙරේ. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මගින් අනතුරු රක්ෂණාවරණයක්, සෞඛ්‍ය රක්ෂණාවරණයක්, අසාධ්‍ය රෝග ප්‍රතිලාභ හා දෙමාපිය වියෝවකදී අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට මූල්‍ය සහය ලබා දේ. මේ තුළින් සෑම ළමයෙක්ම සිය අධ්‍යාපනය විශ්වාසයෙන් යුතුව ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාව සහතික කරයි.

මෙම මුලපිරීමෙන් ළමුන්ගේ ශුභසාධනය හා අධ්‍යාපනික සාධාරණය පිළිබිඹු කරන අතර, ශ්‍රී ලංකාවේ ඉදිරි පරම්පරාවේ අනාගතය ආරක්ෂා කරන මෙම බලපෑම්සහගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීමේදී SLICGL ප්‍රධාන කාර්යභාරයන් ඉටු කරයි.

## "ගුරුබුහුමන්" රක්ෂණාවරණය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් විසින් 2024 දෙසැම්බර් 4 දින දියත් කළ, "ගුරුබුහුමන්" රක්ෂණය පාසල් ගුරුවරුන් සඳහා විශේෂයෙන් නිර්මාණය කළ සුවිශේෂී රක්ෂණ විසඳුමකි. වසරකට රු. 6,000 සඳහා, මෙම එක් වසරක පුළුල් ඔප්පුව මගින් වැඩවලදී මෙන්ම නිවසේදී මානසික සුවය සහතික කරමින් පුද්ගල අනතුරු ආවරණය හා නිවාස රක්ෂණ ආවරණය යන දෙකෙහි වටිනා සංයෝජනයක් පිරිනමයි.

මෙම කල්පනා සහිත මුලපිරීමෙන් අනාගතය හැඩගැසීමට සිය ජීවිතය කැපකරන අයට අත්‍යවශ්‍ය ආරක්ෂාව ලබාදෙමින් ගුරු ප්‍රජාව වෙත SLICGL හි දැඩි ගෞරවය හා කෘතඥතාව පිළිබිඹු කරයි.

## මෝටර් තර්ඩ් පාර්ටි ටෝටල් ලොස් ප්ලස්

Motor Third Party Total Loss Plus යනු සම්මත තෙවැනි පාර්ශව මෝටර් රථ රක්ෂණ ඔප්පුවක උපරිමය මත පිරිනමන ක්‍රමානුකූලව අගය එකතුකළ වර්ධනයකි. මූලික තෙවැනි පාර්ශ්ව රක්ෂණයකින් තෙවැනි පාර්ශව තුවාල, මරණ හෝ දේපල හානි පමණක් ආවරණය කරන අතර, "Total Loss Plus" වෙතින් විශේෂයෙන් මෝටර් රථ අලාභ සිදුවීමකදී යම් නිශ්චිත අවස්ථාවලට අයත් සීමිත හානි ආවරණය ලබා දේ.

## වගකීම්සහගත අලෙවිකරණය හා විනිවිද සන්නිවේදනය

SLICGL හි ගනුදෙනුකාර මැදිහත්වීමේ උපායමාර්ගය තුළින් ඉක්මන් හා දැනුවත් තීරණ ගැනීමට ගනුදෙනුකරුවන් සවිමත් කිරීමට පැහැදිලි, දැනුවත් හා නිවැරදි තොරතුරු ලබාදීම කෙරෙහි අවධානය යොමු කර ඇත. පුළුල් පරිමාවක විකල්ප පරාසයකට ගනුදෙනුරුවෙක් මුහුණපාන විට ගනුදෙනුකරුගේ සංකීර්ණතාව අවම කිරීමයට අපි උත්සාහ ගනිමු. ඒ අනුව, අපගේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ ද්‍රව්‍ය සැලසුම් කිරීමේදී, අපි සියලුම නියාමන අනාවරණ අවශ්‍යතාවන්ට දැඩිව අනුකූල වෙමු. අපගේ අරමුණ වන්නේ අප සමඟ නියැලීමේදී විචක්ෂණ තීරණ ගැනීමට ගනුදෙනුකරුවන් සවිමත් කරමින් අවශ්‍ය සියලුම හා අදාළ තොරතුරු ලබාදෙමින් ක්ෂේත්‍රයේ මං සලකුණු නියම කිරීමයි.

අපගේ ගනුදෙනුකරුවන්ට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළුව බහු මාර්ග ගණනාවක් තුළින් අපගේ නිෂ්පාදන හා සේවා පිළිබඳ තොරතුරු ලැබේ. තවද, සියලුම ශාඛා සේවකයින් වෘත්තීය ආකාරයකින් යම් තොරතුරු සම්බන්ධ විමසීම්වලට ප්‍රතිචාර දක්වීමට, අපගේ නිෂ්පාදන හා සේවා හා බැඳුණු අවදානම් පැහැදිලි කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සුදුසු විසඳුම් පිළිබඳ ගනුදෙනුකරුවන්ට උපදෙස් ලබා දීමට ඔවුන් පුහුණු කෙරේ. මාර්ගගත නිෂ්පාදන හඳුන්වාදීම අපගේ ගනුදෙනුකරුවන්ට පිරිනමන පහසුව සහ විනිවිදභාවය තවදුරටත් ශක්තිමත් කරයි.

## අලෙවිකරණ වැඩසටහන්

### සම්මාන හා පිළිගැනීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත Global Brand Awards විසින් 2024 ශ්‍රී ලංකාවේ පාරිභෝගික තෘප්තිය සඳහා විශිෂ්ටතම රක්ෂණ සමාගම යන සම්මානය පිරිනමා ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ග්ලෝබල් බ්‍රෑන්ඩ් සඟරාව විසින් 2024 ශ්‍රී ලංකාවේ ගනුදෙනුකාර තෘප්තිය සඳහා විශිෂ්ට රක්ෂණ සමාගම ලෙස ගෞරවයට පාත්‍ර විය. මෙම කීර්තිමත් පිළිගැනීම තුළින් සුවිශේෂී ගනුදෙනුකාර සේවාව ලබාදීමට සමාගමේ නොසැලෙන කැපවීම සහ සිය සේවා දායකයින්ගේ වෙනස්වන අවශ්‍යතා අවබෝධකර ගැනීමට හා විසඳීමට ඇති කැපවීම පෙන්නුම් කරයි.




### හවුල්කාරත්වයන්

#### මාස්ටර් කාඩ් සමඟ හවුල්කාරත්වය තුළින් උපායමාර්ගික පාරිභෝගික ප්‍රතිලාභ

2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් අත්‍යවශ්‍ය රක්ෂණ නිෂ්පාදනවල දැරිය හැකි මිල සහ ප්‍රවේශ්‍යතාව වැඩි කිරීම අරමුණු කර ගනිමින් මාස්ටර්කාඩ් සමඟ සහයෝගිත්වයෙන් ඉලක්ක ගත ගනුදෙනුකාර ප්‍රතිලාභ වැඩසටහනක් දියත් කරන ලදී.

මෙම මුලපිරීමේ කොටසක් ලෙස, මාස්ටර්කාඩ් භාවිතයෙන් ගෙවීම් සිදු කිරීමේදී ප්‍රධාන රක්ෂණ සැලසුම් තුනක් මත 10%ක මට්ටමක් ගනුදෙනුකරුවන්ට පිරිනමන ලදී.

**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හෝම් ප්‍රොටෙක්ට්** – නේවාසික දේපල හා අන්තර්ගත ආවරණය කෙරේ.
Medi60 – ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂයෙන් සැලසුම්කළ සෞඛ්‍ය රක්ෂණයකි.
Medi Plus – පුද්ගලයින් හා පවුල් සඳහා පුළුල් සෞඛ්‍ය ආවරණයකි.

උපායමාර්ගික මූල්‍ය හවුල්කාරත්වයන් තුළින් වටිනාකම වැඩි කරමින් ගනුදෙනුකාර අත්කර ගැනීම සහ රඳවා ගැනීම ශක්තිමත් කිරීමට මෙම ප්‍රවර්ධනය ක්‍රියාත්මක කරන ලදී. මෙම පිරිනැමීම 2025 පෙබරවාරි 28 දක්වා පවතින අතර, අඩුකළ පිරිවැයට දිගුකාලීන ආරක්ෂක විසඳුම්වලින් ප්‍රතිලාභ ලැබීමට ගනුදෙනුකරුවන් ශක්තිමත් කරයි.

මෙම මුලපිරීමෙන් අර්ථවත් සහයෝගිතාවන් තුළින් දරියහැකි රක්ෂණ විකල්ප ලබාදීම, අපගේ සන්නාම පොරොන්දුවට අනුකූලව ගනුදෙනුකාර තෘප්තිය හා සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා SLICGL හි කැපවීම පිළිබිඹු කරයි.




### මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස්

#### මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් - 2024 නත්තල් සැමරුම

වැඩිකළ ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණ (CRM) උපායමාර්ගයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් 2024 උත්සව කාලසීමාව තුළ මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් සක්‍රිය කරන ලදී. මෝටර් ප්ලස් විස්තීර්ණ ඔප්පුහිමියන් සඳහා විශේෂයෙන් සකස් කළ, මෙම වැඩසටහනින් නත්තල සැමරීම තුළ විශේෂ පිරිනැමීම් රාශියක් ලබාදෙන ලදී.

ඔප්පුහිමියන් තෝරාගත් හවුල්කාර අලෙවිකුටි වෙතින් සුවිශේෂී වට්ටම් හා ප්‍රතිලාභ භුක්ති විඳි අතර, ප්‍රායෝගික ලෝයල්ටි ප්‍රතිලාභ ප්‍රවර්ධනය කරමින් SLICGL සමඟ රක්ෂණය වී සිටීමේ වටිනාකම ශක්තිමත් කරන ලදී.

දිගුකාලීන සබඳතා පුළුල් කිරීම, ආයතනික සමාජීය වගකීම වෙනුවෙන් කටයුතු කිරීම වැනි කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාත්මක විනි.







## SLICGL කොළඹ මෝටර් රථ දැක්ම 2024

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් මෝටර් රථ පිළිබඳ උනන්දුවන්නන්, ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, සහ රට තුළ පවුල්වල දහස් ගණනක් ආකර්ෂණය කර ගනිමින් කොළඹ මෝටර් රථ දැක්ම 2024ට සහයවීම ගෞරවයකි.

නිල රක්ෂණ සහකරු ලෙස, SLICGL සන්නාම දෘශ්‍යතාව වැඩි කිරීමට, විභව ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමට සහ අපගේ වෙළෙඳපොළ ප්‍රමුඛ මෝටර් ප්ලස් රක්ෂණ විසඳුම් පෙන්වීමට මෙම ප්‍රධාන මෝටර් රථ දැක්ම භාවිතා කළේය. මැදිහත්වීමේ අවස්ථා, ගනුදෙනුකාර අධ්‍යාපනය, සහ සුවිශේෂී ස්ථානීය පිරිනැමීම් දින තුනක උත්සවය තුළ ශක්තිමත් සන්නාම පැවැත්මකට දායක විය.

අපගේ සහභාගිත්වය තුළින් සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය තුළ අපගේ නායකත්වය සවිමත් කරමින් අපගේ ගනුදෙනුකාර පදනම වැඩි කරන ජාතික උත්සව සමඟ පෙළ ගැසීමට SLICGL හි කැපවීම පිළිබිඹු කරයි.




## NIOSH 2024 හි සේවක ආරක්ෂාවට සහයවීම - කාලගුණ වෙනස කෙරෙහි අවධානය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් NIOSH 2024 වාර්ෂික සම්මන්ත්‍රණය සඳහා නිල රක්ෂණ හවුල්කරු ලෙස කටයුතු කිරීම ගෞරවයක් වූ අතර ඒ තුළින් වෘත්තීමය සෞඛ්‍ය හා සේවක ආරක්ෂාව කෙරෙහි කාලගුණ වෙනසේ බලපෑම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මෙම උපායමාර්ගික සහයෝගිතාව පුළුල් රක්ෂණ විසඳුම් තුළින් ජාතියේ ශ්‍රමබලකාය සුරක්ෂිත කිරීම හා කර්මාන්තය ශක්තිමත් කිරීමට SLICGL හි කැපවීම තහවුරු කරයි. NIOSH හි මෙහෙවර සමඟ පෙළ ගැසෙමින්, මතුවන පාරිසරික හා වෘත්තීමය අභියෝග පෙරමුණ තුළ සක්‍රිය අවදානම් කළමනාකරණය හා ඔරොත්තුදීම තුළ SLICGL අඛණ්ඩව පෙරමුණ ගෙන ඇත.

අපගේ සහභාගිත්වය තිරසාර ව්‍යාපාර ප්‍රවර්ධනය කරමින් හා ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය මෙහෙයවන්නන් ආරක්ෂා කරමින් රක්ෂකයෙක් ලෙස පමණක් නොව ජාතික සංවර්ධනයේ හවුල්කරුවෙක් ලෙස නැවත සහතික කර ඇත.

## GIPA සම්මාන 2023 හි ගෞරවනීය විශිෂ්ටත්වය - සාමාන්‍ය රක්ෂණයේ සුවිශේෂී අවස්ථාවක්

2024 නොවැම්බර් 22 දින, මැලේසියාවේ ක්වාලාලම්පූර්හිදී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල්හි රක්ෂණ අංශයේ 2023 වසරේ කැපී පෙනෙන දක්ෂතා පෙන්වූ ජයග්‍රාහකයින් 18 ක් සඳහා General Insurance Pinnacle Achiever (GIPA) සම්මාන ප්‍රදාන උත්සවය පැවැත්වුණ අතර කැපවීම, නවෝත්පාදනය, සහ සේවා අනර්ඝත්වය පිළිබඳ ප්‍රධාන වටිනාකම්වලට ඔවුන්ගේ දායකත්වයන් නිදසුන් දක්වයි.

GIPA සම්මාන ප්‍රදාන උත්සවය සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම කාර්යසාධන වෘත්තිකයින් හඳුනා ගැනීමේදී හා ප්‍රදාන ලබාදීමේදී - කාර්යසාධනය, ගුණාත්මක ව්‍යාපාර ව්‍යවහාර සහ සවිබලගැන්වීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම තුළ අපගේ විශ්වාසය ශක්තිමත් කරමින්, දැඩි පියවරක් ඉදිරිපත් කරයි.

මෙම කීර්තිමත් ජාත්‍යන්තර අවස්ථාවට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, සමූහ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ නායකත්ව කණ්ඩායමේ සාමාජිකයින් මෙන්ම අපගේ බෙදාහැරීමේ කණ්ඩායම සහ වටිනා හවුල්කරුවන් එක්රැස් වූ අතර, ඔවුන් සියලු දෙනාම සැමරුම අති සාර්ථක කර ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය.

GIPA සම්මාන විසින් ක්ෂේත්‍රයේ ප්‍රමිති ඉහළ නැංවීමේදී, වෘත්තීය වර්ධනය දිරි ගැන්වීමේදී සහ ගෝලීය අදියර මත ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ දක්ෂතාව ස්ථානගත කිරීමේදී SLICGL හි කැපවීම නැවත තහවුරු කරයි.



## SLARDAR ගිරිඋල්ල ධාවන තරඟයෙහි නිළ රක්ෂණ සහකරු

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් 2024 අගෝස්තු 31 සහ සැප්තැම්බර් 01 දින පැවති SLARDAR ගිරිඋල්ල මහමෙරුව ධාවන තරඟය සඳහා නිල රක්ෂණ හවුල්කරු ලෙස සාඩම්බරයෙන් කටයුතු කළේය.

ශ්‍රී ලංකා ධාවන රියදුරන් සහ ධාවකයින්ගේ සංගමය (SLARDAR) යටතේ සංවිධානය කරන ලද මෙම සිත් ඇදගන්නාසුළු මෝටර් රථ ක්‍රීඩා තරඟය, adrenaline-fuelled competition and passionate rally enthusiasts එකතු කළේය. SLICGL හි හවුල්කාරිත්වය, තරඟයේ ආරක්ෂක ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර, විශිෂ්ටත්වය, නිරවද්‍යතාවය සහ අවදානම් කළමනාකරණය – මෝටර් රථ ක්‍රීඩා සහ රක්ෂණ යන දෙකටම ගැඹුරින් බැඳුණු වටිනාකම් සඳහා අපගේ කැපවීම පෙන්නුම් කළේය.

අපගේ සහභාගිත්වය ක්‍රියාශීලී මහජන උත්සවවල SLICGL හි පැවැත්ම ශක්තිමත් කළ අතර, ප්‍රජාවන්ට හා පාර්ශවකරුවන්ට එක සමානව අමතක නොවන අත්දැකීම් එකතුකරමින් ආරක්ෂාව සහතික කිරීමට අපගේ කැපවීම තහවුරු කර ඇත.







## ප්‍රජාව කරා රක්ෂණය සමීප කරවීම – ගන්නෝරුව හන්දියේ බිම් මට්ටමේ සක්‍රීයකරණය

ගනුදෙනුකාර සම්බන්ධතා සහ ප්‍රජා සහභාගීත්වය සඳහා වන අඛණ්ඩ බැඳීමේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ගන්නෝරුව මංසන්ධියේදී සාර්ථක බිම් මට්ටමේ සක්‍රීයකරණයක් සිදු කළ අතර, එමගින් දේශීය ප්‍රජාවට අත්‍යවශ්‍ය රක්ෂණ විසඳුම් සඳහා ඍජු ප්‍රවේශයක් නිර්මාණය කරන ලදි.

මෙම වැඩසටහනින් සාමාන්‍ය රක්ෂණ පිරිනැමීම් පිළිබඳ දැනුම වැඩි කිරීමට, සහ පුද්ගලගත මඟපෙන්වීම ලබාදීමට අරමුණු කළ අතර, රට තුළ පුද්ගලයින් සහ පවුල්වලට වඩාත් වැදගත් වන ආරක්ෂාව ලබාදීමේ SLICGL හි මෙහෙවර ශක්තිමත් කරයි.

මෙම ප්‍රාදේශීය ඉදිරිපත්වීම තුළින් SLICGL අඛණ්ඩව විශ්වාසය ගොඩනගා ගැනීම, එහි ව්‍යාප්තිය පුළුල් කිරීම සහ රක්ෂණය කරා වඩාත් ඉහළ ප්‍රවේශ්‍යතාව ඇති කරයි. එහිදී සෑම ශ්‍රී ලාංකිකයෙකුටම විශ්වාසයෙන් යුතුව තම අනාගතය ආරක්ෂා කර ගැනීමට අවස්ථාව ඇති බව සහතික කරයි.






## ඇසල පෙරහැර තුළ මාර්ග ආරක්ෂාව සහතික කිරීම – නොමිලේ වාහන සායන වැඩසටහන

ගනුදෙනුකාර ආරක්ෂාව සහ යහපැවැත්ම කරා සිය අඛණ්ඩ බැඳීමට අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ටොටාචි ශ්‍රී ලංකා හා ඉන්ද්‍රා ට්‍රේඩර්ස් සමඟ සහයෝගිත්වයෙන්, 2024 දී මංගල ඇසල පෙරහැර තුළ නොමිලේ වාහන සායනයක් දියත් කළේය.

අගෝස්තු 19 දක්වා පවත්වන ලද ශ්‍රී ලංකාවේ වඩාත් වැදගත් සංස්කෘතික උත්සවයක් තුළ ආරක්ෂක හා වඩා පහසු ගමනක් සහතික කරමින් පුළුල් වාහන සෞඛ්‍ය පරීක්ෂාවන් හා වට්ටම් පිරිනමමින් වන්දනාකරුවන්ට හා සංචාරකයින්ට සහය ලබාදීමට මෙම වැඩසටහන සැලසුම් කරන ලදී.

මෙම සෘතුමය වැඩසටහන, වගකිවයුතු රක්ෂණකරුවෙකු සහ මාර්ග ආරක්ෂක උපදේශකයෙකු ලෙස SLICGL හි කාර්යභාරය ශක්තිමත් කළ අතර, කාර්යබහුල ගමන් කාලසීමාවලදී මෝටර් රථ හිමියන්ට සහ ප්‍රජාවන්ට සක්‍රියව සහාය විය.









### හෙට දවසේ ජයග්‍රාහකයින් ආරක්ෂා කිරීම – පාසල් රග්බි ක්‍රීඩක රක්ෂණ වැඩසටහන සඳහා නිල රක්ෂණ හවුල්කරු

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් 2024 දී ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ආරම්භ කළ පාසල් රග්බි සඳහා නව ක්‍රීඩක රක්ෂණ වැඩසටහන වෙනුවෙන් නිල රක්ෂණ හවුල්කරු ලෙස කටයුතු කර ඇත.

මෙම ඉදිරිය දකින වැඩසටහන තරුණ ක්‍රීඩකයින්ගේ ආරක්ෂාව හා ශුභ සාධනය සහතික කිරීමට සැලසුම් කළ අතර පාසල් මට්ටමේ රග්බි තරඟ හා බැඳුණු අසමසම අවදානම්වලට ගැලපෙන පුළුල් රක්ෂණ ආවරණය මින් ලබා දේ. මෙම සහයෝගිතාව තුළින්, ආරක්ෂක ක්‍රීඩා පරිසරයක් ප්‍රවර්ධනය කරමින් හා අනාගත ක්‍රීඩා වෘත්තිකයින්ගේ සාකල්‍ය සංවර්ධනයට සහයවෙමින් තරුණ ක්‍රීඩකයින් පෝෂණය කිරීම කරා සිය බැඳීම SLICGL තහවුරු කරයි.

ක්‍රීඩා යටිතල පහසුකම් හා තරුණ ශුභසාධනය ශක්තිමත් කිරීමේ ජාතික උත්සාහයන් හා පෙළ ගැසෙමින්, ක්ෂේත්‍රය මත හා බාහිරව - ඊළඟ පරම්පරාවේ ජයග්‍රාහකයින් ශක්තිමත් කිරීමේදී සක්‍රිය කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරයි.



### වන්දනාකරුවන්ට සහය වැඩසටහන – (අනුරාධපුරය, 2024 ජූනි)

මෝටර් ප්ලස් රෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන තුළින් අගය එකතුකළ සේවා ලබාදීමට අපගේ අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් 2024 ජූනි 21 සිට 23 දක්වා අනුරාධපුරයට වන්දනාවේ ගිය මෝටර් ප්ලස් විස්තීර්ණ ඔප්පුහිමියන් සඳහා සුවිශේෂී මූලික සහය ලබාදෙන ලදී.

ගුණාත්මක සංචාරය තුළ බාධාරහිත සංචාරයේ වැදගත්කම හඳුනා ගනිමින්, අනුරාධපුරය තුළ මාර්ග දෙපස සහය පිරිනැමීමට සම්පත් මෝටර්ස් සහ ලයින් 360 සමඟ SLICGL සහයෝගී විය.

**ප්‍රධාන සහයට පහත දෑ ඇතුළත්ය:**
**සම්පත් මෝටර්ස්:**

- අනුරාධපුර නගර සීමාව තුළ නොමිලේ ඇදගෙන යාම
- සුළු බිඳවැටීම් අලුත්වැඩියාවන් සඳහා නොමිලේ ශ්‍රමය
- Jump-start සේවා
- කැපවූ සම්බන්ධතාවයක් හරහා සහාය සම්බන්ධීකරණය

**ලයින් 360:**

- වට්ටම් සහිත ඇදගෙන යාමේ සේවා
- යාන්ත්‍රික සහ විදුලි අලුත්වැඩියාවන් සඳහා කුලිය මත 25% වට්ටමක්

මෙම වැඩසටහනින් සම්මත රක්ෂණ සේවාවන්ගෙන් ඔබ්බට අර්ථවත් සහභාගිත්වය තුළින් ගනුදෙනුකාර විශ්වාසය හා තෘප්තිය වැඩි කරමින් ඔප්පුහිමියන්ට තත්‍ය කාලීන, ස්ථාන විශේෂිත සහය ලබාදීමේදී SLICGL හි සක්‍රීය ප්‍රවේශය පිළිබිඹු කරයි.




### පුහුණුව තුළ විශිෂ්ටත්වය හඳුනා ගැනිම – SLIM Night of Honour and Gratitude Ceremony 2024

2024 ජූනි 13 දින, කොළඹ කින්ග්ස්බරි හොටෙල් හි පැවති පුහුණුව තුළ විශිෂ්ටත්වය සඳහා පිළිගැනීම – SLIM Night of Honour and Gratitude Ceremony 2024, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි පුහුණු දෙපාර්තමේන්තුව ශාඛා කළමනාකරුවන් සඳහා අලෙවි කළමනාකරණ පාඨමාලා සහතිකය සඳහා සිය කැපී පෙනෙන දායකත්වය අභිමානයෙන් පිළිගන්නා ලදී.

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) මෙම තීරණාත්මක වැඩසටහන සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමේදී ඔවුන්ගේ උත්සාහයන් පිළිගැනීම තුළ පුහුණු දෙපාර්තමේන්තුව වෙත අගය කිරීමේ ඵලකයක් ප්‍රදානය කරන ලදී. ශාඛා කළමනාකරුවන්ගේ නායකත්වය හා අලෙවි කළමනාකරණ නිපුනතා වැඩි කිරීම අරමුණු කළ, මෙම පාඨමාලාව සමාගමේ අලෙවි හැකියාවන් ශක්තිමත් කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කර ඇත.

මෙම පිළිගැනීමෙන් අඛණ්ඩ සේවක සංවර්ධනයට හා ආයතනය තුළ ඉගෙනුම් හා වර්ධන සංස්කෘතියක් පෝෂණය කිරීමට SLICGL හී කැපවීම ඉස්මතු කරයි.




### සන්ධිස්ථාන ජයග්‍රහනය – යූනියන් බැංකුව සමඟ බැංකුරක්ෂණ හවුල්කාරත්වය යටතේ සාර්ථක ව්‍යාපාරික අවස්ථා ඇතිකර ගැනීම

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් යූනියන් බැංකුව සමඟ අලුතින් ස්ථාපිත බැංකු රක්ෂණ හවුල්කාරිත්වය යටතේ පළමු ව්‍යාපාරික ඉදිරිපත් කිරීම සාර්ථකව නිම කිරීම සමඟ 2024 දී සැලකියයුතු සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත. මෙම මූලික සාක්ෂාත්කර ගැනීම යූනියන් බැන්ක් ප්‍රධාන කාර්යාලයේදී 2024 ජූනි 11 දින සිදුවිය.

මෙම හවුල්කාරිත්වය වඩා පුළුල් සේවාදායක පදනමක් වෙත පුළුල් මූල්‍ය හා රක්ෂණ විසඳුම් පිරිනැමීමට ආයතන දෙක සඳහාම නව මාවත් විවෘත විය. මෙම අවස්ථාවට යූනියන් බැංකුවේ උප සභාපති මනීෂ ප්‍රනාන්දු මහතා සහ යූනියන් බැංකුවේ බැංකු රක්ෂණ සහ ප්‍රේෂණ අංශ ප්‍රධානී දසුන් සිරිවර්ධන මහතා සහභාගී වූ අතර, මෙම සහයෝගීතාවය දියත් කිරීමේදී ඔවුන්ගේ සහයෝගය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

මෙම හවුල්කාරිත්වය ආරම්භ කිරීම සහ පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ වැදගත් කාර්යභාරයන් වෙනුවෙන් SLICGL හි බැංකු රක්ෂණ, විකල්ප බෙදාහැරීම් සහ ව්‍යාපාර රඳවා ගැනීම පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරී රොෂාන් කොලස් මහතා සහ නාලිකා ප්‍රවර්ධන (බැංකු සහ හවුල්කාරිත්ව) කළමනාකාරිනී දිලිනි ගාල්ලගේ මහත්මියට විශේෂ කෘතඥතාව පළ කරන ලදී.

මෙම සන්ධිස්ථානය මගින් බෙදාහැරීමේ මාර්ග පුළුල් කරමින් හා බැංකු රක්ෂණය තුළින් මූල්‍ය අංශයේ සහයෝගිතාවන් දැඩි කිරීමේදී SLICGL හි උපායමාර්ගික දිශානතිය තහවුරු කරන ලදී.



### Single Tree Hill Climb 2024 සඳහා රක්ෂණ හවුල්කාරිත්වය

2024 අප්‍රේල් 08 දින, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් නුවරඑලිය දර්ශනීය නගරය තුළ පවත්වන ලද Single Tree Hill Climb තරඟ උත්සවයේ නිල රක්ෂණ හවුල්කරු ලෙස ගෞරවයෙන් කටයුතු කර ඇත.




මෙම හවුල්කාරත්වය තුළින් ප්‍රීතිමත් හා ඉතා වැදගත් උත්සවයක් සඳහා පුළුල් ආවරණය හා මූලික සහය ලබාදෙමින් මෝටර්රථ තරඟ ආරක්ෂාව හා ප්‍රජා සහභාගිත්වය සඳහා අපගේ අඛණ්ඩ කැපවීම පෙන්නුම් කර ඇත. උත්සවය තුළ SLICGL හි අමතක නොවන පෙනී සිටීම ශ්‍රී ලංකාව පුරා ආරක්ෂිත හා වගකීම්සහගත ක්‍රීඩා පරිසරයක් ප්‍රවර්ධනය කිරීමට අපගේ කැපවීම ශක්තිමත් කරන ලදී.

## ජාතික විකුණුම් වැඩසටහන – සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද – 2024

2024 අප්‍රේල් 05 දින, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් කණ්ඩායම සියලුම ශ්‍රී ලාංකිකයින්ට ආරක්ෂාව සහ සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කරමින් සිංහල හා දෙමළ අලුත් අවුරුදු උණුසුම් සුබපැතුම් පළකරමින් ක්‍රියාශීලී ජාතික විකුණුම් වැඩසටහනේ කොටසක් ලෙස රටපුරා ගමනක් ආරම්භ කළේය.

මෙම වැඩසටහන දිවයින පුරා ප්‍රජාවන්ට ගලපනලද රක්ෂණ විසඳුම් ලබා දෙමින් නව නිෂ්පාදන, සේවා සහ අගය එකතු කිරීම් හඳුන්වා දීමේ වේදිකාවක් ලෙස සේවය කළේය. සූක්ෂම සැලසුම් කිරීමේ සිට බාධාරහිත ක්‍රියාත්මක කිරීම දක්වා, මෙම ප්‍රයත්නය SLICGL හි කණ්ඩායමේ උද්‍යෝගය සහ කැපවීම පිළිබිඹු කළේය.

මෙම වැඩසටහන තුළින්, අපි පාර්ශවකරුවන් සමඟ ගනුදෙනුකාර සම්බන්ධතා ශක්තිමත් කර, දැඩි සහභාගිත්වයන් ගොඩ නගා, අපගේ සුවිශේෂී පිරිනැමීම් පිළිබඳ මහජන දැනුවත්කම ශක්තිමත් කරන ලදී. අපගේ පුරවැසියන්ගේ වෙනස්වන අවශ්‍යතාවන්ට රක්ෂණය පිවිසියහැකි, අදාළ, සහ ප්‍රතිචාරාත්මක බවට පත් කිරීමේ SLICGL හි මෙහෙවරට සැබෑ සාක්ෂියක් ලෙස මෙම වැඩසටහන පෙනී සිටී.




## සාමාන්‍ය රක්ෂණ සමුළුව 2023 – අපගේ අලෙවි ජයග්‍රහකයින් සැමරීම

මීගමුව ජෙට්වින්ග් බ්ලූ හි 2024 පෙබරවාරි 22 සහ 23 දින පවත්වන ලද සාමාන්‍ය රක්ෂණ සමුළුව 2023 සුවිශේෂී දක්ෂතා සහ කැපවීම පිළිබඳ ඉහළම සැමරීමක් වන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් අඛණ්ඩ සාර්ථකත්වය ඉන් වැඩි කරයි.

මෙම සමුළුව ආයතනය තුළ ඉහළම කාර්යසාධන විකුණුම් වෘත්තිකයින් සහ මතුවන දක්ෂයින් හඳුනාගෙන පිළිගැනීමට ලක් කර ඇත. එය විශිෂ්ටත්වය සැමරීමට, උපායමාර්ගික අවබෝධතා හුවමාරු කිරීමට, සහ බෙදාහැරීමේ බලකායේ එකමුතුව ශක්තිමත් කිරීමට වේදිකාවක් ලෙස සේවය කරන ලදී. පිළිගැනීමේ උත්සවයේ සිට දැනුම් හුවමාරු සැසි දක්වා, මෙම උත්සවයෙන් කණ්ඩායම් වැඩ, නව්‍යකරණය හා කාර්යසාධනය පදනම් සංස්කෘතිය පෙන්වා ඇත.






සමාගමේ වර්ධනය ඇති කිරීමට හා වටිනාකම් නගා සිටුවීමට අඛණ්ඩව කටයුතු කළ අලෙවි ජයග්‍රහකයින්ගේ උත්සාහයන් සහ සාක්ෂාත්කර ගැනීම් වෙනුවෙන් SLICGL සාඩම්බරයෙන් සමාචාර දක්වන ලදී. මෙම සමුළුව සේවකයින් පිළිගැනීමේ අවස්ථාවක් පමණක් නොව ඔවුන් වෙනුවෙන් සහ සෑම සන්ධිස්ථානයකදීම සාර්ථකත්වය සැමරීම සඳහා අපගේ කැපවීම නැවත සහතික කිරීමේ අවස්ථාවක් ද විය.

## ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ජීවිත සහ සාමාන්‍ය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය 2024 සැමරීම

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් අපගේ ආයතනය තුළ කැපී පෙනෙන කාන්තා දායකත්වයන්ට ගරුකරමින් 2024 ජාත්‍යන්තර කාන්තා දිනය අභිමානයෙන් යුතුව සැමරන ලදී.

සතියක් පැවති උත්සව සැමරුමේදී ආශ්වාදජනක උපුටා දැක්වීම්, අමතක නොවන අවස්ථාවන් ග්‍රහණය කර ගැනීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ඡායාරූප පසුබිමක් සහ "කාන්තාවන් සවිබල ගැන්වීම: ආයතනික ලෝකයේ වැඩ-ජීවිත සමතුලිතතාවය සහ වෘත්තීයභාවය" යන මාතෘකාව යටතේ ආරාධිත දේශනයක් පැවැත්විණි. ප්‍රධාන දේශනය මහාචාර්ය අරෝෂා අදිකාරම් විසින් පවත්වන ලද අතර, ඇයගේ හැඟීම් දනවන තීක්ෂණ බුද්ධිය අපගේ කාර්ය මණ්ඩලයට ශක්තියක් වූ අතර වෘත්තීය සහ පෞද්ගලික අපේක්ෂාවන් සමතුලිත කිරීම පිළිබඳ ප්‍රායෝගික මග පෙන්වීමක් ලබා දෙන ලදී.

සියලුම කාන්තාවන්ට සිය ගමන වැළඳගැනිමට, විශිෂ්ටත්වය හඹායාමට සහ සිය ජයග්‍රහනයන් සැමරීමට අභිප්‍රේරණ පණිවිඩයක් සමඟ වැඩසටහන පවත්වන ලදී. එය ස්ත්‍රීපුරුෂ සමානතාව, සවිබලගැන්වීම සහ සියලුම දෙනා ඇතුළත්කිරීම සඳහා අපගේ කැපවීම පිළිබඳ සැබෑ පිළිබිඹුවක් විය.




### මතුවන අවදානම් සඳහා පුළුල් ආවරණය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් තුළ, අපි ව්‍යාපාර අවදානම්වල ගතික ස්වභාවය හඳුනා ගන්නා අතර විවිධ මට්ටමේ අභියෝග විසඳීමට ගලපන ලද ආවරණය ලබා දුනිමු. එය නිෂ්පාදන අවදානමක්, විද්‍යුත් උපාංග ආශ්‍රිත අවදානමක්, සයිබර් ප්‍රහාරක හෝ ස්වභාවික ආපදාවක බලපෑමක් වුවද, අපගේ සේවාදායකයින්ට සිය අසමසම අවශ්‍යතා සපුරාලන පුළුල් ආවරණය ලැබෙන බව අපි සහතික කරමු.

වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමට ව්‍යාපාරවලට ඉඩදෙමින් ශක්තිමත් ආරක්ෂාව ලබාදීමට අපගේ විසඳුම් සැලසුම්කරන ලද අතර, අපි ඔවුන්ගේ වත්කම් හා මෙහෙයුම් සුරක්ෂිත කරමු.




### විශ්වාසය සමඟ ව්‍යාපාර සවිබලගැන්වීම

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ජෙනරල් ලිමිටඩ් අපගේ ආයතනික සේවා දායකයින්ට වටිනා අවබෝධයක් ලබාදෙමින් කොන්ත්‍රාත්කරුවන්ගේ සියලුම අවදානම් රක්ෂණය පිළිබඳ සුවිශේෂි සංසදයකට සත්කාර කරන ලදී. මෙම උත්සවය තුළින් අවදානම් අවම කිරීමට සහ විශ්වාසයෙන් විශාල පරිමාණ ව්‍යාපෘති භාර ගැනීමට අවශ්‍ය දැනුම හා මෙවලම් සමඟ ව්‍යාපාර සන්නද්ධ කිරීමට අවධානය යොමු කරන ලදී.

ගලපන ලද රක්ෂණ විසඳුම් ලබාදෙමින් සහ ක්ෂේත්‍රයට විශේෂිත අවදානම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදෙමින් ව්‍යාපාරවලට සහයවීමට අපි කැපවී සිටිමු. ඔබගේ ව්‍යාපාරයේ වර්ධනය හා ආරක්ෂාව වැඩි කිරීම අරමුණ කරන බොහෝ උත්සව අපේක්ෂාවෙන් සිටින්න.







### මෝටර්රථ නොවන අංශය තුළ දැඩි වර්ධනය

ක්ෂේත්‍රයේ සාමාන්‍ය වර්ධනය වන 12% සැලකියයුතු ලෙස අභිබවා යමින් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි මෝටර් රථ නොවන අංශය 27%ක ස්ථිර වර්ධනයක් සටහන් කිරීම අපිට ආඩම්බරයකි. මෙම සැලකියයුතු ජයග්‍රහනය තුළින් අපගේ කළඹ විවිධාංගීකරණය කිරීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලන ගලපන ලද රක්ෂණ විසඳුම් ලබාදීමට අපගේ කැපවීම පිළිබිඹු කරයි.

මෙම අංශය තුළ අපගේ වර්ධනය අපගේ සේවාදායකයින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය සහ අගය මත පදනම් නිෂ්පාදන හා සේවා ලබාදීමට අපගේ හැකියාව තහවුරු කරයි.







## මෝටර් රථ රක්ෂණ වෙළෙඳපොල තුළ වර්ධනය

වෙළෙඳපොල පහත වැටීම හමුවේ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් මෝටර් රථ රක්ෂණ වෙළෙඳපොල කොටස තුළ සැලකියයුතු වර්ධනයක් පෙන්වා ඇති අතර 2022ට සාපේක්ෂව එය 5.2% කින් වැඩි වීමකි. අපගේ වෙළෙඳපොල කොටස 2022 දී 20% සිට 2023 දී 21% දක්වා ඉහළ ගිය අතර තරඟකාරී, විශ්වාසී, සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය මෝටර් රථ රක්ෂණ විසඳුම් පිරිනැමීමට අපගේ අඛණ්ඩ කැපවීම ඉන් පිළිබිඹු කරයි.

මෙම වර්ධනයෙන් අභියෝගාත්මක වෙළෙඳපොල තත්ත්වයන්වලදී පවා අපගේ සන්නාමයේ ඔරොත්තුදීම සහ ශක්තිමත් ගනුදෙනුකාර පක්ෂපාතිත්වය පවත්වා ගැනීමට අපගේ හැකියාව ඉස්මතු කරයි.




## ලංකා මෝටර් රථ වෙළෙඳ සංගමයේ (CMTA) සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් MCA ක්‍රීඩාංගනයේදී ජනවාරි 27 දින පැවති Ceylon Motor Trader's Association's ආකර්ශනීය සය සාමාජික ක්‍රිකට් තරඟාවලිවයට හවුල්වීම ආඩම්බරයකි. සාමාජික ආයතනවල කාර්ය මණ්ඩලය සුවිශේෂී ක්‍රිකට් දක්ෂතාවන් පෙන්වූ බැවින් මෙම සංගමය CMTA සමඟ අපගේ සම්බන්ධතාව නව උපරිමයන්ට ලඟා විය.

රක්ෂණ හවුල්කරු වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ජයග්‍රහකයින් හඳුනාගෙන ප්‍රශංසා කිරීමට සහ ඔවුන්ගේ සැලකියයුතු කාර්යසාධනයක් සඳහා විශේෂ ප්‍රදාන ලබාගැනීමට ලැබීම විශේෂත්වයකි.

ක්ෂේත්‍රයේ ඔවුන්ගේ කැපීපෙනෙන ජයග්‍රහනයන් වෙනුවෙන් සියලූම කණ්ඩායම් වෙත සතුට ප්‍රකාශ කර සිටිමු.



# ස්වභාවික ප්‍රාග්ධනය

## SLIC සාමාන්‍ය මෙහෙයුම්වලින් මෙම හිඟ නමුත් වටිනා සම්පත කෙරෙහි අවම බලපෑමක් ඇත. එසේවුවත්, එහි වගකිවයුතු භාවිතය අපගේ තිරසාර මුලපිරීම්වල අත්‍යවශ්‍ය කොටසකි.

### වගකීම්සහගත ප්‍රවේශයක්

අපගේ ව්‍යාපාරය මෙහෙයුම් ද්‍රව්‍ය හා බලශක්ති තීව්‍ර වෙනුවට තොරතුරු තීව්‍ර ව්‍යාපාරයකි. එමනිසා, අපගේ ස්වභාවික සම්පත් පරිභෝජනය ජලය, විදුලිය, ඉන්ධන, කඩදාසි සහ අපද්‍රව්‍ය බැහැර කිරීම (ආහාර, කඩදාසි සහ ඊ-අපද්‍රව්‍ය) භාවිතයට සීමා වේ. යම් මට්ටමකින්, අපගේ පරිභෝජනය හා අපද්‍රව්‍ය කළමනාකරණය ස්වභාවික ප්‍රාග්ධනය වැඩි කරමින් හෝ එහි සීමිත සම්පත් හායනය කරමින් පරිසරයට බලපානු ඇති බවට අප දැනුවත්ය. එසේවුවද, "අපි පෘතුවියේ බුද්ධියට යටත් වුවහොත්, අපට ගස්මෙන් මුල්බැසගෙන නැගී සිටිය හැකිය. *(රේනර් මේරියා රයික්)*, යන කියමන විශ්වාස කරමින්, එයට අවශ්‍ය ගෞරවය සමඟ මෙම සීමිත සම්පත්වල සෑම අංශයකටම අපි සලකමු.

### වැදගත් අවස්ථා

**විදුලි පරිභෝජනය**

| | 2024 | 2023 |
|---|---|---|
| | **3,240,186** kWh | 3,179,305 kWh |
| වෙනස | **1.91%** | |

**ජල පරිභෝජනය**

| | 2024 | 2023 |
|---|---|---|
| | **49,539** $m^3$ | 34,756 $m^3$ |
| වෙනස | **42.5%** | |

**කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය**

| | 2024 | 2023 |
|---|---|---|
| | **7** 1,000 Kgs | 3.49 1,000 Kgs |
| වෙනස | **100.6%** | |

### UN SDGs සඳහා අපගේ දායකත්වය

**12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION**

SDG නිර්වචනය

තිරසාර පරිභෝජනය හා නිෂ්පාදන රටා සහතික කිරීම

අපගේ ප්‍රතිචාරය

ගෘහස්ථ, ජනතාව සහ පුද්ගලික අංශය සමඟ වැඩකිරීමේදී අපගේ සක්‍රිය මැදිහත්වීම

**13 CLIMATE ACTION**

SDG නිර්වචනය

කාලගුණ වෙනස සහ එහි බලපෑම් වැළැක්වීමට හසිදි ක්‍රියාමාර්ග ගැනීම

අපගේ ප්‍රතිචාරය

ජාතික නීති හා පාරිසරික ප්‍රතිපත්තිවලට අනුකූලවීම

## අවස්ථා

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණය සඳහා වර්ධන අවස්ථා ආර්ථික ප්‍රතිසාධනය, නියාමන සංවර්ධනය, සහ වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතාවලදී පැන නගී.

| ඩිජිටල් පාරිනාමන හා රක්ෂණ තාක්ෂණය | ක්ෂුද්‍ර-රක්ෂණය සහ පරම ආවරණය | කාලගුණ හා ආපදා අවදානම් රක්ෂණය | ආයතනික සහ SME රක්ෂණ වර්ධනය | නියාමන හා ඔප්පු වර්ධනයන් |
|---|---|---|---|---|
| සයිබර් රක්ෂණය, ඩිජිටල් රක්ෂණ වේදිකා, කෘතීම බුද්ධිය පදනම් ප්‍රාරක්ෂණය සහ හිමිකම් පිරිසැකසුම් තුළ වර්ධනය පහසු පිවිසීම හා ක්ෂේත්‍රයේ කාලීන බව පිරිනමයි. | ගොවි ප්‍රජාව, සෞඛ්‍ය ක්ෂුද්‍ර රක්ෂණය තුළ රක්ෂණය සඳහා අඩු ආදායම් කණ්ඩායම් සඳහා දැරියහැකි රක්ෂණ විසඳුම් සඳහා වැඩිවන ඉල්ලුම. | පරාමිතික රක්ෂණය, ගංවතුර රක්ෂණය, සහ රජය සහ පුද්ගලික රක්ෂණ යෝජනාක්‍රම සමඟ රජයේ හවුල්කාරත්වය සඳහා ඉඩකඩ. | වෙනස්වන ගෝලීය සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ආයතනික අවදානම් කළමනාකරණය සහ වෙළෙඳ ණය රක්ෂණය සඳහා SMEs, වගකීම් රක්ෂණය සඳහා ව්‍යාපාරික බාධා රක්ෂණයේ පරාමිතික පුළුල් කිරීම. | රක්ෂණ විනිවිදයාම ශක්තිමත් කිරීම, අනිවාර්ය රක්ෂණ ඔප්පු හඳුන්වාදීම, සහ රක්ෂකයින් කෙරෙහි විශ්වාසය වැඩි කිරීමට වැඩිකළ ගනුදෙනුකාර ආරක්ෂක නීති. |

## අභියෝග

| ආර්ථික සහ වෙළෙඳපොල ස්ථාවරත්වය | නියාමන හා අනුකූලතා පීඩනය | කාලගුණ හා ආපදා අවදානම් | ඩිජිටල් සහ තාක්ෂණික තරඟය | ශ්‍රම බලකාය අවශ්‍යතා |
|---|---|---|---|---|
| රක්ෂණ ක්ෂේත්‍රය සඳහා අඩු රක්ෂණ විනිවිදයාම ආවේනික ගැටළුවක් වී ඇත. පොලී අනුපාත උච්ඡාවචන මගින් මෙය වඩාත් පීඩනයට පත් කර ඇති අතර ආයෝජන ප්‍රතිඵලවලට බලපාමින් විනිමය උච්ඡාවචන මගින් වැඩිදුර බලපා ඇත. | අවදානම පදනම් ප්‍රාග්ධන අවශ්‍යතාව, මුදල් විශුද්ධිකරණ විරෝධය දැඩිව යොදා ගැනීම සහ වංචා වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ බඳුකරණය ලාභදායිතාවයට බලපාන ලදී. | අහිතකර කාලගුණ තත්ත්වයන් සහිත කාලසීමා කිහිපයක් හිමිකම් ගෙවීම වැඩි කළ අතර, අඩු මට්ටමේ පරාමිතික රක්ෂණය ආපදා රක්ෂණ අවබෝධය සීමා කර ඇත. | අතිශයින්ම තරඟකාරී කර්මාන්තයක් තුළ යාවත්කාලීනව සිටීමට ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජන සඳහා සීමාවන් හඹායමින් බාධාරහිත සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි රක්ෂණ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම. | ආයුගණක සහ රක්ෂණ අවදානම් කළමනාකරණය තුළ ලබාගත හැකි සීමිත සම්පත්, අඛණ්ඩ පුහුණුවේ අවශ්‍යතාවය සහ බුද්ධිමය ගලනය සහ ජන සංක්‍රමණය රඳවා තබා ගැනීම ඉදිරි වසරවල සැලකිය යුතු අභියෝග එල්ල කරනු ඇත. |

## ප්‍රාග්ධන සම්බන්ධතා

| මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය |
|---|---|---|---|---|
| ස්වභාවික ප්‍රාග්ධනයේ තිරසාර භාවිතය දිගුකාලීන පිරිවැය ඉතිරිකිරීම සහ ලාභදායිතාවය, අවදානම් අඩු කිරීම සහතික කරන අතර වෙළෙඳපොල අවස්ථා නිර්මාණය කරයි. | ස්වභාවික ප්‍රාග්ධනයේ වගකීමෙන් යුතුව භාවිතා කිරීම සම්පත් කාර්යක්ෂමතාව, යටිතල පහසුකම් වල කල්පැවැත්ම, නියාමන අනුකූලතාව, සහ නවෝත්පාදනය සහ තිරසාරභාවය සහතික කරයි. | සන්නාම ගොඩනැගීමට සහ සන්නාම කීර්තිනාමය, උපායමාර්ගික තීරණ ගැනීමට, දැනුම බෙදා ගැනීමට, නව්‍යකරණයට සහ පර්යේෂණ සඳහා උපකාරී වේ. | ප්‍රජා යහපැවැත්ම සහතික කර, විශ්වාසය සහ සහයෝගීතාවය ගොඩනගමින්, ආර්ථික සමානාත්මතාවයට දායක වේ. | සෞඛ්‍ය සම්පන්න පරිසරයක්, ශක්තිමත් ශ්‍රම බලකායක්, ප්‍රසන්න වැඩ කරන වටපිටාවක් සහ ආර්ථික වර්ධනයක් සඳහා දායක වේ. |

## අපගේ ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය

පද්ධති, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි ඇතුළත් අපගේ පාලන ව්‍යුහය මිහිතලයේ මානව යහ පැවැත්ම සහ සංරක්ෂණය සඳහා අවශ්‍ය තිරසාරතාවය රඳවා ගැනීමේ අරමුණ ඇතිව ස්වභාවික ප්‍රාග්ධනය වගකීම්සහගත පරිභෝජනය කළමනාකරණය කිරීමට සැලසුම් කෙරේ. අපි පාරිසරික සංරක්ෂණය වෙත නිසි පරීක්ෂණ සමඟ අපගේ මෙහෙයුම් පවත්වන අතර, අපගේ කාබන් පාසටහන අඩු කිරීම තුළ අඛණ්ඩව ආයෝජනය කරන ලදී. තිරසාරතාව සඳහා ප්‍රධාන නිර්ණායකය ලෙස කඩදාසි පරිභෝජනය අඩු කිරීමට අපගේ පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය හා ස්වයංක්‍රියකරණයට අපි කැපවී සිටිමු.

ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා අපගේ උපායමාර්ග ත්‍රිවිධාකාර සැලැස්මක් මත පදනම් වේ.




## පාරිසරික රෙගුලාසි සමඟ අනුකූලතාව

SLICGL සේවා ආයතනයක් වන බැවින්, ජාතික පාරිසරික ප්‍රතිපත්තියේ ඇතුළත් පාරිසරික රෙගුලාසි සමඟ අපගේ අනුකූලතාව ස්වේච්ඡාවෙනි. කෙසේවෙතත්, අපි ස්වභාවික ප්‍රාග්ධනයේ සීමිත භාවිතය කරා අපගේ පාරිසරික භාරකාරත්වයට අපි එකඟවන අතර, ජලය, බලශක්තිය භාවිතය හා අපද්‍රව්‍ය උත්පාදනය මැනීමේදී පසුවිපරම් හා නියාමන යාන්ත්‍රණයක් යොදා ගනිමු. මෙය අපගේ ස්වභාවික සම්පත් භාවිතය අපගේ කාබන් පාසටහන් අඩු කිරීමට අපව ශක්තිමත් කර ඇත.

## කඩදාසි රහිත මෙහෙයුම් කරා ඩිජිටල්කරණය හා සංක්‍රමණය

### අඩුකළ කඩදාසි පරිභෝජනය

ඩිජිටල්කරණය සමඟ, මානව සම්පත්, මූල්‍ය, ප්‍රසම්පාදනය සහ සාමාන්‍ය පරිපාලන කටයුතු ඇතුළත් බොහෝ මෙහෙයුම් ක්‍රියාවලි වල කඩදාසි රහිත මෙහෙයුම් කරා සමාගම මාරු වී ඇත. කඩදාසි භාවිතය සඳහා අවශ්‍යතාව තවදුරටත් අඩු කිරීමට ඩිජිටල් ලේඛණ ගබඩාව, ඉලෙක්ට්‍රොනික් අත්සන්, සහ මාර්ගගත ආකෘති පිරවීම අපි ආරම්භ කළ අතර ඒ තුළින් ගස්වැල් ඉතිරි කිරීමට හා වන විනාශය අඩු කිරීමට දායක විය. කඩදාසි නිෂ්පාදනය, ප්‍රවාහනය සහ බැහැර කිරීමට ආවේණික වූ විමෝචන අඩු කිරීම වක්‍ර ප්‍රතිලාභයකි.

### බලශක්ති කාර්යක්ෂමතාව

දත්ත මධ්‍යස්ථානවල සහ පොදු මේස සපයන්නන් තුළ බලශක්ති කාර්යක්ෂම දෘඩාංග යොදා ගැනීම, පුනර්ජනනීය බලශක්තිය භාවිතා කරමින්, සාමාන්‍යයෙන් විශාල බලශක්ති ප්‍රමාණයක් පරිභෝජනය කරන සැලකිය යුතු දත්ත ප්‍රමාණයක් ගබඩා කිරීමේදී සහ සැකසීමේදී අපි බලශක්ති පරිභෝජනය ප්‍රශස්ත කළෙමු. මාර්ගගත රැස්වීම් සඳහා භාවිතා කරන ලද දුරස්ථ වේදිකා කාර්යාල අවකාශයන්හි විදුලි පරිභෝජනය තවදුරටත් අඩු කළ අතර, අපගේ පිරිවැය අඩු කර බලශක්ති ඉතිරිකිරීම් සඳහා දායක විය.

### පොසිල ඉන්ධනවල අඩුකළ භාවිතය

අපගේ ඩිජිටල් වේදිකා සහ ස්වයංක්‍රියකළ සේවා ශ්‍රමබලකායට සිය කාර්යයන් දුරස්ථව කිරීමට ඉඩදෙන අතර, මාර්ග සංචාර සඳහා අවශ්‍යතාව අඩුකර, කාබන් විමෝචන අඩුකිරීමට හැකියාව ඇති කරමින් පරිසර දූෂණය වැළැක්වීමට දායක වේ.

සමස්තයක් වශයෙන්, රක්ෂණ කර්මාන්තයේ ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය කාර්යක්ෂමතාව සහ කඩදාසි භාවිතය අඩු කිරීම තුළින් කාබන් පාසටහන අඩු කිරීමේ හැකියාව ඇත. බලශක්ති භාවිතය ප්‍රශස්ත කිරීමට, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් යොදා කිරීමට සහ තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට දරන උත්සාහයන් රක්ෂණ ක්ෂේත්‍රයේ ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණයේ ධනාත්මක පාරිසරික බලපෑම තවදුරටත් වැඩිදියුණු කළ හැකිය.

## කාබන් උදාසීනතාව තුළ ආයෝජනය

SLIC හි හරිතාගාර වායු විමෝචන තක්සේරුව 2021 දී ආරම්භ කරමින් මේ වසරේ සිට අඛණ්ඩව කරගෙන යන අතර මෙහි ප්‍රතිඵල මත, කාබන් උදාසීනතාව ක්‍රමානුකූලව අවබෝධ කර ගැනීමට අපි අපේක්ෂා කරමු.

2021, 2022 හා 2023 දී ලද කාබන් පාසටහන් සහතික කිරීම අපි අඛණ්ඩව පවත්වා ගන්නා අතර, එය 2024 දී ද ලබාදෙන අතර ISO 14064-1:2018 හි අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් හරිතාගාර වායු සත්‍යාපන විගණනය මගින් අවශ්‍ය පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ විගණන ක්‍රියාවලිය තුළ අප සිටින අතර, ISO-14064-3:2019 හි පිරිවිතරවලට අනුකූලව සහතික කිරීමේ සාධාරණ මට්ටමක් සත්‍යාපනය කර ඇත.

අපගේ සේවකයින්ට හරිතාගාර වායු විමෝචන සඳහා අදාළ පරිදි තිරසාර ව්‍යවහාර දැනුවත් කිරීමට හා කාබන් උදාසීනතාව සාක්ෂාත් කර ගැනීමේදී ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

## ප්‍රතිපත්ති රාමුව

අපගේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් තුළ කටයුතු කරන අතර, ඉන් අපගේ මෙහෙයුම් තුළ සම්බන්ධ ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි නිර්වචනය කරයි. මෙයට පහත දැ ඇතුළත් වන අතර අදාළත්වය සඳහා නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය පරිදි වර්තමාන අවශ්‍යතා සහ මෙහෙයුම් අවශ්‍යතා ඇතුළත් කිරීමට සංශෝධනය කරනු ලබයි.

- ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි
- අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය
- සුදුසු නිසි කඩිසර ක්‍රියාවලීන්
- ගකිවයුතු සැපයුම් දාම කළමනාකරණය
- විනිවිදභාවය සහ අවදානම් කළමනාකරණය
- ව්‍යාපාර සහ බඳු උපායමාර්ග පාලනය

## බලශක්ති කළමනාකරණය

අපි බලශක්ති පරිභෝජනය කළමනාකරණය කිරීමේදී ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් තුළ කටයුතු කරන අතර පරිභෝජනය හා භාවිතාව තුළ වගකීම්සහගත පුරවැසියෙක් ලෙස සිටීමට අපිට හැකියාව ඇති කරයි.

### විදුලිය පරිභෝජනය




## ඉන්ධන භාවිතය

| ඉන්ධන වර්ගය | මුළු ලීටර් | හරිතාගාර වායු විමෝචන ($tCO_2e$) | | | |
|---|---|---|---|---|---|
| | | $CO_2$ | $CH_4$ | $N_2O$ | Total |
| පෙට්‍රල් | 568,061.650 | 1,290.518 | 18.31307 | 16.26835 | 1,325.0997 |
| ඩීසල් | 36,260.9 | 97.051997 | 0.152218 | 0.214536 | 97.41875 |

## ජල කළමනාකරණය
## වගකීම්සහගත පරිභෝජනය

අපගේ කාර්යාල පරිශ්‍රයෙහි ජල භාවිතයේ කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම ජල සම්පත් සංරක්ෂණයට අපගේ දායක වීමක් වන අතර ඒ තුළින් පාරිසරික තිරසාරභාවයට සහය වේ.

### ජල පරිභෝජනය




ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය අපගේ තිරසාර උපායමාර්ගයේ වැදගත් සංරචකයකි. තොරතුරු තීව්‍ර සේවා ආයතනයක් ලෙස, අපගේ උත්සාහයන් කඩදාසි භාවිතය අඩුකිරීම සහ කඩදාසි රහිත ඔප්පු නිකුතුව, ඩිජිටල් හිමිකම් පිරිසැකසුම, බලශක්ති කාර්යක්ෂම කාර්යාල අවකාශ පවත්වා ගැනීම කෙරෙහි කේන්ද්‍ර වී ඇත. ජාතික පාරිසරික රෙගුලාසිවලට අනුකූලව කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය හා දැඩි අනුකූලතාව මගින් හරිත සේවා ස්ථාන ව්‍යවහාර අපි දිරි ගන්වමු.

## අපද්‍රව්‍ය හා අපජල කළමනාකරණය

### කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය




## විමෝචන කළමනාකරණය

සමස්ථයක් ලෙස සමාගමේ හරිතාගාර වායු විමෝචනවලට ඉහළ බලපෑමක් ඇති විදුලිය භාවිතා කිරීම හේතුවෙන් ඇතිවන කාබන් විමෝචන අඩු කිරීම සඳහා හැකි උපරිමයෙන් සමාගම බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කරනු ලබන අතර පහත කරුණු පිළිබඳව සලකා බලනු ලැබ ඇත:

- සමාගමේ බොහෝ අංශවල LED ලාම්පු සවි කර තිබීම
- කාර්යාල ප්‍රදේශවල 24°C සහ 26°C අතර වායු සමීකරණ යන්ත්‍රවල තාපපාලනය ස්ථාපනය කර තිබීම
- තාපය ගොඩනැගීම වැළැක්වීම සඳහා වීදුරු මත වර්ණ ගැන්වූ ස්ටිකර් ඇලවීම
- කාර්ය මණ්ඩලය සඳහා විදුලි පහන්, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර නිවා දැමීමට සහ වායු සමීකරණ යන්ත්‍රවල ශක්තිය නාස්ති වීම වැළැක්වීම සඳහා හිස් අවකාශයන්හි ලොබි දොරවල් වසා දැමීම සහ බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව නිතර දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.

## ද්‍රව්‍ය කළමනාකරණය

සේවා ආයතනයක් වශයෙන්, වැඩිපුර භාවිතා කරන ද්‍රව්‍යය වන්නේ කඩදාසි වන අතර, අපි කඩදාසි රහිත මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරන බැවින් අපි කඩදාසි භාවිතය සාර්ථකව අඩුකරගෙන ඇත.

## අනාගත දැක්ම

අපගේ ව්‍යාපාරයේ සමස්ත ප්‍රතිමාන වන්නේ සම්පත් සංරක්ෂණය හා අවම කිරීම වන බැවින්, අපගේ තිරසාර ව්‍යාපාර මෙහෙයුම්වල හරය ලෙස ස්වභාවික ප්‍රාග්ධනයේ වගකීම්සහගත භාවිතය අපි අඛණ්ඩව සහතික කරන්නෙමු.

# 06

# පාලනය හා අවදානම් පාලනය

80
ආයතනික පාලන වාර්තාව

84
විගණන හා අනුකූලතා කමිටු වාර්තාව

86
ආයෝජන කමිටු වාර්තාව

88
අවදානම් කළමනාකරණ වාර්තාව

94
අනුකූලතා වාර්තාව

98
අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

# ආයතනික පාලන වාර්තාව

## සභාපතිතුමාගේ හැඳින්වීම

රජයට අයත් ව්‍යවසායක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ඉක්මන් සහ කඩිසර තීරණ ගැනීමට පහසුකම් සැලකීමේ අරමුණින් ව්‍යාපාරය තුළ වගවීම, විනිවිදභාවය සහ සදාචාර කළමනාකරණය සහ සාධාරණත්වය මත ඉදිරිපත්කළ යහපත් පාලන ව්‍යවහාර යොදාගෙන ඇති අතර එයට පැහැදිලි චර්යා ධර්ම සහ ආචාර ධර්ම සංග්‍රහයන්, නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සහ ශක්තිමත් මූල්‍ය පාලනයක් ඇතුළත්ය.

ආයතනික පාලනයේ කුළුණු හතර එනම් වගකීම, වගවීම, විනිවිදභාවය සහ සාධාරණත්වය මත සමාගම මෙහෙයවන ආකාරය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හැඩය සහ හුවමාරු වටිනාකම් නියම කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ 17 නියෝගය පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ 2023 නොවැම්බර්වල සංශෝධිත "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය – 2017" හි විධිවිධානවලට අපි අනුකූල වෙමු.

මුදල් අමාත්‍යාංශය 2021 දී නිකුත්කළ රජයට අයත් ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශවල මූලධර්ම අපි වැළඳගෙන ඇත.

අපගේ ආයතනික පාලන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් "අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන්කළ කරුණු පිළිබඳ උපලේඛනය" යොදා ගෙන ඇත. මෙම ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් යටතේ පවත්නා කරුණු සහ පැවරිය යුතු කරුණු පැහැදිලිව දක්වයි. ඉන් පාර්ශවකරුවන්ට කරුණු පැහැදිලිතාව සඳහා සහයවන අතර උපායමාර්ගික ප්‍රමුඛතා සහ අවදානම් අඩු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවයි.

**සමාලෝචනය වෙමින් පවතින පසුගිය මූල්‍ය වසර තුළ, ආයතනික පාලනය කරා අපගේ ප්‍රවේශයට පහත කරුණු ඇතුළත් වේ:**

සමාගම තුළ ශක්තිමත් පාලන ව්‍යවහාර පවත්වා ගැනීමට අපි කටයුතු කළෙමු. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි විවිධ අනු කමිටු ඔවුන්ගේ ඒකාබද්ධ ප්‍රවීනතාව සමඟ, පාලනය උපායමාර්ගික මඟ පෙන්වීම අඛණ්ඩව ලබාදී ඇත. අපගේ පාලන රාමුව නගා සිටුවීම සඳහා ඔවුන් පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නියම කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරිත්වයේ කාර්යසාධනය නියාමනය කිරීමට නිරතුරුව මාසයකට වරක් මුණ ගැසෙන අතර, අපි ඵලදායිව මෙහෙයවන බව සහතික කරයි. විධායක නොවන අධ්‍යක්ෂවරු සහයෝගී ප්‍රතිපෝෂණ ලබා දෙන අතර විශේෂ උපදෙස් පිරිනමයි.

අපගේ දිගුකාලීන ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ශක්තිමත් ආයතනික පාලනය අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එබැවින්, ඉදිරි වසරවල අපගේ පාලනය වැඩි කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටින අතර පහත සඳහන් වාර්තාව තුළ ඔබට විස්තරාත්මකව දැකගත හැකි වනු ඇත.

**නුසිත් කුමාරතුංග,**
**සභාපති**

03 ජූනි 2025

## පාලන රාමුව

සමාගම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු මගින් විධිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සහ අදාළ කළමනාකරණ වාර්තාකරණය මාර්ග ඇතුළුව සිය මෙහෙයුම්වල සෑම අංශයක් තුළම පාලන රාමුවක් පවත්වාගෙන යනු ලැබේ.



## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

වාර්තා කරන දිනය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් (07) දෙනෙකුගෙන් සමන්විත විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ අදාල ක්ෂේත්‍රවල කීර්තිමත් වෘත්තිකයන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමාගමේ ඵලදායී මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් ව්‍යාපාරික අත්දැකීම් සපයන බවත් එක් එක් අධ්‍යක්ෂවරුන් විවිධ කුසලතා, දැනුම අත්දැකීම් රාශියකින් දායක වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ. රජයට අයත් ව්‍යවසායක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කොටස් හිමියා ලෙස රජය සහ සමාගම සහ එහි කළමනාකාරිත්වය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ථ භාරකාරත්වය සඳහා වගකීමට බැඳී සිටින අතර, පාර්ශවකරුවන්ට ඍජුව හා වක්‍රව නායකත්වය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පාලනය සහ සැලසුම් කිරීමයි. සමාගමේ මූල්‍ය හා වාණිජ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් තක්සේරු කරයි. ඊට අමතරව, සමාගම නිරාවරණය විය හැකි සියලුම අවදානම් කළමනාකරණ ප්‍රමාණාත්මතාව අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර තක්සේරු කරයි.

## සමාගම් ලේකම්

රජයට අයත් ව්‍යවසායක සමාගම් ලේකම් සමාගමේ පාලන රාමුවේ අඛණ්ඩතාව සහතික කිරීම, උපායමාර්ගික උපදේශන සහ අනුකූලතා කාර්යයන් ඇතුළත් කිරීමට සම්ප්‍රදායික පරිපාලන රාජකාරිවලින් ඉදිරියට යාම සඳහා වගකිව යුතුය. සමාගම් ලේකම්ගේ බැඳීම් සහ වගකීම් 2007 අංක 7 දරන සමාගම් පනත හා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ විශේෂ නියෝග හා මාර්ගෝපදේශ සහ ආයතනික පාලන සංග්‍රහය මගින් මූලිකවම මෙහෙයවනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පටිපාටිවලට අනුකූලවීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු ක්‍රියාපටිපාටි

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සියලුම රාජකාරි ඵලදායීව මුදාහැර ඇති බව සහතික කිරීමට මාසයකට වරක් මුණ ගැසේ. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විශේෂයෙන් උපලේඛණගත රැස්වීම් සඳහා අවශ්‍යතාව පරිදි මුණගැසේ. මූල්‍ය වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන හා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පහත විස්තර කෙරේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවීනතාව වැඩි කිරීමට, කාර්යක්ෂමතාව වැඩි කිරීමට, අධීක්ෂණය වර්ධනය කිරීමට, සහ අභ්‍යන්තර පාලන හා ක්‍රියාවලීන් තක්සේරු කිරීම ඇතුළුව වගවීම වැඩි කිරීමට අනුකණ්ඩායම් පිහිටුවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ අනුකමිටු ආයතනයේ මෙහෙයුම්, උපායමාර්ගය, හා අධීක්ෂණය යන විශේෂ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ඵලදායි ආයතන පාලනය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒවායේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට තමන්ට නියමිත ප්‍රඥප්ති තුළ කරුණු පිළිබඳව ගැඹුරු විශ්ලේෂණය, දැනුවත් නිර්දේශ සහ කඩිසර පාලනය ලබාදීමයි. මෙම පවරන ලද අධිකාරිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සංකීර්ණ ගැටළු වඩාත් කාර්යක්ෂමව සහ පරිපූර්ණ ලෙස විසඳීමට ඉඩ සැලසෙන අතර, විගණනය සහ අනුකූලතාව, මානව සම්පත් සහ සන්නිවේදන සහ අවදානම් කළමනාකරණය වැනි තීරණාත්මක කාර්යයන් සඳහා විශේෂිත විශේෂඥතාව යොදන බව සහතික කරයි. නිසි කඩිසරකම පවත්වා ගැනීම, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, අරමුණු වලට අනුව කාර්ය සාධනය නියාමනය කිරීම සහ ඔවුන්ගේ සොයාගැනීම් සහ නිර්දේශ නිතිපතා සම්පූර්ණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම සඳහා අනුකමිටු වගකිව යුතුවන අතර ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ හැකියාවන් ශක්තිමත් කර, සමස්ත ආයතනයේ වගවීම සහ කාර්යසාධනය වැඩි කරයි.

මෙම කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රඥප්ති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලින් පාලනය කරන අතර නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට වාර්තා කළ යුතුය.

2024 වසර සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුකමිටුවල රැස්වීම් ඒවායේ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි කැඳවීමට හැකියාව නොලැබුණු අතර එයට සමාගම් නෛතිකව වෙන්කිරීමෙන් ඇති වූ නොවැළැක්විය හැකි පරිපාලන සහ ප්‍රායෝගික ප්‍රමාදයන් හේතු විය. එසේවුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම අවශ්‍යතාවන්ට අනුකූලව සිටි අතර පහත විස්තර කර ඇති පරිදි සමාලෝචිත වසර තුළ අනුකමිටු රැස්වීම් පවත්වන ලදී.

01. **අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BRMC):** මෙම කමිටුව ආයතනයේ අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය කරයි. එය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම, යාවත්කිරීම, බලාත්මක කිරීම සහ නියාමනය කිරීම සඳහා වගකීමට බැඳෙන අතර අවදානම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් අවදානම් තක්සේරුව තීරණ ගැනීම හා ඒකාබද්ධ කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අවදානම් රුචි මට්ටම් සහ පෙළ ගැසීම සිදු කරයි.

02. **ආයෝජන කමිටුව (IC):** ආයෝජන කමිටුව අරමුණ වන්නේ අවදානම් හා නියමන මාර්ගෝපදේශවලට දැඩිව අනුකූල වෙමින් ආයෝජන ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීමයි. ආයෝජන දැඩිව නිවාරණය කරමින්, ද්‍රවශීලතාව, ණය, මිල සහ සංකේන්ද්‍රණය වැනි විවිධ අවදානම් විශ්ලේෂණය කරමින් කාර්යක්ෂම හා ඵලදායී ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහතික කරයි.

03. **විගණන හා අනුකූලතා කමිටුව (ACC):** මූලිකවම, විගණන කමිටුවේ කාර්යය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහතික කිරීමයි. එමෙන්ම එය සමාගම සදාචාර ප්‍රමිති, සහ අනෙකුත් සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව මෙහෙයවන බව තහවුරු කරයි.

04. **මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (HR and Rem. Com.):** ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ආයතනයේ මානව සම්පත් කාර්යයන් හී ඵලදායිත්වය සහතික කරයි, ක්ෂේත්‍රයේ මනා පරිචයන් හා දත්ත පදනම් පුද්ගල කේන්ද්‍රීය සංස්කෘතියක් මගින් මෙහෙයවමින්, මෙම කමිටුව බඳවාගැනීම, පුහුණුව, කාර්යසාධන කළමනාකරණය (මූලික කාර්යසාධන හා මූලික කාර්යසාධන දර්ශක) සේවක සහභාගිත්වය, වැටුප් ගෙවීම, සහ ප්‍රතිලාභ හා කාර්මික සම්බන්ධතා හා පරිපාලනය අධීක්ෂණය කරයි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික මානව සම්පත් නිර්දේශ සිදු කරයි.

    මෙම කමිටුව අවම වශයෙන් සාමාජිකයින් හතර දෙනෙකුගෙන් එනම් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (එක් අයෙක් සභාපති ලෙස සේවය කරන), සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී, සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් යන අයගෙන් සමන්විත වේ. ප්‍රධාන මානව සම්පත් ප්‍රතිපත්ති සහ තීරණ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාසිකව හෝ අවශ්‍ය පරිදි රැස්වීම් පවත්වනු ලැබේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමට පහළින් සිටින කාර්ය මණ්ඩලය සඳහා මූල්‍යමය නොවන ප්‍රතිපත්ති වෙනස්කම්, ව්‍යුහාත්මක ගැලපීම් සහ විනය ක්‍රියාමාර්ග මෙම කමිටුව අනුමත කරන අතර ප්‍රධාන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරයි. විනිවිදභාවය සහතික කිරීමට රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ වුවමාරු කර ගන්නා අතර කමිටුව සිය කාර්යසාධනය හා ප්‍රඥප්තිය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පවත්වනු ලබයි.

05. **උපායමාර්ගික සමාලෝචන කමිටුව (SRC):** උපායමාර්ගික සමාලෝචන කමිටුව සමාගමේ උපායමාර්ගික සැලැස්ම නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිර්දේශ හා මඟපෙන්වීම ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. මෙයට සමාගමේ දිගුකාලීන පරමාර්ථ, ප්‍රධාන මූලපිරිම්, සහ උපායමාර්ගික දිශානතිය හා බැඳුණු අවදානම් සමාලෝචනය කිරීම ඇතුළත්ය.

06. **ඩිජිටල් පරිනාමන කමිටුව (DTC):** ඩිජිටල් පරිනාමන කමිටුව සමාගමේ ඩිජිටල් උපායමාර්ගය සහ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබාදෙන අතර සමස්ත සංවිධානය පුරා ඩිජිටල් තාක්ෂණයන් සහ ක්‍රියා පටිපාටි ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමට පහසුකම් සපයන නව, නව්‍ය තාක්ෂණික විසඳුම් ක්‍රියාත්මක කිරීම, ඒවායේ පුළුල්ව පැතිරුණු භාවිතය සහ සාර්ථකත්වය සහතික කිරීම සඳහා උපදෙස් ලබා දේ, කමිටුව පිළිගත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙක් වන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහයවනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් – 2024

2024 වර්ෂය තුළ දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් දොළහක් (12) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නුසිත් කුමාරතුංග මහතා 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 03 |
| රොනල්ඩ් පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 09 |
| අනිල් කොස්වත්ත මහතා, 2025 ජනවාරි 02 දින සිට ඉල්ලා අස්විය | 07 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 12 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා 2024 අප්‍රේල් 29 දින සිට පත්කර ඇත | 07 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 04 |
| නඹමාල් පෙරේරා මහතා, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 09 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, 2024 අප්‍රේල් 29 පත් කර ඇත | 06 |

## විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් (ACC) – 2024

2024 වර්ෂය තුළ දී විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් දෙකක් (02) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති) | 02 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 02 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 02 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති), රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා

## ආයෝජන කමිටු රැස්වීම් (IC) – 2024

2024 වර්ෂය තුළ දී රැස්වීම් පහක් (05) පවත්වා ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් රැස්වීම් මෙහෙයවන ලදී.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (කමිටුවේ සභාපති) | 05 |
| රොනල්ඩ් පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 04 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 04 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 05 |
| නුසිත් කුමාරතුංග මහතා 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්ඊ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (කමිටුවේ සභාපති), නුසිත් කුමාරතුංග මහතා, දුෂ්මන්ත තොටවත්ත මහතා, රජීව් ධර්මේන්ද්‍ර මහතා

## අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් (BRMC) – 2024

2024 වර්ෂය තුළ දී අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා ඇත. කමිටුවට පුළුල් සාමාජිකත්වයක් ඇති අතර ඔවුන් මූල්‍ය, ආයෝජන, ආයුගණක, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණන, මානව සම්පත් කළමනාකරණ සහ ICT දෙපාර්තමේන්තුවල අවදානම් කළමනාකරුවන් විවිධ කණ්ඩායමක් නියෝජනය කරයි. විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් රැස්වීම් මෙහෙයවන ලදී.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නඹමාල් පෙරේරා මහතා, (කමිටුවේ සභාපති) 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 02 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 02 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති, 2024 දෙසැම්බර් 13 දින සිට පත්කර ඇත) | 03 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 01 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, | 01 |

## මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් (HR AND REM. COM.) – 2024

2024 වර්ෂය තුළ දී මෙම කමිටුව රැස්වීම් පහක් (05) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නිශාන්ත දයානන්ද මහතා, (කමිටුවේ සභාපති) 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 05 |
| රොන්ල්ඩ් පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 04 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 04 |
| නුසිත් කුමාරතුංග මහතා 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: නීල් ඩී බී උනන්බුව මහතා, (කමිටුවේ සභාපති), නුසිත් කුමාරතුංග මහතා, දුෂ්මන්ත තොටවත්ත මහතා

## උපායාමාර්ගික සමාලෝචන කමිටු රැස්වීම් (SRC) – 2024

2024 වර්ෂය තුළ දී එක් (01) රැස්වීමක් පවත්වා ඇත

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| රොන්ල්ඩ් පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 01 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, | 01 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: දුෂ්මන්ත තොටවත්ත මහතා, (කමිටුවේ සභාපති), රජීව් ධර්මේන්ද්‍ර මහතා, නීල් ඩී බී උනන්බුව මහතා, රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා

## ඩිජිටල් පරිනාමන කමිටු රැස්වීම් – 2024

2024 වර්ෂය තුළ දී එක් ඩිජිටල් පරිනාමන කමිටු රැස්වීමක් පවත්වා ඇත.

## මෙහෙයුම් කළමනාකරණ කමිටු

ඉහත සඳහන් අනුකමිටුවලට අමතරව, සමූහයේ ප්‍රධාන විධායක නිලධාරීට සහයවීම පිණිස, අනෙකුත් මෙහෙයුම් කමිටුවලට විධායක කමිටුව, ප්‍රතිරක්ෂණ කමිටුව, විගණන පසු විපරම් කමිටුව, නිෂ්පාදන සංවර්ධන කමිටුව, නීති කමිටුව සහ වික්‍රුණුම් සහ අලෙවිකරණ සමාලෝචන කමිටුව ඇතුළත් වන අතර, මේ සියල්ල පාලන ව්‍යුහයේ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. සාමාජිකයින් තෝරා ගනු ලබන්නේ සමාගම තුළින්ම වන අතර ඔවුන්ට අදාල විශේෂඥතා ක්ෂේත්‍රවලට අනුකූලවේ. විධායක කමිටුව උපාය මාර්ගය, මෙහෙයුම් සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අයවැය ආදිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කරයි. විධායක කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය හවුල්ව සමාගමේ උපායමාර්ගය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකරයි. කමිටුව මාසිකව සහ අවශ්‍යතාව පරිදි රැස්වේ. කමිටුවේ රැස්වීම් සමාගමේ සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී වන, කමිටුවේ සභාපති විසින් එහි විෂයපථය තුළට වැටෙන ඕනෑම කරුණක් සලකා බැලීමට ඕනෑම අවස්ථාවක කැඳවනු ලබයි.

## තොරතුරු ප්‍රවාහය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටු රැස්වීම් වලදී දැනුවත් තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් වලට පෙර සවිස්තරාත්මක ලිපි ලේඛන සපයනු ලැබේ. විධායක කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් සහ අනෙකුත් ප්‍රධාන සේවකයින් සුදුසු පරිදි නියෝජනය කරමින් රැස්වීම්වලදී සහභාගී වේ. අධ්‍යක්ෂවරුන් වශයෙන් තම රාජකාරී ඉටු කිරීමේදී සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට බලය ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටීන් නිරීක්ෂණය කිරීම සහතික කිරීම සහ ආයතනික පාලන කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සම්බන්ධයෙන් වගකිව යුතු සමාගම් ලේකම්ගේ සේවාවන්ට සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. සියලුම අධ්‍යක්ෂවරුන්ට ඉලෙක්ට්‍රොනික අවකාශයක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාළ අනුකමිටු පත්‍රිකා සඳහා ප්‍රවේශය ඇති අතර, ඒ මගින් අධ්‍යක්ෂවරුන්ට තොරතුරු කාලෝචිත සහ ආරක්ෂිතව ලබා දීම සහතික කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩල/කමිටු රැස්වීම්වල පාරිසරික බලපෑම අවම කරයි. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් වාර්තා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## මූල්‍ය වාර්තාකරණය

අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

# විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටුවට සමාගමේ මූල්‍ය තත්ත්වය නිවැරදිව නියෝජනය කරන බව සහතික කරමින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව අධීක්ෂණය කිරීම සඳහා මූලිකව වගකීමට බැඳී සිටී. ඊට අමතරව, මෙම කමිටුව සදාචාරාත්මක ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සමාගම ක්‍රියාත්මක වන බව සහතික කරයි. විගණන සහ අනුකූලතා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් මෙහෙයවනු ලබයි. සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි. අනුකූලතා සහ විගණන කාර්යයන් ද්විත්වයම විගණන සහ අනුකූලතා කමිටුව වෙත වාර්තා කරනු ලැබුව ද, ඒවායේ මෙහෙයුම් ස්වාධීනත්වය පැහැදිලි රාජකාරි වෙන් කිරීමක් තුළින් ආරක්ෂා කෙරේ.

විගණන හා අනුකූලතා කමිටුවට මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාව සහ බාහිර විගණන අධීක්ෂණය කිරීම ඇතුළුව සිය වගකීම් ඵලදායීව කරගෙන යාමට සමාගම ශක්තිමත් කරන මූල්‍යකරණය, විගණනය, සහ රක්ෂණයේ ප්‍රවීනත්වය සහිත ජ්‍යෙෂ්ඨ වෘත්තිකයින් සහය වේ.

## විෂය නිර්දේශය

SLICGL හී විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) විෂය නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩල විගණන සහ අනුකූලතා කමිටු ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇත. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (2023) මගින් ඒකාබද්ධව නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය" සහ "2021 දී නිකුත්කළ රජයට අයත් ව්‍යවසාය සමාගම් සම්බන්ධ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" ඇතුළුව විගණන සඳහා මඟ පෙන්වන මූලධර්ම සහ මනා පරිචයන් සමඟ පෙළ ගැසේ. මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාව සහ අභ්‍යන්තර හා බාහිර විගණනය සම්බන්ධයෙන් සිය අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට කමිටු සහය ලබා දේ. සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ එහි පාලන රාමුවේ ඵලදායිත්වය පිළිබඳ අඛණ්ඩතාව සහතික කිරීමට මෙවැනි කාර්යයන් සිදු කෙරේ. කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට නිරන්තව වාර්තාකරන අතර වසර පුරා සුදුසු පරිදි නිර්දේශ ලබා දේ. එමෙන්ම එය කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත ව්‍යාපාර අවදානම් කළමනාකරණය නියාමනය හා සම්බන්ධ වේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගවන අතර සිය කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිරතුරුවම වාර්තා ලබා දේ.

## කමිටුවේ රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ, කමිටුවේ රැස්වීම් දෙකක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කරනු ලබන අතර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද නිරතුරුව වාර්තා කරයි. ආරාධනය අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගී වේ.

2024 දී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත දක්වා ඇත:

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (2024 පෙබරවාරි 26 දින සිට කමිටුවේ සභාපති ලෙස පත් කර ඇත) | 02 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා (2022 අගෝස්තු 31 දින සිට 2024 පෙබරවාරි 26 දින සිට මේ දක්වා කමිටුවේ සභාපති ලෙස සේවය කර ඇත) | 02 |
| නිශාන්ත දයානන්ද මහතා | 02 |

*වාර්ෂික වාර්තාවේ දිනයට, පහත විධායක නොවන අධ්‍යක්ෂවරු විගණන සහ අනුකූලතා කමිටුවේ සේවය කර ඇත. ආර් පත්මප්‍රිය මහතා, ඩී තොටවත්ත මහතා සහ නිශාන්ත දයානන්ද මහතා.*

## අභ්‍යන්තර විගණනය

සුදුසුකම් සහිත වරලත් ගණකාධිකාරිවරයෙක් විසින් මෙහෙයවන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ආයතනය ක්‍රියාත්මක කරයි. විගණන කමිටුව අභ්‍යන්තර විගණන උපායමාර්ගය අනුමත කරන අතර, සිය ස්වාධීනත්වය සහතික කිරීමට සහ ඉහළ ප්‍රමිති පිළිපැදීමට අභ්‍යන්තර විගණන හා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය නිරන්තරව තක්සේරු කර අධීක්ෂණය කරයි. දෙපාර්තමේන්තුවට සිය රාජකාරි ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය බලය හා සම්පත් ලබා දෙන බව කමිටුව සහතික කරයි. උපලේඛනගත රැස්වීම්වලදී, අභ්‍යන්තර විගණක සැලැස්මේ ප්‍රගතිය නියාමනය කිරීමට සහ ප්‍රධාන සොයාගැනීම් ඇගයීමට අභ්‍යන්තර විගණන ප්‍රධානියාගේ වාර්තා කමිටුව සමාලෝචනය කරයි.

## බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් පත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයාට සහාය ලබා දීම සඳහා සුදුසුකම් ලත් විගණකයකු වශයෙන් Messrs BDO Partners යන සමාගම විගණකාධිපතිවරයා විසින් පත් කරන ලදී. ඊට අමතරව, බාහිර විගණක විසින් ලබාදෙන සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබීය.

## විගණන හා අනුකූලතා කමිටුවට තොරතුරු ලැබීම

විගණන සහ අනුකූලතා කමිටුවට කළමනාකාරීත්වයෙන් සහ බාහිර විගණකයන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බව කමිටුව සහතික වේ. මෙමගින් වගකීම් ඵලදායීව ඉටුකිරීමට විගණන සහ අනුකූලතා කමිටුව ශක්තිමත් කරයි.

## වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණයේ වර්ධනීය විශ්වාසය සහ එහි සැලකියයුතු බලපෑම සලකා බලමින්, සාධාරණ අගයන් තීරණය කිරීමේ දී භාවිත කරනු ලබන වැදගත් උපකල්පන විනිවිදව අනාවරණය කරන බවත්, සම්පූර්ණයෙන් සමාලෝචනය කරන බවත් සහ අවශ්‍ය පරිදි ඒවා ප්‍රශ්න කරන බවත් විගණන කමිටුව සහතික කරයි. ඊට අමතරව, හානිකරණය තක්සේරු කිරීම සඳහා පවතින ක්‍රියාපටිපාටි සතුටුදායක බව කමිටුව තහවුරු කරයි.

## ජාත්‍යන්තර ගිණුම්කරණ වාර්තාකරණ ප්‍රමිති (IFRS) යොදා ගැනිම

විගණන කමිටුව විසින් ආයතනය තුළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs) යොදා ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කරයි. කමිටුව විසින් නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මෙම ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සහ සංවර්ධනයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වරින් වර දැනුවත් කිරීම් සිදු කරයි.

## ස්වාධීන බාහිර උපදෙස්

විගණන කමිටුවේ ප්‍රඥප්තිය මගින් සුදුසු අවස්ථාවල දී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීම සඳහා අවසර ලබා දේ.

## අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාට සහ අනුකූලතා අංශයේ ප්‍රධානියාට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම් ට විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම්වලට ප්‍රවේශවීමට ඇති හැකියාව

අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුකූලතා ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම්ට විගණන හා අනුකූලතා කමිටුව වෙත සෘජු ප්‍රවේශයක් ඇති අතර, ඒ අනුව ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වගකිව යුතුය.

## විගණන නොවන සේවා

වසර තුළ, එවැනි සේවා ලබාදීම විගණකගේ ස්වාධීනත්වයට සහ විෂයමූලකත්වයට බලපෑමක් නොමැති බව සහතික කිරීමට බාහිර විගණක විසින් ලබා දෙන සියලුම විගණන නොවන සේවා කමිටුව ඇගයීමට ලක් කර ඇත.

## අනුකූලතා කාර්යය

ආයතනික අනුකූලතා කාර්යයට අනුකූලතා වැඩසටහන් මෙහෙයුම් සහ ආධාරක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අධීක්ෂණය පවරා ඇත. අනුකූලතා ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම් සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකවරුන්ගේ සහය ඇතිව අනුකූලතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අනුකූලතා නිලධාරී සහ විගණන සහ අනුකූලතා කමිටුව අතර වාර්තාකරණ ව්‍යූහය මගින් වසර තුළ ඇති විය හැකි සුවිශේෂී ගැටළු සහ අවදානම් ආමන්ත්‍රණය කරයි. වගකීම්සහගත නිලධාරීන් ලෙස නම්කළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සුවිශේෂී බැඳීම් සමඟ අනුකූලතාව තහවුරු කිරීම සඳහා වගවිය යුතුය.

පිරිවැය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ අනුකූලතාව සඳහා සමාගම "ස්වාධීන ආදර්ශයක්" යොදා ගෙන ඇති අතර ශක්තිමත් ස්වාධීන අනුකූලතා කාර්යයන් පවත්වා ගනී. එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකයින් ඵලදායී සහභාගිත්වය සහතික කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරයි.

සමාලෝචිත වසර තුළ, ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර සඳහා මනා පරිචයන් යොදා ගැනීමට අනුකූලතා කාර්යය ශක්තිමත් කරන ලදි. අනුකූලතා කාර්යය අමතර බරක් ලෙස නොව සමාගමේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස දකින බව සහතික කිරීමට සමාගම අනුකූලතා සංස්කෘතිය ආයතනය පුරා පෝෂණය කර ඇත.

## නිගමනය

පසුගිය වසර තුළ අභ්‍යන්තර විගණන අංශයේ සහ බාහිර විගණකයින්ගේ ඵලදායීත්වය හා ස්වාධීනත්වය සමඟ කමිටුව සෑහීමකට පත් වෙයි. එමෙන්ම, ඔවුන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම අනුමත කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය බව සලකා බලයි. ඊට අමතරව, බාහිර විගණකයින්ගේ වාර්තාවේ අනාවරණය කළ පරිදි අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලවීම සහතික කරමින් සමාගමේ අනුකූලතා රාමුව සම්බන්ධයෙන් කමිටුව සෑහීමට පත් වේ. සමාලෝචිත වසර තුළ හඳුනාගත් අනුකූල නොවීමේ සිදුවීම් සඳහා නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති – විගණන හා අනුකූලතා කමිටුව
2025 ජූනි 03

# ආයෝජන කමිටු වාර්තාව

## ආයෝජන කමිටුවේ අරමුණ

ආයෝජන කමිටුවේ අරමුණුවලට දැඩි අවදානම් සහ නියාමන පරාමිති තුළ ආයෝජන ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීම, ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ ආයෝජන කටයුතු කාර්යක්ෂම, ඵලදායී සහ කාලීනව සිදු කිරීම, සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් පිළිපැදිම ඇතුළත් වේ.

ආයෝජන කමිටුව ක්‍රියාත්මක කිරීමට පෙර සියලු ආයෝජන නිවාරණය කරයි. ආයෝජන කමිටුව ද්‍රවශීලතා අවදානම්, ණය අවදානම්, මිල අවදානම්, සහ සංකේන්ද්‍රණ අවදානම් වැනි අවදානම්වලට නිසි අවධානය යොමු කරයි.

## ආයෝජන උපායමාර්ග

2024 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වාතාවරණය ප්‍රධාන දර්ශක කිහිපයකින් සැලකියයුතු පුනරුත්ථාපනයයක් සලකුණු කරන ලද අතර තියුණු ආර්ථික ආපදා කාලසිමාවකින් පසු සැලකියයුතු ඉහළ යාමක් පෙන්වන ලදි. දළ දේශීය නිෂ්පාදිතයේ 5%ක ප්‍රසංසනිය වර්ධනයක් ජාතියට දැකගත හැකි වූ අතර, එය පසුගිය හැකිලීම්වලට මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ වේ. මූල්‍ය විනයේ ප්‍රතිඵල ලබා ගැනීම රජයේ ආදායම් වැඩිවීමේ ස්ථාවරත්වය හා IMF ඉලක්කවලින් ඔබ්බට මූලික ශේෂයේ අතිරික්තයක් සාක්ෂාත්කර ගැනිම සමඟ ආරම්භ විය. උපකාරී මූල්‍ය ප්‍රතිපත්ති, පොලී අනුපාතවල ක්‍රමානුකූල අඩුවිමකට හේතු වූ අතර ණය ප්‍රසාරණයේ මුල් සංඥා පෝෂණය කර ඇත. තවද, බාහිර අංශය වර්ධනීය සංචිත, වැඩිවූ ප්‍රේෂණ, සහ සංචාරක ඉපයීම් සහ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත්වීම සමඟ ශක්තිය පෙන්වන ලදී. ආර්ථික ප්‍රගතියේ මෙම කාලසීමාව ජනාධිපතිවරණය නිමවිම සමඟ එකට සිදු වූ අතර ඉන් නව පරිපාලනයක් බලයට ගෙන එන ලදී.  මෙම අත්‍යවශ්‍ය සංවර්ධනයන්ට අනුගත වෙමින්, ශ්‍රී ලංකාව බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයේ සැලකියයුතු නිමකිරීම සමඟ සිය ආර්ථික ප්‍රතිසාදන ගමන් මගේ තීරණාත්මක සන්ධිස්ථානයක් සාක්ෂාත් කර ගෙන ඇති අතර එය ඉහළ මූල්‍ය ස්ථාවරත්වයට හා අලුත්කළ ආයෝජන විශ්වාසයට මඟ පාදන ලදි. 2024 දී බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයේ නිමකිරීම ආයෝජකයින්ට ශක්තිමත් විශ්වාසයක් ලබා දුන් අතර, රටේ ස්වෛරී ශ්‍රේණිගතකිරීම එහි පැහැර හැරීමේ තත්ත්වයේ සිට CCC+ (ෆිට්ච් ශ්‍රේණිගතකිරීම) දක්වා ඉහළ දැම්මක් සිදු විය. මෙය 2025 සිට ඉදිරියට ස්වෛරී බැඳුම්කර හිමියන්ට පොලිය සහ මුල්මුදල ගෙවීම් ආපසු ආරම්භ කිරීම සමඟ සිදුවනු ඇත.

ආයෝජන කමිටුවේ සාමාජිකයින්ගේ දැනුම, පලපුරුද්ද සහ ප්‍රවිනතාව SLIC සාමාන්‍ය රක්ෂණය සඳහා අපේක්ෂිත ආයෝජන ආදායමට වඩා ඉහළ ආදායමක් ඉපයීමට ක්‍රියාවට නංවන ලදී. ආයෝජන කමිටුව ගන්නා කඩිසර තීරණ ස්ථිර ආදායම් උපකරණවල ආකර්ෂනිය ප්‍රතිඵල සහතික කිරීමට පහසුකම් සලසන ලදී. වත්කම්වල පවත්නා කාලය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරිමේ ප්‍රතිලාභ ලබා ගැනීමට දීර්ඝ කරන ලදි. ස්කන්ධ වෙළෙඳපොලේ ශක්තිමත් නැවත නැගිටීම ආයෝජන ආදායම තුළ ස්ථිර වර්ධනයට හේතු විය.

## නියාමනය සහ පාලනය

ආයෝජන කාර්යසාධනයන් නිරන්තරව නියාමනය කෙරේ. කමිටුව බාහිර සාධකවල සංවර්ධනයන් පිළිබඳ උනන්දුවෙන් සිටින අතර අවදානම් මාර්ගෝපදේශ තුළ ආයෝජන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඒවා භාවිතා කිරීම කෙරෙහි අවධානයෙන් සිටී. ආයෝජන ඉදිරිපෙළ කාර්යාලය, මැදපෙළ කාර්යාලය සහ පසුපෙළ කාර්යාලය විසින් කාර්යක්ෂම ආයෝජන ක්‍රියාවලියට පහසුකම් සැපයීමට විචක්ෂණව සම්බන්ධීකරණය කරයි.

## සමාලෝචනයට යටත් වසර – ආයෝජන කටයුතුවල සාරාංශය

සාමාන්‍ය රක්ෂණ අරමුදල රුපියල් බිලියන 20.4 ක් විය.

## ආයෝජනයේ සුරක්ෂිතබව සහ ස්ථාවරත්වය

ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා කළඹ විවිධාංගීකරණය ආයෝජන කමිටුවේ ප්‍රධාන තේමාවකි. පහත සඳහන් ප්‍රස්ථාරවලින් 2024 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ අරමුදලේ ආයෝජන වත්කම් වෙන් කිරීම පැහැදිලි කරයි. (වටිනාකම් වෙළෙඳපොළ වටිනාකම් මත පදනම් වේ).

### 2024 දෙසැම්බර් 31 දිනට අංශමය වෙන් කිරීම – ලැයිස්තුගත ස්කන්ධ සාමාන්‍ය අරමුදල




- A – 91.84 මූල්‍ය
- B – 0.00 සෞඛ්‍යාරක්ෂාව
- C – 2.03 කර්මාන්ත
- D – 0.18 උපයෝගිතා
- E – 0.16 විදුලි සන්නිවේදන සේවා
- F – 4.03 පරිභෝජන භාණ්ඩ
- G – 1.75 ද්‍රව්‍ය
- H – 0.01 ගනුදෙනුකාර අභිමතිය
- I – 0.00 නිශ්චල
- J – 0.00 බලශක්තිය

## ආයෝජන ආදායම

වර්ෂය සඳහා මුළු ආයෝජන ආදායම සාමාන්‍ය රක්ෂණය සඳහා රු. බිලියන 3.9 ක් විය. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ ආයෝජන ආදායම සාමාන්‍ය රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 16.4% ට වැඩිය.

## වත්කම් හා වගකීම් කළමනාකරණ ප්‍රතිෂ්ඨාවන්

ආයෝජන කමිටුව වත්කම් හා වගකීම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරයි. අරමුදලට හිතකර නොගැලපීම් සිදුවීම ප්‍රධාන අවධානයක්ව පවතී. ආයෝජන කමිටුව පොලී අනුපාත 2024 දී පහත යමින් පැවති බැවින් දිගුකාලීන වත්කම්වල ආයෝජනය කිරීමට දැනුවත්ව තීරණය කරන ලදී. ස්කන්ධය හා ස්ථිර ආදායම ආයෝජන ආදායම සඳහා යහපත් ප්‍රතිඵල ලබාදෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර වනු ඇති බවට සහ ශක්තිමත් ප්‍රතිසාධනයක් පෙන්වනු ඇති බවට අපේක්ෂා කරමු. ආයෝජන කමිටුව ඉදිරි වසරවල ඉහළම මට්ටමේ සාක්ෂාත් කර ගැනීම් ලබාගැනීමට උත්සාහ කරනු ඇත.



**රවීන්ද්‍ර පත්මප්‍රිය**

සභාපති – ආයෝජන කමිටුව

2025 ජූනි 03

# අවදානම් කළමනාකරණ වාර්තාව

**SLICGL විසින් පුළුල් අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කරමින් සම්ප්‍රදායික මූල්‍ය පාලනයෙන් ඔබ්බට ප්‍රගතිය ලබා ඇති අතර එම රාමුව තොරතුරු ආරක්ෂාව, තොරතුරු තාක්ෂණය, තෙවන පාර්ශවීය සබඳතා, පාලන අවදානම, සහ නියාමන අනුකූලතාව ඇතුළු විවිධ තීරණාත්මක පාලන තන්ත්‍ර ආමන්ත්‍රණය කරයි.**

සිය උපායමාර්ගික, මෙහෙයුම් සහ ව්‍යාපාරික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට මෙන්ම තිරසාර ව්‍යාපාර වටිනාකම ලබාදීමට අත්‍යවශ්‍ය බව හා ඵලදායී අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය බව සමාගම හඳුනා ගනී. ඒ අනුව, සමාගම එහි මූලික ව්‍යාපාර හා උපායමාර්ගික අවදානම් ක්‍රමානුකූල හඳුනා ගැනීම, තක්සේරු කිරීම, සහ අවම කිරීමට පහසුකම් ඇති කිරීම සඳහා SLICGL විසින් ISO 31000 ප්‍රමිතිය සමඟ අනුකූලවන ව්‍යුහගත හා ශක්තිමත් රාමුවක් සංවර්ධනය කර ඇත.

**මෙම රාමුව ප්‍රස්ථාරිකව පහත දක්වේ:**




තක්සේරු අදියර තුළ, අවදානම සිදුවීමේ විභවතාව/හැකියාව සහ බලපෑම සමස්ථ අවදානම් වර්ගය තීරණය කිරීමට තක්සේරු කරනු ලැබේ. අවදානම සිදුවීමේ හැකියාව සහ එහි විභව බලපෑම සමස්ථ අවදානම් මට්ටමට අදාළ වන ආකාරය පෙන්වන අවදානම් අනුකෘතියක් භාවිතයෙන් මෙය විස්තර කළ හැකිය.

## අවදානම් පාලනය

SLICGL හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණය අධීක්ෂණයේදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුවේ සහය ලැබේ. අවදානම් කළමනාකරණය SLICGL හි ආයතනික උපායමාර්ගයේ හරයට ඇතුළත් කිරීමේදී මෙම අනු කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම අනු කමිටුවේ ප්‍රධාන වගකීම්වලට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි SLICGL හි උපායමාර්ගය මෙන්ම එහි නිශ්චිත අවදානම් රුචිය සහ දරා ගැනීමේ මට්ටම් සමඟ පෙළ ගැසී ඇති බව සහතික කිරීම ඇතුළත්ය. අවදානම් කළමනාකරණ අනු කමිටුවට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන්ට අදාළ  වගකීම් ක්ෂේත්‍රවල අවදානම් අධීක්ෂණයට සහයවීම සඳහා විගණන සහ අනුකූලතා කමිටුව සහ ආයෝජන කමිටුව වැනි වෙනත් විශේෂ අනු කමිටු පත් කර ඇත.

## පාලන ව්‍යුහය

පහත දක්වා ඇති පරිදි වෙනස් සහ පැහැදිලිව හඳුනාගත් ව්‍යාපාර මාර්ග හතරක් පවත්නා අවස්ථාවල අවදානම් කළමනාකරණය ශක්තිමත් අදියරයක පවතී:

අ. පළමු ආරක්ෂක මාර්ගය ලෙස "සැබෑ අවදානම් හිමිකරුවන් විසින් මෙහෙයුම් කළමනාකරණය" (අවදානම හිමි සහ කළමනාකරණය කරන)

ආ. දෙවන ආරක්ෂක මාර්ගය ලෙස "මූල්‍ය පාලනය, අවදානම් පාලනයන්, සහ අනුකූලතාව" (අවදානම අධීක්ෂණය)

ඇ. තෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස "අභ්‍යන්තර විගණනය" (ස්වාධීන සහතිකය)

ඈ. සිව්වන ආරක්ෂක මාර්ගය ලෙස "බාහිර විගණනකවරු සහ නියාමකයින්" (විධිමත් සන්නිවේදනය)

සිව්වන ආරක්ෂක මාර්ග සම්බන්ධය අභ්‍යන්තර විගණනකවරු, බාහිර විගණකවරු සහ අධීක්ෂණ බලධාරීන් අතර වැඩිකළ සහයෝගිතාව ඇති කරයි. රක්ෂණ අංශයේ සංදර්භය තුළ, නියාමක අධීක්ෂණය මූලිකවම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරයි.

විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් විගණන කාර්යයන්හී ස්වාධීනත්වය සහතික කරන අතර අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම මගින් අවදානම් කළමනාකරණ න්‍යාය පත්‍රයේ අඛණ්ඩතාව සුරක්ෂිත කර එය වෙනස්ව පවතින බව සහ විගණන ප්‍රමුඛතාවන්ට යටත්ව නොමැති බව සහතික කරයි.




## අභ්‍යන්තර පාලන රාමුවේ අවදානම් තක්සේරුව

සමාගම ඵලදායී අවදානම් කළමනාකරණ ව්‍යවහාර යොදා ගැනීම ස්ථිරව ප්‍රවර්ධනය කරමින් සහය වී ඇත. මෙම අරමුණ අත්කර ගැනීම සඳහා, සමාගම අභ්‍යන්තර පාලන රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර එය බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ මූලධර්ම 13 සමඟ පෙළ ගැසේ.

## නුබුන්වත් තත්ත්වය

SLICGL හි ශක්තිමත් අවදානම් කළමනාකරණ පදනම් 2024 දී අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් අවකාශයක් ලබා දී ඇත. SLICGL විසින් 2024 දී අවශ්‍ය මට්ටමට වඩා ඉහළින් අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය අඛණ්ඩව පවත්වා ගෙන ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2023 මූල්‍ය වසර තුළ පැවති 226.6%ට සාපේක්ෂව 2024 මූල්‍ය වසරේ 277.3%ක් විය.

## වර්තමාන ආර්ථික අංගවල බලපෑම්

පවත්නා ආර්ථික තත්ත්වයන් රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි ප්‍රධාන බලපෑමක් ඇති කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සෑම අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවකදීම ශීර්ෂ උද්ධමනය, ආහාර උද්ධමනය, රැකියාවේ වෙනස්වීම්, මූල්‍ය ප්‍රතිපත්තිය, වෙළෙඳපොළ පොළී අනුපාත සහ රජයේ සුරැකුම්පත් මත ඉපැයීම, මූල්‍ය හිඟය, රජයේ ණයගැනීම් සහ ණය සේවා ගෙවීම්, රුපියල අවප්‍රමාණය සහ ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට අනුව රුපියලේ හුවමාරු අනුපාතිකයේ වෙනස්වීම්, සංචාරක ඉපැයීම්, සේවක ප්‍රේෂණ, සහ වෙනත් ආර්ථික විචල්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් සමඟ, ප්‍රධාන ආර්ථික සාධකවල බලපෑම කෙරෙහි සාකච්ඡාවන් තුළින් ඇතුළත් කෙරේ.

ඊට අමතරව, අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයකින්, අපි ප්‍රධාන අංශ එනම් මූල්‍ය, ආයෝජනය, ජීවිත, ජීවිත නොවන සහ වෙනත් දෙපාර්තමේන්තු වැනි ප්‍රධාන අංශ සමඟ මෙම අවදානම් සාධක ආමන්ත්‍රණය කරන උපායමාර්ග සකස් කිරීම සඳහා සමීපව කටයුතු කරන්නෙමු. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව ද මූල්‍ය ප්‍රතිපත්තිය සහ මූල්‍ය කොන්දේසිවල ක්‍රමික ලිහිල්වීම සහ ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයට සහයවීම සඳහා තීරණාත්මක බාහිර අංශයේ කාර්යසාධනය මඟින් සහයවන ආර්ථිකයේ පුනරුත්ථාපනය හඳුනා ගනී.

## සාමාන්‍ය රක්ෂණ අවදානම

2016 ජනවාරි 01 සිට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විධානමය අවශ්‍යතාව පරිදි, SLICGL විසින් RBC පාලන තන්ත්‍රය යටතේ අවශ්‍ය අවදානම පදනම් ප්‍රාග්ධන නුබුන්වත් රාමුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලදී.

මේ යටතේ, හිමිකම් වගකීම හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව හා අවදානම් ආන්තිකයේ සංයෝගය ලෙස අර්ථ දැක්වේ. වාරික වගකීම අවදානම් ආන්තික සමඟ කල් නොඉක්මවූ අවදානම් සංචිතයේ මධ්‍යම ඇස්තමේන්තුව ලෙස අර්ථ දක්වේ.

## සංචිත ස්ථාපිත කිරීමේ විචක්ෂණතාව

වාරික වගකීම සහ හිමිකම් වගකීම නමින් සාමාන්‍ය ආයුගණකමය සංචිතයන් හි ප්‍රධාන සංරචකයන් දෙකක් ඇත. SLICGL 75% ක විශ්වාස මට්ටමක හිමිකම් වගකීමක් (හිඟ හිමිකම් සංචිතය සඳහා හා දරන ලද එහෙත් (ප්‍රමාණවත්ව) වාර්තා නොවූ හිමිකම්) ස්ථාපිත කර ඇති අතර එයට හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව, හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරණ වියදම් සහ මධ්‍යම ඇස්තමේන්තු වගකීමේ අහිතකර අපගමනය හා ප්‍රතිපාදන හා හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරණ වියදම් සඳහා ප්‍රතිපාදන අන්තර්ගත වේ. වාරික හිමිකම ද 75% ක විශ්වාස මට්ටමක ස්ථාපිත කර ඇති අතර එය, ගතවූ හදිසි අනතුරු වර්ෂ දෙකක් හෝ තුනක් සඳහා වන මධ්‍යම ඇස්තමේන්තු අවසාන අලාභ අනුපාතයෙහි සාමාන්‍යය අරගනිමින් තීරණය කරනු ලබන මධ්‍යම ඇස්තමේන්තු කල් නොපිරුනු අවදානම් සංචිතය මත පදනම් වී ගණනය කරන අතර, නිරාවරණය ලෙස අතිරේක වෙනස්වීම් විදහා දක්වන පරිදි අහිතකර අපගමනයන් සඳහා වන වෙන් කිරීම සිදුවීමට නියමිතය.

## හිමිකම් සංවර්ධන තොරතුරු

ප්‍රතිරක්ෂණයන් ශුද්ධ ඓතිහාසික ජීවිත නොවන සංචිතයන් හි වෙනස්වීම් පහත වගුවෙහි දක්වා ඇත. අදාළ වසරේ සහ ඉකුත් වසරවල දරන ලද අලාභ සඳහා ඇස්තමේන්තුගත අනාගත ගෙවීම් ප්‍රමාණය නියෝජනය කරන එක් එක් ශේෂ පත්‍ර දිනය අනුව නොගෙවූ අලාභ සහ අලාභ ගැලපීම් වියදම් සඳහා වන ඇස්තමේන්තුගත දළ සංචිත වගුවෙහි ඉහළ පෙළෙහි පෙන්නුම් කරයි. එක් එක් වසර අවසානයේ දී ස්ථාපිත සංචිත සඳහා එක් එක් පසුව එන වසර වල ගෙවන ලද සමුච්චිත වටිනාකම් වගුවෙහි සමුච්චිත ගෙවීම් කොටසේ දැක්වේ. ඒ ආකාරයෙන්ම, ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය සහ මූල්‍ය වර්ෂය අවසානයේ දී ශුද්ධ හිඟ තත්ත්වය පිළිබඳ තොරතුරු සමුච්චිත වාර්තා ගතවූ අලාභ කොටසෙහි දක්වා ඇත.

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|
| අලාභ සහ අලාභ ගැලපීම් කිරීමේ වියදම් සඳහා දළ සංචිත | **9,602** | 9,675 | 11,856 | 9,549 | 7,862 | 7,311 |
| ප්‍රතිරක්ෂණ ආපසු ලබාගැනීම් | **(1,740)** | (1,656) | (3,104) | (1,888) | (1,395) | (1,061) |
| අලාභ සහ අලාභ ගැලපීම් කිරීමේ වියදම් සඳහා ශුද්ධ සංචිත | **7,862** | 8,018 | 8,751 | 7,661 | 6,466 | 6,250 |
| **දෙසැම්බර් 31 දිනට සමුච්චිත ගෙවීම්:** | | | | | | |
| වසරකට පසු | **7,984** | 7,948 | 6,790 | 6,995 | 5,371 | 7,723 |
| වසර දෙකකට පසු | **–** | 9,949 | 9,271 | 9,312 | 7,043 | 9,451 |
| වසර තුනකට පසු | **–** | – | 9,695 | 9,537 | 7,093 | 9,589 |
| වසර හතරකට පසු | **–** | – | – | 9,624 | 7,170 | 9,666 |
| වසර පහකට පසු | **–** | – | – | – | 7,211 | 9,724 |
| වසර හයකට පසු | **–** | – | – | – | – | 9,772 |
| **දෙසැම්බර් 31 දිනට වාර්තාගත සමුච්චිත ගෙවීම්:** | | | | | | |
| වසරකට පසු | **9,782** | 9,651 | 8,893 | 8,980 | 6,493 | 9,153 |
| වසර දෙකකට පසු | **–** | 10,246 | 9,682 | 10,015 | 7,255 | 9,718 |
| වසර තුනකට පසු | **–** | – | 10,025 | 10,030 | 7,322 | 9,852 |
| වසර හතරකට පසු | **–** | – | – | 9,874 | 7,367 | 9,898 |
| වසර පහකට පසු | **–** | – | – | – | 7,367 | 9,881 |
| වසර හයකට පසු | **–** | – | – | – | – | 9,907 |

*ඉහත සංඛ්‍යා රුපියල් මිලියනවලින් දක්වා ඇත.*

## සාමාන්‍ය රක්ෂණ අවදානම සඳහා සංවේදිතා විශ්ලේෂණ

පහත වගුවෙන් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායමේ සංවේදීතාව සහ සියයට දශම එකකින් පියවීමට ඇති වාර්තාකළ හිමිකම්වල හානිකර වර්ධනයේ ප්‍රතිඵල ලෙස ශුද්ධ වත්කම් වල සංවේදීතාව පෙන්නුම් කරයි. එවැනි වර්ධනයක් රක්‍ෂිත අවස්ථාවන් වැඩි වාර ගණනක දී සිදු වීමෙන් හෝ ප්‍රතිඵල හිමිකම් වල බරපතලකමේ වර්ධනයකින් හෝ වාර ගණනේ හෝ බරපතලකමේ සංයෝජනයෙන් පැන නැගිය හැකිය. සංවේදීතාවලින් එවැනි සිදුවීමක සම්භාවිතාවයක් සඳහන් නොකරන අතර ප්‍රතිරක්‍ෂණයේ කවර හෝ රේඛීය නොවන බලපෑමක් සලකා බැලීමක් නොකරයි.

මෙහිදී මධ්‍යම නිමාන වැය කරන ලද නමුත් (ප්‍රමාණවත් තරම්) වාර්තා නොකළ IBN(E)R වගකීම් වලට නොගෙවූ වගකීම් වටිනාකම් සමඟ සියයට දශම එකකින් බලපෑමක් තිබෙන බව සහ වගකීම් පරිහරණ වියදම් (CHE) කෙරෙහි බලපෑමක් නොමැති බව අපි උපකල්පනය කරන්නෙමු. පහත සඳහන් වගුවේ සංවේදීතා විශ්ලේෂණය ඉදිරිපත් කිරීමේදී යොදාගත් උපකල්පන මත පදනම්ව වාර්තාගත නොවූ වගකීම්වල සෑම අතිරේක සියයට දශම එකක වැඩි වීමක් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායම සහ ශුද්ධ වත්කම් මත රේඛීය බලපෑමක් ඇති කරයි. ඊට අමතරව, සමාගම ප්‍රතිරක්‍ෂණ ගිවිසුම්වල රේඛීය නොවන බලපෑම් සැලකිල්ලට ගනිමින් ආන්තික වාතාවරණ ඇගයීම තුළින් රක්‍ෂණ අවදානම් නියමනය කරයි.

| | උපකල්පනවල වෙනස % | වාර්තාවේ තිබෙන ගෙවීමට ඇති දළ හිමිකම් රු. මිලියන | වාර්තාවේ තිබෙන ගෙවීමට ඇති ශුද්ධ හිමිකම් රු. මිලියන | දළ වගකීම් මත බලපෑම රු. මිලියන | ශුද්ධ වගකීම් මත බලපෑම රු. මිලියන | බදුකරණයට පෙර ලාභය මත බලපෑම රු. මිලියන | කොටස් ප්‍රමාණය මත බලපෑම (බදුකරණයට පසුව) රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| 2024 දෙසැම්බර් 31 | +1 | 6,783 | 5,121 | 90 | 72 | (72) | (50) |

## ආයෝජන අවදානම් කළමනාකරණය

ආර්ථික අර්බුදයෙන් පසු බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණය මැතිවරණ වසරක් වූ 2024 ප්‍රධාන කාරණය විය. එබැවින් අවිනිශ්චිතතාවන් හේතුවෙන් උච්ඡාවචනය 2024 මුල් කොටසේදී වෙළෙඳපොල තේමාව වී තිබීම දක්නට විය. එකී කාලසීමාව තුළ මෙම සාධක නිරාකරණය වූයෙන් වසරේ දෙවන භාගයේදී ආර්ථිකය ස්ථාවරවීම සහ වර්ධනය වීමේ සංඥා පෙන්වන ලදී. SLIC සමූහය ආයෝජන ආදායම උපරිම කිරීමට වැඩකළ අතර එම කාලසීමාව තුළ වෙළෙඳපොල වෙනස්වීම සිය වාසියට භාවිතා කරන ලදී.

ආයෝජන කමිටුව මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරිමේ අපේක්ෂාවන් හේතුවෙන් ස්ථිර ආදායම් උපකරණවල කාර්ය දීර්ඝ කිරීමට කටයුතු කළ අතර, වෙළෙඳපොල යථාතත්ත්වයට පත් වූ  බැවින් ඉහළ යාමේ විභවතාවක් තිබුණු සිය කළඹ තුළ ස්කන්ධ කවුළුවල ආයෝජනය පවත්වා ගන්නා ලදී. ආයෝජන අවදානම් කළමනාකරණය උපරිම ආරක්ෂාව හා විචක්ෂණභාවය සමඟ සිදු කරන ලදී.

ආයෝජන කළඹ ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා අඛණ්ඩව විවිධාංගීකරණය කරන ලදී. ද්‍රවශීලතාව, ණය, සංකේන්ද්‍රණය හා ප්‍රතිආයෝජන අවදානම්වලට ආයෝජන කමිටුවේ නිසි සැලකීම ලැබුණි.

ආයෝජන තීරණ ගැනීම ආදායම කඩිසර හා කාර්යක්ෂම වූ බැවින් ආයෝජන ආදායම තවදුරටත් ඉහළ අගයන් වාර්තා කර ඇත.

අවදානම් කළමනාකරණ මූලධර්ම සහ අදාළ IRCSL මාර්ගෝපදේශ දැඩිව පිළිපැදීම නියාමන අවදානම් අවම කිරීමට උපකාරි විය.

## වෙළෙඳපොල අවදානම

### පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු පොලී අනුපාතවල හෝ ඵලදා වක්‍රයේ හැඩයේ වෙනස්වීම් ආයෝජනයක හෝ මූල්‍ය තත්ත්වයේ වටිනාකමට සෘණාත්මකව බලපෑමේ අවදානමයි. එය බැඳුම්කර සහ වෙනත් ස්ථිර ආදායම සුරැකුම්පත් සඳහා අදාළ වන නමුත් එය යම් ප්‍රමාණයකට ණය, ඉතුරුම් හා කොටස්වලට පවා බලපෑම් කළ හැකිය. හැකි සෑම අවස්ථාවකදීම, SLICGL පහලයන පොලී අනුපාතවලට අනුව යමින් වඩා දිගුකාලීන වත්කම්වල දැනුවත්ව ආයෝජනය කරන ලදී.

### ප්‍රතිආයෝජන අවදානම

ප්‍රතිආයෝජන අවදානම යනු අනාගත මුදල් ප්‍රවාහයන්, බැඳුම්කරයකින් ලැබෙන කූපන් ගෙවීම් හෝ ප්‍රධාන ආපසු ගෙවීම් වැනි, මුල් ආයෝජනයට වඩා අඩු පොලී අනුපාතයකට නැවත ආයෝජනය කිරීමට සිදුවීමේ අවදානමයි. වසර තුළ පොලී අනුපාත පහත වැටුණ බැවින් සහ දැකියහැකි අනාගතයක් තුළ අඩු මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින් ප්‍රතිආයෝජන අවදානම ඉහළින් පැවතුණි.

### විනිමය අනුපාත අවදානම

විනිමය අවදානම හෝ විදේශ විනිමය අවදානම ලෙසින්ද හඳුන්වන හුවමාරු අනුපාත අවදානම යනු විදේශ විනිමය හුවමාරු අනුපාතවල වෙනස්වීම් ආයෝජනයක, වත්කමක හෝ වගකීමක වටිනාකම කෙරෙහි සෘණාත්මක බලපෑමක් සිදුවීමේ අවදානමයි.

2024 වසර තුළ, එක්සත් ජනපද ඩොලරය ශ්‍රී ලංකාවේ රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය. කෙසේවෙතත්, මෝටර් රථ ආනයන වැඩි වනු ඇති බවට අපේක්ෂා කලද, ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රතිසාධනය වන බැවින් හා විදේශිය ආයෝජන හා සංචාරක කර්මාන්තයේ ආදායම වැඩිවන බැවින් එක්සත් ජනපද ඩොලරයේ 2025 වසර තුළ ස්ථාවරව පවතිනු ඇත.

### කොටස් අවදානම

කොටස් අවදානම යනු ස්කන්ධවල වටිනාකම පහත වැටීම හේතුවෙන් මුදල් අහිමිවීමේ අවදානමයි.

පූර්ව මැතිවරණ අවිනිශ්චිතතා නිරවුල් වූ බැවින් හා ආර්ථිකය ප්‍රතිසාධනයට ඇතුළත් වූ බැවින් 2024 තුළ ශ්‍රී ලංකාවේ දර්ශක දෙකම සැලකියයුතු ලාභ වාර්තා කළේය.

SLICGL පහත දක්වා ඇති පරිදි විවිධාංගීකරණය තුළින් ක්‍රමානුකූල නොවන අවදානම අඩු කර තිබුනද, සමස්ථ වෙළෙඳපොලට ආවේනික අවිනිශ්චිතතාව වන ක්‍රමානුකූල අවදානමට ස්කන්ධ ආවේනිකව නිරාවරණය වේ.

**අංශ සඳහා වෙන් කිරීම – ලැයිස්තුගත කොටස් 2024 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ අරමුදල**



## ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු ආයෝජන වත්කමක් එහි මිලට සැලකියයුතු බලපෑමක් නොමැතිව ඉක්මණින් මිලදී ගැනීමට හෝ විකිණීමට නොහැකි වීමේ අවදානමයි.

SLICGL හි වත්කම් සමූහයෙන් විශාල ප්‍රමාණයක් භාණ්ඩාගාර බැඳුම්කර වැනි වඩා ඉහළ ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කෙරේ.

**කල්පිරීමේ පැතිකඩ – 2024 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ අරමුදල**




## ණය අවදානම

ණය අවදානම යනු කූපනයක් හෝ මුල් මුදල මත බැඳීම හිඟ වන අවස්ථාවේ ණයකරු විසින් ණය මුදලක් ආපසු ගෙවීම පැහැර හැරීමේ අවදානමයි. දැඩි අභ්‍යන්තරව සකස් කළ ණය ශ්‍රේණිගතකරණ නිර්ණායක SLICGL හි ආයෝජන පාලනය කරයි.

## සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු තනි ආයෝජනයක්, අංශයක්, ණයකරුවෙක්, හෝ භූගෝලීය ප්‍රදේශයක් කරා වඩා වැඩි නිරාවරණය හේතුවෙන් ඇතිවන අලාභ අවදානමයි. සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා ආයෝජන ප්‍රමාණවත් ලෙස බෙදා හැර ඇති බවට ආයෝජන කමිටුව සහතික කරයි.

## තොරතුරු තාක්ෂණ සන්නිවේදන අවදානම් කළමනාකරණය

තොරතුරු තාක්ෂණ සන්නිවේදන අවදානම් කළමනාකරණයට තොරතුරු තාක්ෂණ පද්ධති සහ ක්‍රියාවලි හා බැඳුණු අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අවම කිරීම සම්බන්ධ වේ. මූල්‍ය සහ පෞද්ගලික දත්ත සහ ගනුදෙනුවල තීරණාත්මක ස්වභාවය හේතුවෙන්, දත්තවල අඛණ්ඩතාව, විශ්වාසනීයත්වය, ලබාගතහැකිවීම, සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කිරීමට තොරතුරු තාක්ෂණයෙහි ඵලදායී අවදානම් කළමනාකරණය ඉතා වැදගත් වේ. අපි වෙනස්වන තර්ජන, තාක්ෂණයන්, සහ ව්‍යාපාර අවශ්‍යතා මත පදනම් වී නිරන්තරයෙන් අවදානම් කළමනාකරණ උපායමාර්ග, ප්‍රතිපත්ති, සහ පාලනයන් සමාලෝචනය කර යාවත් කරමු.

තොරතුරු තාක්ෂණ සන්නිවේදන අවදානම් කළමනාකරණය වර්ධනය සඳහා අපගේ ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර සහ උපායමාර්ග:

1. **අවදානම් තක්සේරු කිරීම:** ශක්තිමත් රාමුවක් ස්ථාපිත කර ඇති අතර තොරතුරු තාක්ෂණ පද්ධති, යෙදුම් හා ක්‍රියාවලි හා බැඳුණු විභව උවදුරු, තර්ජන හා අවදානම හඳුනා ගැනීමට නිරන්තර අවදානම් තක්සේරු කිරීම් පැවැත්වීම. මෙයට දෘඩාංග, මෘදුකාංග, ජාලය සහ දත්ත ගබඩා විසඳුම්වල ආරක්ෂාව ඇගයීම ඇතුළත්ය.
2. **සයිබර් ආරක්ෂක ක්‍රියාමාර්ග:** අනවසර පිවිසීම, දත්ත කඩවීම්, malware, phishing ප්‍රහාර සහ වෙනත් සයිබර් තර්ජන වලින් ආරක්ෂාවීමට ශක්තිමත් සයිබර් ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. වෙබ් යෙදුම් ආරක්ෂා කිරීමට මේඝ පදනම් WAF හා අභ්‍යන්තර WAF, SOC කළමනාකරණය කරන 24x7 සමඟ දීර්ඝකළ සොයාගැනීමේ සහ ප්‍රතිචාර (XDR) විසඳුම, වැඩිකළ Spam Gateway විසඳුම සහ අඛණ්ඩ උවදුරු හා විනිවිද පරීක්ෂණය වැනි විවිධ ආරක්ෂක ක්‍රියාමාර්ග ඇත.
3. **අනුකූලතා කළමනාකරණය:** රක්ෂණ ක්ෂේත්‍රයෙහි තොරතුරු ආරක්ෂාව සහ සයිබර් ආරක්ෂාවට අදාළ නියාමන අවශ්‍යතා සහ ක්ෂේත්‍රයේ ප්‍රමිති සමඟ අපි යාවත්කාලීනව සිටිමු. 2023 දී අපි ISO/IEC 27001:2013 සහතිකකරණය රැකගත් අතර, එය තොරතුරු ආරක්ෂාව තුළ විශිෂ්ටත්වය පිළිබඳ අපගේ නොසැලෙන අඛණ්ඩව ලුහුබැඳීම සඳහා සාක්ෂියකි. දැනට ITSM සඳහා ISO 20000 හා රැකගැනීමට යාවත් කිරීම් සිදු කරමින් සිටිමු.
4. **සිදුවීම් ප්‍රතිචාර සැලැස්ම:** තොරතුරු තාක්ෂණ ආරක්ෂක සිදුවීම් සහ දත්ත කඩවීම්වල බලපෑම ඵලදායීව කළමනාකරණය කර අවම කිරීම සඳහා සිදුවීම් ප්‍රතිචාර සැලැස්මක් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී. මෙයට පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම්, සන්නිවේදන පෙරාතු ලේඛණ, සහ සිදුවීම් සොයා ගැනීම, වාර්තාකරණය සහ පිළියම් කිරීම සඳහා ක්‍රියාපටිපාටි ඇතුළත් විය යුතුය, මෙහි කොටසක් ලෙස, අපි 24x7 කළමනාකරණය කරන SOC ක් ස්ථාපිත කර ඇත.
5. **සේවක පුහුණුව සහ දැනුවත්කම:** තොරතුරු තාක්ෂණ ආරක්ෂක මනා පරිචයන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳව සේවකයින් දැනුවත් කිරීමට ඔවුන් වෙනුවෙන් නිරතුරුවම පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබාදී ඇත. සැකසහිත කටයුතු වාර්තා කිරීමට සහ මානව දෝෂ හා අභ්‍යන්තර තර්ජන අවම කිරීමට ආරක්ෂක නියමයන් පිළිපැදීමට සේවකයින් දිරි ගන්වා ඇත.
6. **ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධනය:** බිඳවැටීම්, ආපදා, හෝ අනපේක්ෂිත සිදුවීම් නිසා තීරණාත්මක තොරතුරු තාක්ෂණ පද්ධති සහ සේවාවල ඔරොත්තුදීම දීම සහ ලබාගතහැකිබව සහතික කිරීම සඳහා විස්තීර්ණ ව්‍යාපාර අඛණ්ඩතා සහ අවදානම් ප්‍රතිසාධන සැලසුම් සංවර්ධනය කර ඇත. මෙයට ප්‍රතිසාධන උපායමාර්ග හා සැලසුම් නිරන්තර පරීක්ෂණය, යාවත් කිරීම, සහ සකස් කිරීම ඇතුළත්ය.

## මානව සම්පත් (HR) අවදානම

SLICGL විවිධ උපායමාර්ග හා ව්‍යවහාර ක්‍රියාත්මක කරමින් මානව සම්පත් අවදානම කළමනාකරණය කර ඇත. ඒවායින් සමහරක් පහත දක්වේ. පසුබිම් පරීක්ෂාවන්, යොමු පරීක්ෂාවන්, සහ නිපුනතා ඇගයීම් ඇතුළත් සම්පූර්ණ නිවාරණ ක්‍රියාවලියක් තුළින් නිවැරදි පුද්ගලයින් බඳවා ගැනීම, මානව සම්පත්වලට අදාළ කටයුතු පාලනය කරන පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය, සේවක චර්යාව, විනය ක්‍රියාපටිපාටි, වෙනස් ලෙස නොසැලකීම, හිරිහැර කිරීම, සහ විශ්වාසය, නිරන්තර පුහුණු සහ සංවර්ධනය, නිරන්තර ප්‍රතිපෝෂණ සහ පුහුණුව ඇතුළත් ඵලදායී කාර්යසාධන කළමනාකරණ ව්‍යවහාර යොදා ගැනීම, අදාළ නීතිවලට අනුකූලතාව සහ සේවකයින් සමඟ නිරත්තර සන්නිවේදනය වැනි ගැටළු විසඳීම ඇතුළත්ය.

## වංචා සහ විෂමාචාර කළමනාකරණය

පහත දී ඇති පරිදි අපට අදාළ විවිධ නීති සහ රෙගුලාසි විශාල රාමුවක් අපගේ වංචා සහ විෂමාචාර විරෝධී උත්සාහයන්ට එකතු කර ගැනීමට නිර්ණායක සමූහයක් ලබා දේ:

අ. මුදල් විශුද්ධිකරණ විරෝධී සහ ත්‍රස්ත මූල්‍ය විරෝධී රෙගුලාසිය: 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත (PMLA), සංශෝධිත 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තාකරණ පනත (FTRA), 2019 අංක 01 දරන රක්ෂක (ගනුදෙනුකාර නිසි සම්ප්‍රජන්‍ය) නියමය, එක්සත් ජාතීන්ගේ සම්බාධක ලැයිස්තු, මූල්‍ය තොරතුරු ඒකකය විසින් සිදුකළ නියමයන් සහ රෙගුලාසි, ශ්‍රී ලංකා රක්ෂණ

නියාමන කොමිෂන් සභාව විසින් දෙන ලද මාර්ගෝපදේශ SLICGL හි ප්‍රතිමුදල් විශුද්ධිකරණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිමුදල් විශුද්ධිකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවන අතර අපි ශක්තිමත් ප්‍රතිමුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත.

ආ. 1975 අංක 01 දරන වත්කම් හා වගකීම් ප්‍රකාශන පනත සහ 1954 අංක 11 දරන අල්ලස් පනත අවලංගු කරන ලද අතර, 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත හඳුන්වාදෙන ලදි. අදාළ නිලධාරීන් මෙම පනත යටතේ අවශ්‍ය කරන පරිදි වාර්ෂිකව තම වත්කම් හා වගකීම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය තුළ සිටින අතර පනතේ අධීක්ෂණය යටතේ පවත්වනු ලබන සියලුම පරීක්ෂණ සඳහා අපගේ සම්පූර්ණ සහය ලබාදීමට අපි කැපවී සිටිමු.

ඇ. ආයතනික යහපාලන සංග්‍රහ – වංචා වැලැක්වීමේදී එවැනි සංග්‍රහ මගින් අවශ්‍ය වන මූලධර්ම අපි වැළඳගෙන ඇති අතර, වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා ඇත.

## දත්ත ආරක්ෂක අවදානම් කළමනාකරණ රාමුව

පුද්ගල දත්ත රැස්කිරීම, පිරිසැකසුම, ගබඩා කිරීම සහ බැහැර කිරීම හා අදාළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා 2022 අංක 09 දරන දත්ත ආරක්ෂක පනතට අනුකූලව දත්ත ආරක්ෂාව කළමනාකරණය සඳහා ශක්තිමත් රාමුවක් සමාගම ක්‍රියාත්මක කර ඇත. රෙගුලාසියට අනුකූලතාව සහතික කිරීම සඳහා, සමාගම විසින් දත්ත ආරක්ෂණ නිලධාරියෙක් පත්කර, සිය වෙබ් අඩවියේ රහස්‍යතා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කර ඇත. පුද්ගලික දත්ත රඳවාගෙන පිරිසැකසුම් කිරීම සඳහා ඔප්පුහිමියන්ගේ කැමැත්ත ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටී. කාර්ය මණ්ඩලයට මෙම නීතියට අනුකූලවීම සඳහා අදාළ පුහුණු ලබා දී ඇත. ඊට අමතරව, සමාගම "Triple-A" ප්‍රවේශය භාවිතා කරන අතර, එයට එහි සමස්ථ දත්ත ආරක්ෂණ අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස සහතික කිරීම, බලය ලබාදීම සහ විගණනය ඇතුළත්ය.

## සමාජ මාධ්‍ය අවදානම් කළමනාකරණය

SLICGL ශක්තිමත් සමාජ මාධ්‍ය අවදානම් කළමනාකරණ සැලැස්මක් ස්ථාපිත කර ඇති අතර එය එහි සමාජ මාධ්‍ය පැවැත්ම හා පාර්ශවකාර සන්නිවේදනය සුරක්ෂිත කිරීමට ව්‍යුහගත ක්‍රියාවලින්ගෙන් සමන්විත වේ. ගිණුම් ප්‍රවේශ හිමිකම් අර්ථ දැක්වීම, සන්නාමයේ මාර්ගගත අඛණ්ඩතාව නගා සිටුවීමට බලතල හා ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කිරීම මගින් විභව ව්‍යාපාර අවදානම් අවම කිරීමට මෙම මුලපිරීමෙන් අරමුණු කරයි.

**දුෂ්මන්ත තොටවත්ත මහතා**
සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුව
2025 ජූනි 03

# අනුකූලතා වාර්තාව

## අනුකූලතාවයට අපගේ ප්‍රවේශය

රක්ෂණ ක්ෂේත්‍රය තුළ, වෙනස්වන නියාමන විධි නියෝග සහ ව්‍යාපාර පරිසරය තුළ වෙනස්වීම් හේතුවෙන් සක්‍රීය අනුකූලතා අවදානම් කළමනාකරණය වැඩිවන තීරණාත්මක බවට පත්ව ඇත. මෙයට ගනුදෙනුකාර සහ දත්ත ආරක්ෂාව, රහස්‍යතාව සහ වෙනත් නෛතික බැඳීම් කෙරෙහි වැඩිවූ අවධානයක් ඇතුළත්ය. රක්ෂණ සපයන්නන් ස්ථාපිත අනකූලතා ප්‍රමිති දැඩිව පිළිපදිමින් විනිවිදභාවය ප්‍රමුඛ කළ යුතුය. SLICGL හි, අපි අපගේ දෛනික ව්‍යාපාර පරිචයන්ට අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරනු ලබයි. නියාමන සංවර්ධනයන් තුළ වේගය සහ සංකීර්ණතාව රක්ෂකයින් මත අඛණ්ඩ අභියෝග මතු කරන අතර නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය වන IFRS 17 හඳුන්වාදීම රක්ෂණ ගිණුම්කරණ අවශ්‍යතාවල සැලකියයුතු වෙනසක් පෙන්වා දේ. SLICGL, රජය සතු ආයතනයක් ලෙස, සීමිත වගකීම් සමාගම්, රක්ෂණ සමාගම් සහ රජය සතු ව්‍යවසාය සඳහා අදාළ වන විවිධ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

SLICGL අදාළ සියලු නීති සහ රෙගුලාසිවලට අනුකූල වීමට කැපවී සිටින අතර, අනුකූලතාව හඳුනා ගැනීම, නියාමනය කිරීම, වාර්තා කිරීම සහ සහතික කිරීම ඇතුළත් විධිමත් අනුකූලතා රාමුවක් සමාගම ක්‍රියාත්මක කර ඇත. අනුකූලතා විධිනියෝගය මගින් ආයතනික අනුකූලතා කාර්යයක් ස්ථාපිත කිරීම සහ මෙහෙයවීම සඳහා මාර්ගෝපදේශ ලබාදෙන අතර එය අනුකූලතා ප්‍රධානීගේ අධීක්ෂණය යටතේ පවතී. ඔහු විගණන හා අනුකූලතා කමිටුවට, අවදානම් කළමනාකරණ කමිටුවට, සහ අධ්‍යක්ෂක මණ්ඩලයට නිතිපතා වාර්තා ලබා දේ. සමාගමේ විධායක කමිටුව ද "ඉහළ මට්ටමේ අපේක්ෂාවන්" ආයතනය තුළ ශක්තිමත් අනුකූලතා සංස්කෘතියකට පරිවර්තනය කරන බව සහතික කරමින් අනුකූලතා උත්සාහයන්ට සහය ලබා දේ.

"අනුකූලතා අවදානම" යන්නෙන් අදාළ නීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මූලධර්මවලට අනුකූල නොවීමෙන් SLICGL හි අඛණ්ඩතාවයට ඇතිවන අවදානම හෝ හානිය අර්ථවත් වේ. අනුකූලතා අවදානම ඵලදායී ලෙස කළමණාකරණය කිරීමට අසමත් වීම මගින් SLICGL දඬ, සිවිල් හා සාපරාධී දඬුවම් යනාදියට නිරාවරණය විය හැකිය. SLICGL හි ව්‍යාපාර මූලධර්ම අනුව සෑම මට්ටමකම සියලුම සේවකයින් නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම පමණක් නොව වගවීමෙන් අවංකව කටයුතු කිරීම අවශ්‍ය වේ. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ලබාදීමේදී සම්බන්ධවන බව සමාගම හඳුනා ගනී.

## අනුකූලතා රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය SLICGL හි අනුකූලතා අවදානම් රුචිය තීරණය කිරීම සඳහා වගකීම දරන අතර, ඔවුන් ව්‍යාපාර උපායමාර්ගය, පරමාර්ථ, සහ ආයතනික ප්‍රතිපත්ති ඇතුළුව වැනි  නියාමන අවශ්‍යතා, සහ ක්ෂේත්‍රයේ සංග්‍රහ සහ අභිමත අවදානම් වැනි අනුගම්‍ය අවශ්‍යතා තුළනය තබාගත යුතුය. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය සඳහා අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික හා මානව සම්පත් ඇතුළුව ආයතනය තුළ ඇති සියලුම පාලන ක්‍රියාකාරකම් සම්බන්ධ කරන සහයෝගී ප්‍රවේශයක් අවශ්‍යය.

අනුකූලතා අවදානම කළමනාකරණය සඳහා, SLICGL ආරක්ෂක මාර්ග හතරක ආකෘතියක් අනුගමනය කරයි:

1. දෙපාර්තමේන්තු අවදානම් හිමිකමේ පළමු ආරක්ෂක මාර්ගය ලෙස;
2. අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන හා අනුකූලතා කමිටුව දෙවන ආරක්ෂක මාර්ගය ලෙස;
3. අභ්‍යන්තර විගණනය තුන්වන ආරක්ෂක මාර්ගය ලෙස, විශේෂයෙන් මුදල් විශුද්ධිකරණ කාර්යය;
4. නියාමක, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ බාහිර විගණකවරු සිව්වැනි ආරක්ෂක මාර්ගය ලෙස

අනුකූලතා අවදානමේ වැදගත්කම අවධාරණය සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව විගණන හා අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.

අනුකූලතා දෙපාර්තමේන්තුව අදාළ වන නීති, රීති සහ රෙගුලාසි වලට වගකිව යුතු අංශ හඳුනාගෙන ඇති අතර අනුකූලතා අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීමට සහයෝගී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. සක්‍රිය ප්‍රවේශයේ කොටසක් ලෙස, අනුකූලතා දෙපාර්තමේන්තුව අනාගතයේ අපේක්ෂිත රෙගුලාසි පිළිබඳව කළමනාකරණයට මඟ පෙන්වයි, මෙම සක්‍රීය ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ උපායමාර්ගය මඟින් නව රෙගුලාසි අවශ්‍යතා පිරිවැය ඵලදායී ආකාරයකින් විසඳීමට අවශ්‍ය මෙවලම්වලින් සමාගම සන්නද්ධ කරයි.

## මුදල් විශුද්ධිකරණය (AML) පාලනය

ප්‍රතිමුදල් විශුද්ධිකරණය සහ ප්‍රතිමුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීමට පහසුකම් සපයන ඕනෑම ක්‍රියාකාරකමක් තහනම් කිරීම සහ සක්‍රීයව වැළැක්වීමට උත්සාහ ගැනීම සමාගමේ ප්‍රතිපත්තියයි. SLICGL අදාළ නීතිවලට අනුකූලව ප්‍රති මුදල් විශුද්ධිකරණ අනුකූලතාවයට බැඳී සිටින අතර මුදල් විශුද්ධිකරණ අරමුණු සඳහා සිය නිෂ්පාදන හා සේවාවන් භාවිතා කිරීම වැළැක්වීම සඳහා එහි කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩලය සහ පත් කරන ලද නියෝජිතයින් මෙම ප්‍රමිතීන් පිළිපැදීම අවශ්‍යය.

## මුදල් විශුද්ධිකරණ පුහුණුව

ඊට අමතරව, SLICGL ප්‍රතිමුදල් විශුද්ධිකරණය, එහි ක්‍රම හා වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් සේවකයින්ට ලබාදීමට අභ්‍යන්තර ඊ-ඉගෙනුම් මොඩියුලයක් සංවර්ධනය කර ඇත. සේවකයින් සිය කාර්යසාධනය හා සම්බන්ධ විභාගයක් සමත්වීම අවශ්‍ය වේ.

## උසස්කළ නිසි පරීක්ෂාව

මුදල් විශුද්ධිකරණ අනුකූලතා රාමුව ශක්තිමකත් කිරීමට, SLICGL විසින් අවදානම් තොරතුරු මෙවලමක් වන World-check Refenitiv දත්තපදනම් පද්ධතිය තුළ ආයෝජනය කර ඇති අතර එය ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) සහ ඇතුළත් කිරීමේ නිවාරක තුළින් නිසි පරීක්ෂාව තහවුරු කරයි. පද්ධතියේ මූලික ලක්ෂණවලට පහත දෑ ඇතුළත් වේ.:

- දේශපාලනිකව නිරාවරණ පුද්ගලයින් නියාමනය (PEP)
- සම්බාධක හා මුර ලැයිස්තු ආයතන සහ/හෝ පුද්ගලයින් තේරීම
- අහිතකර මාධ්‍ය නිවාරණය
- තෙවැනි පාර්ශව නිසි පරීක්ෂාව

වසර පුරා, අනුකූලතා දෙපාර්තමේන්තුව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් ලබාදීම වැළැක්වීමට අදාළ විෂයයන් පිළිබඳ පුහුණු සැසි සහ දැනුවත්කිරීමේ වැඩසටහන් විශේෂයෙන් ශාඛා කළමනාකරුවන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉලක්ක කරමින් ලබාදීම සඳහා ආයතනික අවධානම් කළමණාකරණ දෙපර්තමේන්තුව සමඟ සහයෝගීව සිදු  විය.

## තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය

SLICGL සතුව තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇති අතර එය ක්‍රියාත්මකවීම අධීක්ෂණය සඳහා තොරතුරු දැනුම්දීමේ නිලධාරියා කටයුතු කරයි.

## ව්‍යාපාර චර්යාධර්ම සහ ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සියලුම සේවකයින් සඳහා වන ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය" ආයතනයේ සාමාජිකයන් ව්‍යාපාර කටයුතුවල යෙදීමේදී මූලධර්ම, රීති, සාරධර්ම, ප්‍රමිතීන් සහ නෛතික අනුකූලතාවයට අනුකූල වන බව සහතික කිරීම සඳහා සැලසුම් කරනු ලබයි.

අනුකූලතා සහ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කිරීම; විවෘත හා විනිවිද වාර්තාකරණය; සහ ශක්තිමත් පාර්ශවකාර සබඳතා ගොඩනගා ගැනීම ක්‍රියාත්මක කිරීමෙන් අනුකූලතා අවදානම සිදුවීම අවම කර ඇත. නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනුකූලතා ගැටළු සහ සිදුවීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු වෙත තීව්‍ර කරනු ලබන අතර ඒ තුළින් අනුකූලතා රාමුව, ආචාර ධර්ම හා මනා පරිචයන් තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ.

## ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව

සමාගම ආයතනය තුළ දත්ත ආරක්ෂක ව්‍යවහාර ශක්තිමත් කිරීමට සේවක පුහුණු වැඩසටහන තුළින් දැනුවත්කම ඇති කිරීම ඇතුළුව අදාළ රෙගුලාසිවලට අනුව එහි දත්ත ආරක්ෂක රාමුව ශක්තිමත් කිරීම සඳහා සැලකියයුතු පියවර ගෙන ඇත. ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛණ සංවර්ධනය කර ඇති අතර අභ්‍යන්තර අනුමත ක්‍රියාවලිය තුළින් ක්‍රියාත්මක කරමින් සිටී. දත්ත ආරක්ෂක නිලධාරීන් නම් කර ඇති අතර මේ සම්බන්ධ මෙහෙයුම් කරුණු විසඳමින් ඇත. විනිවිදභාවය වැඩි කිරීමට හා ඔප්පුහිමියන්ගේ කැමැත්ත ලබා ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර ආයතනික වෙබ් අඩවිය මත රහස්‍යතා ප්‍රතිපත්තියක් ප්‍රකාශ කිරීම ඇතුළුව සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීමට වැඩිදුර ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතී.

සමාලෝචිත වසර තුළ, බාහිර විගණක වාර්තාවේ, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ ආයතනික පාලන වාර්තාවල හෙළිදරව් කිරීම් හැර සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා, රීති හා රෙගුලාසි වලට සමාගම අනුකූල විය. තවද, සමහර නියාමන වාර්තා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් සමාගමට දීර්ඝකිරීමක් ලැබී ඇත. නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතාව - 2024 පෙබරවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා නියාමක/නියාමන බලධාරීන් වෙත වාර්තා සහ ගෙවීම් ඉදිරිපත් කිරීම.

## නියාමනය හා ව්‍යවස්ථාපිත අනුකූලතාව – 2024 පෙබරවාරි 01 වන දින සිට 2024 දෙසැම්බර් 31 වන දින දක්වා වන කාල පරිච්ඡේදය සඳහා නියාමන අධිකාරීන් සඳහා ප්‍රතිඵල සහ ගෙවීම් ඉදිරිපත් කිරීම

| නියාමන/ව්‍යවස්ථාපිත අවශ්‍යතාව | වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන | ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය | සිදුකළ දිනය | අනුකූලතාව සහ විශේෂ කරුණු |
|---|---|---|---|---|
| **කාල පරිච්ඡේදය තුළදී ගෙවීමට නියමිත වන නියාමන/ව්‍යවස්ථාපිත වාර්ථා/ගෙවීම්** | | | | |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) | | | | |
| **රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන කාර්තුමය වාර්තා** | | | | |
| **2012 අප්‍රේල් 01 වන දින සිට බලපවත්වනු ලබන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රතිශෝධිත කාර්තුමය වාර්තා (ආකෘතිය 49)** | | | | |
| නිර්ණය ආකෘති | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) - අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) - ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3 වන කාර්තුව (24) - ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) - අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) - ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3වන කාර්තුව (24) - ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| ශේෂ පත්‍ර සහ ලාභ ආලාභ ගිණුම (ආකෘති) | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) - අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) - ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3 වන කාර්තුව (24) - ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (අ) සහතික කිරීම | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) - අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) - ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3 වන කාර්තුව (24) - ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |

| නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව | වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන | ඉදිරිපත් කිරීම/ ගෙවීම කළ දිනය | සිදුකළ දිනය | අනුකූලතාව සහ විශේෂ කරුණු |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කෝමිෂන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (ආ) සහතික කිරීම | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| වැඩිදුර වාර්තා | | | | |
| වෛකල්පිත සැලසුම | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30 | 2024 ජූනි 10 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් දීර්ඝකිරීම ඉල්ලා ඇත |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| ගෙවීම් | | | | |
| සෙස් බද්ධ ශුද්ධ වාරිකයෙන් ජීවිත 0.4% | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 31 | 2024 ජූලි 31 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 31 | 2024 ඔක්තෝබර් 30 | |
| වාර්ෂික ගාස්තු | වාර්ෂිකව | 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | | |
| **ආපසු ලැබීම්** | | | | |
| අගය එකතු කළ බදු වාර්තා | කාර්තුමය | 1 වන කාර්තුව (24) - අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 31 | 2024 ජූලි 31 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 31 | 2024 ඔක්තෝබර් 31 | |
| මුද්දර ගාස්තු | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 15 | 2024 අප්‍රේල් 11 | |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 15 | 2024 ජූලි 15 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 15 | 2024 ඔක්තෝබර් 15 | |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 20 | 2024 අප්‍රේල් 19 | |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 20 | 2024 ජූලි 19 | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 20 | 2024 ඔක්තෝබර් 18 | |
| අත්තිකාරම් ආදායම් බද්ධ | වාර්ෂිකව | 2023 - 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| අත්තිකාරම් උපයන විට ගෙවීමේ බද්ධ | වාර්ෂිකව | 2023 - 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| බෝග රක්ෂණ බද්ද | කාර්තුමය | 1 වන කාර්තුව (24) – ජූලි 30 | 2024 ජූලි 30 | |
| | | 2 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ඔක්තෝබර් 30 | |
| ගෙවීම් | | | | |
| අගය එකතු කළ බදු | මාසික | ඉදිරිමස 20 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| අත්තිකාරම් උපයන විට ගෙවීමේ බද්ධ | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| ආදායම් බදු | කාර්තුමය | අගෝස්තු 15 දින හෝ ඊට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| | | නොවැම්බර් 15 දින හෝ ඊට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |

| නියාමන/ව්‍යවස්ථාපිත අවශ්‍යතාව | වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන | ඉදිරිපත් කිරීම/ ගෙවීම කළ දිනය | සිදුකළ දිනය | අනුකූලතාව සහ විශේෂ කරුණු |
|---|---|---|---|---|
| මුද්දර ගාස්තු | කාර්තුමය | 1 වන කාර්තුව (24) අප්‍රේල් 15 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| | | 2 වන කාර්තුව (24) – ජූලි 15 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| | | 3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 15 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| බෝග රක්ෂණ බද්ද | කාර්තුමය | 1 වන කාර්තුව (24) – ජූලි 30 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| | | 3 වන කාර්තුව (24) ඔක්තෝබර් 30 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| අත්තිකාරම් ආදායම් බද්ධ | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| ශ්‍රී ලංකා මහ බැංකුව | | | | |
| සේවක අර්ථසාධක අරමුදල් වාර්තා | අර්ධ-වාර්ෂිකව | ජනවාරි 31 සහ ජූලි 31 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| මුදල් විශුද්ධිකරණ වාර්තා | | | | |
| මුදල් ගනුදෙනු වාර්තාව | මාසික | ගනුදෙනුවේ දින සිට දින 31ක් ඇතුළත | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල | මාසික | ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| සේවා නියුක්තිකයන්ගේ වාර අරමුදල් මණ්ඩලය | | | | |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් වාර්තා | අර්ධ-වාර්ෂිකව | ජනවාරි 31 සහ ජූලි 31 | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක මුදල | මාසික | ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර් | | | | |
| ගෙවීම – සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී බද්ද | මාසික | ඉදිරි මස 10 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| ප්‍රවාහන අමාත්‍යාංශය | | | | |
| ගෙවීම – මාර්ග ආරක්ෂක අරමුදල | මාසික | ඉදිරි මස 15 දින | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| ජාතික රක්ෂණ භාර අරමුදල | | | | |
| ගෙවීම් – SRCC සහ ත්‍රස්තවාදී අරමුදල | මාසික | මෝටර් රථ – මාසයේ අවසාන වැඩ කරන දින සිට දින 75ක් ඇතුළත | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| | | මෝටර් රථ නොවන – මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| සමාගම් රෙජිස්ටාර් | | | | |
| මූල්‍ය ප්‍රකාශන ලියාපදිංචි කිරීම | වාර්ෂිකව | සමාගමේ මූල්‍ය ප්‍රකාශන දිනයෙන් පසු දින 20 ක් ඇතුලත | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |
| කම්කරු වන්දි කොමසාරිස් | | | | |
| බලපත්‍රය අලුත් කිරීම – කම්කරු වන්දි රක්ෂණ | වාර්ෂිකව | මැයි 30ට පෙර | නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී | |

# අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම සහතික කිරීමට අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසාන අධීක්ෂණය සහ උපායමාර්ගික දිශානතිය සපයයි. පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේදී මෙම පද්ධතිවල ඵලදායීතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණය සහ පාලනයෙහි සංවර්ධනයන් පිළිබඳ දැනුවත්ව සිටී.

ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ව්‍යවහාර සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ අත්‍යවශ්‍ය සංරචක බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. අපේක්ෂිත ප්‍රතිඵල සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සියලුම අසාර්ථකවීමේ අවදානම් තුරන් කිරීමට වඩා පිළිගතහැකි මට්ටමකට අවදානම කළමනාකරණය කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කරනු ලබයි.

මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු හයක් පිහිටුවා ඇති අතර, වගවීම සහ පවරන ලද බලය පිළිබඳ සඳහන් කරන ලද ආයතනික ව්‍යුහය මනාව පැහැදිලි කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හය නම්; විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් හා වේතන කමිටුව, ආයෝජන කමිටුව, උපායමාර්ගික සමාලෝචන කමිටුව සහ ඩිජිටල් පරිනාමන කමිටුව වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති මගින් මෙම කමිටු පාලනය කරනු ලබන අතර, ඒවා යහපාලනයේ මූලික මූලධර්මවලට අනුකූල වේ.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි අංශවල අධීක්ෂණ වගකීම් ඉටු කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමේදී විගණන හා අනුකූලතා කමිටුව අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සමඟ මෙහෙයුම්වල අනුකූලතාවය සත්‍යාපනය කිරීමට මෙන්ම අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය ඇගයීම සඳහා වගකීමට බැඳී සිටී. යම් අනනුකූල නොවීම්වලට අදාළ සැලකිය යුතු සොයාගැනීම් විධිමත්ව ඉස්මතු කොට දක්වයි. තක්සේරුකළ අවදානම් මට්ටම මත පදනම් වී තීරණය කළ වාරගණන සමඟ සියළුම ඒකක සහ ශාඛා පිළිබඳව විගණන සිදු කරනු ලබන අතර, මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු පිළිබඳ ස්වාධීන හා විෂය මූලික ඇගයීම්වල විධිවිධාන සහතික කරයි.

වාර්ෂික විගණන සැලැස්ම විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර, විගණනයේ සොයා ගැනීම් සිය කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. ඊට අමතරව, ශාඛා විගණනයේදී මතුවන සොයා ගැනීම් සාකච්ඡා කිරීම සඳහා විශේෂ අනුකමිටුවක් පිහිටුවා ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ශක්තිමත් අභ්‍යන්තර පාලනය සමාගමේ පාලන රාමුවේ අත්‍යවශ්‍ය සංරචකයකි. විගණන හා අනුකූලතා කමිටුව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සඳහා මූලික වගකීම දරයි. ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම කළමනාකරණයට පවරන අතර, මෙවැනි පාලනයන් අධීක්ෂණය කිරීමට සහ පද්ධතියේ සමස්ත ඵලදායිත්වය සමාලෝචනය කිරීමට විගණන හා අනුකූලතා කමිටුව වගකීමට බැඳී සිටී.

අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යසාධනය අඛණ්ඩ නියාමන කටයුතු, අභ්‍යන්තර විගණන සහ හඳුනාගත් පාලනයන්හී යෝග්‍යතාවය හා ඵලදායීතාවය නියාමනය කිරීමට ආයතනයේ මෙහෙයුම් තුළ අන්තර්ගත ක්‍රියාපටිපාටි වැනි වෙනත් ඇගයීම් තුළින් තක්සේරු කරනු ලබයි.

ආයතනයේ සමස්ත අවදානම් කළමනාකරණ උපාය මාර්ගය හා ඒකාත්මික වූ ශක්තිමත් අනුකූලතා කළමනාකරණ පද්ධතියක් ආයතනය ස්ථාපිත කර ඇති අතර, මෙය අනුකූලතා අවදානම් කළමනාකරණ ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇත. අනුකූලතා වැඩසටහනින් සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක්, රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගමකට අදාළවන නෛතික හා රෙගුලාසිමය අවශ්‍යතා සහ රජයට අයත් සීමිත වගකීම් සමාගම් පාලනය කරන වෙනත් නෛතික රාමු ආවරණය කරයි.

මෙහෙයුම් රාමුවේ අඛණ්ඩතාව සහ ස්ථායිතාව සුරක්ෂිත කිරීම සඳහා, පුළුල් මුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත. මෙම රාමුවට නිශ්චිත දත්ත පදනම් අනුව ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීම, ගනුදෙනුකරුවන්ගේ නිසි සම්ප්‍රජන්‍ය ක්‍රියාවලිය, සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයීම් සඳහා ඇතුළත් කර ඇති ඉ-ඉගෙනුම් මොඩියුලයක්, වාර්ෂික අභ්‍යන්තර විගණන සහ නිරන්තර ප්‍රති මුදල් විශුද්ධිකරණ අවදානම් තක්සේරු කිරීම් ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ කාර්යය විශේෂ අවදානම් කළමනාකරණ කමිටුවකට පවරා ඇති අතර, එමඟින් සමාගමේ වඩාත්ම තීරණාත්මක අවදානම් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාගම විසින් ස්ථාපිත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාගමේ සමස්ත උපාය මාර්ග හා අවදානම් රුචියට ගැලපෙන බවට අවදානම් දැනුවත්කිරීම් පිළිබඳ පුළුල් ව්‍යවසාය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

අවදානම් දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ කමිටුව සහ ආයෝජන කමිටුව මෙන්ම විධායක කමිටුව, විගණන පසු විපරම් කමිටුව සහ නිෂ්පාදන සංවර්ධන කමිටුව යනාදිය ඇතුළත් කළමනාකරණ මට්ටමේ කමිටු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටුවලට නියෝජනයන් ලබා දේ. මෙම ක්‍රියාවලිය තුළින්, ව්‍යවසාය අවදානම් කළමනාකාරිත්වය අවදානම් දෘෂ්ටි කෝණයකින් ස්වාධීන මතයන් සපයන අතර එමඟින් වියහැකි අවදානම් බලපෑම සැලකිල්ලට ගනිමින් කළමනාකාරීත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකියාව ඇති කරයි.



**නුසිත් කුමාරතුංග**
සභාපති



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති – විගණන සහ අනුකූලතා කමිටුව

2025 ජූනි 03

# 07

# මූල්‍ය වාර්තා

**100**
සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

**104**
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

**105**
ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

**106**
දරන ලද නමුත් (ප්‍රමාණවත්ව) වාර්තා නොකළ හිමිකම් සහතිකයි

**107**
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

**110**
මූල්‍ය තත්වය ප්‍රකාශය

**111**
ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

**112**
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

**114**
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**116**
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

# සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගමේ 2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ සිය වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය, 2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ එහි ඇති විගණකගේ වාර්තාව සමඟ සමාගමේ වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තාවේ අන්තර්ගතය 2007 අංක 07 දරණ සමාගම් පනතේ අදාළ විධිවිධාන, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත (සංශෝධිත පරිදි), 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා එයට අදාළ සියලුම සංශෝධනවලට අනුකූලව පිළියෙල කර ඇත. ඊට අමතරව, වාර්තාව ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්ට ද අනුකූල වී ඇත.

## සමාගමේ ආයතනික පසුබිම

2011 දී, 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධිත) පනතේ දක්වා ඇති විධානය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දිගුකාලීන ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය ලෙස වෙන් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් හී තනි කොටස්හිමිකරු සමඟ 2014 ජූලි 25 දින සංස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් හී සම්පූර්ණයෙන් අයත් පරිපාලන සමාගමක් ලෙස 2014 ජූලි 25 දින සංස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි හිමිකාරත්වය 2023 වසර තුළ වෙන් කිරීමේ අරමුණ සඳහා 2023 ඔක්තෝබර් 16 දින සිට ක්‍රියාත්මකව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් වෙත මාරු කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර මෙහෙයුම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් වෙන් කිරීමත් සමඟ 2024 පෙබරවාරි 01 සිට බලාත්මකව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කරන ලදී.

2011 දී, 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධිත) පනතට අනුකූලව අංක 23/0431/604/046 හා 2023 මාර්තු 17 දිනැති කැබිනට් තීරණයට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනම නෛතික ආයතන දෙකකට නීත්‍යානුකූලව වෙන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, පරිපාලක සමාගමක කළමනාකාරිත්වය යටතේ සමාගමට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් දෙකක්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වශයෙන් සිය මෙහෙයුම් වෙන් කරන ලදී. 2024 පෙබරවාරි 01 සිට බලාත්මකව, වර්තමානයේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් පරිපාලක සමාගමක් ලෙස ක්‍රියා කරයි.

## කොටස් හිමිකාරත්වය පිළිබඳ තොරතුරු

සමාගමේ තනි කොටස්හිමියා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් වන අතර එහි 99.98% ක කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබ ඇත.

## ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21, රක්ෂණ මන්දිරයෙහි පිහිටා ඇත.

## සමාගමේ ප්‍රධාන කටයුතු

2024 පෙබරවාරි 01 සිට බලපවත්නා පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි මූලික කාර්යය වන්නේ මෝටර්රථ, ගිනි, නාවික, සෞඛ්‍ය, සහ විවිධ පන්තිවල රක්ෂණය ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාමයි. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කටයුතුවල විශාල වෙනස්වීම් නොමැත.

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ පිළිබිඹුවක් නිරූපනය වන පරිදි සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. වංචා හෝ දෝෂ හේතුවෙන් සැලකියයුතු අවප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වා ගැනීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීම සහ වාතාවරණය තුළ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්වලට ඇතුළත්වේ.

වාර්ෂික වාර්තාව තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සකස්කර තිබෙන බව අධ්‍යක්ෂවරුන්ගේ අදහස වේ.

## මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව

2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කරනු ලබයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක විසින් විධිමත්ව අත්සන් තබා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සහ සටහන් මගින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනයෙන් අවසන් වන වසර සඳහා එහි කාර්ය සාධනයන් පිළිබඳ සත්‍ය හා සධාරණ දැක්මක් ඉදිරිපත් කරනු ලබයි.

## විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණක වශයෙන් පත්කරන ලදි. 2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රකාශ වාර්ෂික විගණනයේදී සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස විගණකාධිපතිට සහයවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍ර සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් වරලත් ගණකාධිකාරී සමාගමක් වන මෙසර්ස් බීඩීඕ පාර්ට්නර්ස් පත්කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වන මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## විගණන හා අනෙකුත් අදාළ සේවා ගාස්තු

සමාලෝචිත වසර තුළ විගණන ගාස්තු ලෙස සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගෙවන ලද ප්‍රමාණ පහත දැක්වේ. මෙම ඡේදයෙන් අනාවරණය කෙරෙන කරුණු හැර විගණකවරුන්ට සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂවරු දැන සිටිති.

| | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ව්‍යවස්ථාපිත විගණන ගාස්තු | 3,211 | 64 |
| විගණනයට අදාළ නොවන සේවා | 394 | – |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සඳහා යොදාගත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධති

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යය ක්‍රියාත්මක කර පාලනය කර ඇත.

සමාගම මනා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටි ක්‍රියාත්මක කර ඇති අතර, එවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කරනු ලබයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන කාර්යය අධීක්ෂණය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ කාර්යයයේ සඵලත්වය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව සිටී.

## අඛණ්ඩතා පැවැත්ම

වසර තුළ, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමේ හැකියාවට සැලකියයුතු සැකයක් ඇති කළ හැකි හඳුනාගත් සිදුවීම් හෝ තත්ත්වයන් නොමැති අතර,මේ සම්බන්ධයෙන් කිසිදු වැදගත් අවිනිශ්චිතතා වාර්තා නොවීය. සමාගමේ මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් කාර්යසාධනය, මුදල් ප්‍රවාහය සහ නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලවීම සැලකිල්ලට ගනිමින්, දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අඛණ්ඩතා පැවැත්ම පදනමක් මත සකස් කරනු ලැබ ඇත.

## පිරිවැටුම/දළ ලිඛිත වාරිකය (GWP)

2024 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් මුළු පිරිවැටුම රු. මිලියන 20,199 ක් වූ අතර, මුළු දළ ලිඛිත වාරිකය රු.මිලියන 23,571 ක් විය. සමාගම විසින් අත්කරගත් මුළු දළ ලිඛිත වාරික පිළිබඳ සවිස්තර විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

## මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

| | 2024 රු. '000 |
|---|---|
| බදු ගෙවීමට පෙර ලාභය (PBT) | 3,573,323 |
| ආදායම් බදු වියදම් | (911,984) |
| බදු ගෙවීමට පසු ලාභය | 2,661,339 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම්/(අලාභ) | (126,638) |
| ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභ | 76,345 |
| විසර්ජන සඳහා ලබාගත හැකි ලාභ | 2,611,046 |
| ගෙවූ ලාභාංශ | – |
| පහළට ගෙන ආ විසර්ජනය නොවන ලාභ | 2,611,046 |

### ලාභාංශ

2024 මූල්‍ය වසර සඳහා සමාගමේ කොටසකට රුපියල් 0.18 (එකතුව රුපියල් 250,000,000) ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කිරීමට යෝජනා කර ඇත.

ලාභාංශ ගෙවීමට පෙර, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2024 අංක 4 දරන නියෝගයට මෙන්ම 2007 අංක 07 දරණ සමාගම් පනතේ දරණ 57 වන වගන්තියට අනුව බාහිර විගණක විසින් දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු බවට ආයතනය විසින් තහවුරු කරනු ලැබ ඇත.

### පරිත්‍යාග

2024 වර්ෂය තුළදී. සමාගම විසින් කිසිදු පරිත්‍යාගයක් සිදුකර නොමැත.

### බදුකරණය සඳහා වෙන් කිරීම

සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරේ.

### සංචිත

වර්ෂය තුළදී සංචිතවල වෙනස්වීම හිමිකම් වෙනස්වීම ප්‍රකාශයේ දක්වා ඇත.

### රක්ෂණ වගකීම් සහ වෙන් කිරීම්

සියලුම දැනුවත් හා වගකීම් හා බැඳීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකරන ලද බව තහවුරු කිරීමෙහිලා සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන ඇත.

පාරිතෝෂික වගකීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 19 සේවක ප්‍රතිලාභ අනුව අවශ්‍ය වන පරිදි ස්වාධීන ආයුගණකවරයෙකු මඟින් අගයන ලදි.

මෙම වාර්තාවේ දිනට මූල්‍ය ප්‍රකාශවල සිදුකළ ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදුන් බවට දැක්වෙන කිසියම් හෝ අවස්ථාවක් ගැන අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

## ආයෝජන

2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් දරන ආයෝජනවල වටිනාකම රු.මිලියන 39,585 ක් විය. දරන ලද ආයෝජනවල සවිස්තර විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කෙරේ.

## දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## සින්නක්කර දේපලවල වෙළෙඳපොල වටිනාකම

දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳව වාර්තාකිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස සමාගම පිරිවැය ක්‍රමය භාවිතා කරයි. වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ සෑම වසර තුනකටම එක් වරකි. ඒ අනුව, දේපල ඇගයීම පිළිබඳ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරුකරුවෙක් වන, ඒ ඒ එම් පාතිහු මහතා (MRICS) විසින් 2024 මූල්‍ය වසර තුළ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ඒවා බල පවත්වන දිනය වන 2024 දෙසැම්බර් 31 දින සිට මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරන ලදී.

## වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදුවන සිදුවීම් මූල්‍ය ප්‍රකාශවලට සටහන් අංක 41 හි අනාවරණය කර ඇත.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දි යොදා ගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 අනුව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, සහ සම්බන්ධිත පාර්ශව අනාවරණ මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සමාගමේ ප්‍රධාන කොටස්හිමියා වන භාණ්ඩාගාරයේ ලේකම් විසින් සිදුකරනු ලබන නාමයෝජනා මත පදනම් වී සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස පත් කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනට තනතුර දැරූ සමාගමේ අධ්‍යක්ෂවරු පහත පරිදි වේ:

**රොනල්ඩ් සී පෙරේරා මහතා - ජනාධිපති නීතිඥ**
2022 ඔක්තෝබර් 24 පත්කරන ලදි - 2024 ඔක්තෝබර් 08 දින ඉල්ලා අස්විය

**නඹමාල් එම් පැල්පොල මහතා**
2022 ඔක්තෝබර් 24 පත්කරන ලදි - 2024 ඔක්තෝබර් 08 දින ඉල්ලා අස්විය

**ආචාර්ය එස් එම් පී කිත්සිරි මංචනායක මහතා**
2022 අප්‍රේල් 29 පත්කරන ලදි -2024 ඔක්තෝබර් 09 දින ඉල්ලා අස්විය

**එස් නිශාන්ත දයානන්ද මහතා**
2022 ඔක්තෝබර් 24 පත්කරන ලදි -2024 දෙසැම්බර් 31 දින ඉල්ලා අස්විය

**අනිල් කොස්වත්ත මහතා**
2024 අප්‍රේල් 29 පත්කරන ලදී

**කේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා**
2024 අප්‍රේල් 29 පත්කරන ලදී

**දුෂ්මන්ත තොටවත්ත මහතා**
2024 අප්‍රේල් 29 පත්කරන ලදී

**පී නුසිත් එස් කුමාරතුංග මහතා**
2024 ඔක්තෝබර් 23 පත්කරන ලදී

මෙම වාර්තාවේ දිනයට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

1. පී නුසිත් එස් කුමාරතුංග මහතා
2. දුෂ්මන්ත තොටවත්ත මහතා
3. කේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා
4. රොහාන් පී බුල්ජන්ස් මහතා
   2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී
5. කේ රජීව් ධර්මේන්ද්‍ර මහතා
   2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී
6. එන් ඩී බී උනන්බුව මහතා, ජනාධිපති නීතිඥ,
   2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී

වටමාරුව හෝ වෙනත් ආකාරයෙන් විශ්‍රාමයාම සහ ඔවුන් නැවත පත් කිරීම

1. **සාමාන්‍ය යෝජනාව**
   සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 108 වගන්තිය සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ කන්දේගමගේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා සහ පලවින්නගේ නුසිත් සමරාසි කුමාරතුංග මහතා වටමාරුව අනුව විශ්‍රාම යන අතර ඔවුන් දෙදෙනා නැවත පත් කිරීම සඳහා සුදුසුය.
2. **විශේෂ යෝජනාව - 01**
   සෝමදාස පලිහවර්ධන මහතා (වයස අවුරුදු හැත්තෑවට (70) ට වැඩි) ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම.

2007 අක 07 දරන සමාගම පනතේ 212 වගන්තිය යටතේ සෝමදාස පලිහවර්ධන මහතාගෙන් ඔහුට වයස අවුරුදු 71 ක් වන බවටත් 2025 ජූනි 07 දින 72 ට ලඟා වෙන බවටත් සමාගමට විධිමත් දැනුම්දීමක් ලැබී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය දැන්වීමේ දක්වා ඇති ආකාරයට සිය කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු පත් කිරීමට යෝජනා කර සිටී.

## සමාගම් සමඟ ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ගිවිසුම්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ රැස්වීම්වලදී ද විධිමත් පරිදි අනාවරණය කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරු සමාගමේ කිසිදු කොටසක හිමිකාරත්වය නොදරයි.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වසර තුළ දී ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමිකය රු. 1,988,000කි.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 14,000 කි. 2024 දෙසැම්බර් 31 දිනට කොටස් වලින් 100% ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පවරන ලදී.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුවත්භාවය සහ විශ්වාස කරන පරිදි රජයට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සහ සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරු සැහීමකට පත් වෙති.

## අස්පෘශ්‍ය වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත.

## පරිසරය

අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සමඟ සමාගමේ මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර යම් හානිකර කටයුතුවල නිරත වී නොමැත.

## නීති හා රෙගුලාසිවලට අනුකූලතාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙන් අනාවරණය කර ඇති පරිදි මූල්‍ය වර්ෂය තුළ සමාගම අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වී ඇත. අනුකූලතා දෙපාර්තමේන්තුව සමාගමේ අනුකූලතා කාර්යය නියාමනය කරන අතර විගණන සහ අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට ඒ පිළිබඳ වාර්තා කරයි. තවද, කලින් කළ අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.

## මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 අප්‍රේල් 28 දින අනුමත කරන ලදී.

## වාර්ෂික මහ සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජූනි 30 වන දින පස්වරු 12,00 ට කොළඹ 02 වොක්ස්හෝල් වීදියේ අංක 21 හි සිය ලියාපදිංචි කාර්යාලයේ දී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල ශාලාවේදී පවත්වනු ලැබේ.

## වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිගැනීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 (1) (කේ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් පිළිගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**ශිරෝමි කෝදාගොඩ**
සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්.



**නුසිත් කුමාරතුංග**
සභාපති/අධ්‍යක්ෂ
2025 අප්‍රේල් 28



**රවීන්ද්‍ර පත්මප්‍රිය**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශයේ විස්තර කෙරේ.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සෑම මූල්‍ය වසරක් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හා මහා සභා රැස්වීමක් ඉදිරියේ ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරු වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකවරුන්ගේ වගකීම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් විගණකවරුන්ගේ වාර්තාවේ පැහැදිළි කරයි.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් ශේෂ පත්‍රයේ දිනයට සහ එම දිනයෙන් අවසන් වන ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගමේ ලාභය, අලාභය හෝ ආදායම සහ වියදම් ඇතුලත් සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බව සහතික කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවලින් සමාග මේ සමස්ථ කටයුතුවල තත්ත්වය පිළිබඳව සාධාරණ නියෝජනයක් ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS and LKAS), 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනතට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් භාවිතා කර ඇති බවත් යහපත් විනිශ්චය සහ ඇස්තමේන්තු ක්‍රියාත්මක කර ඇති බවත් අධ්‍යක්ෂවරු තහවුරු කරති. ඊට අමතරව, දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් අධ්‍යක්ෂවරුන්ට ඇති අතර, එමනිසාම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඔවුන් අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**ශිරෝමි කෝදාගොඩ**
සමාගම් ලේකම්
ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

2025 ජූනි 30

# ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශ පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලදී:

I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKASs) සහ නිර්දේශිත ප්‍රකාශය

II. 2007 අංක 07 දරණ සමාගම් පනත

III. සංශෝධිත පරිදි 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනත.

මූල්‍ය ප්‍රකාශ සහ එහි සිදුකළ අනාවරණ සකස් කිරීමේදී භාවිතා කළ ආකෘති අදාළ නියාමන බලධාරීන් විසින් නියම කරන ලද ආකෘතීන් සමග අනුකූල වන අතර, ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි අනාවරණය කිරීමේ අවශ්‍යතාවන්ට ද අනුකූල වේ.

අපගේ උපරිම දැනුමට අනුව, මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශ, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය, සෑම වැදගත් අංශයකින්ම සාධාරණව නියෝජනය කරන බව අපි සහතික කරමු.

තවද, සමාගමට දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අපි තහවුරු කරන අතර, ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම අපි යොදා ගෙන ඇත.

කළමනාකරණය, සිය මූල්‍ය වාර්තාකරණ වගකීම් සපුරාලනු ලබන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තරව පාලනයන් ස්ථාපිත කර පවත්වාගෙන යාම මගේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශ සියලුම වැදගත් ආකාරයෙන් නිවැරදි හා සම්පූර්ණ බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා සැලසුම්කළ අභ්‍යන්තර පාලන ක්‍රමයක් කළමනාකරණය ක්‍රියාත්මක කර ඇත. මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය, වත්කම්වල ආරක්ෂාව සහ මූල්‍ය ප්‍රකාශ විධිමත්ව සකස් කිරීම සහතික කිරීමට මෙවැනි පාලනයන් ප්‍රමාණවත් බව අපි විශ්වාස කරමු.

SLICGL හි අභ්‍යන්තර විගණන කාර්යය විසින් අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටිවලට ස්ථිර අනුකූලතාව සහතික කිරීමට කාලීන සමාලෝචන සිදු කරනු ලබයි.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන විගණන කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු, විගණන පසුවිපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව කොටස්හිමියන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත. විගණකාධිපතිට විගණන කමිටුව වෙත සම්පූර්ණ හා නිදහස් ප්‍රවේශය ඇති අතර, අවශ්‍ය පරිදි කළමනාකාරිත්වයේ ස්වාධීනත්වය සපුරාලිය හැකිය.

අපගේ උපරිම දැනුම අනුව,:

I. සමාගම අදාළ සියළුම නීති, රීති සහ රෙගුලාසි සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන්වල වෙනත් ආකාරයෙන් විස්තර කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කර ඇති බවට,

II. මූල්‍ය ප්‍රකාශ සටහන්වල වෙනත් ආකාරයෙන් විස්තර කර ඇති පරිදි හැර කිසිදු සැලකියයුතු අනුකූල නොවීම් වෙනස්වීම් නොමැති බවට,

III. සමාගම විසින් සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම බදු ගාස්තු හා ව්‍යවස්ථාපිත ගෙවීම් වාර්තාකරණ දිනට ගෙවා ඇති බව හෝ අවශ්‍ය වන පරිදි වෙන්කර ඇති බවට,

IV. සංචිතකරණ සහ නුබුන්වත් මාර්ගෝපදේශවලට අනුකූල වී ඇති බව සහ පිළිගත හැකි වත්කම් ගැළපීම මගින් සියලුම සංචිත වලට පිටුබලයක් ඇති බවට,

V. අදාළ රෙගුලාසි මගින් දක්වා ඇති පරිදි සමාගමේ ස්කන්ධ ප්‍රාග්ධනය අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලන බවට සහතික කර සිටිමු.



**මාලක මිහිර බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2025 මැයි 16

# වැයකරන ලද නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොකළ හිමිකම් පිළිබඳ සහතිකය

2025 අප්‍රේල් 9

සීමාසහිත ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවේ කොටස්හිමියන් වෙත

**සීමාසහිත ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවේ 2024 දෙසම්බර් 31 ට ශුද්ධ වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් සහ වගකීම්වල ප්‍රමාණාත්මක බව පරීක්‍ෂා කිරීමේ සහතිකය**

ශ්‍රී ලංකා රු. 2,749,084,709 ක 75% විශ්වාස මට්ටමේ වැය සිදු කරන ලද නමුත් වාර්තා නොකළ ප්‍රතිපාදනය, 2023 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි හිමිකම් වගකීම්වලට එනම් ප්‍රතිරක්‍ෂණ රක්‍ෂණාවරණය (වට්ටම් නොකළ) ට අදාළව ප්‍රමාණවත් වන බවට මම මෙයින් සහතික කරමි. සමාගම විසින් රඳවා ගෙන ඇති සිද්ධි සංචිත සමඟ මෙම වැය සිදු කරන ලද නමුත් වාර්තා නොකළ ප්‍රතිපාදන, 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ වැයකළ හිමිකම්වල වගකීම්වලට අදාළවද හිමිකම් පරිහරණ වියදම් ද ඇතුළුව, බොහෝ අවස්ථාවල දී නමුත් අනාගතයේ අත් විඳින සියලුම අවස්ථාවල දී නොව අනාගත වගකීම් සපුරා ගැනීමට 75% ක ප්‍රතිශතයකින් ප්‍රමාණවත් වන බවට අපේක්‍ෂා කරනු ලබයි. (වට්ටම් නොකළ 75% විශ්වාසනීය මට්ටමේ IBNR ප්‍රතිපාදනය, CHE සඳහා දීමනාවක් ඇතුළුව ප්‍රතිරක්ෂණයේ දළ වටිනාකම රු. 2,827,243,767 කි).

එක් එක් වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම, ශ්‍රී. ලං. මු. වා. ප්‍ර. 4 හි දක්වෙන පරිදි සමාගම විසින් වගකීම්වල ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් (“LAT”) පැවැත්වීම අවශ්‍යය. උපයා නොගත් වාරික සංචිතවල (UPR) ධාරණ අගයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සඳහා වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් සිදු කරනු ලබයි. සමාගම විසින් සලසනු ලැබ ඇති රු. 10,098,370,461 ක උපයා නොගත් රක්‍ෂණ වාරික සංචිත ප්‍රතිපාදන එනම් ප්‍රතිරක්‍ෂණ රක්‍ෂණාවරණය, බොහෝ අවස්ථාවල දී අත්විඳින, සියලුම අවස්ථාවලදී එසේ නොවන, 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අවසන් නොවු අවදනම්වලට අදාළව 50 ක ප්‍රතිශතයකින් ප්‍රමාණාත්මක බවට මම මෙයින් සහතික වෙමි. එම නිසා සමාගම විසින් හඳුනාගත යුතු රක්‍ෂණ වාරික ඌණතා නොමැත.

මෙම ප්‍රතිඵල ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක මූලධර්ම අනුව තීරණය කරනු ලැබ ඇත.

ඉහත සමාගමේ කළමනාකාරිත්වය විසින් ලබා දෙන ලද තොරතුරු සහ දත්ත මත මා විශ්වාසය තබා ඇති අතර, දත්තවල සාධාරණත්වය පිළිබඳව මට සෑහීමට පත්වීම සඳහා යොදාගත් පරීක්ෂාවන්ගෙන් ඔබ්බට ලබාදුන් දත්ත මම ස්වාධීනව සත්‍යාපනය කර නොමැත.

රොබර්ටෝ මලට්ටියා
ආයුගණක ආයතනය සහ පීඨයේ (FIA) සහාය සාමාජික
NMG මූල්‍ය සේවා උපදේශන වෙනුවෙන්
දිනය: 2025 අප්‍රේල් 9

T: +65 6325 9855 F: +65 6325 4700 E: contact@NMG-Group.com
www.NMG-Group.com
109 North Bridge Road #05 21, Singapore 179097

# ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. INF/A/01/SLIC-GENERAL/AR/2024
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 30 April 2025

සභාපති
ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ පිටු අංක 116 සිට 165 දක්වා මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි (සමාගම) මූල්‍ය ප්‍රකාශන සහ පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීමේදී රාජ්‍ය විගණනය සිදු කරන වරලත් ගණකාධිකාරී සමාගමක් මා හට සහය විය.

මගේ මතය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා එහි මූල්‍ය කාර්යසාධනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණු අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 39 කෙරෙහි මම අවධානය යොමු කරවන අතර, ඉන් 2011 අංක 3 දරන රක්ෂණ රෙගුලාසි පනතේ 53 වගන්තිය පරිදි ක්‍රියාත්මක කළ වෙන් කිරීමේ තත්ත්වය සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධිත) පනතේ 30 වගන්තිය සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාවලියේ තත්ත්වය විස්තර කරයි. මගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් කරනු නොලබයි.

### 1.4 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කරන තොරතුරු එහි ඇති මාගේ විගණන වාර්තාව තුළ ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව මම කියවීමේදී, එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතීනම්, යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථ තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමු.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2001 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** 2001 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියට සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

**2.1.3** 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සමාගම සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම.

**2.2.2** ඉහත දැ හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම.

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 53 වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හා ජීවිත රක්ෂණ ව්‍යාපාරය ("සමාගම") ලෙස 2024 පෙබරවාරි 01 දින සිට සිය ව්‍යාපාර මෙහෙයුම් වෙන් කර ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් හි වත්කම් වෙන් කිරීමේ මාර්ගෝපදේශ පරිදි සමාගමට මාරු කර ඇති අතර ඉහළ උසාවිය විසින් අනුමත කළ යෝජනා ක්‍රමය සහ මාරු කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 256 වගන්තිය පරිදි බලාත්මක කරන ලදී.

කෙසේවෙතත්, තෙවැනි පාර්ශව සමඟ පරිපාලන නමේ වෙනස්වීම ඇතුළු නියමයන් තවදුරටත් ක්‍රියාත්මක වේ.

තවද, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් දීර්ඝ කිරීමක් ඉල්ලා ඇති අතර එයට හේතුව වෙන් කිරීමට අදාළව පරිපාලන නමේ වෙනස්වීම ඇතුළුව යම් පරිපාලන කරුණු තවදුරටත් ක්‍රියාත්මකව පවතින බැවින් හා වඩා පුළුල්ව පශ්චාත් වෙන් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ආමන්ත්‍රණය කරන බැවින් හා සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලිඛිත ප්‍රතිචාරයක් ලැබීමේ ක්‍රියාවලියක සිටින බැවින්ය.

ඒ අනුව, දැනට සිදුවෙමින් පවතින මෙහෙයුම් හා පරිපාලන වෙනස්වීම් හේතුවෙන්, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතේ 30 වගන්තිය යටතේ පරිපාලන ක්‍රියාපටිපාටිවලට අදාළව අනුකූල නොවීම සඳහන් කර ඇත.

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

**2.2.4** 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.



**ජී එච් ඩී ධර්මපාල**
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන | පිටුව | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 5 | 120 | **61,879** | – |
| දේපළ, පිරියත සහ උපකරණ | 6 | 122 | **611,198** | – |
| විලම්බිත බදු වත්කම් | 7 | 124 | **254,677** | – |
| මූල්‍ය ආයෝජන | 8 | 125 | **36,982,166** | – |
| අය විය යුතු ප්‍රතිරක්ෂණ | 9 | 130 | **1,972,225** | – |
| අය විය යුතු රක්ෂණ වාරික | 10 | 131 | **5,144,352** | – |
| අනෙකුත් වත්කම් | 11 | 131 | **1,583,253** | 1,905 |
| විලම්බිත වියදම් | 12 | 132 | **732,566** | – |
| මුදල් සහ මුදලට සමාන දෑ | 13 | 132 | **3,791,489** | 579,400 |
| **මුළු වත්කම්** | | | **51,133,805** | 581,305 |
| **ස්කන්ධය හා වගකීම** | | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | 14 | 132 | **14,000,000** | 500,000 |
| සීමිත ප්‍රාග්ධන සංචිතය | 15 | 133 | **1,000,000** | – |
| ප්‍රත්‍යාගණන සංචිතය | 16 | 133 | **185,236** | – |
| අලෙවියට තබා ඇති සංචිත | 17 | 133 | **4,182,152** | – |
| ප්‍රත්‍යාගණන සංචිතය | 18 | 133 | **2,611,046** | 76,345 |
| **මුළු ස්කන්ධය** | | | **21,978,434** | 576,345 |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 19 | 133 | **20,441,265** | – |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 20 | 135 | **1,391,859** | – |
| ප්‍රතිරක්ෂණ ගෙවිය යුතු | 21 | 137 | **1,751,702** | – |
| ප්‍රවර්තන බදු වගකීම් | 22 | 137 | **404,367** | 4,876 |
| අනෙකුත් වගකීම් | 23 | 137 | **4,898,032** | 84 |
| බැංකු අයිරා | 24 | 137 | **268,146** | – |
| **මුළු වගකීම්** | | | **29,155,371** | 4,960 |
| **මුළු වගකීම් සහ ස්කන්ධය** | | | **51,133,805** | 581,305 |

පිටු අංක 116 සිට 165 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.
2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.



**මාලක මිහිර බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.
එම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද අතර ඒ වෙනුවෙන් අත්සන් කරන ලදි.



**නුසිත් කුමාරතුංග**
සභාපති
කොළඹ



**ආර් පී බුල්ජන්ස්**
අධ්‍යක්ෂ

2025 අප්‍රේල් 28

# ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටුව | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|---|
| ආදායම | 25 | 138 | **20,199,038** | 19,798 |
| **දළ ලිඛිත වාරිකය** | 26 | 138 | **23,570,648** | – |
| දළ නොඉපැයූ වාරිකය සඳහා සංචිතවල වෙනස | 27.1 | 139 | **420,875** | – |
| **ශුද්ධ ඉපැයූ වාරිකය** | | | **23,991,523** | – |
| ප්‍රතිරක්ෂකයන්ට පවරා දෙන ලද වාරික | 27.2 | 139 | **(6,998,145)** | – |
| නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතවල වෙනස | 27.3 | 139 | **(432,281)** | – |
| **ශුද්ධ ඉපයූ වාරිකය** | 27 | 138 | **16,561,097** | – |
| **අනෙකුත් ආදායම** | | | | |
| ආයෝජන ආදායම | 28 | 139 | **3,987,625** | 19,798 |
| ශුද්ධ උපලබ්ධි/උපලබ්ධි නොවූ අලාභ | 29 | 140 | **(419,807)** | – |
| අනෙකුත් ආදායම | 30 | 140 | **70,123** | – |
| | | | **3,637,941** | 19,798 |
| ආදායම | | | **20,199,038** | 19,798 |
| **ප්‍රතිලාභ, අලාභ සහ වියදම්** | | | | |
| ශුද්ධ ප්‍රතිලාභ, හිමිකම් | 31 | 140 | **(9,482,391)** | – |
| ප්‍රාරක්ෂණය හා ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය | 32 | 141 | **(221,274)** | – |
| අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | | | **(6,922,050)** | (114) |
| **ශුද්ධ ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්** | | | **(16,625,715)** | (114) |
| **බදුකරණය පෙර ලාභය** | 33 | 142 | **3,573,323** | 19,684 |
| ආදායම් බදු වියදම | 34 | 142 | **(911,984)** | (4,876) |
| **වසර සඳහා ශුද්ධ ලාභය** | | | **2,661,339** | 14,808 |
| **අනෙකුත් විස්තරාත්මක ආදායම** | | | | |
| **ලාභයට හෝ අලාභයට පසුකාලීනව ප්‍රතිවර්ගීකරණය කරන අයිතම** | | | | |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම | 17 | 133 | **4,349,529** | – |
| අලෙවිය සඳහා තබා ඇති සංචිතවල සාධාරණ අගය මත විලම්බිත බදු බලපෑම | 17 | 133 | **(167,377)** | – |
| **ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ නොහැකි අයිතම** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන මත ශුද්ධ ඉපයීම | 16 | 133 | **264,623** | – |
| දේපල, පිරියත සහ උපකරණ මත සංචිතවල ප්‍රත්‍යාගණනයේ උපලබ්ධිවීම මත විලම්බිත බදු බලපෑම | 16 | 133 | **(79,387)** | – |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලැබීම් | 18 | 133 | **(180,910)** | – |
| ආයුගණක ලාභ/(අලාභ) මත විලම්බිත බදු බලපෑම | 18 | 133 | **54,272** | – |
| **වර්ෂය සඳහා බද්දෙන් ශුද්ධ අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | **4,240,750** | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | **6,902,089** | 14,808 |
| කොටසක මූලික/තනුක ඉපයීම් (රු.) | 35 | 143 | **2.07** | 0.03 |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 116 සිට 165 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ

2025 අප්‍රේල් 28

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටුව | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. '000 |
|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | | | 100,000 | – |
| නිකුත් කළ කොටස් | | | 400,000 | |
| | | | 500,000 | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | | | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | – | – |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | | 500,000 | – |
| | | | | |
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | | | 500,000 | – |
| වෙන් කිරීමෙන් පසු නිකුත් කළ කොටස් | | | 13,500,000 | – |
| සීමාකළ ප්‍රාග්ධන සංචිතය | | | – | – |
| **2024 පෙබරවාරි 01 දිනට ශේෂය** | | | 14,000,000 | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | | | – | – |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | | |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස, බද්දෙන් ශුද්ධ | 17 | 133 | – | – |
| දේපල, පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණන මත ලාභය | 16 | 133 | – | 185,236 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ප්‍රතිපූරණ අලාභ, බද්දෙන් ශුද්ධ | 18 | 133 | – | – |
| **මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ** | | | – | 185,236 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | – | 185,236 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | | 14,000,000 | 185,236 |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි

පිටු අංක 116 සිට 165 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන්හි සංකලිත කොටසකි.

කොළඹ

2025 අප්‍රේල් 28

| සීමාකල ප්‍රාග්ධන සංචිතය රු. '000 | අලෙවිය සඳහා පවතින සංචිතය රු. '000 | රඳවාගත් සංචිත රු. '000 | මුළු ස්කන්ධය රු. '000 |
|---:|---:|---:|---:|
| – | – | 61,537 | 161,537 |
| | | | 400,000 |
| – | – | 61,537 | 561,537 |
| | | | |
| – | – | 14,808 | 14,808 |
| – | – | 14,808 | 14,808 |
| – | – | 76,345 | 576,345 |
| | | | |
| – | – | 76,345 | 576,345 |
| – | – | – | 13,500,000 |
| 1,000,000 | – | – | 1,000,000 |
| 1,000,000 | – | 76,345 | 15,076,345 |
| | | | |
| – | – | 2,661,339 | 2,661,339 |
| | | | |
| – | 4,182,152 | – | 4,182,152 |
| – | – | – | 185,236 |
| – | – | (126,638) | (126,638) |
| – | 4,182,152 | (126,638) | 4,240,750 |
| – | 4,182,152 | 2,534,701 | 6,902,089 |
| 1,000,000 | 4,182,152 | 2,611,046 | 21,978,434 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටුව | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලද වාරිකය | | | **22,887,058** | – |
| ගෙවන ලද ප්‍රතිරක්ෂණ වාරිකය | | | **(6,480,361)** | – |
| **ගෙවන ලද රක්ෂණ ප්‍රතිලාභ හා හිමිකම්** | | | **(10,199,723)** | – |
| හිමිකම් හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ලැබීම | | | **1,537,161** | – |
| සේවකයින් වෙනුවෙන් ගෙවන ලද මුදල | | | **(4,324,150)** | – |
| අනෙකුත් මෙහෙයුම් මුදල් ගෙවීම් | | | **(502,037)** | 13,394 |
| මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | A | | **2,917,948** | 13,394 |
| ගෙවන ලද පාරිතෝෂික | 20 | 135 | **(77,555)** | – |
| ගෙවන ලද ආදායම් බදු | 22 | 137 | **(379,465)** | (393) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **2,460,928** | 13,001 |
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | | |
| මූල්‍ය ආයෝජන අත්පත් කර ගැනීම | | | **(11,773,912)** | – |
| මූල්‍ය ආයෝජනවලින් ලද මුදල | | | **9,169,116** | – |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලද මුදල | | | **5,310** | – |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | 6 | 122 | **(147,143)** | – |
| අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම | 5 | 120 | **(42,730)** | – |
| ලද පොලිය | | | **2,551,522** | – |
| ලද ලාභාංශය | | | **211,213** | – |
| ලබාදෙන ලද සේවක හා නියෝජිත ණය | | | **(214,296)** | – |
| අයකළ ලද සේවක හා නියෝජිත ණය | | | **460,281** | – |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල** | | | **219,361** | – |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | | |
| වෙන් කිරීම මත ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් ලද මුදල | | | **683,461** | – |
| කොටස් නිකුතුවෙන් ලද මුදල | | | **–** | 400,000 |
| **මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල** | | | **683,461** | 400,000 |
| මුදල් හා මුදලට සමාන දෑ මත විනිමය අනුපාත වෙනසේ බලපෑම | | | **(419,807)** | – |
| මුදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | | **2,943,943** | 413,001 |
| වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | | | **579,400** | 166,399 |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | B | | **3,523,343** | 579,400 |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි

පිටු අංක 116 සිට 165 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2025 අප්‍රේල් 28

**සටහන A – මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ සමඟ මෙහෙයුම් ලාභ සැසඳීම**

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනනය කළ මුදල් ප්‍රවාහ** | | |
| බදු පෙර ලාභය | 3,573,323 | 19,684 |
| ගැලපීම්: | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම මත ලාභ | 129,860 | – |
| දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ලාභ | (4,173) | – |
| ශුද්ධ සාධාරණ අගයේ ලාභ | (881,008) | – |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | 179,579 | – |
| විදේශ විනිමය ගනුදෙනු මත අලාභය | 419,807 | – |
| ලද පොලිය | (2,551,522) | – |
| ලද ලාභාංශය | (211,213) | – |
| ක්‍රමක්ෂය කළ සේවක හා ක්ෂේත්‍ර නිලධාරී පිරිවැය | 145,674 | – |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ලාභය | 800,327 | 19,684 |
| **මෙහෙයුම් වත්කම්වල ශුද්ධ වෙනස** | | |
| ලැබීම්වල (වැඩිවීම)/අඩුවීම | 123,239 | (1,198) |
| **මෙහෙයුම් වගකීම්වල ශුද්ධ වෙනස** | | |
| නොඉපයූ වාරිකවල වැඩිවීම/(අඩුවීම) | 11,406 | – |
| හිමිකම් වෙන් කිරීම්වල වැඩිවීම/(අඩුවීම) | (200,147) | – |
| ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | 2,183,123 | (5,092) |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | 2,917,948 | 13,394 |
| **සටහන ආ – මුදල් හා මුදලට සමාන දෑ හි විශ්ලේෂණ** | | |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | | |
| බැංකුවේ හා අතැති මුදල් | 1,189,148 | – |
| කෙටිකාලීන ආයෝජන | 2,602,341 | – |
| බැංකු අයිරාව | (268,146) | – |
| **මුදල් හා මුදලට සමාන දෑ** | 3,523,343 | – |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි

පිටු අංක 116 සිට 165 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ

2025 අප්‍රේල් 28

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගම (සමාගම/SLICGL) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරන රක්ෂණ මන්දිරයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් (SLIC), වෙන් කිරීමත් සමඟ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගම 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව රක්ෂණ බලපත්‍රය ලබා දී ඇති අතර SLIC බලපත්‍රය ඒ අනුව අවසන් කරන ලදී. (වෙන් කිරීම පිළිබඳ විස්තර සඳහා සටහන 39 බලන්න)

### 1.2 මව් සමාගම හා අවසාන මව් සමාගම

සමාගමේ ආසන්න සහ අවසාන මව් සමාගම ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වේ. සාමාන්‍ය කොටස්වලින් 100%ක් මව් සමාගමට අයත් වේ.

### 1.3 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ පුද්ගලයින් හා ආයතන සඳහා සියලුම පන්තිවල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාමයි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

### 1.5 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025 අප්‍රේල් 28 දින අනුමත කර අවසර ලබා දෙන ලදී.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ හා සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

### 2.2 මැනීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ, උපචිත පදනමක් මත සහ විකල්ප පදනමක් මත මනිනු ලබන පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතම හැර ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

| අයිතමය | මැනීමේ පදනම | සටහන | පිටුව |
|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 8 | 125 |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 8 | 125 |
| **මූල්‍ය නොවන වත්කම්/වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | ආයුගණකව නිශ්චය කරන වටිනාකම් | 19 | 133 |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම | ආයුගණකව අගයන අතර නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම | 20 | 135 |
| තොගය – අවශේෂ තොග | සාධාරණ අගය | 11 | 131 |
| මෝටර් රථ | සාධාරණ අගය | 6 | 122 |

සමාගම LKAS 1 – මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම යටතේ අවසර දී ඇති පරිදි ද්‍රවශීලතාව පදනම් ආකෘතිය භාවිතයෙන් සිය මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරයි.

### 2.3 මූල්‍ය කාලසීමාව

මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සකස් කරනු ලබයි.

### 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

අතිරේක තොරතුරු ඇතුළු මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදලින් ඉදිරිපත් කර ඇති අතර, ශ්‍රී ලංකා රුපියල් සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වේ. සියලු වටිනාකම් වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් ආසන්නතම රුපියල් දහසට වටයා ඇත.

### 2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

SLFRSs සහ LKASs අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම්, සහ වියදම් යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍යය. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

විනිශ්චයෙන් ඇතිවන ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව සහ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලබන අතර සැලකියයුතු වෙනස්වීම්, ඇත්නම් අනාගතයේදී බලාපොරොත්තු විය හැකි පරිදි හඳුනාගනු ලැබේ.

## 2. මැනීමේ පදනම (ඉතිරි කොටස)

### 2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය (ඉතිරි කොටස)

**රටේ වර්තමාන ආර්ථික තත්ත්වය හා අස්තමේන්තුවල අවිනශ්චිතතාව**

ශ්‍රී ලංකා ආර්ථිකය 2024 දී අපේක්ෂා කළ වට්ටමට වඩා වේගවත් ප්‍රතිසාධනයක් පෙන්නුම් කළේය. එයට පහත පිරිවැය පිළිබිඹුවන උපයෝගිතා මිලකරණය, විචක්ෂණ මුදල් හා මූල්‍ය ප්‍රතිපත්තිය, දේශීය හා බහුජාතික ණය ප්‍රතිව්‍යුහගතකරණය වැනි අඛණ්ඩ ක්‍රියාවන් හේතු විය. 2024 දී පොලී අනුපාත, උද්ධමනය, සහ දේශීය මුදලේ අගය කිරීම වැනි ප්‍රධාන ආර්ථික දර්ශක ස්ථාවර වීමත් සමඟ, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සිදුකළ වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවල වැදගත් අවිනිශ්චිතතාවන් නොවීය.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් මත සැලකියයුතු බලපෑමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව පිළිබඳ තොරතුරු පහත සටහන් යටතේ ඇතුළත් කෙරේ.

| | සටහන | පිටුව |
|---|---|---|
| **උපකල්පනය** | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන | 20 | 135 |
| මූල්‍ය නොවන වත්කම් හා මූල්‍ය වත්කම්වල හානිකරණය සඳහා වෙන් කිරීම: ප්‍රධාන පාදක වූ උපකල්පන | 8 | 125 |
| IBNR/IBNER සහ UPR ඇතුළුව ජීවිත නොවන සඳහා රක්ෂණ වෙන් කිරිම මැනිම | 19 | 133 |
| විලම්බිත අත්කර ගැනිමේ පිරිවැය (DAC) මැනීම | 12 | 132 |
| ලැයිස්තුගත නොකළ උපකරණවල සාධාරණ අගය හා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් | 8 | 125 |
| සැලකියයුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම සහිත මෝටර් රථ වල සාධාරණ අගය තීරණය කිරිම | 6 | 122 |
| අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණය | 5 | 120 |
| රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ගිවිසුම් මැනීම: ප්‍රධාන උපකල්පන | 19 සහ 25 | 133 සහ 138 |
| ද්‍රවශීලතා ප්‍රමාණාත්මකතා පරීක්ෂණය | 19 | 133 |
| **විනිශ්චයන්** | | |
| රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ගිවිසුම් මැනීම: අවදානම ඇස්තමේන්තු කිරිම සඳහා ශිල්ප තීරණය කිරීම | 19 සහ 25 | 133 සහ 138 |
| මූල්‍ය වත්කම් වර්ගීකරණය | 8 | 125 |

### 2.6 ප්‍රමාණාත්මකතාව සහ සමාහරණය

සමාන අයිතමවල සෑම ප්‍රමාණවත් වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කරනු ලබයි. LKAS 1 – "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අවසර දී ඇති පරිදි වැදගත් නොවේනම් මිස අසමාන ස්වභාවයේ හෝ වර්ගයේ අයිතම වෙනම ඉදිරිපත් කරනු ලබයි.

### 2.7 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ වර්තමාන වසර සමඟ ගැලපීමට අවශ්‍ය වන අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍රය ලබා දීමෙන් පසු 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව රක්ෂණ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදී. පෙර වසරවල යම් රක්ෂණයට අදාළ කටයුතු සමාගම සිදු කර නොමැත.

### 2.8 අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියට යාමට සමාගමේ හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර දැකියහැකි අනාගතයේදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව සිටියි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමාගමේ ඇති හැකියාව ගැන අවිශ්වාසයක් ඇති කළ හැකියැයි සැලකිය හැකි අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී, කළමනාකාරිත්වය වර්තමාන ආර්ථික තත්ත්වයන් තක්සේරු කර ඇති අතර සකස් කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම භවිතා කිරීමේ යෝග්‍යතාව සනාථ කර ඇත. ලාභදායිතාව, ආදායම් මූලාශ්‍ර, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම, මුදල් සංචිත සහ සමාගම විසින් ක්‍රියාත්මක කළ පිරිවැය කළමනාකරණ වැඩසටහන් වැනි පුළුල් සාධක රාශියක් සලකා බලමින් සිය ව්‍යාපාරයේ ඔරොත්තුදීම සහ පවත්නා ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර කරගෙන යාම සමාගම තක්සේරු කර ඇත. ලබාගතහැකි තොරතුරු මත පදනම වී විශ්ලේෂණය හා අනාගත දැක්ම මත පදනම් වී, අඛණ්ඩ පැවැත්ම පදනම මත සමාගමට ක්‍රියාත්මක වීමට ඇති හැකියාවට සැලකියයුතු සැකයක් ඇති කරන යම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

එම නිසා අඛණ්ඩ පැවැත්ම පදනම මත මූල්‍ය ප්‍රකාශ දිගටම පිළියෙළ කරනු ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු

මෙම මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කරන සියළුම කාලසීමා සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් නිත්‍ය වශයෙන් යොදා ගෙන ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ සටහන් සමඟ ඉදිරිපත් කෙරේ.

| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | සටහන | පිටුව |
|---|---|---|
| **වත්කම් හා වගකීම් හඳුනා ගැනීම** | | |
| අස්පෘශ්‍ය වත්කම් | 5 | 120 |
| දේපල, පිරියත හා උපකරණ | 6 | 122 |
| විලම්බිත බදු වත්කම් හා වගකීම් | 7 | 124 |
| මූල්‍ය ආයෝජන | 8 | 125 |
| අයවිය යුතු ප්‍රතිරක්ෂණ | 9 | 130 |
| අයවිය යුතු රක්ෂණ වාරික | 10 | 131 |
| වෙනත් වත්කම් | 11 | 131 |
| ශුද්ධ විලම්බිත වියදම් - රක්ෂණ ගිවිසුම | 12 | 132 |
| මුදල් හා මුදලට සමාන දෑ | 13 | 132 |
| ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය | 14 | 132 |
| රක්ෂණ ගිවිසුම් බැඳීම් | 19 | 133 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 20 | 135 |
| ප්‍රතිරක්ෂණ ගෙවිය යුතු | 21 | 137 |
| වෙනත් වගකීම් | 23 | 137 |
| බැංකු අයිරාව | 24 | 137 |
| **ආදායම් හා වියදම් හඳුනා ගැනීම** | | |
| ආදායම | 25 | 138 |
| දළ ලිඛිත වාරිකය | 26 | 138 |
| ශුද්ධ ඉපයූ වාරිකය | 27 | 138 |
| ආයෝජන ආදායම | 28 | 139 |
| ශුද්ධ උපලබ්ධි/උපලබ්ධි නොවූ ලාභ/(අලාභ) | 29 | 140 |
| අනෙකුත් ආදායම | 30 | 140 |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් | 31 | 140 |
| ප්‍රරක්ෂණය හා ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය | 32 | 141 |
| ආදායම් බදු වියදම් | 34 | 142 |
| **කොටස්හිමියන්ට අදාළ** | | |
| කොටසකට මූලික/තනුක ඉපයීම් | 35 | 143 |
| කොටසකට ලාභාංශය | 36 | 144 |
| **සාමාන්‍ය** | | |
| සම්බන්ධිත පාර්ශව අනාවරණ | 40 | 162 |
| වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් | 41 | 165 |
| වෙන් කිරීම් හා අසම්භාව්‍යයන් | 42 | 165 |

### 3.1 තනි සටහන් තුළ අනාවරණය නොකරන වෙනත් සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගම විසින් ස්ථිරව යොදා ගෙන ඇති පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති යම් වෙනත් අංශ තුළ ආවරණය නොකරණ නමුත් වැදගත් ලෙස සලකනු ලැබේ.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුවේ දිනවල පවතින විනිමය අනුපාත අනුව සමාගම යොදාගන්නා ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වලට නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම්, වාර්තාකරණ දිනයට පවතින විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදල්වල සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම්, සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වල ඓතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම ගනුදෙනුවේ දිනයට ඇති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලැබේ.

විදේශ විනිමය වෙනස්වීම් පොදුවේ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### 3.3 රක්ෂණ ගිවිසුම්

### නිෂ්පාදන වර්ගීකරණය

මාරුකළ රක්ෂණ අවදානම මට්ටම මත රුඳෙමින් "රක්ෂණ ගිවිසුම්" හෝ "ආයෝජන ගිවිසුම්" ලෙස රක්ෂකයින් විසින් ලියන ගිවිසුම් වර්ගීකරණය කළ යුතු බව SLFRS 4 විසින් අවශ්‍ය වේ.

රක්ෂණ ගිවිසුම් යනු විශේෂ අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම) ඔප්පුහිමියන්ට අහිතකර ලෙස බලපාන්නේනම්, ඔප්පුහිමියක්ට වන්දි ගෙවීමට එකඟවෙමින් වෙනත් පාර්ශවයකින් (ඔප්පුහිමියන්) සමාගම (රක්ෂකයා) සැලකියයුතු රක්ෂණ අවදානම් භාර ගැනීමේ ගිවිසුම්ය. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස, රක්ෂිත සිදුවීම සිදු නොවුයේනම් ලබාගත හැකි ප්‍රතිලාභ සමඟ ගෙවූ ප්‍රතිලාභ සසඳමින් සැලකියයුතු රක්ෂණ අවදානමක් තිබේද යන්න සමාගම තීරණය කරයි. රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානම මාරු කළ හැකිය.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුම්ක් ලෙස වර්ගීකරණය කර ඇත්නම්, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ලෙස අඩු වුවද, සියලු අයිතිවාසිකම් සහ බැඳීම් අවසන් වී හෝ කල් ඉකුත් වී නොමැති නම්, ඉතිරි ගිවිසුම් කාලය සඳහා එය රක්ෂණ ගිවිසුමක් ලෙස පවතී.

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශය" ට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ ඍජු ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

මුදල් ප්‍රවාහ අරමුණ සඳහා, මුදල් හා මුදලට සමාන දෑ බැංකු අයිරාවලින් ශුද්ධව ඉදිරිපත් කෙරේ.

# 4. නිකුත්කළ නමුත් වාර්තාකරණ දිනට බලාත්මක නොකළ ගිණුම්කරණ ප්‍රමිති

## 4.1 2024 ජනවාරි 01 දින සිට යොදා ගත් නව ප්‍රමිති, අර්ථ කථන, සහ සංශෝධන

සමාගම විසින් පළමු වරට සමහර ප්‍රමිති සහ සංශෝධන යොදාගත් අතර ඒවා 2024 ජනවාරි 01 දින හෝ එදිනට පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මකය.

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය |
|---|---|
| LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සංශෝධන | ගිවිසුම් සමග ජංගම හෝ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය |
| SLFRS 16 කල්බදුවලට සංශෝධන | විකුණුම් හා කල්බදුවල කල්බදු වගකීම |
| LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ SLFRS 7 මූල්‍ය උපකරණ: අනාවරණයට සංශෝධන | සැපයුම්කාර මූල්‍ය වැඩපිළිවෙල |
| LKAS 12 ට සංශෝධන | ජාත්‍යන්තර බදු ප්‍රතිසංස්කරණ – ස්ථර 2 ආදර්ශ නියමය |

ඉහත සංශෝධන සමාගමේ මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වයට සැලකියයුතු බලපෑමක් නොමැත.

## 4.2 නිකුත් කලද බලපෑමක් ඇති වියහැකි බලාත්මක නොකළ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පහත සඳහන් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කර ඇති අතර, ඒවා 2025 ජනවාරි 01 වන දින හෝ ඉන් පසුව හෝ පසු දිනක ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා අදාළ වනු ඇත.

නිකුත් කරන ලද නමුත් මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනයේදී තවමත් ක්‍රියාත්මක නොවන නව සහ සංශෝධිත ප්‍රමිතීන් පහත දැක්වේ.

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය | බලාත්මක දිනය |
|---|---|---|
| විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම්වල බලපෑම් සඳහා SLFRS 21 ප්‍රමිතියට සංශෝධන | හුවමාරු කිරීමේ හැකියාව නොමැතිකම | 2025 ජනවාරි 01 |
| SLFRS S1 – තිරසාරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සඳහා වන සාමාන්‍ය අවශ්‍යතා | තීරණ ගැනීමේදී පොදු කාර්ය මූල්‍ය වාර්තා භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වන එහි තිරසාරභාවයට අදාළ අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම | 2025 ජනවාරි 01 |
| SLFRS S2 දේශගුණයට අදාළ හෙළිදරව් කිරීම් | තීරණ ගැනීමේදී පොදු අරමුණු සහිත මූල්‍ය වාර්තා පරිශීලකයින්ට ප්‍රයෝජනවත් වන දේශගුණික අවදානම් සහ අවස්ථාවන් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම. | 2025 ජනවාරි 01 |
| SLFRS 17 – රක්ෂණ ගිවිසුම් | රක්ෂණ ගිවිසුම් වගකීම වත්මන් ඉටුකිරීමේ වටිනාකමකින් මැනීම සහ සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා වඩාත් ඒකාකාරී මිනුම් සහ ඉදිරිපත් කිරීමේ ප්‍රවේශයක් සැපයීම. | 2026 ජනවාරි 01 |
| SLFRS 9 සහ SLFRS 7 ට සංශෝධන | මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් කිරීම | 2026 ජනවාරි 01 |

**SLFRS 09 වෙතින් තාවකාලික නිදහස්වීම**

**SLFRS 09 – "මූල්‍ය උපකරණ"**

මෙම ප්‍රමිතිය LKAS 39 – "මූල්‍ය උපකරණ: පිළිගැනීම සහ මැනීම" හි පවතින මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරයි. SLFRS 09 හි මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ, මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව සාමාන්‍ය වැටයිමේ ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 09 කලින් යොදා ගැනීමට අවසරය සමඟ 2018 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා බලාත්මක වේ.

සමාගම (SLICGL) ප්‍රධාන වශයෙන් SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" සඳහා යෝජිත සංශෝධන මත පදනම් වන අතර, එමගින් රක්ෂණ ගිවිසුම් නිකුත් කරන ප්‍රමුඛ ක්‍රියාකාරකම් ඇති ආයතනවලට 2022 දී ආරම්භ වූ සංශෝධිත SLFRS 04 යොදා ගන්නා තෙක් SLFRS 09 හි සම්පූර්ණ යොදාගැනීම කල් දැමීමට අවසර දෙනු ලැබේ. 2026 ජනවාරි 01 වන දින සිට බලාත්මක වන IFRS 17 – "රක්ෂණ ගිවිසුම" ගෝලීය වශයෙන් කල් දැමීමේ ප්‍රතිඵලයක් ලෙස, තාවකාලික නිදහස් කිරීම 2026 ජනවාරි දක්වා කල් දැමීමට සමාගම අපේක්ෂා කරයි.

රක්ෂණකරුවෙකුට SLFRS 09 වෙතින් තාවකාලික නිදහස් කිරීම පහත සඳහන් අවස්ථාවලදී පමණක් හැකි වේ:

(අ) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර ඇති මූල්‍ය වගකීම් මත ලාභ සහ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා පමණක් හැර, එය SLFRS 09 හි කිසිදු පිටපතක් මීට පෙර අදාළ කර නොමැති වීම.

(ආ) 2016 අප්‍රේල් 01 දිනට පෙර වාර්ෂික වාර්තාකරණ දිනයකදී හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණ දිනයකදී එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වීම

SLFRS 04 – රක්ෂණ ගිවිසුමට කරන ලද සංශෝධනවලට අනුකූලව, රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන්නේ, පහත සඳහන් පරිදි නම්:

(අ) රක්ෂණ ගිවිසුම් වලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචක හෝ අන්තර්ගත ව්‍යුත්පන්නයන් ඇතුළත් වන මෙම SLFRS හි විෂය පථය තුළ ඇති ගිවිසුම්වලින් පැන නගින එහි වගකීම්වල ධාරණ මුදල, එහි සියලුම වගකීම්වල මුළු ධාරණ මුදලට සාපේක්ෂව සැලකිය යුතු වේ, සහ

(ආ) එහි සියලු වගකීම්වල මුළු ධාරණ මුදලට සාපේක්ෂව රක්ෂණයට සම්බන්ධ වගකීම්වල මුළු ධාරණ මුදලේ ප්‍රතිශතය:

## 4. නිකුත්කළ නමුත් වාර්තාකරණ දිනට බලාත්මක නොකළ ගිණුම්කරණ ප්‍රමිති (ඉතිරි කොටස)

### 4.2. 2024 ජනවාරි 01 දින සිට යොදා ගත් නව ප්‍රමිති, අර්ථ කථන, සහ සංශෝධන (ඉතිරි කොටස)

**SLFRS 09 වෙතින් තාවකාලික නිදහස්වීම (ඉතිරි කොටස)**

I. සියයට 90ට වඩා වැඩිවීම, හෝ

II. සියයට 90 ට අඩු හෝ සමාන නමුත් සියයට 80 ට වැඩි, සහ රක්ෂණකරු රක්ෂණයට සම්බන්ධ නොවන සැලකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවීම.

SLFRS 09 වෙතින් තාවකාලික නිදහස් කිරීම, එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇත්දැයි ඊළඟ වාර්ෂික වාර්තාකරණ දිනයකදී නැවත තක්සේරු කරනු ලබන්නේ, එම දිනයේ අවසන් වූ වාර්ෂික කාල සීමාව තුළ ආයතනයේ ක්‍රියාකාරකම්වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි.

සංශෝධිත SLFRS 04 යොදා ගැනීමට ආසන්නව, සමාගම SLFRS 09 යටතේ තම ආයෝජන සුදුසු ලෙස වර්ගීකරණය කිරීමට තීරණය කරනු ඇති අතර, එම නිසා වාර්තා කරන දිනයේදී එහි මූල්‍ය ප්‍රකාශන මත SLFRS 09 යොදා ගැනීමේ බලපෑම සම්පූර්ණයෙන්ම ප්‍රමාණනය කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, එය සමාගමේ මුළු ස්කන්ධය සැලකිය යුතු ලෙස වෙනස් නොකළ හැකි බව අපේක්ෂා කෙරේ.

### SLFRS 17 – රක්ෂණ ගිවිසුම්

SLFRS 17 2026 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වේ. SLFRS 9 සහ SLFRS 15 යොදා ගැනීමත් සමඟ කලින් යොදා ගැනීමට අවසර ඇත. SLFRS 17 මගින් SLFRS 4 රක්ෂණ ගිවිසුම් අවලංගු කරයි. සමාගම එහි අනිවාර්ය බලාත්මක දිනයේදී නව ප්‍රමිතිය යොදා ගැනීමට අදහස් කරයි.

SLFRS 4 මගින් රක්ෂණකරුවන්ට 2005 ජනවාරි මාසයට පෙර තම බල ප්‍රදේශය තුළ පැවති රක්ෂණ වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයේ ව්‍යවස්ථාපිත පදනම දිගටම භාවිතා කිරීමට අවසර ලබා දී ඇත. SLFRS 17 සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා නව මිනුම් ආකෘතියක් සමඟ ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 17 මගින් රක්ෂණ ගිවිසුම් සඳහා වගකීම් අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය වන අතර, වත්මන් තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනකම යාවත්කාලීන කරන ලද පැහැදිලි අවදානම් ගැලපීමක් සහ ඕනෑම දිනයකට – මූලික හඳුනාගැනීම මත පැන නගින එක් ලාභයකට සමාන සහ ප්‍රතිවිරුද්ධ ගිවිසුම්ගත සේවා ආන්තිකයක් ඇතුළත් වේ. අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී. ඇගයීමේ අරමුණ සඳහා, ගිවිසුම් අවදානම් ලාභදායිතා පැතිකඩ සහ නිකුත් කළ වර්ෂයට සමාන ගිවිසුම් ලෙස වෙන වෙනම කළමනාකරණය කරනු ලබන ගිවිසුම් සඳහා තවදුරටත් බෙදීම් සමඟ කාණ්ඩගත කර ඇත.

SLFRS 17 යටතේ රක්ෂණ ගිවිසුම් සඳහා ලාභය රක්ෂණ ඔප්පු හිමියන්ට සපයනු ලබන සේවාව පිළිගැනීම (CSM මුදා හැරීම), ආර්ථික නොවන අවදානමෙන් නිදහස් කිරීම (අවදානම් ගැලපුම් මුදා හැරීම) සහ ආයෝජන ලාභය මගින් නියෝජනය වේ.

රක්ෂණ ඔප්පුහිමියාට සේවා සැපයීම පිළිබිඹු කරමින්, රක්ෂණ ගිවිසුමේ ආවරණ කාලය පුරාවට ලාභයක් ලෙස CSM නිකුත් කරනු ලබයි. සහභාගීත්ව ලක්ෂණ සහිත ඇතැම් ගිවිසුම් සඳහා (අදාළ ආයෝජනවල සාධාරණ වටිනාකමෙන් සැලකිය යුතු කොටසක් සහ අනෙකුත් පාදක අයිතම රක්ෂණ ඔප්පු හිමියන්ට ගෙවනු ලබන අවස්ථාව) CSM මගින් කොටස් හිමියන්ට විචල්‍ය ගාස්තුව පිළිබිඹු කරයි. මෙම ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම් සහ උපකල්පනවල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා CSM ගලපා ඇත. අනෙකුත් සියලුම ගිවිසුම් සඳහා ආර්ථික නොවන උපකල්පන සඳහා පමණක් CSM ගලපා ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ට සේවා සැපයීම මත පදනම්ව සහ ඔප්පුවල ආයෝජන අංගවලට අදාළ ඕනෑම වාරිකයක් බැහැර කරමින් SLFRS 17 රක්ෂණ ආදායම පිළිබඳ නව මිනුමක් හඳුන්වා දෙන අතර එය ආදායම් ප්‍රකාශනයේ දැනට වාර්තා කර ඇති පවතින වාරික ආදායම් මිනුම්වලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. SLFRS 17 වෙත සංක්‍රමණය වීම සඳහා, සංක්‍රාන්ති දිනයේ CSM මත කල් දැමූ ලාභ ප්‍රමාණය තීරණය කිරීම අවශ්‍යය.

SLFRS 17 මගින් ප්‍රමිති අතීතානුයෝගීව යොදා ගෙන තිබුනේනම්, CSM ගණනය කිරීම අවශ්‍ය වේ. මෙය ප්‍රායෝගික නොවේනම්, යම් ආයතනයක් සරලකළ අතීතානුයෝගී ප්‍රවේශයක් තෝරා ගැනීම හෝ සංක්‍රාන්ති දිනයට වගකීම්වල සාධාරණ අගයට යොමුව මගින් CSM තීරණය කිරීම අවශ්‍යය. CSM තීරණය කිරීම සඳහා ප්‍රවේශය කොටස්හිමියන්ගේ ස්කන්ධය මත හෝ අනාගත වර්තාකරණ කාලසීමාවන්වල බලාත්මක ව්‍යාපාරය මත ලාභයේ ප්‍රමාණය මත සැලකියයුතු බලපෑමක් ඇතිවිය හැකිය.

SLFRS 17 මගින් මූල්‍ය ප්‍රකාශ සහ අනාවරණ ඉදිරිපත් කිරීමේදි සැලකියයුතු වෙනසක් ඇතිවිය හැකි බවට අපේක්ෂා කරන අතර එයට හේතුව නව ප්‍රමිතියේ අවශ්‍යතා සංකීර්ණ වීම සහ රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණය මෙන්ම සැලකියයුතු විනිශ්චය හා නව තක්සේරු ශිල්ප යොදා ගැනීමට මූලික වෙනසක් අවශ්‍ය විමයි. මෙවැනි ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අවශ්‍ය වෙනස්වීමේ බලපෑම දැනට අවිනිශ්චිත නමුත් වෙනත් කරුණු අතර ලාභ හඳුනා ගැනීමේ කාලය වෙනස්වීම වැනි වෙනස්වීම් අපේක්ෂා කළ හැකිය.

SLFRS 17 ක්‍රියාත්මක කිරීමත් සමඟ, රක්ෂණයට අදාළ වත්කම් හා වගකීමට ඡායා ගිණුම්කරණය අදාළ කරනු නොලැබේ.

SLFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහනක් සමාගමට ඇත. මෙම වැඩසටහන ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ යොදා ගැනීමේ ක්‍රම සංවර්ධනය, සුදුසු ක්‍රියාවලි හා පාලනයන් ස්ථාපිත කිරීම, සුදුසු දිනය නියම කිරීම සහ ආයුගණක හා මූල්‍ය පද්ධතියේ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය.

## 5. අස්පෘශ්‍ය වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**හඳුනා ගැනීම හා මැනීම**

LKAS 38 – අස්පෘශ්‍ය වත්කම්වලට අනුව, වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ප්‍රවාහය වන්නේනම් සහ වත්කමේ පිරිවැය පහසුවෙන් මැනිය හැකිනම් සමාගම අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනී.

**මැනිමේ පදනම – මෘදුකාංග**

මූලිකව හඳුනා ගැනීමෙන් පසු, මෘදුකාංග වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිවැයට ගෙන යනු ලැබේ. එහි ආර්ථික ප්‍රතිලාභවල සාධාරණ නියෝජනය සහතික කරමින් ක්‍රමක්ෂය වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පුරා ක්‍රමානුකූලව වෙන් කෙරේ.

සමාගම වත්කමක් ලෙස අභ්‍යන්තරව සංවර්ධනය කළ මෘදුකාංගය මත වියදම හඳුනා ගනු ලබන්නේ සංවර්ධනය සම්පූර්ණ කිරිමට එහි අපේක්ෂාව හා හැකියාව පෙන්වා දිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන ආකාරයෙන් මෘදුකාංගය භාවිතා කරන අවස්ථාවේදීය. ඊට අමතරව, සංවර්ධනය සම්පූර්ණ කිරිමට යන පිරිවැය පහසුවෙන් මැනිය හැකි විය යුතුය.

අභ්‍යන්තරව සංවර්ධනය කළ මෘදුකාංගයේ ප්‍රාග්ධනිත පිරිවැයට අදාළ පරිදි ප්‍රාග්ධනනියකළ ණය ගැනීමේ පිරිවැය සමඟ සංවර්ධන අදියර තුළ දරන ලද සියලූම සෘජුව ආරෝපනයවන වියදම් ඇතුළත් වේ. මෙම පිරිවැය මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පුරා ක්‍රමක්ෂය කෙරේ. අභ්‍යන්තරව සංවර්ධනය කළ මෘදුකාංගය සමුච්චිත ක්‍රමක්ෂය හා යම් සමුච්චිත හානිකරණ අලාභවලින් ශුද්ධ ප්‍රාග්ධනිත පිරිවැයට සඳහන් කෙරේ.

## 5. අස්පෘශ්‍ය වත්කම් (ඉතිරි කොටස)

**පසුකාලීන වියදම**

මෘදුකාංග වත්කම් මත පසුකාලීන වියදම එය සම්බන්ධ විශේෂ වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන අවස්ථාවේදී පමණක් ප්‍රාග්ධනීයකරණය කෙරේ. මෙම නිර්ණායකය සපුරාන්නේ නැති යම් වෙනත් වියදම එය දරන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

**හඳුනා නොගැනීම අවලංගු කිරීම**

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීම හෝ එහි භාවිතය හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවේදී හඳුනා නොගනී. එවැනි වත්කමක් බැහැර කිරීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය.

**වත්කම හඳුනානොගන්නා කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයෙහි අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගනී.**

**පර්යේෂණ හා සංවර්ධන පිරිවැයට සැලකීම**

පර්යේෂණ වියදම් සිදුවන විටම ගණනය කරයි. තනි ව්‍යාපෘතියක සංවර්ධන පිරිවැය
සමාගමට පෙන්වාදිය හැකි අවස්ථාවේදී පමණක් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනී.:

- අස්පෘශ්‍ය වත්කම භාවිතයට හෝ විකිණීමට ලබා ගත හැකි වන පරිදි සම්පූර්ණ කිරීමේ තාක්ෂණික ශක්‍යතාව
- වත්කම සම්පූර්ණ කිරීමට සහ භාවිතා කිරීමට හෝ විකිණීමට එහි අභිප්‍රාය සහ හැකියාව
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වත්කමට ඇති හැකියාව
- සංවර්ධනය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබීම
- සංවර්ධනය අතරතුර දරන ලද වියදම් විශ්වාසදායක ලෙස මැනීමේ හැකියාව
- උත්පාදනය කළ පසු අස්පෘශ්‍ය වත්කම ඵලදායී ලෙස භාවිතා කිරීමේ හැකියාව

සමාගම 2024 මූල්‍ය වසර සඳහා කිසිදු පර්යේෂණ සහ සංවර්ධන පිරිවැයක් දරා නොමැත.

### ඵලදායි ජීව කාලය, ක්‍රමක්ෂය හා හානිකරණය

### සීමිත ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම්

සීමිත ඵලදායි ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, ඒවා භාවිතයට ගත හැකි දින සිට ආරම්භ වන පරිදි, ඒවායේ ඇස්තමේන්තුගත ආර්ථික ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම ප්‍රවේශය මගින් ක්‍රමක්ෂය වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව පිළිබිඹු කරන බව සහතික කරයි. ඊට අමතරව, වත්කමට හානිකරණය සිදුවිය හැකි බවට ඇඟවීමක් ඇති විට අස්පෘශ්‍ය වත්කම් හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ.

සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ජීව කාලය, ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සහ අවශේෂ වටිනාකම සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලයෙහි හෝ වත්කමෙහි අන්තර්ගත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභවල ඕනෑම වෙනසක් තක්සේරු කරනු ලබන අතර, ඵලදායී ජීව කාලය, ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය හෝ සුන්බුන් වටිනාකමට වෙනස් කිරීම් සුදුසු පරිදි සිදු කරනු ලැබේ.

ක්‍රමක්ෂය වියදම

සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම, අනෙකුත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් යටතේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

ඵලදායී ජීවකාලය, සුන්බුන් වටිනාකම සහ ක්‍රමක්ෂය ක්‍රමය

| අස්පෘශ්‍ය වත්කම් | ඇස්තමේන්තුගත ජීව කාලය/ක්‍රමක්ෂය කාලසීමාව | සුන්බුන් වටිනාකම | ක්‍රමක්ෂය ක්‍රමය |
|---|---|---|---|
| පරිගණක මෘදුකාංගය | වසර 5 | නැත | වත්කම භාවිතයට ගත් දිනයේ සිට මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සරල මාර්ගික පදනම |

වාර්තාකරන දිනයට අසීමිත ඵලදායි ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමාගමට නොමැත.

අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණ සමාලෝචනය

සෑම වාර්තාකරණ දිනකම සහ වත්කමක් හානිකරණය විය හැකි බවට ඇඟවීම් ඇති අවස්ථාවක සමාගම අස්පෘශ්‍ය වත්කම් හානිකරණය සඳහා තක්සේරු කරයි. සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, (උදා: ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය, පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු) ඒවායේ ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර දර්ශක පවතින විට හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

හානිකරණ සමාලෝචනය වත්කමේ ධාරණ අගය සහ:

(1) විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය – නියමිත ගනුදෙනුවක් තුළ වත්කමක් විකිණීමෙන් අයකරගත හැකි මුදල

(2) භාවිතයේ වටිනාකම – සුදුසු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් වත්කමෙන් අනාගත අපේක්ෂිත මුදල්ප්‍රවාහවල වර්තමාන වටිනාකම යන දෙකෙන් ඉහළ අයකරගත හැකි අගය සමඟ සැසඳීම සිදු කරයි

වත්කමක ධාරණ අගය අයකරගතහැකි මුදල ඉක්මවන්නේනම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හානිකරණ අලාභයක් හඳුනා ගනී.

### 5.1 අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය සැසඳීම

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| **පිරිවැය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| SLIC වෙතින් මාරු කිරීම | 354,609 | – |
| එකතුකිරීම් | 42,729 | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 397,338 | – |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| SLIC වෙතින් මාරු කිරීම | 324,407 | – |
| ක්‍රමක්ෂය වෙනස | 11,052 | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 335,459 | – |
| **ධාරණ වටිනාකම** | | |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය | 61,879 | – |

## 6. දේපල, පිරියත හා උපකරණ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**හඳුනා ගැනීම හා මැනීම**

සමාගම එයට අයත් වත්කම් ගිණුම්ගත කිරීමේදී LKAS 16 – “දේපල, පිරියත හා උපකරණ” යන මූලධර්ම දැඩිලෙස පිළිපදිනු ලබයි. සේවා ලබාදීම, කුළී කටයුතු හෝ පරිපාලන කාර්යයන් සඳහා භාවිතා කළ මෙම වත්කම් වසරක් ඉක්මවන ඒවායේ අපේක්ෂිත භාවිත කාලසීමාව මත පදනම් වී හඳුනා ගනී.

**හඳුනාගැනීමේ පදනම**

වත්කම සමාගම වෙනුවෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන හා සහ එහි පිරිවැය පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී දේපල, පිරියත හා උපකරණ හඳුනාගනී.

**මැනීමේ පදනම**

වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණවල යන අයිතමයක් මූලිකමව එහි අත්කර ගැනීමේ පිරිවැයට හඳුනා ගනී. මෙම පිරිවැයට වත්කම මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට සෘජුව ආරෝපනය වන සියලුම වියදම් මෙන්ම එහි නඩත්තු වියදම් හා අයකරගතහැකි බදුමුදල් රහිත එහි කාර්යය වැඩි කිරීමට දරන ලද පසුකාලීන වියදම් ඇතුළත්ය. ස්වයං නිෂ්පාදිත වත්කමක් වන අවස්ථාවකදී, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා සකස් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය. සහ වෙනත් සෘජුව ආරෝපනය වන පිරිවැය මෙම පිරිවැයට ඇතුළත්ය.

**හඳුනා ගැනීම අවලංගු කිරීම**

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවනස්ථාවේදී හඳුනා නොගනී. එවැනි වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම් ලාභය හෝ අලාභය වත්කම් හඳුනා නොගන්නා කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගනී.

**පසුකාලීය මැනීම**

**පිරිවැය ආදර්ශය**

සමාගම මෝටර් රථ හැර සියලුම දේපල, පිරියත හා උපකරණ සඳහා පිරිවැය ආදර්ශය යොදා ගනී, මෙම වත්කම් සෘජුව ආරෝපනය කළ වියදම් ඇතුළුව ඒවායේ මිලදි ගැනීමේ පිරිවැයට වාර්තාකරන අතර සමුච්චිත ක්ෂයකිරීම සහ යම් හානිකරණ අලාභවලින් ශුද්ධව පසුකාලීනව මනිනු ලැබේ.

**ප්‍රත්‍යාගණන ආදර්ශය**

මූලික හඳුනාගැනීමෙන් පසු සමාගම මෝටර් රථ සඳහා ඒවායේ ප්‍රත්‍යාග ණන වටිනාකම්වලට ඒවා මනිමින් ප්‍රත්‍යාගණන ආකෘතිය යොදා ගන්නා අතර, පසුකාලීන සමුච්චිත ක්ෂයකිරීම සහ තක්සේරුවලින් පසු හඳුනාගත් යම් හානිකරණ අලාභ අඩුකළ  ප්‍රත්‍යාගණන දිනයට සාධාරණ අගය නියෝජනය කරයි. ධාරණ අගයෙන් සාධරණ අගය පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා, මෝටර් රථ ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් විසින් වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන වත්කම්වල ධාරණ අගයෙහි යම් වැඩිවීම ආදායම් ප්‍රකාශය තුළ වාර්තාකළ පෙර ප්‍රත්‍යාගණන අඩුවීම නැවත හැරවීමට භාවිතා කළ වෙනත් විස්තරාත්මක ආදායම තුළින් ස්කන්ධය තුළ ප්‍රත්‍යාගණන සංචිතය තුළ හඳුනා ගනී. ලාභ හෝ අලාභ තුළ පෙර හඳුනාගත් එකම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසුහැරවීම ආපසු හරවන ප්‍රමාණයට පමණක් ආදායම ලෙස එවැනි වැඩි කිරීමක් හඳුනා ගනී.

අනෙක් අතට, ධාරණ අගය තුළ යම් අඩුවීම ආදායම ප්‍රකාශය තුළ වියදමත් ලෙස වාර්තාකරයි නැතිනම් අනෙකුත් විස්තරාත්මක අදායම තුළින් ස්කන්ධය තුළ ප්‍රත්‍යාගණන සංචිතයෙන් අඩුකරනු ලබන්නේ එම වත්කම සඳහා ප්‍රත්‍යාගණන සංචිතය තුළ යම් පවත්නා ණය ශේෂයේ ප්‍රමාණයට පමණි. ප්‍රත්‍යාගණන වත්කමක් බැහැරකිරීම හෝ විශ්‍රාම ගැන්වීම මත, එම වත්කමට අදාළ ප්‍රත්‍යාගණන සංචිතයේ යම් ඉතිරි ශේෂය රඳවාගත් ඉපයීම්වලට සෘජුව මාරු කෙරේ.

**පසුකාලීන පිරිවැය**

දේපල හෝ උපකරණයක සංරචකයක් ප්‍රතිස්ථාපිත කිරිමේ පිරිවැය වත්කමේ ධාරණ අගයේ කොටසක් ලෙස ප්‍රාග්ධනනියකරණය කරනු ලබයි. එසේ කරනු ලබන්නේ සංරචකය හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ප්‍රවාහය වන සහ එය පහසුවෙන් මැනිය හැකි ප්‍රමාණයටය. ප්‍රතිස්ථාපිත සංරචකයේ ධාරණ අගය හඳුනා නොගනී.

**අලුත්වැඩියාවන් හා නඩත්තුව**

අලුත්වැඩියාවන් සහ නඩත්තු වියදම් ඒවා දරන ලද කාල සීමාව තුළ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. කෙසේ වෙතත්, ප්‍රතිසංස්කරණය මඟින් වත්කමේ පෙර තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතිය ඉක්මවා අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට සහ වත්කමේ හඳුනාගත හැකි සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීමට ඉඩ ඇති විට, ප්‍රධාන ප්‍රතිසංස්කරණවල පිරිවැය වත්කමේ දාරණ අගයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කෙරේ.

**ඵලදායී ජීව කාලය, ඵලදායි ආර්ථික කාලය, සුන්බන් වටිනාකම් සහ ක්ෂය කිරිම**

වත්කමක් භාවිතයට ගත හැකි දින සිට එය බැහැර කරන තෙක් සමාගම ක්ෂය කිරීම සඳහා වෙන් කරයි. විවිධ වත්කම් වර්ගීකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මත ක්ෂයවීම සරල මාර්ගික පදනමක් මත ගණනය කෙරේ. ප්‍රත්‍යාගණනය කළ වත්කම් පන්ති සඳහා, ප්‍රත්‍යාකරණ අවස්ථාවේදී ඉතිරි ඵලදායි ජීව කාලය මත පදනම්ව ක්ෂයවීම තීරණය කෙරේ.

සමාගම ක්ෂය කිරීම සඳහා සංරචක ප්‍රවේශය යොදාගන්නා අතර, එහිදී විවිධ ඵලදායී ජීව කාල සහිත දේපල, පිරියත සහ උපකරණ අයිතමයක සැලකිය යුතු කොටස් වෙන වෙනම ක්ෂය කරනු ලැබේ. සෑම සංරචකයක්ම සරල මාර්ගික ක්‍රමය භාවිතයෙන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා ක්ෂය කරනු ලබන අතර ක්ෂයවීම් වියදම තුළින් වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන රටාව පිළිබිඹු කරන බව සහතික කරයි.

ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් යටතේ ක්ෂයවීම වියදමක් ලෙස හඳුනාගනී.

**ඵලදායි ආර්ථික කාලය, ක්ෂය කිරීමේ අනුපාත හා සුන්බුන් අගයන්**

සෑම වාර්තාකරණ දිනයකදීම සමාගම එහි දේපළ, පිරියත සහ උපකරණවල සුන්බුන් වටිනාකම්, ඵලදායී ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රම පිළිබඳ පුළුල් සමාලෝචනයක් පවත්වයි. මෝටර් රථ වැනි ඇතැම් වත්කම් වර්ගවලට සැලකිය යුතු සුන්බුන් අගයන් තිබිය හැකි වුවද, සමාගම එහි ක්ෂයවීම් ගණනය කිරීම් වලදී සුන්බුන් අගයන් නොසලකා මධ්‍යස්ථ ප්‍රවේශයක් යොදා ගෙන ඇත. ඒ වෙනුවට, විචක්ෂණශීලී වත්කම් තක්සේරුව සහතික කිරීම සඳහා වත්කමේ සම්පූර්ණ ඵලදායී ජීව කාලය පුරාවටම ක්ෂයවීම් ක්‍රමානුකූලව අය කෙරේ.

## 6. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

මෙම නිරන්තර සමාලෝචනවල ප්‍රතිඵල මත පදනම්ව සුන්බුන් අගයන්, ඵලදායී ජීව කාලයන් හෝ ක්ෂයවීම් ක්‍රම සඳහා අවශ්‍ය ඕනෑම ගැලපීමක් සිදු කරනු ලැබේ.

| වත්කම් පන්තිය | ක්ෂයකිරීමේ අනුපාතය % | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය වසර | සුන්බුන් වටිනාකම |
|---|---|---|---|
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15 | 6 2/3 | නැත |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 15 | 6 2/3 | නැත |
| පරිගණක උපකරණ | 20 | 5 | නැත |
| මෝටර් වාහන | 20 | 5 | නැත |
| CCTV කැමරා | 33.33 | 3 | නැත |
| නාම පුවරු | 25 | 4 | නැත |

### දේපල, පිරියත හා උපකරණවල හානිකරණ සමාලෝචනය

**උපකරණය**

වාර්තාකාරණ දිනයට, සමාගම සිය දේපළ, පිරියත සහ උපකරණ සඳහා හානිකරණය පිළිබඳ යම් හැඟවීමක් තිබේද යන්න පිළිබඳව තක්සේරු කරයි. එවැනි හැඟවීම් හඳුනා ගන්නේනම්, හානිකරණ අලාභය හඳුනාගත යුතු ද යන්න තීරණය කිරීමට සමාගම වත්කමේ අයකරගතහැකි වටිනාකම තක්සේරු කරයි.

මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වටිනාකම් නිවැරදිව පිළිබිඹු කිරීම සහතික කිරීම සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඕනෑම හානිකරණ අලාභ වාර්තා කරනු ලැබේ.

### අයකරගතහැකි ප්‍රමාණය තක්සේරු කිරීම

වත්කමක අයකරගතහැකි ප්‍රමාණය යනු:

1. විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගය – බැහැර කිරීමේ පිරිවැය අඩුකළ නියමිත ගනුදෙනුවක් තුළ වත්කමක් විකිණීමෙන් ලැබිය හැකි මිල
2. භාවිතයේ වටිනාකම – සුදුසු අනුපාතයක් භාවිතා කරමින් වට්ටම් කළ වත්කමෙන් ව්‍යුත්පන්න වේයයි අපේක්ෂිත ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම යන දෙකෙන් ඉහළ අගයයි.

වත්කමක ධාරණ අගය අයකරගතහැකි මුදල ඉක්මවන්නේනම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හානිකරණ අලාභයක් හඳුනා ගනී.

### හානිකරණය ආපසු හැරවීම

අයකරගතහැකි ප්‍රමාණය තීරණය කිරීමට භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් ඇත්නම්, හානිකරණ අලාභයක් ආපසු හරවනු ලබයි. ආපසු හැරවීම හානිකරණය හඳුනාගෙන නොතිබුණේනම් ක්ෂයකිරීමෙන් ශුද්ධ වත්කමේ ධාරණ අගයට සීමා කෙරේ.

### දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය

2024 දෙසැම්බර් 31 දිනට සමාගම එහි සියලුම මෝටර් රථ පන්ති සඳහා නවතම ප්‍රත්‍යාගණනයක් සිදු කරන ලදී. සමාගමේ ප්‍රතිපත්තියට අනුව, මෝටර් රථ සෑම වසර තුනකට වරක් තක්සේරු කළ යුතු අතර ඊළඟ තක්සේරුව 2027 දෙසැම්බර 31 දින වේ.

### දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමාගමේ ප්‍රතිපත්තියට අනුව, මෝටර් රථ වත්කම් පන්ති සඳහා සෑම වසර තුනකට වරක් තක්සේරු කළ යුතය. සමාගම වෙන් කිරීමට පෙර, නවතම තක්සේරුව 2021 මූල්‍ය වසර සඳහා සිදු කරන ලදී. දේපල, පිරියත හා උපකරණවල වටිනාකම තක්සේරුකළ යුතු වත්කම් වර්ගය පිළිබඳ අදාල පළපුරුද්ද සහිත බාහිර ස්වාධින වරලත් තක්සේරු කරුවෙන් විසින් තීරණය කරන ලදී.

### සාධාරණ වටිනාකම ධූරාවලිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව, (LKAS 16 – දේපල, පිරියත හා උපකරණවල) සහ SLFRS 13 – අගය මැනීම, සමාගම එහි දේපල, පිරියත හා උපකරණවල වටිනාකම තක්සේරු කිරීමේදී සාධාරණ අගයේ ධූරාවලිය යොදා ගනී.

| | |
|---|---|
| **මට්ටම 1** | සක්‍රිය වෙළෙඳපොල තුළ ලැයිස්තුල මිලගණන් මත පදනම් වේ |
| **මට්ටම 2** | සමාන වත්කම්වල මෑතකාලීන ගනුදෙනු වැනි නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල යෙදවුම්වලින් ව්‍යුත්පන්න වීම |
| **මට්ටම 3** | වෘත්තීමය ඇගයීම් හා කළමනාකරණ උපකල්පන ඇතුළුව නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් මත විශ්වාස කිරීම |

මෝටර් රථ හැර, 2024 දෙසැම්බර් 31 දිනට තක්සේරුකරන වත්කම් වර්ගය පිළිබඳ අදාල පළපුරුද්ද සහිත බාහිර ස්වාධින වරලත් FM Valuers විසින් තක්සේරු කර ඇත.

සමාගම අදාළ පරිදි ස්වාධින තක්සේරු, වෙළෙඳපොල සැසඳීම් සහ පිරිවැය පදනම් ප්‍රවේශ මත පදනම් වී මට්ටම 2 හා මට්ටම 3 භාවිතයෙන් දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ අගය මූලිකවම තීරණය කරයි. වත්කමේ ධාරණ අගයෙන් ඒවායේ සාධාරණ වටිනාකම පිළිබිඹු වන බව සහතික කිරීමට තක්සේරු කිරීම් කලින් කල පවත්වනු ලැබේ.

### සම්පූර්ණයෙන්ම ක්ෂයකළ වත්කම්

වාර්තාකාරණ දිනයට භාවිතයේ ඇති සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ.

| වත්කම් පන්තිය | 2024 රු. '000 |
|---|---|
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 81,563 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 19,395 |
| පරිගණක උපකරණ | 112,519 |
| **එකතුව** | **213,477** |

6. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

## 6.1 දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය සැසැඳීම

| | උපකරණ<br>රු. '000 | ගෘහභාණ්ඩ හා සවිකිරීම්<br>රු. '000 | මෝටර්රථ<br>රු. '000 | වෙනත්<br>රු. '000 | එකතුව 2024<br>2024<br>රු. '000 | එකතුව<br>2023<br>රු. '000 |
|---|---|---|---|---|---|---|
| පිරිවැය/නැවත අගය කිරීම | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | **–** | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 476,680 | 186,820 | 228,145 | – | **891,645** | – |
| වසර තුළ එකතු කිරීම් | 104,034 | 39,065 | – | 4,045 | **147,144** | – |
| ප්‍රත්‍යාගණන සංචිත | – | – | 264,623 | – | **264,623** | – |
| ප්‍රත්‍යාගණනය වත්කම් මත සමුච්චිත ක්ෂය කිරීම මාරු කිරීම | – | – | (210,825) | – | **(210,825)** | – |
| වසර තුළ බැහැර කිරීම | – | – | (5,875) | – | **(5,875)** | – |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 580,714 | 225,885 | 276,068 | 4,045 | **1,086,712** | – |
| **සමුච්චිත ක්ෂය කිරීම** | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | **–** | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 269,196 | 111,028 | 192,045 | – | **572,269** | – |
| වසර සඳහා ක්ෂය කිරීමේ වෙනස | 79,865 | 14,315 | 23,518 | 1,110 | **118,808** | – |
| ප්‍රත්‍යාගණනය වත්කම් මත සමුච්චිත ක්ෂයකිරීම මාරු කිරීම | – | – | (210,825) | – | **(210,825)** | – |
| වසර තුළ බැහැර කිරීම | – | – | (4,738) | – | **(4,738)** | – |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 349,061 | 125,343 | – | 1,110 | **475,514** | – |
| ධාරණ අගය | | | | | | |
| දෙසැම්බර් 31 දිනට | 231,653 | 100,542 | 276,068 | 2,935 | **611,198** | – |

# 7. විලම්බිත බදු වත්කම්

## ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### විලම්බිත බදු වත්කම් හා වගකීම් හඳුනා ගැනීම

මූල්‍ය වර්තාකරණ අරමුණු සඳහා සහ වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් සහ බදු අරමුණ සඳහා භවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස සඳහා ගිණුම්ගත කරමින් විලම්බිත බදු හඳුනා ගනී.

වාර්තාකරන දිනට පනවනු ලැබ ඇති හෝ පසුකාලීනව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි වීමට හෝ බැරකම් බේරුම් කිරීමට නියමිත වර්ෂයට අදාළ වනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාතිකවලට විලම්බිත බදු වත්කම් හා බැරකම් මිනුම්කරණය කරනු ලැබේ.

### විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීම

සෑම වාර්තාකරණ දිනකටම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කර, අදාළ බදු ප්‍රතිලාභ උපලබ්ධි කරනු ලබන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. එවැනි අඩුකිරීම් අනාගත බදුකළ හැකි ලාභවල විභවතාව වර්ධනය වන අවස්ථාවේදී සමාලෝචනය කෙරේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකටම යළි තක්සේරු කර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම ආපසු අය කර ගැනීමට අවස්ථාව සැලසීමට හැකියාව පවතින තාක් දුරට හඳුනාගනු ලැබේ.

### විලම්බිත බදු හඳුනා ගැනීම

කීර්තිනාමය මූලිකව හඳුනා ගැනීමෙන් හෝ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මූලිකව හඳුනා ගැනීමෙන් ඇතිවන විලම්බිත බදු වගකීම හැර, විලම්බිත බදු වගකීම් සියලුම බදුකළහැකි තාවකාලික වෙනස්වීම් සඳහා හඳුනා ගනී. ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මූලිකව හඳුනා ගැනීමෙන් ඇතිවන සහ ගිණුම්කරණ ලාභය හෝ බදුකළහැකි ලාභ හෝ අලාභවලට බලපෑම් නොකරන තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත බදු හඳුනා නොගනී.

### විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කිරීම

විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලබන්නේ ප්‍රවර්තන බදු වගකීම්වලට අනුව ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීමට නීතියෙන් බලාත්මක අයිතියක් ඇත්නම් හා විලම්බිත බදු එම බදුකළහැකි ආයතනයට හා එකම බදු අධිකාරියට අදාළනම් පමණි.

### ආයතනික ආදායම් බදු අනුපාතයෙහි වෙනසේ බලපෑම

වසර තුළ ආයතනික බදු අනුපාතයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය.

## 7. විලම්බිත බදු වත්කම් (ඉතිරි කොටස)

### 7.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගත් විලම්බිත බදු වත්කම්/වගකිම් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | තාවකාලික වෙනස | බදු අනුපාතය | බදු බලපෑම | තාවකාලික වෙනස | බදු අනුපාතය | බදු බලපෑම |
| | රු. '000 | % | රු. '000 | රු. '000 | % | රු. '000 |
| **විලම්බිත බදු වත්කම්;** | | | | | | |
| **බදුකළහැකි තාවකාලික වෙනස්වීම්** | | | | | | |
| සේවක ප්‍රතිලාභ | **1,391,857** | **30** | **417,557** | – | – | – |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් | **370,083** | **30** | **111,025** | – | – | – |
| **විලම්බිත බදු වගකිම්;** | | | | | | |
| **බදුකළහැකි තාවකාලික වෙනස්වීම්** | | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | **(355,093)** | **30** | **(106,528)** | – | – | – |
| වෙළෙඳ ලැබීම් සඳහා වෙන් කිරීම් | **(557,923)** | **30** | **(167,377)** | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ හඳුනාගත් විම්හිත බදු වත්කම්** | **–** | **–** | **254,677** | – | – | – |

### 7.2 විලම්බිත බදු වත්කම් සහ වගකිම්වල වෙනස්වීම

| දෙසැම්බර් 31 දිනට | SLIC වෙතින් මාරු කිරීම | ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් | වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් | 2024 දෙසැම්බර 31 දිනට ශුද්ධ ශේෂය | විලම්බිත බදු වත්කම | විලම්බිත බදු වගකිම |
|---|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | – | (27,141) | (79,387) | **(106,528)** | – | (106,528) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 302,697 | 60,587 | 54,273 | **417,557** | 417,557 | – |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් | – | – | (167,377) | **(167,377)** | – | (167,377) |
| වෙළෙඳ ලැබීම් සඳහා වෙන් කිරීම් | 277,499 | (166,474) | – | **111,025** | 111,025 | – |
| | 580,196 | (133,028) | (192,491) | **254,677** | 528,582 | (273,905) |

## 8. මූල්‍ය ආයෝජන

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**මූල්‍ය ආයෝජන**

මූල්‍ය වත්කමක් යනු වර්ගීකරණ කිහිපයකින් එකකට අයත් ඕනෑම ප්‍රාග්ධන වත්කමකි. එයට මුදල් සහ වෙනත් ආයතනයක ප්‍රාග්ධන උපකරණ ඇතුළත් වේ. ඊට අමතරව, මූල්‍ය වත්කමක් වෙනත් ආයතනයකින් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා ගැනීමට හෝ විභවයෙන් හිතකර තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් හුවමාරු කර ගැනීමට ගිවිසුම්ගත අයිතියක් විය හැකිය. තවද, මූල්‍ය වත්කමක් ආයතනයේම ස්කන්ධ උපකරණවල විචල්‍ය අංකයක් ලැබීම අවශ්‍ය නොවන ව්‍යුත්පන්නයක් හෝ ආයතනයේම ප්‍රාග්ධන උපකරණවල ස්ථාවර සංඛ්‍යාවක් සඳහා ස්ථාවර මුදල් ප්‍රමාණයක් හෝ වෙනත් මූල්‍ය වත්කමක් හුවමාරු කිරීම හැර වෙනත් ආකාරයකින් පියවනු ලබන හෝ පියවිය හැකි ව්‍යුත්පන්නයක් වැනි ආයතනයේම ස්කන්ධ උපකරණවල පියවිය හැකි ගිවිසුමක් ද විය හැකිය.

**පහත ප්‍රධාන ප්‍රතිෂ්ඨාවන් මත පදනම් වී මූල්‍ය වත්කම් වර්ගීකරණය.**

1. **ව්‍යාපාර ආදර්ශය හා අරමුණ**
   වත්කම් දැරීම පසුපස අපේක්ෂාව (උදා- වෙළෙඳාම, දිගුකාලීන දරා ගැනීම, හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම) ආයතනය කල්පිරීමට පෙර වත්කම විකිණීමට සැලසුම් කිරීම

2. **ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ**
   වත්කමට ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් තිබීම වත්කම්ට පොලී ගෙවීම් සහ මුල් මුදල ආපසු ගෙවීම ඇතුළත්ය

3. **වෙළෙඳපොල ලැයිස්තුගත කිරීම හා ද්‍රවශීලතාව**
   වත්කම ලැයිස්තුගත කරන්නේනම් හෝ එයට ලැයිස්තුගත මිලක් ඇත්නම්, මූල්‍ය වෙළෙඳපොල තුළ වත්කම සක්‍රියව වෙළෙඳාම් කෙරේ.

4. **කල්පිරෙන තෙක් රඳවා ගැනීමේ හැකියාව හා අපේක්ෂාව**
   කල්පිරෙන තෙක් රඳවාගත්තා ආයෝජන, කල්පිරීම දක්වා දරාගැනීමේ හැකියාව හා අපේක්ෂාව ආයතනය පෙන්විය යුතුය.

   කල්පිරෙන තෙක් රඳවා ගැනීමේ වත්කම් කලින් විකිණීම අලෙවිය සඳහා තබාගත හැකි ලෙස නැවත වර්ගකරණය අවශ්‍ය වන පිරිහීමකි.

5. **අන්තර්ගත ව්‍යුත්පන්න**
   මූල්‍ය වත්කමක ව්‍යුත්පන්න ඇතුළත්නම්, ආයතනය විසින් එය වෙන් කර වෙන වෙනම ගිණුම්ගත කරන්නේද යන්න තක්සේරු කළ යුතුය.

6. **අවදානම හා වෙනස්වන ප්‍රතිෂ්ඨාවන්**
   මිල වෙනස්වීම්වලට නිතර යටත්වන මූල්‍ය වත්කම (උදා- ස්කන්ධ ආයෝජන) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට හෝ අලෙවියට තබා ඇති ලෙස සාමාන්‍යයෙන් වර්ග කෙරේ.

## 8. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

සමාගමේ පවතින මූල්‍ය වත්කම් හා ඒවායේ වර්ගීකරණ පහත දක්වේ.

**(1) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)**

**මූලික මැනීම**

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ලෙස වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් වෙළෙඳ දිනයට සාධාරණ අගයට මූලිකව හඳුනා ගන්නා අතර එම දිනය උපකරණයේ ගිවිසුම්ගත පාර්ශවයක් බවට පත්වන දිනය වේ. මූල්‍ය උපකරණ අත්කර ගැනීමට සෘජුව ආරෝපනයවන ගනුදෙනු පිරිවැය වහාම ලාභය හෝ අලාභයට වියදම් කෙරේ.

**වර්ගීකරණය සඳහා පදනම**

මූල්‍ය වත්කම් පහත නිර්ණායක මත පදනම වී ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ලෙස වර්ගීකරණය කෙරේ:

(1) අලෙවියට තබා ඇති - ආසන්න කාලයකදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණ සඳහා මූලිකව අත්කරගත් හෝ දරන ලද හෝ කෙටිකාලීන ලාභ ගැනීම සඳහා කළමනාකරණය කරන කළඹේ කොටසක් වන මූල්‍ය වත්කම්.

(2) සාධාරණ අගයට නම්කළ - ආයතනයකට පහත කරුණු අනුව මූලික හඳුනාගැනීම මත ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කමක් වෙනස් කළ නොහැකි ලෙස නම් කළ හැකිය.:

- එය ස්ථිරව මැනීම හෝ හඳුනා ගැනීම (ගිනුම්කරණ නොගැලපීම) ඉවත් කිරීම හෝ සැලකියයුතු ලෙස අඩු කිරීම
- මූල්‍ය උපකරණය ආයතනයේ අවදානම් කළමනාකරණය හෝ ආයෝජන උපායමාර්ගය අනුව සාධාරණ වටිනාකම පදනමක් මත කළමනාකරණය කිරීම

**පසුකාලීන මැනීම**

මූලික හඳුනා ගැනීමෙන් පසු, ඒවා සාධාරණ අගයට මනිනු ලැබේ. සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් ප්‍රකාශයේ සාධාරණ අගයට ලාභ හෝ අලාභ යටතේ වාර්තා කෙරේ.

ඵලදායී පොලී අනුපාතය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ උපචිත කර ඉදිරිපත් කරනු ලබයි. ලාභාංශ ආදායම ගෙවීමට අයිතිය තහවුරු වූ අවස්ථාවේදී මූල්‍ය ආදායම තුළ හඳුනා ගනී.

**හඳුනා නොගැනීම**

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ මූල්‍ය වත්කමක් පහත පරිදි හඳුනා නොගනී.

(1) වත්කමේ මුදල් ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය කල් පිරීම, හෝ

(2) වත්කම මාරු කිරීම හා හිමිකාරත්වයේ සැලකියයුතු සියලු අවදානම් හා ප්‍රදාන වෙනත් පාර්ශවයකට මාරු කිරීම

හඳුනා නොගැනීම මත, වත්කමේ ධාරණ අගය සහ ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී. යම් පෙර හඳුනාගත් සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම ප්‍රකාශය තුළ පවතින අතර ස්කන්ධයට නැවත වර්ගීකරණය නොකෙරේ.

**(2) කල්පිරීමට තබා ඇති (HTM)**

**මූලික මැනීම**

කල්පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන යනු ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, සමාගමට කල්පිරෙන තෙක් තබා ගැනීමේ අභිප්‍රාය සහ හැකියාව ඇත.

මූලික හඳුනා ගැනීම මත, කල්පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන සාධාරණ වටිනාකමට සහ සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට මනිනු ලැබේ.

**වර්ගීකරණය සඳහා පදනම**

මූල්‍ය වත්කම් පහත පරිදි වන්නේනම් පමණක් කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ:

(1) ඒවාට ස්ථිර හෝ තීරණයකළ හැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීමක් තිබීම

(2) සමාගමට කල්පිරෙන තෙක් වත්කම තබා ගැනීමේ ධනාත්මක අභිප්‍රාය සහ හැකියාව තිබීම

(3) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට හෝ අලෙවියට තබා ඇති ලෙස ඒවා නම් නොකර තිබීම

යම් ආයතනයක් කල්පිරීමට පෙර කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජනවලින් සැලකිය යුතු කොටසක් අලෙවි කරන්නේනම් හෝ නැවත වර්ගීකරණය කරන්නේනම්, (ණය පිරිහීම වැනි ඉඩදුන් හේතු සඳහා හැර) පවත්නා සියලුම කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජන අලෙවියට තබා ඇති ලෙස නැවත වර්ගීකරණය කළ යුතු අතර ඉදිරි මූල්‍ය වසර දෙක සඳහා කල්පිරෙන තෙක් තබා ඇති ලෙස වත්කම් වර්ගීකරණය කළ නොහැක.

**පසුකාලීන මැනීම**

කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජන සඵල පොලී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීනව මනිනු ලැබේ.

(1) සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් පොලිය ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

(2) ආයෝජනයක ක්‍රමක්ෂය පිරිවැය එහි මූලික පිරිවැය ගනිමින්, මුල් මුදල ගෙවීම සඳහා ගලපමින් සහ වත්කමේ ජීව කාලය පුරා යම් වාරික හෝ වට්ටම් ක්‍රමක්ෂය කරමින් අදාළනම් හානිකරණ අලාභ සඳහා ගිණුම්ගත කරමින් තීරණය කෙරේ.

**හානිකරණය**

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී, කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජන ණය අලාභ සිදුවීමක විෂය මූලික සාක්ෂියක් ඇත්නම් හානිකරණය සඳහා තක්සේරු කරන්නේ,

(1) හානිකරණය හඳුනාගන්නේනම්, ධාරණ අගය අඩු කරන්නේනම් සහ අලාභ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගන්නේනම්,

(2) හානිකරණ අලාභ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ලෙස අගය කරන්නේනම් සහ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරන්නේනම්,

(3) පසුකාලීන සිදුවීමක් හානිකරණය ආපසු හරවන්නේනම්, ආපසු හැරවීම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා නමුත් එයට පෙර වාර්තාගත හානිකරණ අලාභය ඉක්මවිය නොහැකිනම පමණි.

**හඳුනාගැනීම**

කල්පිරෙන තෙක් තබා ඇති ලෙස වර්ගීකරණය කළ මූල්‍ය වත්කමක් පහත අවස්ථාවලදී හඳුනා නොගනී:

(1) වත්කමේ මුදල් ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය කල් පිරීම, හෝ

(2) වත්කම විකිණීම හෝ මාරු කිරීම හා හිමිකාරත්වයේ සැලකියයුතු සියලු අවදානම් හා ප්‍රදාන වෙනත් පාර්ශවයකට මාරු කිරීම

හඳුනා නොගැනීම මත, වත්කම විකුණන්නේනම්, ලාභය හෝ අලාභය තුළින් ආපසු හරවා නොමැති හානිකරණ අලාභ සඳහා හැර යම් ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

**(3) ණය හා ලැබීම් (L&R)**

**මූලික මැනීම**

ණය හා ලැබීම් යනු සක්‍රීය වෙළෙඳපොලක ලැයිස්තුගත නොකළ ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. ආයතනය මෙම වත්කමේ ගිවිසුම්ගත පාර්ශවකරුවෙන් වන අවස්ථාවේදී මෙම වත්කම් හඳුනා ගනී.

8. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

මූලික හඳුනා ගැනීම මත, ණය හා ලැබීම් සාධාරණ වටිනාකම සහ වත්කම අත්කර ගැනීමට සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මනිනු ලැබේ.

පහළ වෙළෙඳපොල පොලී අනුපාතවලට නිකුත්කළ සේවක ණය සඳහා, වෙළෙඳපොලට අදාළ පොලී අනුපාත (සමාන අවදානම් පැතිකඩ ණය සඳහා පවත්නා අනුපාතය වැනි) භාවිතයෙන් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කරමින් සාධාරණ අගය තීරණය කෙරේ. ලබාදුන් ණය ප්‍රමාණය හා සාධාරණ අගය අතර වෙනස LKAS 19 - සේවක ප්‍රතිලාභ අනුව සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනා ගනී.

වර්ගීකරණය සඳහා පදනම

LKAS 39 යටතේ ණය හා ලැබීම් ලෙස මූල්‍ය වත්කමක් වර්ගීකරණය කිරීමට, පහත සාධක සපුරාලිය යුතුය:

(1) වත්කමට ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් තිබිය යුතුය.

(2) වත්කම සක්‍රිය වෙළඳපොළක ලැයිස්තුගත නොකළ යුතුය.

(3) වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට හෝ අලෙවියට තබා ඇති ලෙස නම් නොකළ යුතුය.

(4) වත්කම සාමාන්‍යයෙන් ගනුදෙනුකරුවන්, සේවකයින් හෝ වෙනත් ණයගැතියන් සමඟ තිබිය යුතුය (සේවක ණය සහ වෙළෙඳ ලැබීම් ඇතුළුව)

(5) වත්කමේ අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා ණය අවදානම තක්සේරු කළ යුතුය.

පසුකාලීන මැනීම

මූලික හඳුනා ගැනීම මත, ණය හා ලැබීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි.

(1) පොලී අනුපාතය සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

(2) හඳුනා නොගැනීම හෝ හානිකරණයයෙන් ඇතිවන යම් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

(3) පහළ වෙළෙඳපොල පොලී අනුපාතවලට ලබා දුන්නද සේවක ණය සඵල පොලී අනුපාතයට උපචිත කරන අතර එය මූලික හඳුනා ගැනීමට අදාළ වෙළෙඳපොල මට්ටම් අනුපාතය මත පදනම් වේ.

ධාරණ අගය ආපසු ගෙවීම් සඳහා ගලපන අතර අයකළ නිමකල පොලිය හා සඵල පොලී අනුපාතය අතර යම් වෙනස ණය කාලසීමාව පුරා ඇතුළත් කෙරේ.

හානිකරණය

එක් එක් වාර්තාකරන දිනයට, සමාගම ණය අවදානමේ විෂයමූලක සාක්ෂිය හේතුවෙන් හානිකරණය සඳහා ණය හා ලැබීම් තක්සේරු කෙරේ.

හානිකරණය හඳුනාගන්නේනම්:

(1) ධාරණ අගය සැකසහිත ගිණුම් සඳහා දීමනාවක් තුළින් අඩු කෙරේ.

(2) ධාරණ අගය හා මුල් සඵල පොලී අනුපාතයට වට්ටම්කල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස හානිකරණ අලාභය මනිනු ලැබේ.

අලාභය ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී

සේවක ණය සඳහා, සේවකයෙක් ණය ආපසු ගෙවීමට පෙර ඉවත්වන්නේනම්, යම් හිඟ ශේෂ හානිකරණය සඳහා තක්සේරු කෙරේ. ආපසු අයකිරීම අවිනිශ්චිතනම්, ඉතිරි ශේෂය කපා හරිනු ඇත නැතිනම් අවසන් නිරවුල් කිරීම අනුව හිලව් කරනු ඇත.

**පෙර හානිකරණය වූ ණයක් ආපසු ලදහොත්:**

ආපසු හැරවීම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා නමුත් ධාරණ අගය එහි මුල් ක්‍රමක්ෂය පිරිවැය ඉක්මවිය නොහැක.

හඳුනා නොගැනීම

සේවක ණය ඇතුළු ණය හා ලැබීම් පහත අවස්ථාවලදී හඳුනා නොගනී:

(1) මුදල් ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය කල් පිරීම,

(2) වත්කම මාරු කිරීම හා හිමිකාරත්වයේ සැලකියයුතු සියලු අවදානම් හා ප්‍රදාන වෙනත් පාර්ශවයකට මාරු කිරීම.

(3) සේවක ණය සඳහා, ආපසු ගෙවීම වැටුප්වලින් අඩුකිරීම් හෝ අවසන් වන්දිගෙවීම් ගැලපීම් තුලින් සම්පූර්ණ කිරීම හෝ අයකරගත නොහැකිබව හෝ කපාහැර ඇති බවට සැලකීම.

හඳුනා නොගැනීම මත, ධාරණ අගය හා ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභය හෝ අලාභය තුල හඳුනා ගනී.

**(4) අලෙවියට තබා ඇති වත්කම් (AFS)**

**මූලික මැනීම**

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් යනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා අලෙවියට තබා ඇති ලෙස නම් කර ඇති හෝ ණය සහ ලැබීම්, කල්පිරීම දක්වා රඳවා ගත් ආයෝජන, හෝ ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් වැනි වෙනත් වර්ගීකරණවලට වර්ගීකරණය කර නොමැති මූල්‍ය වත්කම් වේ. අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් යනු සාමාන්‍යයෙන් සමාගම අවිනිශ්චිත කාලයක් සඳහා තබා ගැනීමට අදහස් කරන ස්කන්ධ සහ ණය උපකරණවල ආයෝජන වන නමුත් ද්‍රවශීලතාවය සඳහා අවශ්‍යතා හෝ පොලී අනුපාත, විනිමය අනුපාත හෝ ස්කන්ධ මිල ගණන් වල වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් විකිණිය හැකි වත්කම් වෙති.

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර එයට වත්කම අත්කර ගැනීමට සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය. මූලික හඳුනා ගැනීම වෙළෙඳ දිනයට සිදු කෙරේ.

**පසුකාලීන මැනීම**

මූලික හඳුනා ගැනීමෙන් පසු, අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් පහත සලකා බැලීම් සමඟ සාධාරණ අගයට මනිනු ලැබේ.

(1) ප්‍රාග්ධන උපකරණ -මේවා අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ සෘජුවම හඳුනාගෙන ඇති සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් සමඟ සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, වත්කම හඳුනා නොගන්නා හෝ හානිකරණය කරන තුරු ස්කන්ධවල වෙනම සංරචකයක (අලෙවියට තබා ඇති සංචිතය) සමුච්චිත කරනු ලැබේ.

(2) ණය උපකරණ – වත්කම හානිකරණය වී නොමැති නම්, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ සෘජුවම හඳුනාගත් සාධාරණ අගයෙහි වෙනස්වීම් සමඟ සාධාරණ අගයට මේවා මනිනු ලැබේ. එවැනි අවස්ථාවක දී, හානිකරණ අලාභය ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී.

අලෙවියට තබා ඇති වත්කම්වල ලාභ සහ අලාභ

(1) **උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ:** ණය සහ ප්‍රාග්ධන උපකරණ දෙක සඳහා සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ සෘජුවම වාර්තා කෙරේ. ණය උපකරණ සඳහා, වත්කම විකුණන හෝ හානිකරණය වන තෙක් උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඇතුළත් වේ.

(2) **උපලබ්ධි වූ ලාභ සහ අලාභ:** අලෙවියට තබා ඇති මූල්‍ය වත්කමක් විකුණීමේදී හෝ හඳුනා නොගැනීමේදී, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභය, හඳුනා නොගැනීමේදී ලාභ හෝ අලාභයේ කොටසක් ලෙස ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

(3) **හානිකරණ අලාභ:** අලෙවියට තබා ඇති මූල්‍ය වත්කමක් හානිකරණය වූ බවට විෂයමූලික සාක්ෂි තිබේ නම් (උදා: එහි පිරිවැයට වඩා අඩු සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු හෝ දිගුකාලීන පහත වැටීමක්), හානිකරණ අලාභය ලාභ හෝ අලාභයේ හඳුනාගන්නා අතර, සමුච්චිත අලාභය අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

## 8. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

### හානිකරණය

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂියක් තිබේද (පහත පරිදි) යන්න තක්සේරු කිරීමට එක් එක් වාර්තාකරණ දිනයට හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලබයි:

(1) පිරිවැයට පහළ සාධාරණ අගය තුළ සැලකියයුතු හෝ කල්පවත්නා පහත වැටීම.

(2) නිකුත් කරන්නාගේ මූල්‍ය දුෂ්කරතාව (ණය උපකරණ සඳහා)

(3) නිකුත් කරන්නාගේ පැහැර හැරීම හෝ සැලකියයුතු ණය පිරිහීම පිළිබඳ වෙනත් සාක්ෂිය

**හානිකරණය හඳුනාගන්නේ නම්,:**

(1) ණය උපකරණ - අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගෙන ඇති සමුච්චිත අලාභය ලාභය හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

(2) ස්කන්ධ උපකරණ – හානිකරණ අලාභය ලාභය හෝ අලාභය තුළින් ආපසු හරවනු නොලැබේ. කෙසේවෙතත් පසුකාලීන කාලසීමාවල ස්කන්ධ උපකරණයක සාධාරණ අගයෙහි ආපසු අයකිරීමක් ඇත්නම් ලාභය හෝ අලාභය තුළ නොව අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ සෘජුවම හඳුනා ගනී.

### නැවත වර්ගීකරණය

LKAS 39 යටතේ මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය ඉහළින් සීමිත වන අතර දුර්ලභ අවස්ථා යටතේ පමණක් අවසර ඇත.

නැවත වර්ගීකරණය සඳහා ප්‍රධාන ප්‍රතිෂ්ඨාවන්

| සාධකය | බලපෑම |
|---|---|
| මැනීමේ පදනම | වත්කම නව වර්ගීකරණය මත පදනම් වී මැනිය යුතුය. |
| ලාභ හෝ අලාභ බලපෑම | උපලබ්ධි නොවූ ලාභ/අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ලාභය හෝ අලාභයට මාරු කිරීම අවශ්‍ය නැත. |
| ආපසු හැරවීම | නැවත වර්ගීකරණය කල පසු. වත්කම ක්‍රමානුකූලව LKAS 39 යටතේ ආපසු හැරවිය නොහැක. |
| නියාමන අනුකූලතාව | නැවත වර්ගීකරණය LKAS 39 නීතිවලට අනුකූල විය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල සාධාරණය කළ යුතුය. |

### LKAS 39 යටතේ නැවත වර්ගීකරණය නියමයන්

| සිට | දක්වා | ඉඩදුන් | තත්ත්වයන්/සීමා කිරීම් |
|---|---|---|---|
| FVTPL | AFS, HTM, L&R | දුර්ලභ | ව්‍යාපාර ආදර්ශයක සැලකියයුතු වෙනස වැනි දුර්ලභ අවස්ථාවල පමණක් ඉඩදී ඇත. |
| AFS | HTM | ඔව් | සමාගම මෙම වත්කම් කල්පිරෙන තුරු තබාගැනීමට තීරණය කරයිනම්, අනෙකුත් විස්තරාත්මක ආදායමේ උපලබ්ධි නොවූ ලාභ/අලාභ පවතින අතර කාලය පුරා ක්‍රමක්ෂය කෙරේ. |
| HTM | AFS | ඔව් | ඉඩදෙන ලද නමුත් සැලකියයුතු ප්‍රමාණය නැවත වර්ගීකරනය කරන්නේනම්, සමස්ත කල්පිරෙන තෙක් තබාගන්නා කළඹ වසර දෙකකට අලෙවියට තබා ඇති ලෙස නැවත වර්ගීකරණය කළ යුතුය. |
| L&R | AFS | ඔව් | වත්කම කල්පිරෙන තෙක් තවදුරටත් තබා ගැනීමට සමාගම අදහස් නොකරයි නම් ඉඩ ලබා දේ. |
| HTM හෝ L&R | FVTPL | නැත | ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නැවත වර්ගීකරණය LKAS 39 යටතේ ඉඩ නැත. |

සමාගමේ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ඒවායේ වර්ගීකරණ පහත පරිදි සාරාංශ කෙරේ.;

| මූල්‍ය වත්කම | HTM | L&R | AFS | FVTPL |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | √ | | √ | |
| ලැයිස්තුගත ණයකර | √ | | √ | |
| ලැයිස්තුගත නොකළ ණයකර | | √ | | |
| වාණිජ පත්‍රිකා | | | √ | |
| කාලීන තැන්පතු | | √ | | |
| ඒකක භාර | | | √ | √ |
| ලැයිස්තුගත කොටස් | | | √ | √ |
| සේවක ණය හා ලැබීම් | | √ | | |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | | √ | | |
| වාරික ලැබීම් | | √ | | |
| වෙනත් මූල්‍ය වත්කම් | | √ | | |
| මුදල් හා මුදලට සමාන දෑ | | √ | | |

## 8. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

සමාගමේ මූල්‍ය ආයෝජන පහත පරිදි සාරාංශ කෙරේ.

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 ධාරණ අගය රු. '000 | 2024 සාධාරණ අගය රු. '000 | 2023 ධාරණ අගය රු. '000 | 2023 සාධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|---|
| **මූල්‍ය ආයෝජන** | | | | | |
| කල්පිරීමට තබා ඇති (HTM) | 8.1 | **3,048,129** | **3,051,119** | – | – |
| ණය හා ලැබීම් (L&R) | 8.2 | **7,337,968** | **7,337,968** | – | – |
| අලෙවියට තබා ඇති (AFS) | 8.3 | **23,611,511** | **23,611,511** | – | – |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | 8.4 | **2,984,558** | **2,984,558** | – | – |
| **මුළු මූල්‍ය ආයෝජන** | | **36,982,166** | **36,985,156** | – | – |

### 8.1 කල්පිරෙන තෙක් තබා ගන්නා (HTM)

| | 2024 ධාරණ අගය | 2024 සාධාරණ අගය | 2023 ධාරණ අගය | 2023 සාධාරණ අගය |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | **1,029,294** | **1,032,284** | – | – |
| ලැයිස්තුගත ණයකර | **2,018,835** | **2,438,835** | – | – |
| | **3,048,129** | **3,471,119** | – | – |

### 8.2 ණය හා ලැබීම් (L&R)

| | 2024 ධාරණ අගය | 2024 සාධාරණ අගය | 2023 ධාරණ අගය | 2023 සාධාරණ අගය |
|---|---|---|---|---|
| ලැයිස්තුගත නොකළ ණයකර | **2,569,781** | **3,197,881** | – | – |
| කාලීන තැන්පතු | **3,310,237** | **3,310,237** | – | – |
| සේවක ණය හා ලැබීම් | **1,457,950** | **1,457,950** | – | – |
| | **7,337,968** | **7,966,068** | – | – |

### 8.3 අලෙවියට තබා ඇති (AFS)

| | 2024 ධාරණ අගය | 2024 සාධාරණ අගය | 2023 ධාරණ අගය | 2023 සාධාරණ අගය |
|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | **8,873,396** | **8,873,396** | – | – |
| ඒකක භාර | **1,557,712** | **1,557,712** | – | – |
| ලැයිස්තුගත ණයකර | **1,263,668** | **1,263,668** | – | – |
| වානිජ පත්‍රිකා | **1,717,952** | **1,717,952** | – | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | **10,198,783** | **10,198,783** | – | – |
| | **23,611,511** | **23,611,511** | – | – |

### 8.4 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL)

| දෙසැම්බර් 31 දිනට | 2024 ධාරණ අගය රු. '000 | 2024 සාධාරණ අගය රු. '000 | 2023 ධාරණ අගය රු. '000 | 2023 සාධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | **1,446,350** | **1,446,350** | – | – |
| ඒකක භාර | **1,538,208** | **1,538,208** | – | – |
| | **2,984,558** | **2,984,558** | – | – |

මූල්‍ය වසර තුළ, කිසිදු හානිකරණ අලාභයක් හඳුනා නොගත් අතර මූල්‍ය වත්කම්වල නැවත වර්ගීකරණ සිදු කර නොමැත.

8. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

## 8.5 මූල්‍ය ආයෝජනවල ධාරණ අගයන් හී වෙනස්වීම

| | අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් රු. '000 | ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම රු. '000 | කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් රු. '000 | ණය හා ලැබීම් රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | **–** |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 17,696,626 | 2,642,060 | 3,561,270 | 7,225,211 | **31,125,167** |
| වෙන් කිරීමේ අවස්ථාවේදී සත්‍ය වත්කම් වෙන් කිරීමේ බලපෑම | 3,722 | (94,184) | – | 273,404 | **182,942** |
| මිලදී ගැනීම් | 2,045,244 | – | – | 9,942,964 | **11,988,208** |
| කල්පිරීම් | (1,512,000) | – | (450,000) | (9,828,003) | **(11,790,003)** |
| බැහැර කිරීම් | – | (444,685) | – | – | **(444,685)** |
| දායක අයිතිය ක්‍රියාත්මක කිරීම (හිමිකම් නිකුතුව) | 747,755 | 27 | – | – | **747,782** |
| අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ වාර්තාකළ ශුද්ධ සාධාරණ ලාභ | 4,331,506 | – | – | – | **4,331,506** |
| ආදායම් ප්‍රකාශයේ වාර්ගාකළ උපලබ්ධි ප්‍රාග්ධන ලාභ/(අලාභ) | (39,376) | 59,544 | – | – | **20,168** |
| ලාභය හෝ අලාභය තුල වාර්තාකළ සාධාරණ අගයේ ලාභ සහ විදේශ විනිමය ගනුදෙනු | – | 821,796 | – | (215,052) | **606,744** |
| සාධාරණ අගය ගැලපීම | – | – | – | 87,988 | **87,988** |
| උපචිත පොලය තුළ ශුද්ධ වෙනස | 346,627 | – | (69,769) | (148,544) | **128,314** |
| ක්‍රමක්ෂය ගැලපීම | (8,593) | – | 6,628 | – | **(1,965)** |
| 2024 දෙසැම්බර් 31 දිනට | 23,611,511 | 2,984,558 | 3,048,129 | 7,337,968 | **36,982,166** |

## 9. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සටහන 8හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය බලන්න.

සමාගම ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල තුළින් එහි සියලු මෙහෙයුම් හරහා ව්‍යාපාරයේ සාමාන්‍ය තත්ත්වය තුළ රක්ෂණ අවදානම් පවරනු ලබයි. ප්‍රතිරක්ෂණකයින්ගෙන් අයකර ගත හැකි මුදල්, සමඟ ප්‍රතිරක්ෂණකරුගේ ඔප්පු හා සම්බන්ධ හිඟ හිමිකම් ප්‍රතිපාදන හෝ පියවා ඇති හිමිකම් වලට අනුකූල වන ආකාරයෙන් ඇස්තමේන්තු කරන අයකරගත හැකි ප්‍රමාණ ප්‍රතිරක්ෂණ ලැබීම්වල නියෝජනය කරයි. මෙම ඇස්තමේන්තු අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුම්වල නියමයන් අනුව තිරණය කෙරේ.

**ප්‍රතිරක්ෂණ ලැබිය යුතු හානිකරණය**

සමාගම වාර්තාකරන දිනයට ප්‍රතිරක්ෂණ ලැබීම්වල විභව හානිකරණ අලාභය තක්සේරු කර ඇත. මූල්‍ය ස්ථාවරත්වය, ගෙවීම් පැහැර හැරීම හෝ අපචාරය, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල මැනියහැකි අඩුවීම සඳහන් කරන නිරීක්ෂණය කළ හැකි දත්ත සහ ප්‍රතිරක්ෂණයේ විශ්වාසනීයත්වය සම්බන්ධ නිරන්තර සමාලෝචන වැනි හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂියට සලකා බලා ඇත. මෙම තක්සේරුව මත පදනම් වී, නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම සහතික කිරීමට හා සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව හා විශ්වාසනීයත්වය පවත්වා ගැනීමට ප්‍රමාණවත් වෙන් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇත.

ප්‍රතිරක්ෂණ ලැබීම්වල ධාරණ අගය වාර්තාකරණ දිනයට සාධාරණ අගයට ආසන්න වේ.

**හිඟ හිමිකම් මත ප්‍රතිරක්ෂණ ලැබිය යුතු**

හිඟ හිමිකම් මත ප්‍රතිරක්ෂණ ලැබීම් ප්‍රතිරක්ෂණ ගිවිසුම්වල නියමන්ට අනුකූලව ප්‍රතිරක්ෂකයින්ගෙන් ලබාගතහැකි මුදල නියෝජනය කරයි.

සමාගම ප්‍රතිරක්ෂකයින්ගේ මූල්‍ය ස්ථාවරත්වය, හිමිකම් නිරවුල් කිරීමේ රටාවන් සහ ගිවිසුම්ගත බැඳීම් මත පදනම් වී මෙම ප්‍රමාණ අයකරගැනීමේ හැකියාව තක්සේරු කරයි. මෙයට ගෙවා නොමැති හිමිකම් මත ප්‍රතිරක්ෂණ සංචිත හා ලැබි නොමැති ප්‍රතිරක්ෂණ ලැබීම් ඇතුළත් වේ.

### 9.1 ප්‍රතිරක්ෂණ ලැබිය යුතු විස්තර විග්‍රහය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ගෙවන ලද හිමිකම් මත ලැබියයුතු ප්‍රතිරක්ෂණ | 289,315 | – |
| නිරවුල්කළ හිමිකම් මත ප්‍රතිරක්ෂණ ලැබීම් | 1,740,034 | – |
| හිඟ හිමිකම් මත ප්‍රතිරක්ෂණ ලැබීම් | (57,124) | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,972,225 | – |

## 10. වාරික ලැබිය යුතු

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සටහන 8හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලබන්න.

රක්ෂණ ලැබීම් ගෙවියයුතු අවස්ථාවේදි හඳුනාගන්නා අතර ලැබියහැකි ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. වාරික අයකිරීමේ හැකියාව අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ වාරික ගෙවීමේ ඇප උපදේශයට (PPW) අනුව, රක්ෂණ ඔප්පු එම උපදේශයට යටත්ව නිකුත් කරන අතර. පියවූයේ නැත්නම් දින 60 කල්පිරීම මත අවලංගු කෙරේ.

**හානිකරණය**

වාරික ලැබීම් මත හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් හානිකරන අලාභ සමඟ ධාරණ අගය හා ලබාගතහැකි මුදල අතර වෙනස ලෙස මනිනු ලැබේ. හානිකරණ තක්සේරුව ඇපකර පාර්ශවයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ගෙවීම් පැහැර හැරීම හෝ අපචාරය, බුන්වත්භාවය හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය වීමේ සම්භාවිතාව සහ ණයගැතියාගේ හිඟ මුදල් පියවීමේ හැකියාවට බලපාන ආර්ථික තත්ත්වයන්හි අහිතකර වෙනස්කම් වැනි දර්ශක ඇතුළුව විෂයමූලික සාක්ෂි මත පදනම් වේ.

ලැබීම්වලින් හානිකරණ සංඥා පෙන්වන අවස්ථාවේදී, බොල්ණය සඳහා සුදුසු වෙන් කිරීම් හඳුනා ගන්නා අතර ආපසු අයකිරිම නොලැබෙනබව කල්පනා කරන අවස්ථාවේ කල්පැනපු ගිණුම් කපාහැරීමේ හැකියාව සමාලෝචනය කෙරේ. සමාගම නිරීක්ෂණය කළ හැකි දත්ත සහ ඓතිහාසික ප්‍රවනතා මත පදනම් වී ණය අවදානම් නිරාවරණය විශ්ලේෂණය කරමින් අඛණ්ඩව වාරික ලැබීම් නියාමනය කරයි.

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරික | 10.1 | 2,541,727 | – |
| නියෝජිතයින්ගෙන්, සහ තැරැව්කරුවන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබියයුතු වාරික | 10.2 | 2,602,625 | – |
| | | 5,144,352 | – |

## 10.1 ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරික

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| වසර ආරම්භයේදී | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 3,163,904 | – |
| වසර තුළ ශුද්ධ වෙනස | (489,674) | – |
| ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරික | 2,674,230 | – |
| | 2,674,230 | – |
| **ලැබියයුතු වාරිකවල හානිකරණය** | | |
| වසර ආරම්භයේදී | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | (509,721) | – |
| වසර තුළ සිදුකළ ආපසු හැරවීම | 377,218 | – |
| වසර අවසානයේදී | (132,503) | – |
| **ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරික** | 2,541,727 | – |

## 10.2 නියෝජිතයින්ගෙන් තැරැව්කරුවන්ගෙන්, සහ අතරමැදියන්ගෙන් වාරික ලැබිය යුතු

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| වසර ආරම්භයේදී | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 2,165,181 | – |
| වසර තුළ ශුද්ධ වෙනස | 617,482 | – |
| නියෝජිතයින්ගෙන්, තැරැව්කරුවන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබියයුතු වාරික | 2,782,663 | – |
| | 2,782,663 | – |
| **ලැබියයුතු වාරිකවල හානිකරණය** | | |
| වසර ආරම්භයේදී | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | (358,602) | – |
| වසර තුළ සිදුකළ ආපසුහැරවීම | 178,564 | – |
| **නියෝජිතයින්ගෙන්, තැරැව්කරුවන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබියයුතු වාරික** | 2,602,625 | – |

සමාගම වාර්තාකරණ දිනයට වාරික ලැබීම් මත විභව හානිකරණ අලාභ තක්සේරු කර ඇති අතර ප්‍රමාණවත් වාරික මූල්‍ය ප්‍රකාශවල සිදුකර ඇත.

## 11. අනෙකුත් වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සටහන 8හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය බලන්න.

**තොග**

මුද්‍රිත ආකෘති, ලිපිද්‍රව්‍ය, අලෙවිකරණ ද්‍රව්‍ය, සහ බේරා ගත් භාණ්ඩ ඇතුළත් තොගය, බේරාගත් තොගය සඳහා හැර පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධිකළහැකි වටිනාකම යන දෙකෙන් අඩුමිලට මනිනු ලැබේ. බරතබනලද සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතයෙන් පිරිවැය පොදුවේ තීරණය කරන අතර, ශුද්ධ උපලබ්ධිකළහැකි වටිනාකම යම් ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළ සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ ඇස්තමේන්තුගත වෙළෙඳපොල මිල නියෝජනය කරයි.

රක්ෂණ සමාගම බේරාගත් අයිතමයේ පාලනය ලබාගන්නා අවස්ථාවේ සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ප්‍රවාහය වන විට හිමිකම් නිරවුල් කිරීමෙන් ඇතිවන බේරාගත් තොගය වත්කමක් ලෙස හඳුනා ගනී. බේරාගත් තොගයේ තක්සේරුව වර්තමාන වෙළෙඳපොල තත්ත්වයන්, මෑතකාලින වෙන්දේසි ප්‍රතිඵල හා ඓතිහාසික අයකිරීමේ පළපුරුද්ද මත පදනම් වේ. බේරාගත් අයකිරිම් ලාභ අලාභ ප්‍රකාශයේ දරන ලද දල හිමිකම්වලට අනුව හිලව් කෙරේ. විකුණන සහ වෙළෙඳපොල මිලගණන් හෝ වෙනත් අදාළ සාධකවල වෙනස්වීම පිළිබිඹු කිරිමට තක්සේරුව යාවත්කරන තුරු සමාගමේ නිරන්තරව බේරාගත් වත්කම්වල ධාරණ අගය සමාලෝචන කරයි. මෙම ප්‍රවේශය හිමිකම් අයකිරිම සම්බන්ධ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමඟ අනුරූප වන අතර අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව සමඟ අනුකූල වේ.

**සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබීම් හා වෙනත් ලැබිය යුතු දෑ**

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් හා හිඟ බොල් සහ අඩමාණ ලැබීම් වෙනුවෙන් දීමනා අඩුකළ පිරිවැයට හඳුනා ගනී.

## 11. අනෙකුත් වත්කම් (ඉතිරි කොටස)

### 11.1 ලැබිය යුතු සහ අනෙකුත් වත්කම් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | |
| සේවක සහ නියෝජිතයින්ට අදාළ ලැබිය යුතු | **477,551** | – |
| SLIC වෙතින් ගෙවියයුතු ප්‍රමාණ - සම්බන්ධිත පාර්ශවය | **805,847** | 676 |
| වෙනත් ලැබිය යුතු | **34,709** | 1,229 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,318,107** | 1,905 |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| තොග | **174,818** | – |
| අත්කාරම් හා පෙර ගෙවීම් | **90,328** | – |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | **265,146** | – |
| **මුළු අනෙකුත් වත්කම්** | **1,583,253** | 1,905 |

## 12. විලම්බිත වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නව හෝ අලුත්කළ රක්ෂණ ගිවිසුම්වලින් ඇතිවන මූල්‍ය කාලසීමාව තුළ දරන ලද සෘජු පිරිවැය විලම්බිත කර අදාළ ආදායම උපයන කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ. අනෙකුත් සියලූම අත්කර ගැනීමේ පිරිවැය දරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනා ගනී. අත්කර ගැනීමේ පිරිවැයට අදාළ ප්‍රතිරක්ෂණ කොමිස් ද විලම්බිත කර අදාළ දළ ලිඛිත වාරිකය උපයන සමාන කාලසීමාව පුරා හඳුනා ගනී.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ නියාමන මාර්ගෝපදේශවලට අනුකූලව, විලම්බිත අත්කරගැනීමේ පිරිවැය සහ විලම්බිත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම යන ද්විත්වය දින 365 පදනමක් මත ගණනය කෙරේ. මෙවැනි ශේෂ අදාළ විලම්බිත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායමෙන් ශුද්ධ විලම්බිත අත්කර ගැනිමේ පිරිවැය නියෝජනය කරමින් ශුද්ධ විලම්බිත අත්කර ගැනිමේ පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශය තුළ ශුද්ධ පදනමින් ඉදිරිපත් කෙරේ. අදාළ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුම් නිරවුල් කරන හෝ බැහැර කරන අවස්ථාවේදී ශුද්ධ විලම්බිත ශේෂය හඳුනා ගනී.

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **ශුද්ධ විලම්බිත අත්කර ගැනීමේ වියදම්** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **–** | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | **743,475** | |
| විලම්බිත අත්කර ගැනීමේ වියදම්වල වැඩිවීම | **105,075** | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **848,550** | – |
| **විලම්බිත ප්‍රතිරක්ෂණ කොමිස් මුදල** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **–** | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | **(111,026)** | |
| විලම්බිත අත්කර ගැනීමේ වියදම්වල වැඩිවීම | **(4,958)** | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **(115,984)** | – |
| **ශුද්ධ විලම්බිත අත්කර ගැනීමේ වියදම්** | **732,566** | – |

## 13. මුදල් හා මුදලට සමාන දෑ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් හා මුදලට සමාන දෑ අත්පත් කර ගැනීමේ දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, මුදල් ශේෂයන් සහ ඇමතුම් තැන්පතුවලින් සමන්විත වන අතර, ඒවායේ සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සඳහා නොසැලකිය හැකි අවදානමකට යටත් වන අතර සමාගම විසින් එහි කෙටි කාලීන බැඳීම් කළමනාකරණය කිරීමේදී භාවිතා කරනු ලබයි.

සමාගමේ මුදල් කළමනාකරණයේ අත්‍යවශ්‍ය කොටසක් සාදන බැංකු අයිරා ඇත්නම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදලට සමාන දෑ හි සංරචකයක් ලෙස වර්ගීකරණය කෙරේ. කෙසේ වෙතත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ, බැංකු අයිරා වගකීම් යටතේ ඉදිරිපත් කෙරේ.

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| අතැති හා බැංකුවේ මුදල් | | **1,189,148** | 401,413 |
| කෙටි කාලීන ආයෝජන | | **2,602,341** | 177,987 |
| මුළු මුදල් හා මුදලට සමාන දෑ | | **3,791,489** | 579,400 |
| බැංකු අයිරාව | 24 | **(268,146)** | – |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් හා මුදලට සමාන දෑ | | **3,523,343** | 579,400 |

## 14. ප්‍රකාශිත ප්‍රාග්ධනය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**සාමාන්‍ය කොටස්**

සාමාන්‍ය කොටස් ස්කන්ධය ලෙස වර්ගීකරණය කෙරේ. සාමාන්‍ය කොටස් නිකුතුවට සෘජුවම ආරෝපනය වන වර්ධනීය පිරිවැය යම් බදු බලපෑමෙන් ශුද්ධ ස්කන්ධයේ අඩුකිරීමක් ලෙස හඳුනා ගනි.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ, පනතේ විධිවිධාන අනුව හෝ උසාවි නියෝගය මත පදනම් වී එයට අයත් කොටස් මිලදි ගැනීමේ හෝ අත්කර ගැනීමේ හැකියාව සමාගමට ඇත. නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට යටත්ව සිය කොටස් ප්‍රාග්ධනය හා හිමිකාර ව්‍යූහය කළමනාකරණය කිරීමේදී මෙම විධිවිධානයෙන් නම්‍යශීලී ලබා දී ඇත.

වාර්තාකරන දිනයට, සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය රු මිලියන 14 කි. වසර තුළ, සමාගම වෙන් කිරීමේ අවශ්‍යතාවයට අනුව එකක් රු. 10ට කොටස් 1,350,000,000 නිකුත් කළේය. සියලූම නිකුත් කළ කොටස්වලට සම්පූර්ණයෙන් ගෙවා ඇත. සාමාන්‍ය කොටස් හිමියන් වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කරන පරිදි ලාභාංශ ලබාගැනීමට හිමිකම ඇත.

### 14.1 සාමාන්‍ය කොටස්වල වෙනස්වීම

| දෙසැම්බර් 31 දිනට | කොටස් ප්‍රමාණය '000 | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| **නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවූ** | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 50,000 | **500,000** | 100,000 |
| නිකුත් කළ කොටස් | 1,350,000 | **13,500,000** | 400,000 |
| | 1,400,000 | **14,000,000** | 500,000 |

14. ප්‍රකාශිත ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

## 14.2 සාමාන්‍ය කොටස්හිමියන්ගේ අයිතිවාසිකම්

සමාගම එක් පන්තියක සාමාන්‍ය කොටස් පමණක් ඇත. නිකුත් කළ සියලුම කොටස්වලට මහ සභා රැස්වීමේදී කොටසකට එකක් බැගින් කොටස්හිමියන්ට සමාන ඡන්ද අයිතිවාසිකම් ඇත.

## 15. සීමාකළ නියාමක ප්‍රාග්ධනය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙන් කිරීමේ දිනයට, අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය විචක්ෂණභාවය හා සහ දිගුකාලීන ස්ථාවරත්වයට සමාගමේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් අමතර රු. බිලියන 1ක් විශේෂ සංචිතයකට වෙන් කර ඇත. මෙම සීමාකළ ප්‍රාග්ධන සංචිතය 2023 දෙසැම්බර් 05 දිනැති ලිපියේ (MF/LA/022/CM/2023/305) දක්වා ඇති පරිදි අනුමත කැබිනට් සංදේශයට අනුකූලව ස්ථාපිත කරන ලදී.

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| විශේෂ සංචිතය | 1,000,000 | – |
| | 1,000,000 | – |

## 16. ප්‍රත්‍යාගණන සංචිතය

**සංචිතයේ ස්වභාවය හා අරමුණ**

වත්කමක් ප්‍රත්‍යාගනනය මත. ධාරණ අගයේ යම් වැඩිවීම අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ස්කන්ධය තුළ ප්‍රත්‍යාගණන සංචිතය තුළ හඳුනා ගනී. නැතිනම් ආදායම් ප්‍රකාශයට අයකළ එම වත්කමේ ප්‍රත්‍යාගණනය මත පෙර අලාභ ආපසු හැරවීමට භාවිතා කෙරේ. මෙම වාතාවරණය තුළ, පෙර කපාහැරි වටිනාකමේ ප්‍රමාණයට පමණක් මෙම වැඩිවීම ආදායම ලෙස හඳුනා ගනී. ධාරණ අගයේ යම් අඩුවීමක් ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගනී නැතිනම් වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවතින යම් ණය ශේෂවල ප්‍රමාණයට පමණක් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ස්කන්ධය තුළ ප්‍රත්‍යාගණන සංචිතයට අය කෙරේ. වත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවතින යම් ශේෂයක් විශ්‍රාම ගැනීම මත රඳවාගත් ඉපයීම්වලට හෝ වත්කම බැහැර කිරීමට සෘජුවම මාරු කෙරේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **ජනවාරි 01 දිනට ශේෂය** | **–** | – |
| වසර තුළ ප්‍රත්‍යාගණන අතිරික්තය | 264,623 | – |
| අදාළ බදු (විලම්බිත බදු) | (79,387) | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **185,236** | – |

## 17. විකිණීමට පවතින සංචිතය

**සංචිතයේ ස්වභාවය හා අරමුණ**

විකිණීමට පවතින සංචිතය වත්කම හඳුනා නොගන්නා සහ හානිකරණය කරන තුරු අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්වල සමුච්චිත ශුද්ධ වෙනසින් සමන්විත වේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයෙහි ශුද්ධ වෙනස | 4,349,529 | – |
| අදාළ බදු (විලම්බිත බදු) | (167,377) | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 4,182,152 | – |

## 18. ආදායම් සංචිත

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 76,345 | 61,537 |
| වසර සඳහා ලාභය | 2,661,339 | 14,808 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ ආයුගණක අලාභ | (180,910) | – |
| අදාළ බදු (විලම්බිත බදු) | 54,272 | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,611,046 | 76,345 |

## 19. රක්ෂණ ගිවිසුම් වගකීම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**හඳුනාගැනීම සහ මැනීම**

රක්ෂණ ගිවිසුම් වගකීම්වලට IBNR සහ IBNER ඇතුළුව හිඟ හිමිකම් වෙන් කිරීම, උපයා නොගත් වාරික සඳහා වෙන් කිරීම සහ වාරික හිඟ සඳහා වෙන් කිරීම ඇතුළත් වේ.

නොඉපයූ වාරික සංචිතයේ වටිනාකම (UPR) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ මාර්ගෝපදේශවලට අනුව සිදු කෙරේ. (එනම් දින 365 මත පදනම්වී). කෙසේවෙතත්, ගිවිසුම් කාලයෙන් සැලකියයුතු ලෙස වෙනස්වන අවදානම් කාලසීමාව සඳහා වන ගිවිසුම් සඳහා, ලබාදුන් රක්ෂණ ආවරණයේ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරික උපයනු ලැබේ.

දරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත්ව වාර්තා නොකළ (IBNER) හිමිකම් සංචිත ආයුගණකව ගණනය කෙරේ.

සමානතා හෝ ආපදා සංචිත සඳහා කිසිදු වෙන් කිරීමක් හඳුනා නොගනී හිමිකමක් ගෙවීමට බැඳීම කල්පිරෙන, මුදාහරින හෝ අවලංගුකරන අවස්ථාවේදී වගකීම් හඳුනා නොගනී.

SLFRS 4 – (රක්ෂණ ගිවිසුම්), හි අවශ්‍යතාව පරිදි, සමාගම බාහිර ආයුගණකඥයෙකුගේ සහය ඇතිව රක්ෂණ ගිවිසුම්ගත වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් (LAT) පවත්වා ඇත.

19. රක්ෂණ ගිවිසුම් වගකීම් (ඉතිරි කොටස)

**හිමිකම් රක්ෂණ සංචිතය**

හිමිකම් රක්‍ෂණ ඔප්පුවලින් ඇතිවන විභව හිමිකම් සඳහා ගෙවීම් සිදුකිරීමට සමාගම විසින් හිමිකම් රක්‍ෂණ සංචිතය පවත්වාගෙන යනු ලබයි. සාමාන්‍යයෙන් හිමිකම් රක්‍ෂණ ඔප්පු වසර පහ හෝ ඊට වැඩි දිගු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබයි. පළමු වසරේ සිදුවන හිමිකම්වල විභවතාව ඉහළ වුවත් ඔප්පුවේ පළමු වසර තුළ කිසිදු ලාභයක් හඳුනා නොගනී. දෙවැනි වසරේ සිට ඉදිරියට, ලද වාරික ක්‍රමක්ෂය කරමින් ලාභය හඳුනා ගන්නා අතර සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඔප්පුවේ ඉතිරි කාලසීමාව පුරා බෙදාහරිනු ලැබේ. පළමු වසර සඳහා ලාභය දෙවැනි වසරේදී පමණක් හඳුනා ගන්නා අතර ඉන්පසුව නිරන්තරයෙන් හඳුනා ගනී.

නිකුත්කළ හිමිකම් රක්‍ෂණ ඔප්පුවක අනුරූපණය කල්පිරීමට පෙර නිරවුල් කළහොත්, එකී ණය නිරවුල් කළ දිනයට ඉතිරිව ඇති එකී ඔප්පුවල සම්පූර්ණ වාරිකය අදාළ බැංකුව විසින් එය තහවුරු කිරීම මත ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති රක්‍ෂණ සංචිතවලින් පහත දෑ නියෝජනය කරයි:

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| ශුද්ධ නොඉපයූ වාරිකය සඳහා සංචිත | 19.1 | 10,106,019 | – |
| හිමිකම් රක්ෂණය සඳහා සංචිත හා කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය | 19.2 | 724,919 | |
| දළ හිඟ හිමිකම් සඳහා සංචිත | 19.3 | 9,610,327 | – |
| | | 20,441,265 | – |

## 19.1 ශුද්ධ නොඉපයූ වාරිකය සඳහා සංචිතය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **නොඉපයූ වාරිකය සඳහා සංචිතය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 11,930,292 | – |
| වසර තුළ මාරුකිරීම | (497,104) | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 11,433,188 | – |
| **නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | (1,759,450) | – |
| වසර තුළ මාරුකිරීම | 432,281 | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | (1,327,169) | – |
| ශුද්ධ නොඉපයූ වාරිකය සඳහා මුළු සංචිත | 10,106,019 | – |

## 19.2 හිමිකම් රක්ෂණය සඳහා සංචිත හා කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **හිමිකම් රක්ෂණය සඳහා සංචිතය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 648,690 | – |
| වසර තුළ මාරුකිරීම | 76,229 | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 724,919 | – |
| මුළු හිමිකම් රක්ෂණය සඳහා සංචිත හා කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය | 724,919 | – |

## 19.3 දළ හිඟ හිමිකම් සඳහා සංචිතය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 7,082,893 | – |
| වසර තුළ දරන ලද වියදම් | 9,899,914 | – |
| වසර තුළ ගෙවනලද හිමිකම් | (10,199,723) | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,783,084 | – |
| ජනවාරි 01 දිනට IBNR/IBNER ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 2,727,581 | – |
| IBNR/IBNER හි වැඩිවීම/අඩුවීම | 99,662 | – |
| දෙසැම්බර් 31 දිනට IBNR/IBNER ශේෂය | 2,827,243 | – |
| මුළු දළ හිඟ හිමිකම් සඳහා සංචිතය | 9,610,327 | – |

හිමිකම් දැනුම්දීම තුළ සැලකියයුතු ප්‍රමාදයන් සිදුවන අතර, පළපුරුද්ද හා විනිශ්චය තුළ සැලකියයුතු ක්‍රියාමාර්ගයක් වාර්තාකරන දිනයට ස්ථිරබව හඳුනාගත නොහැකි අවසාන පිරිවැය වන හිඟ වගකීම් තක්සේරු කිරීමේදී සම්බන්ධ වේ. සංචිත දැනට ලබාගත හැකි තොරතුරු මත පදනම් වී තීරණය කෙරේ. කෙසේවෙතත්, පසුකාලීන සංවර්ධනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අවසාන වගකීම වෙනස්විය හැකි ව්‍යාපාර ස්වභාවයකට එය අවේනික වේ.

## 19.4 රක්ෂණ ගිවිසුම් වගකීම් හා තාක්ෂණික සංචිත අතර සැසඳීම

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 20,441,265 | – |
| ශුද්ධ විලම්බිත අත්කර ගැනීමේ වියදම් සඳහා සංචිත | (732,566) | – |
| හිමිකම් සංචිත මත ප්‍රතිරක්ෂණය | (1,740,034) | – |
| **තාක්ෂණික සංචිත** | 17,968,665 | – |

19. රක්ෂණ ගිවිසුම් වගකීම් (ඉතිරි කොටස)

## 19.5 හිමිකම් සංවර්ධන තොරතුරු

ප්‍රතිරක්ෂණයන් ශුද්ධ ඓතිහාසික ජීවිත නොවන සංචිතයන් හි වෙනස්වීම් පහත වගුවෙහි දක්වා ඇත. අදාළ වසරේ සහ ඉකුත් වසරවල දරන ලද අලාභ සඳහා ඇස්තමේන්තුගත අනාගත ගෙවීම් ප්‍රමාණය නියෝජනය කරන එක් එක් ශේෂ පත්‍ර දිනය අනුව නොගෙවූ අලාභ සහ අලාභ ගැලපීම් වියදම් සඳහා වන ඇස්තමේන්තුගත දළ සංචිත වගුවෙහි ඉහළ පෙළෙහි පෙන්නුම් කරයි. එක් එක් වසර අවසානයේ දී ස්ථාපිත සංචිත සඳහා එක් එක් පසුව එන වසර වල ගෙවන ලද සමුච්චිත වටිනාකම් වගුවෙහි සමුච්චිත ගෙවීම් කොටසේ දැක්වේ. ඒ ආකාරයෙන්ම, ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය සහ මූල්‍ය වර්ෂය අවසානයේ දී ශුද්ධ හිඟ තත්ත්වය පිළිබඳ තොරතුරු සමුච්චිත වාර්තා ගතවූ අලාභ කොටසෙහි දක්වා ඇත.

| දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. '000 | 2023<br>රු. '000 | 2022<br>රු. '000 | 2021<br>රු. '000 | 2020<br>රු. '000 | 2019<br>රු. '000 |
|---|---|---|---|---|---|---|
| අලාභ සහ අලාභ ගැලපීම් කිරීමේ වියදම් සඳහා දළ සංචිත | **9,601,884** | 9,674,573 | 11,855,930 | 9,549,407 | 7,861,686 | 7,310,845 |
| ප්‍රතිරක්ෂණ ආපසු ලබාගැනීම් | **(1,740,034)** | (1,656,462) | (3,104,431) | (1,888,143) | (1,395,321) | (1,060,735) |
| **අලාභ සහ අලාභ ගැලපීම් කිරීමේ වියදම් සඳහා ශුද්ධ සංචිත** | **7,861,850** | 8,018,111 | 8,751,499 | 7,661,264 | 6,466,365 | 6,250,110 |
| **ගෙවන ලද සමුච්චිත** | | | | | | |
| වසරකට පසු | **7,983,827** | 7,948,365 | 6,790,213 | 6,994,929 | 5,370,767 | 7,723,147 |
| වසර දෙකකට පසු | **–** | 9,949,287 | 9,271,432 | 9,312,011 | 7,043,437 | 9,451,250 |
| වසර තුනකට පසු | **–** | – | 9,694,934 | 9,537,176 | 7,092,891 | 9,589,406 |
| වසර හතරකට පසු | **–** | – | – | 9,624,465 | 7,169,932 | 9,666,070 |
| වසර පහකට පසු | **–** | – | – | – | 7,211,162 | 9,723,979 |
| වසර හයකට පසු | **–** | – | – | – | – | 9,771,600 |
| **වාර්තාගත සමුච්චිත** | | | | | | |
| වසරකට පසු | **9,782,133** | 9,650,801 | 8,892,648 | 8,980,052 | 6,492,661 | 9,152,921 |
| වසර දෙකකට පසු | **–** | 10,246,257 | 9,681,923 | 10,014,973 | 7,255,303 | 9,718,009 |
| වසර තුනකට පසු | **–** | – | 10,025,269 | 10,029,949 | 7,321,827 | 9,851,857 |
| වසර හතරකට පසු | **–** | – | – | 9,874,325 | 7,366,908 | 9,898,280 |
| වසර පහකට පසු | **–** | – | – | – | 7,367,255 | 9,881,032 |
| වසර හයකට පසු | **–** | – | – | – | – | 9,907,343 |

## 20. සේවක ප්‍රතිලාභ බැඳීම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පූර්ව සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වන අතර මේ යටතේ යම් ආයතනයක් වෙනත් ආයතනයකට ස්ථාවර දායකත්ව ගෙවන අතර ඊට වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්ව ලබාදීම සඳහා වන බැඳීම්, සේවකයන් විසින් සේවා සපයන කාලසීමාවේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනා ගනී.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය පරිදි, සෑම සේවකයෙකුම සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවකයාගේ මුළු ඉපයීම්වලින් 12%ක් දායක විය යුතු අතර, මුළු දායකත්වය 20%ක් කරමින් සේවකයාගේ ඉපයීම්වලින් 8%ක් අඩු කරයි.

කෙසේවෙතත්, සමාගම සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 25% කරමින් සේවා යෝජක වෙනුවෙන් 15%ක් දායක වෙමින් හා සේවකයාගෙන් 10%ක් අඩුකරමින් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව ඉක්මවයි. මෙම ව්‍යවහාරය පනත හා අනුකූල වන අතර සේවකයාට වැඩිකළ විශ්‍රාම ප්‍රතිලාභ ලබා දේ.

1980 අංක 46 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ 16 වගන්තිය පරිදි, සමාගම සේවකයාගේ මුළු ඉපයීම්වලින් 3%ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක වේ.

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් පවතින නීති හා රෙගුලාසිවල අවශ්‍යතාව පරිදි නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ලබා දේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගත් වගකීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතයෙන් වාර්තාකරණ දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ. ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) යනු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 19 මඟින් නිර්දේශ කර ඇති මිණුම් ලකුණු ක්‍රමයකි.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ වටිනාකම සුදුසුකම්ලත් හා ස්වාධීන ආයුගණකයෙක් වන, සීමාසහිත ආයුගණක හා කළමනාකරණ උපදේශක (පුද්ගලික) සමාගම විසින් සිදු කර ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතයෙන් තීරණය කරන අතර එය සේවා කාලයට අදාළ ප්‍රතිලාභ පිරිවැයට ආරෝපනය වේ. ආයුගණක උපකල්පනවල පළපුරුද්ද ගැලපීම් හෝ වෙනස්වීම් වලින් ඇතිවන ආයුගණක ලාභ හා අලාභ වහාම විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ හඳුනා ගන්නා අතර රඳවාගත් ඉපයීම් යටතේ ස්කන්ධය තුළ සෘජුව ඉදිරිපත් කරයි. මෙම නැවත මැනීම් පසුකාලීනව අනාගත කාලසීමාවල ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නෙකෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ වත්කම හෝ වගකීම සැලසුම් වත්කම්වල සාධාරණ අගය අඩුකළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ඇතුළත් වන අතර, එහි බැඳීම් සෘජුව නිරවුල් කළ යුතුය.

20. සේවක ප්‍රතිලාභ බැඳීම් (ඉතිරි කොටස)

**සැලසුම්කළ වත්කම්**

සැලසුම්කළ වත්කම් යනු දිගුකාලීන සේවක ප්‍රතිලාභ අරමුදලක් විසින් දරන වත්කමක් වන අතර, සේවක ප්‍රතිලාභ බැඳීම සපුරාලීමේ අරමුණ සඳහා හුදෙක් නම් කර ඇත. මෙම වත්කම් සමාගමෙන් නීතියෙන් වෙන කරන අතර සමාගමේ ණයගැතියන්ට ප්‍රවේශ විය නොහැකි අතර සමාගමට සෘජුව ආපසු ලබාදිය නොහැක.

සැලසුම් වත්කම් වාර්තාකරණ දිනයට සාධාරණ අගයට මනින අතර ඉන් අරමුදලේ ආයෝජනවල වෙළෙඳපොල වටිනාකම පිළිබිඹු කරයි.

**වර්තමාන සේවා පිරිවැය**

වර්තමාන සේවා පිරිවැය යනු වර්තමාන කාලසීමාව තුළ සේවකයාගේ සේවය තුළින් ඇතිවන නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකමේ වැඩිවීමකි.

**ආයුගණක ලාභ/අලාභ, වර්තමාන සේවා පරිවැය සහ පොලී පිරිවැය හඳුනා ගැනීම**

සමාගම ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ වෙනත් විස්තරාත්මක ආදායම තුළ වහාම හඳුනාගන්නා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලින් ඇතිවන සියලුම ආයුගණක ලාභ හෝ අලාභ හඳුනා ගනී. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වර්තමාන සේවා පිරිවැය හා පොලී පිරිවැය මූල්‍ය උපකල්පන ප්‍රකාශයෙහි සේවක ප්‍රතිලාභ වියදමේ කොටසක් ලෙස හඳුනා ගනී.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක ප්‍රතිලාභ සංශෝධනය කරන විට හෝ සැලැස්ම අඩුකරන විට, පසුගිය සේවා පිරිවැයට හෝ අඩුකිරීම මත ලාභ සහ අලාභවලට අදාළව ඇතිවන වෙනස වහාම ලාභ හෝ අලාභය තුළ හඳුනාගනී. එමෙන්ම සමාගම පියවීම සිදුවන දිනයේදී නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් පියවීමෙන් ඇතිවන යම් ලාභ හෝ අලාභ හඳුනා ගනී.

## 20.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ වෙනස්වීම

| දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වෙතින් මාරු කිරීම | 1,108,925 | – |
| **ලාභය හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගත්** | | |
| වර්තමාන සේවා පිරිවැය | 57,598 | – |
| පොලී පිරිවැය | 121,982 | – |
| **අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ හඳුනාගත්** | | |
| බැඳීම මත නැවත මැනීමේ අලාභ | 180,910 | – |
| **වෙනත්** | | |
| වසර සඳහා ගෙවීම් | (77,556) | – |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,391,859 | – |

## 20.2 භාවිතා කළ මූලික ආයුගණක උපකල්පන

සමාගමේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ස්වාධීක ආයුගණකයෙක් වන සීමාසහිත ආයුගණක හා කළමනාකරණ උපදේශක (පුද්ගලික) සමාගම විසින් සිදු කළ ආයුගණක තක්සේරුව මත පදනම් වේ. ආයුගණක තක්සේරුව වට්ටම් අනුපාත හා අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන සිදු කිරීම හා සම්බන්ධ වේ. තක්සේරුවේ හා පාදක වූ උපකල්පන හා එහි දිගුකාලීන ස්වභාවයේ සංකීර්ණතාව හේතුවෙන්, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මෙම උපකල්පනවල වෙනසට ඉහළින් සංවේදී වේ. සියලුම උපකල්පන එක් එක් වාර්තාකරන දිනයට සමාලෝචනය කෙරේ.

ස්වාධීන ආයුගණකයෙකුගේ සහය ඇතිව පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සාධකවල වෙනස්වීම් හේතුවෙන් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත බලපෑම සමාගම සලකා බලා ඇත.

- පිරිවැය පිළිබඳ පුළුල් තක්සේරුව සහ ගනුදෙනුකරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් දිවයින පුරා පිහිටි ගරාජ මගින් ලබා දේ.
- සැලකියයුතු හිඟ හිමිකම් කළමනාකාරිත්වය විසින් මාසික සමාලෝචනයකට යටත් කෙරේ.
- දරන ලද නමුත් වාර්තා නොකළ සහ දරන ලද නමුත් ප්‍රමාණවත්ව වාර්තා නොකළ හිමිකම් සම්බන්ධයෙන් සිදුකළ සංචිතවල ප්‍රමාණතාව තක්සේරු කිරීමට සුදුසුකම් ලත් ආයුගණකයෙකුගේ සේවය කාර්තුමය වශයෙන් ලබා ගනී.
- සියලුම තෙවැනි පාර්ශව හිමිකම් දනුම්දීම නීති අංශයේ සහය ඇතිව වෙන වෙනම සමාලෝචනය කෙරේ.
- ප්‍රමාණවත් හිමිකම් සංචිත සමාගම විසින් යොදා ගෙන ඇති එකඟ වූ ක්‍රමවේදයට අනුව පවත්වා ගනු ලබයි.
- සියලුම නව සහ පවතින හිමිකම් තක්සේරු කිරීමට හිමිකම් සමාලෝචන ප්‍රතිපත්ති, හිමිකම් මෙහෙයුම් ක්‍රියාපටිපාටිය පිළිබඳ නිරන්තර විස්තරාත්මක සමාලෝචනය, සහ වියහැකි වංචාසහගත හිමිකම් පිළිබඳ නිරන්තර විමර්ෂණය අවදානම් නිරාවරණය අඩු කිරීමට ස්ථාපිත කෙරේ.
- මූල්‍ය බලතල සීමා හිමිකම් මණ්ඩලයට උපරිම සීමා ලබා දෙමින් හිමිකම් සඳහා හිමිකම් සීමා සකස් කරන අතර එය සැලකියයුතු/ප්‍රශ්නගත හිමිකම් සහ හිමිකම් සම්බන්ධයෙන් සිදුකරන අභියාචනා පිළිබඳ තීරණ ගැනීම හා සම්බන්ධ වේ.

**සාමාන්‍ය රක්ෂණය තුළ වගකීම් තක්සේරු කිරීම**

වගකීම් ඇස්තමේන්තු පිළිබඳ පාදකවන ප්‍රධාන උපකල්පනය වන්නේ සමාගමේ අනාගත හිමිකම් සංවර්ධනය පසුගිය හිමිකම් සංවර්ධන අත්දැකීමට සමාන රටාවක් අනුගමනය කරන බවයි. මෙයට සාමාන්‍ය හිමිකම් පිරිවැය සම්බන්ධ උපකල්පන, හිමිකම් මෙහෙයවීමේ පිරිවැය, හිමිකම් උද්ධමන සාධක හා එක් එක් අනතුරු වසරවල හිමිකම් ගණන ඇතුළත් වේ. අමතර ප්‍රමාණාත්මක විනිශ්චයන් අනාගතයේදී වගකීම් ඇතිවිය හැකි ප්‍රමාණය තක්සේරු කිරීමට භාවිතා කරන නමුත්, එකෝචිත සිදුවීම්, හිමිකම් පිළිබඳ මහජන ආකල්ප, ආර්ථික තත්ත්වයන් වැනි වෙළෙඳපොල සාධකවල වෙනස්වීම් සහ කළඹ තුළ මුසුව ඔප්පුවල තත්ත්වයන් හා හිමිකම් මෙහෙයුම් ක්‍රියාපටිපාටි වැනි අභ්‍යන්තර සාධක ඉවත් කරයි. ඇස්තමේන්තුවලට බලපාන අධිකරණ තීරණ හා රජයේ නීතිකරණ වැනි බාහිර සාධකවල ප්‍රමාණය තක්සේරු කිරීමට විනිශ්චයන් තවදුරටත් භාවිතා කෙරේ.

දළ හා ශුද්ධ වගකීම්, බදු පෙර ලාභය හා ස්කන්ධය කෙරෙහි බලපෑම පෙන්වමින්, පහත විශ්ලේෂණ අනෙකුත් සියලුම උපකල්පන ස්ථාවරව තබාගෙන හිඟව පවතින හිමිකම්වල වියහැකි වෙනස්වීම් සඳහා සිදුකර ඇත. මෙම උපකල්පනවල වෙනස්වීම් රේඛීය නොවන බව සටහන් කර සිටිමි.

**හිඟව පවතින හිමිකම්වල සංවේදිතාව**

| දෙසැම්බර් 31 දිනට | උපකල්පනවල වෙනස % | වාර්තාකළ හිඟ හිමිකම් රු. '000 | දළ වගකීම් මත බලපෑම රු. '000 | ශුද්ධ වගකීම් මත බලපෑම රු. '000 | බදුපෙර ලාභය කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම (බදු පසු) රු. '000 |
|---|---|---|---|---|---|---|
| **2024** | **+/-10** | **6,783,084** | **678,308** | **678,308** | **678,308** | **474,816** |
| 2023 | | 6,972,431 | 697,243 | 697,243 | 697,243 | 488,070 |

**හිමිකම් සංවර්ධන තොරතුරු**

පසුගිය වසර හත තුළ හිමිකම් සංවර්ධනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහා, කරුණාකර සටහන 19.5 බලන්න.

### 38.3 මූල්‍ය අවදානම්

මැතිවරණ වසරක් වූ 2024 තුළ, ආර්ථික අර්බුදයෙන් පසු බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණය ප්‍රධාන කාරණය විය. එබැවින්, අවිනිශ්චිතතාව හේතුවෙන් උච්චාවචනය 2024 වසරේ මුල් කොටස තුළ වෙළෙඳපොල තේමාව වී තිබුණි. එකී කාලසීමාව තුළ මෙවැනි සාධක නිරවුල් කිරීමෙන් පසු වසරේ දෙවන කොටස තුළ ආර්ථිකය ස්ථාවරවීමේ හා වර්ධනයේ සංඥා පෙන්වන ලදී. සමාගම ආයෝජන ආදායම උපරිම කිරීම කරා කටයුතු කළ අතර, එම කාලසීමාව තුළ සිය වාසි ලබාගැනීමට වෙළෙඳපොල උච්චාවචන භාවිතා කරන ලදී.

ආයෝජන කමිටුව එවැනි අවදානම් අවම කිරීම සහ ආයෝජන ප්‍රතිඵල ප්‍රශස්ත කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

ආයෝජන කමිටුව මුදල් මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ අපේක්ෂාවන් හේතුවෙන් ස්ථිර ආදායම් උපකරණවල කාලසීමාව දීර්ඝ කිරීම කරා කටයුතු කළ අතර වෙළෙඳපොල ප්‍රතිසාධනය වන බැවින් ඉහළයාමේ විභවතාවක් ඇති සිය කළඹ තුළ ස්කන්ධ කවුළුවල ආයෝජන රඳවා ගෙන ඇත. උපරිම පරීක්ෂාව සහ විචක්ෂණභාවය භාවිතා කරමින් ආයෝජන අවදානම් කළමනාකරණය සිදුකරන ලදී.

ආයෝජන කළඹ ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා තවදුරටත් විවිධාංගීකරණය කරන ලදී. වෙළෙඳපොල අවදානම, ආයෝජන සංකේන්ද්‍රණය, ද්‍රවශීලතාව සහ ණය සඳහා ආයෝජන කමිටුව විසින් නිසි පරීක්ෂාව ලබාදෙන ලදී.

ආයෝජන තීරණ ගැනීම කඩිසර හා කාර්යක්ෂමව තවදුරටත් පැවති බැවින් ආයෝජන ආදායම ඉහළ අගයන් වාර්තා කර ඇත.

අවදානම් කළමනාකරණ මූලධර්ම හා අදාළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා මාර්ගෝපදේශවලට දැඩි අනුකූලතාව නියාමන අවදානම් අවම කිරීමට සහය විය.

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
## 38.3 මූල්‍ය අවදානම් (ඉතිරි කොටස)

### 38.3.1 වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත වැනි වෙළෙඳපොල මිලෙහි වෙනස් වීමේ අවදානම වන අතර එය සමාගමේ ආදායමට හෝ එහි මූල්‍ය උපකරණවල දරාසිටීමේ වටිනාකම කෙරෙහි බලපානු ඇත. වෙළෙඳපොල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

#### 38.3.1.a ස්කන්ධ මිල අවදානම

ස්කන්ධ අවදානම යනු ස්කන්ධවල මිල පහත යාම හේතුවෙන් මුදල් අහිමිවීමේ අවදානමයි.

පූර්ව මැතිවරණ අවිනිශ්චිතතා නිරවුල් වීම හා ආර්ථිකය ප්‍රතිසාධන රටාවට ඇතුළත්වීම නිසා, සමස්ත කොටස් මිල දර්ශකය හා ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය 2024 වසර තුළ සැලකියයුතු වාසි වාර්තා කර ඇත.

සමාගම ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී ස්කන්ධය සඳහා උපරිම නිරාවරණ සීමා පවත්වා ගනී. තවද, සමාගම ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා විවිධ අංශ වෙත ආයෝජන කළඹ විවිධාංගීකරණය කර ඇත.

පහත දක්වා ඇති පරිදි විවිධාංගීකරණවය තුළින් සමාගම ක්‍රමානුකූල නොවන අවදානම් අඩුකරගෙන තිබුනද, ස්කන්ධ ආවේනිකව ක්‍රමානුකූල අවදානමට නිරාවරණය වන අතර එය සමස්ත වෙළෙඳපොලට අවිනිශ්චිතව ආවේනික වේ.

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

- සමාගමේ ආයෝජන ප්‍රතිපත්තිය මඟින් කළමනාකරණයට අරමුණු සහ ආයෝජන සීමාවන්, විවිධාංගීකරණ සැලසුම් මෙන්ම ස්කන්ධ නිරාවරණය පිළිබඳ සීමාවන් සැකසීමට/නියාමනය කිරීමට මඟ පෙන්වයි.
- ස්කන්ධ කළඹ කාර්තුමය පදනමක් මත ආයෝජන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයෝජන විසින් වෙළෙඳපොළ චලනයෙන් ඇතිවන බලපෑම නියාමනය කරනු ලැබේ.
- ස්කන්ධ ආයෝජන සඳහා සම්පූර්ණ නිරාවරණය එකඟ වූ ඉලක්කගත වත්කම් වෙන් කිරීම සහ අංශයේ ස්කන්ධ සීමාවන් තුළ දැඩි ලෙස සිදු කෙරේ.
- ස්කන්ධ මූලික වශයෙන් ශක්තිමත් ස්කන්ධවල ආයෝජන සිදු කරනු ලබයි. එය ආයෝජන කළමනාකරණ කණ්ඩායම විසින් ගැඹුරු පර්යේෂණ සහ ඇගයීම් ක්‍රියාවලියකින් පසුව හඳුනා ගනු ලබයි.

**ස්කන්ධ අවදානම්වල කළඹ විවිධාංගීකරණය**

| දෙසැම්බර් 31 දිනට | | 2024 | | 2023 | |
|---|---|---|---|---|---|
| අංශය | කර්මාන්ත සමූහය | වෙළෙඳපොල වටිනාකම රු. '000 | % | වෙළෙඳපොල වටිනාකම රු. '000 | % |
| මූල්‍ය | බැංකු | 9,046,511 | 88.00 | – | – |
| | විවිධාංගීකරණය කළ මූල්‍ය | 431,322 | 3.90 | – | – |
| ගනුදෙනුකාර අභිමතිය | කල්පවත්නා පරිභෝජන හා ඇඟලුම් | 923 | 0.10 | – | – |
| කර්මාන්ත | ප්‍රාග්ධන භාණ්ඩ | 209,616 | 2.00 | – | – |
| විදුලි සංදේශ සේවා | විදුලි සංදේශ සේවා | 17,004 | 0.10 | – | – |
| අමුද්‍රව්‍ය | අමුද්‍රව්‍ය | 181,050 | 1.90 | – | – |
| | ආහාර පාන හා දුම්කොල | 415,277 | 3.90 | – | – |
| උපයෝගිතා | උපයෝගිතා | 18,043 | 0.10 | – | – |
| **එකතුව** | | 10,319,746 | 100 | – | – |

**ස්කන්ධ වෙළෙඳපොල සංවේදීතාව**

| 2024 දෙසැම්බර් 31 දිනට | වෙළෙඳපොල පිඹිදීම | | වෙළෙඳපොල බිඳවැටීම | |
|---|---|---|---|---|
| | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 |
| **කම්පන මට්ටම:** | | | | |
| 5% | 72,317 | 443,670 | (72,317) | (443,670) |
| 10% | 144,635 | 887,340 | (144,635) | (887,340) |

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
## 38.3 මූල්‍ය අවදානම් (ඉතිරි කොටස)

### 38.3.1.b හුවමාරු අනුපාත අවදානම

විනිමය අවදානම හෝ විදේශ විනිමය අවදානම ලෙසින්ද හඳුන්වන හුවමාරු අනුපාත අවදානම යනු විදේශ විනිමය හුවමාරු අනුපාතවල වෙනස්වීම් ආයෝජනයක, වත්කමක හෝ වගකීමක වටිනාකම කෙරෙයි ඍණාත්මක බලපෑමක් සිදුවීමේ අවදානමයි.

සමාගම ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදලකින් නම්කරන මූල්‍ය වත්කම්වල ආයෝජනය කෙරෙහි ව්‍යවහාර මුදල් අවදානමට නිරාවරණය වේ. මෙම ගනුදෙනු මූලිකව නම්කළ විදේශීය ව්‍යවහාර මුදල ඇමෙරිකානු ඩොලර්වල වේ.

2024 තුළ, ඇමෙරිකානු ඩොලරයට අනුව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. කෙසේවෙතත්, මෝටර් රථ නිරාවරණය වැඩි වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රතිසාධනය වන බැවින් හා සංචාරක අංශයේ ආයෝජන හා ආදායම වැඩිවූ බැවින් හා ඇමෙරිකානු ඩොලරයට අනුව එය 2025 දී ස්ථාවරව පවතිනු ඇත.

### අවදානම් ප්‍රතිචාර උපායමාර්ග

- සමාගමේ ප්‍රධාන ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලින් සිදු කෙරේ.
- විදේශ මුදල් අවශ්‍යතා සඳහා කාල නිර්ණය නිතිපතා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විදේශ විනිමය ලබා ගැනීම සඳහා අදාළ කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විවිධ ආතති සහගත තත්ත්වයන් යටතේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි විදේශ විනිමය අනුපාත බලපෑම අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය.

### විනිමය අවදානමට නිරාවරණය

විදේශ විනිමය අවදානමට සමාගමේ නිරාවරණය නාමික ප්‍රමාණ මත පදනම් වී පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දින ට ධාරණ අගය | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **ස්ථිර තැන්පතු:** | | |
| ඇමෙරිකානු ඩොලර් | 3,277,537 | – |
| | 3,277,537 | – |

පහත සඳහන් සැලකියයුතු හුවමාරු අනුපාත වසර තුළ අදාළ විය.

| ව්‍යවහාර මුදල | සාමාන්‍ය අනුපාතය | | වාර්තාකරන දිනයට ස්ථානීය අනුපාතය | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | 2024 | 2023 |
| ඇමෙරිකානු ඩොලර් (1$ = LKR) | 304.88 | 341.36 | 288.75 | 321.00 |

### සංවේදිතා විශ්ලේෂණය

පහත සඳහන් පරිදි, 2024 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ඩොලරය අනුව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත්වීම පහත සඳහන් ප්‍රමාණ මගින් විදේශ විනිමය ලාභ/අලාභ සහ පොලී ආදායම වැඩිකර/(අඩුකර) ඇත. මෙම විශ්ලේෂණයේදී, අනෙකුත් සියලුම විචල්‍යතා විශේෂයෙන් පොලී අනුපාත ස්ථිරව පවතී.

| 2024 දෙසැම්බර් 31 දිනට | හුවමාරු අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| | 1.0% රු. '000 | 1.5% රු. '000 | 2.0% රු. '000 |
| **ස්ථිර අනුපාත උපකරණ** | | | |
| ඇමෙරිකානු ඩොලර් | 32,775 | 49,163 | 65,551 |
| | 32,775 | 49,163 | 65,551 |
| **ස්ථිර අනුපාත උපකරණ** | | | |
| ඇමෙරිකානු ඩොලර් | 2,330 | 3,496 | 4,661 |
| | 2,330 | 3,496 | 4,661 |

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

### 38.3.1.c පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු අවදානම් රහිත පොලී අනුපාත ඵලදා වක්‍රය පුරා ණය පැතිරීමේ මට්ටම හෝ උච්චාවචනය තුළ වෙනස්වීම් හේතුවෙන් වත්කම් හා වගකීම්වල අගයන්හි සංවේදීතාව, ණය පැතිරීමේ අවදානම විස්තර කරන අතර ඵලදායී වක්‍රයේ හැඩයේ වෙනස්වීම් ඇතුළුව, පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන අවදානමයි.

අවදානම් සීමාවන් සමඟ සමස්ථ තත්ත්වයට එකඟවීමෙන් එක් එක් ප්‍රධාන කල්පිරීම් රාමුව හරහා පොලී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ. ආයෝජන කමිටුව ස්ථාවර ආදායම් කළඹ සක්‍රියව කළමනාකරණය කළ අතර එහිදී අඩු ප්‍රතිලාභයක් සහිත ආයෝජන වලින් සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභයක් සහිත ආයෝජන වෙත උපායමාර්ගිකව මාරුවීම, නොගැලපීම් කාලසීමාව සමීපව නිරීක්ෂණය කිරීමෙන් පොලී ආදායම මත වන පීඩනය අවම කිරීම සිදුකර ඇත.

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

- ආයෝජන වලින් සැලකිය යුතු කොටසක් අවදානම් රහිත ආයෝජන පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම විසින් නිකුත් කළ නීති හා රෙගුලාසි පිළිපදිමින් රජයේ සුරැකුම්පත්වල අවදානම් රහිත ආයෝජනවල සිදු කෙරේ.
- ආයෝජන කළඹේ ප්‍රධාන කොටස ශ්‍රේණිගත මූල්‍ය ආයතනවල හෝ ශ්‍රේණිගත උපකරණවල සිදු කෙරේ.
- ආයෝජන කමිටුව ආයෝජන තීරණ ගන්නා අතර, අවශ්‍ය අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනී.

**පොලී අනුපාත අවදානමට නිරාවරණය**

සමාගමේ කළමනාකාරිත්වයට වාර්තා කර ඇති පරිදි සමාගමේ පොලී අනුපාත දරණ මූල්‍ය උපකරණවල පොලී අනුපාත විස්තර පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | ස්ථිර පොලී අනුපාතය රු. '000 | විචල්‍ය පොලී අනුපාතය රු. '000 | ස්ථිර පොලී අනුපාතය රු. '000 | විචල්‍ය පොලී අනුපාතය රු. '000 |
| **කල්පිරීම සඳහා පවතින (HTM)** | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | **1,029,294** | **–** | – | – |
| ලැයිස්තුගත ණයකර | **2,018,835** | **–** | – | – |
| | **3,048,129** | **–** | – | – |
| **ණය සහ ලැබීම් (L&R)** | | | | |
| ලැයිස්තුගත නොකළ ණයකර | **2,569,781** | **–** | – | – |
| කාලීන තැන්පතු | **3,310,237** | **–** | – | – |
| සේවක ණය හා ලැබිය යුතු දෑ | **1,457,950** | **–** | – | – |
| | **7,337,968** | **–** | – | – |
| **විකිණීම සඳහා තබා ඇති (AFS)** | | | | |
| ලැයිස්තුගත ණයකර | **1,263,668** | **–** | – | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | **10,198,783** | **6,249,282** | – | – |
| වාණිජ පත්‍රිකා | **1,717,952** | **–** | – | – |
| | **13,180,403** | **6,249,282** | – | – |
| **පොලී අනුපාත අවදානමට මුළු නිරාවරණය** | **23,566,500** | **6,249,282** | – | – |

**සංවේදිතා විශ්ලේෂණය**

වාර්තා කරන දිනට පොලී අනුපාතවල පදනම් ලකුණු 100 ක සාධාරණව වියහැකි වෙනස පහත දක්වා ඇති ගණන් වලින් ස්කන්ධය සහ පොලී ආදායම ඉහළ නංවනු (පහළ හෙළනු) ඇත.

| 2024 දෙසැම්බර් 31 දිනට | +100 පදනම් ලකුණු | | -100 පදනම් ලකුණු | |
|---|---|---|---|---|
| | පොලී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000 | පොලී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000 |
| **මූල්‍ය ආයෝජන** | | | | |
| ණය සහ ලැබීම් (L&R) | **62,443** | **–** | **(62,443)** | **–** |
| විකිණීමට තබා ඇති (AFS) | **–** | **(58,648)** | **–** | **67,705** |

** ඵලදා වක්‍රයේ වෙනස්වීමක් වූ විටෙක පහත තත්ත්වයක් ඇතිවිය:*
*පොලී ආදායමේ හෝ HTM හා L&R යටතේ වර්ගිකරණය කර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා ස්කන්ධයට කිසිදු බලපෑමක් ඇති වී නැත.*
*HTM හා L&R යටතේ වර්ගිකරණය කර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් නොවී පොලී ආදායමට බලපෑමක් ඇති වී ඇත.*
*පොලී ආදායමට කිසිදු බලපෑමක් නොවුවද AFS යටතේ වර්ගකර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට බලපෑමක් ඇති වී ඇත.*
*පොලී ආදායමට බලපෑමක් වුවද AFS යටතේ වර්ගකර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් එල්ල වී නැත.*

38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

### 38.3.2 ආයෝජන සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු තනි ආයෝජනයක්, අංශයක්, ණයකරුවෙක් හෝ භූගෝලීය ප්‍රදේශයක් සඳහා වඩා වැඩි නිරාවරණය හේතුවෙන් ඇති වන අලාභ අවදානමයි. ආයෝජන කමිටුව සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම පිණිස ආයෝජනවල සැලකියයුතු බණ්ඩනයක් ඇති බව සහතික කරයි.

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

- ආයෝජන කමිටුව සමාගමේ ආයෝජන කළඹ කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සංවර්ධනය කර සකස් කරයි.
- පවතින නීති සහ රෙගුලාසි සමඟ ආයෝජනවල අනුකූලතාව සහතික කිරීම සඳහා ආයෝජන කමිටුව විසින් ශක්තිමත් නියාමන ක්‍රියාවලියක්.
- අනුකූලතා අංශය විසින් වත්කම් වෙන් කිරීමේ සීමාවන් අඛණ්ඩව සමාලෝචනය කිරීම.
- සමාගම තනි ප්‍රතිපාර්ශවයක් සමඟ ආයෝජනය කළ හැකි උපරිම මුදල අඛණ්ඩව සමාලෝචනය කර සීමා කරයි.

මූල්‍ය ආයෝජනවලට අදාළ ආයෝජන සංකේන්ද්‍රණය පහත දක්වේ.

| දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| **රජයේ සුරැකුම්පත්** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 11,228,077 | – |
| **ණයකර** | | |
| බැංකු, මූල්‍ය, සහ රක්ෂණය | 4,843,682 | – |
| විදුලිය හා බලශක්තිය | 1,008,602 | – |
| කාලීන තැන්පතු | | |
| බැංකුව | 3,310,237 | – |
| **ප්‍රාග්ධන කොටස්** | | |
| බැංකු | 9,046,511 | – |
| විවිධාංගීකරණය කළ මූල්‍ය | 431,322 | – |
| කල්පවත්නා පරිභෝජන හා ඇඟලුම් | 923 | – |
| ප්‍රාග්ධන භාණ්ඩ | 209,616 | – |
| විදුලි සන්නිවේදන සේවා | 17,004 | – |
| ද්‍රව්‍ය | 181,050 | – |
| ආහාරපාන හා දුම්කොළ | 415,277 | – |
| විදුලිය හා බලශක්තිය | 18,043 | – |
| **වාණිජ පත්‍රිකා** | 1,717,952 | – |
| **ඒකක භාර** | 3,095,920 | – |
| **සේවක ණය හා ලැබියයුතු දෑ** | 1,457,950 | – |
| | 36,982,166 | – |

### 38.3.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු යම් වත්කමක් එහි මිලට සැලකියයුතු බලපෑමක් නොමැතිව ඉක්මණින් මිලදී ගැනීමට හෝ විකිණීමට නොහැකි වීමේ අවදානමයි.

සමාගමේ වත්කම්වලින් වැඩි කොටස භාණ්ඩාගාර බැඳුම්කර වැනි ඉහළ ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කෙරේ.

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

ද්‍රවශීලතා අවදානමට සමාගමේ නිරාවරණය අවම කිරීමට පහත සඳහන් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා ඇත.

- ආයෝජන කමිටුව විසින් නිතිපතා සමාලෝචනය කරනු ලබන සමාගම් ආයෝජන ප්‍රතිපත්තියේ දක්වා ඇති වත්කම් සහ වගකීම් කළමනාකරණ මාර්ගෝපදේශ සමාගම අනුගමනය කරයි.
- සමාගමේ රක්ෂණ සහ ආයෝජන ගිවිසුම් බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා වත්කම් වෙන් කිරීම, කළඹ සීමා ව්‍යුහයන් සහ වත්කම්වල කල්පිරීමේ පැතිකඩ සඳහා මාර්ගෝපදේශ දක්වා ඇත.
- සමාගමේ අපේක්ෂිත බැඳීම් සහ කැපවීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂයන්, ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් සහ අනෙකුත් කෙටි කාලීන ආයෝජන පවත්වා ගැනීම.
- හඳුනාගත් රක්ෂණ වගකීම් වලින් ශුද්ධ මුදල් පිටතට ගලා යාමේ ඇස්තමේන්තුගත කාලය මත පදනම්ව රක්ෂණ ගිවිසුම් වගකීම් සහ ප්‍රතිරක්ෂණ වත්කම්වල කල්පිරීමේ පැතිකඩ තීරණය කිරීම.
- කළමනාකරණය සහ ආයෝජන කමිටුව විසින් නිරන්තර පදනමක් මත ආයෝජන කළඹේ කල්පිරීමේ මුසුව සමාලෝචනය කිරීම.
- අවශ්‍යතාවයක් ඇති වුවහොත් මුදල් ඇමතුමක් මගින් සහාය වීමට ප්‍රතිරක්ෂකයින් සමඟ එකඟ වීම.
- සියලුම විශාල මුදල් පිටතට ගලායාම සඳහා කල්තියා පුරෝකථනය කිරීම සහ සැලසුම් කිරීම සහ එවැනි පිටතට ගලායාම සපුරාලීම සඳහා අරමුදල් ලබා ගැනීම සහතික කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ සම්පාදනය කිරීම.
- සමාගම මාසික පදනමක් මත මුදල් ප්‍රවාහ සහ ද්‍රවශීලතා තත්ත්වය පුරෝකථනය කර නියාමනය කරයි.

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

### 38.3.3 ද්‍රවශීලතා අවදානම (ඉතිරි කොටස)

**කල්පිරීම් විශ්ලේෂණ**

ගෙවීමට ඇති පොලිය සහ ලැබීමට ඇති පොලිය ඇතුලත්ව ඉතිරිව ඇති වට්ටම් රහිත ගිවිසුම් බැදියාවන් මත පදනම් කරගත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ පහත වගුවෙන් සාරාංශ කරයි.

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ධාරණ වටිනාකම රු. '000 | ස්ථිර කාල ගණන රු. '000 | වසර 1 දක්වා රු. '000 | වසර 1 - 2 දක්වා රු. '000 | වසර 2 - 5 දක්වා රු. '000 | වසර 5 - 10 දක්වා රු. '000 | වසර 10 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| **මූල්‍ය වත්කම්** | | | | | | | | |
| කල්පිරීමට තබා ඇති (HTM) | 3,048,129 | – | 1,000,000 | – | 2,000,000 | – | – | 3,000,000 |
| ණය හා ලැබීම් (L & R) | 5,880,018 | – | 3,786,127 | 1,000,000 | 1,000,000 | – | – | 5,786,127 |
| විකිණීමට තබා ඇති (AFS) | 23,611,511 | 10,431,108 | 4,336,596 | 4,789,000 | 2,491,596 | 1,261,109 | – | 23,309,409 |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL) | 2,984,558 | 2,984,558 | – | – | – | – | – | 2,984,558 |
| ලැබියයුතු ප්‍රතිරක්ෂණ | 1,972,225 | – | 1,972,225 | – | – | – | – | 1,972,225 |
| ලැබියයුතු වාරික | 5,144,352 | – | 5,144,352 | – | – | – | – | 5,144,352 |
| වෙනත් මූල්‍ය වත්කම් | 1,318,107 | – | 1,318,107 | – | – | – | – | 1,318,107 |
| බැංකුවේ මුදල් | 3,791,489 | – | 3,791,489 | – | – | – | – | 3,791,489 |
| | 47,750,389 | 13,415,666 | 21,348,896 | 5,789,000 | 5,491,596 | 1,261,109 | – | 47,306,267 |

ඉහල කල්පිරීම් විශ්ලේෂණවලට සේවක ණය හා ලැබියයුතු දෑ ඇතුළත් නොවේ.

### 38.3.4 ණය අවදානම

ණය අවදානම් යනු ආයෝජක සමාගම්, ප්‍රතිරක්ෂකයින් සහ වෙනත් ණයගැතියන් ගෙවීමට ඇති ගෙවීම් පැහැරහැරීමේ අවදානමයි. ඒ අනුව, ණයගැතියෙක් බැඳී ඇති ගෙවීම් සිදුකිරිමට අසමත්වීම තුලින් යම් වර්ගයක ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම ඉන් සඳහන් කරයි. මෙම අවදානම් මූලිකවම ණයගැතියාගෙන් සිදුවන අතර මූලිකවම අහිමි වූ මුල් මුදල සහ පොලිය, මුදල් ප්‍රවාහ බිඳවැටීම සහ එකතු කිරිමේ පිරිවැය වැඩි වීම ඇතුළත් වේ.

සමාගම විසින් තනි රක්ෂණයෙකු සහ සමහර වත්කම් පන්තිවලින් සිදුකරන ආයෝජනයන්ගේ සංකේන්ද්‍රණය මත එයටම අයත් සීමාවන් ස්ථාපිත කර ඇති අතර ද්‍රවශීල උපකරණවල ආයෝජන සිමා කරයි.

බලපත්‍රලාභි වාණිජමය බැංකු හෝ බලපත්‍රලාභි විශේෂිත බැංකු හැර වාර තැන්පතුවල කිසිදු ආයෝජනයක් සිදුකර නොමැත.

පිළිගත් ණය ශ්‍රේණිගතකරන ආයතනයන් විසින් ආයතනය සහ උපකරණය සඳහා අයෝජන ශ්‍රේණි ණය ශ්‍රේණිගතකරණය ණයකර සහ වාණිජ පත්‍රිකා ඇතුළත් සියලුම ආයෝජන සඳහා අපේක්ෂා කෙරේ.

කිසිදු ණය උපකරණයක් සම්බන්ධිත සමාගම් සමඟ සිදුකර නොමැත.

ණය සුරැකුමක් තුළ යම් ආයෝජනයක් සිදුකිරීමට පෙර විස්තරාත්මක ණය විශ්ලේෂණයක් අභ්‍යන්තර වශයෙන් සිදුකරනු ලැබේ.

**මූල්‍ය ආයෝජනවල ණය අවදානම අවම කිරීම සඳහා සමාගම විසින් ගනු ලැබූ විශේෂ ක්‍රියාමාර්ග පහත දැක්වේ.**

- සමාගමේ ආයෝජන ප්‍රතිපත්තිය විශේෂයෙන් බලතල ලබාදී නොමැතිනම් මිස ශ්‍රේණිගත නොකළ ආයෝජන තහනම් කරයි.
- සමාගම පහළට ශ්‍රේණිගත කරනු ඇතැයි අපේක්ෂා කරන ආයෝජන හඳුනා ගන්නා අවස්ථාවේදී සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබයි.
- සමාගම දුර්වල ණය පැතිකඩ සහිත තෙවැනි පාර්ශවයක් විසින් නිකුත් කරන සුරක්ෂිත නොවූ සහ ද්විතියික ණය නිරාවරණය හඳුනාගෙන තෝරා ගනිමින් අඩු කරයි.
- ව්‍යූහගත මූල්‍ය නිරාවරණය අත්පත් කර ගැනීමට පෙර පවතින ණය ශ්‍රේණිගත කිරීම් හෝ ණය පැතිකඩවල ශක්තිය මත පමණක් නොව, ආපසු ලබා ගැනීමේ පදනම මත තක්සේරු කරනු ලබයි.

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
## 38.3.4 ණය අවදානම (ඉතිරි කොටස)

### ණය අවදානමට නිරාවරණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රේණිගත ආයතනය | කල්පිරෙන තෙක් තබාගන්නා | ණය ලැබියයුතු දෑ | අලෙවියට තබා ඇති | ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට | එකතුව | |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % |
| **මූල්‍ය ආයෝජන** | | | | | | | |
| **රජයේ සුරැකුම්පත්** | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | **1,029,294** | **–** | **10,198,783** | **–** | **11,228,077** | **34** |
| **ආයතනික ණය සුරැකුම්පත්** | | | | | | | |
| AA- | ෆිච් | **2,018,835** | **1,061,178** | **1,008,603** | **–** | **4,088,616** | **12** |
| A | ෆිච් | **–** | **1,001,589** | **–** | **–** | **–** | **–** |
| A- | ෆිච් | **–** | **–** | **255,065** | **–** | **–** | **–** |
| BBB+ | ෆිච් | **–** | **507,014** | **–** | **–** | **507,014** | **2** |
| **කාලීන තැන්පතු** | | | | | | | |
| AA+ | ෆිච් | **–** | **3,049,286** | **–** | **–** | **3,049,286** | **9** |
| A | ෆිච් | **–** | **260,951** | **–** | **–** | **260,951** | **1** |
| **වාණිජ පත්‍රිකා** | | | | | | | |
| A | ෆිච් | **–** | **–** | **1,717,952** | **–** | **–** | **–** |
| සේවක ණය හා ලැබියයුතු දෑ | | **–** | **1,457,950** | **–** | **–** | **1,457,950** | **4** |
| ලැබියයුතු ප්‍රතිරක්ෂණ | | **–** | **1,972,225** | **–** | **–** | **1,972,225** | **6** |
| ලැබියයුතු වාරික | | **–** | **5,144,352** | **–** | **–** | **5,144,352** | **16** |
| වෙනත් මූල්‍ය වත්කම් | | **–** | **1,318,107** | **–** | **–** | **1,318,107** | **4** |
| බැංකුවේ මුදල් | | **–** | **3,791,489** | **–** | **–** | **3,791,489** | **12** |
| | | **3,048,129** | **19,564,141** | **13,180,403** | **–** | **32,818,067** | **100** |

** ස්ථිර තැන්පතු මත ණය අවදානම බැංකුවේ ණය අවදානම මත පදනම් වේ.*

**සේවක ණය හා ලැබියයුතු දෑ**

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

සමාගම සක්‍රිය ණය ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇති අතර ඉන් ණය ලබාදීමට පෙර සේවක හා උපදේශක ණය වටිනාකම ඇගයීමට ලක් කරයි.

සියලුම ණය සාධාරණව අගය කරන අතර නිරන්තර පදනමක් මත හානිකරණය සඳහා පරීක්ෂා කෙරේ. සමාගම සේවකයින්ට සියලුම මෝටර් රථ ණය සඳහා මෝටර් රථය උකස් කිරීමේ මාර්ගයෙන් ඇප ලබා ගනී. ණය ලබාදීමේදී අනුමත ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර මෝටර් රථයේ තක්සේරු කිරීමේ සහතික ලබාදීමට පෙර පිළිගත් තක්සේරු කරුවෙකුගෙන් ලබා ගනී.

**ලැබියයුතු ප්‍රතිරක්ෂණය**

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

- භාවිතා කළ හැකි ප්‍රතිරක්ෂකයින් සීමා කරමින් හා එක් එක් ප්‍රතිරක්ෂකයාට දැඩි සීමා යොදා ගනිමින් සිය ප්‍රතිරක්ෂණ ඇප නිරාවරණ කළමනාකරණය කිරීමට සමාගම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි.
- ප්‍රතිරක්ෂකයින්ගේ ණය සුදුසුකම නිරන්තරව සමාලෝචනය කරයි.

**ලැබියයුතු වාරිකය**

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

- වාරික ගෙවීම් වගකීම් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම, දින 60 කට වඩා වැඩි කාලයක් ගෙවීම් හිඟව ඇති සියලුම සාමාන්‍ය රක්ෂණ ඔප්පු අවලංගු කරන බව සහතික කිරීම.
- මාසික පදනමක් මත ණය එකතු කිරීම පිළිබඳ පසු විපරම් රැස්වීම් පැවැත්වීම
- වාරික මතක් කිරීම් සහ අවලංගු කිරීමේ දැන්වීම් පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම සඳහා නවතම තාක්ෂණය (උදා: ජංගම දුරකථන කෙටි පණිවිඩ) භාවිතා කිරීම
- දිගු හිඟ ශේෂයන් පිළිබඳව අපගේ ණය කළමනාකරණ ඒකකය අමතා පාරිභෝගිකයා සමඟ පසු විපරම් කිරීම
- වාරික පියවූ ඔප්පු සඳහා පමණක් හිමිකම් සැකසීම

**මුදල් හා මුදලට සමාන දෑ**

මුදලට අදාළ ණය අවදානම බැංකුව/මූල්‍ය ආයතනය සමාගම වෙත ණය මුදල ආපසු ගෙවීමට අසමත්වීමකට මුහුණදෙන අවස්ථාවකදී ඇති වේ.

## 38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
### 38.3.4 ණය අවදානම (ඉතිරි කොටස)

සමාගම ජංගම/ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යන බැංකු සහ මූල්‍ය ආයතන පිළිබඳ ලැයිස්තුව සහ ඔවුන්ට අදාළ ශ්‍රේණිගතකරණය පහත දැක්වේ.

**අදාළ ණය ශ්‍රේණිගතකිරීම් සමඟ මුදල් හා මුදලට සමාන දෑ ශේෂ**

| දෙසැම්බර් 31 දිනට | ශ්‍රේණිගතකරණය | ශ්‍රේණිගතකරණ ආයතනය | 2024 රු. '000 | % |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **743,472** | 74.51 |
| චීන බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **1,100** | 0.11 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **40,483** | 4.06 |
| DFCC බැංකුව | A- | ෆිච් ශ්‍රේණිගතකරණය | **17,967** | 1.80 |
| හැටන් නැෂනල් බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **8,484** | 0.85 |
| HSBC ශ්‍රී ලංකා | A+ | ෆිච් ශ්‍රේණිගතකරණය | **155** | 0.02 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | AAA | ෆිච් ශ්‍රේණිගතකරණය | **1,029** | 0.10 |
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් | A- | ෆිච් ශ්‍රේණිගතකරණය | **20,647** | 2.07 |
| පැන් ඒෂියා බැංකුව | BBB- | ෆිච් ශ්‍රේණිගතකරණය | **12,626** | 1.27 |
| මහජන බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **122,769** | 12.30 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | BBB+ | ෆිච් ශ්‍රේණිගතකරණය | **21,330** | 2.14 |
| සම්පත් බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **1,043** | 0.10 |
| සෙලාන් බැංකුව | A- | ෆිච් ශ්‍රේණිගතකරණය | **6,202** | 0.62 |
| ස්ටෑන්ඩර්ට් චාර්ටඩ් බැංකුව | AAA | ෆිච් ශ්‍රේණිගතකරණය | **442** | 0.04 |
| කාගිල්ස් බැංකුව | A | ෆිච් ශ්‍රේණිගතකරණය | **115** | 0.01 |
| **ණය අවදානමට මුළු නිරාවරණය** | | | **997,864** | 100.00 |
| **අතැති මුදල්** | | | **191,284** | – |
| **මුදල් හා මුදලට සමාන දෑ** | | | **1,189,148** | – |

**අවදානම් ප්‍රතිචාර උපායමාර්ග**

සමාගම යහපත් ණය ශ්‍රේණිගතකරණ යන බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ජංගම/ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යයි. 2024 දෙසැම්බර් 31 දිනට, මුදල්වලින් 92.10% ක් ඒ සහ ඊට ඉහළ ශ්‍රේණිගත බැංකු සමඟ පවත්වා ගන්නා ලද අතර, මුදල්වලින් 89% ක් රජයට අයත් බැංකුවල පවත්වා ගන්නා ලදී.

| දෙසැම්බර් 31 දිනට ශ්‍රේණිගතකරණය | 2024 රු. '000 | % |
|---|---|---|
| AAA | **1,471** | 0.14 |
| A+ | **155** | 0.02 |
| A | **917,468** | 91.94 |
| A- | **44,815** | 4.49 |
| BBB- | **12,626** | 1.27 |
| BBB+ | **21,329** | 2.14 |
| **ණය අවදානමට මුළු නිරාවරණය** | **997,864** | 100.00 |
| අතැති මුදල් | **191,284** | – |
| මුදල් හා මුදලට සමාන දෑ | **1,189,148** | – |

### 38.4 මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ව්‍යාපාර මෙහෙයුම්වලට බලපාන මානව දෝෂ, නොදැනුවත් තීරණ, ප්‍රමාණවත් නොවන/අසමත් අභ්‍යන්තර ක්‍රියාවලි සහ පද්ධතිවලින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇතිවන අලාභ දැරීමේ අවදානමයි.

මෙහෙයුම් අවදානමේ ප්‍රධාන දායකයින් පහත පරිදි වේ.

| අවදානම | විස්තරය |
|---|---|
| නෛතික හා නියාමන අනුකූලතා අවදානම | නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවදානම |
| ආදර්ශ අවදානම | විවිධ ආකෘති, ඒවායේ යෙදවුම, ඌනතා ආකෘති භාවිතය, දත්ත හෝ උපකල්පනවල නුසුදුසු භාවිතය හෝ අර්ථ නිරූපණය හේතුවෙන් මූල්‍යමය අලාභ හෝ නුසුදුසු ව්‍යාපාරික තීරණ ඇතිවීමේ අවදානම. |
| මානව සම්පත් අවදානම | සමාගමේ මෙහෙයුම්වල යෙදවීමට සුදුසුකම් සහිත මානව සම්පත් ලබාගත නොහැකිවීම |
| තෙවැනි පාර්ශව අවදානම | සේවා සපයන්නන්ගේ අනපේක්ෂිත ප්‍රමාදයන් හා බාහිරින් සිදුකරන ව්‍යාපාර කාර්යයන්ගේ අසමත්කම |
| තාක්ෂණික හා තොරතුරු ආරක්ෂක අවදානම | පද්ධති දෝෂ, තොරතුරු ආරක්ෂණ කඩකිරීම්, රහස්‍යතා කඩකිරීම්, සයිබර් ප්‍රහාර, මානව දෝෂ, සාපරාධී ක්‍රියා හෝ මෘදුකාංග බලපත්‍ර ගිවිසුම් නැතිවීම හේතුවෙන් මෙහෙයුම් බාධා ඇතිවීමේ අවදානම. |
| ව්‍යාපාර අඛණ්ඩතා අවදානම | තීරණාත්මක ව්‍යාපාරික මෙහෙයුම් බිඳවැටීම හේතුවෙන් ඇතිවන අවදානම |

38. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
38.4 මෙහෙයුම් අවදානම (ඉතිරි කොටස)

### අවදානම් ප්‍රතිචාර උපායමාර්ග

- මෙහෙයුම් අවදානම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා කළමනාකරණය වගකිව යුතුය. අංශ ප්‍රධානීන් විසින් සම්පූර්ණ කර අත්සන් කරන ලද මාසික පිරික්සුම් ලැයිස්තුවක් තුළින් අනුකූලතාව නියාමනය කරනු ලබන අතර, එහි සාරාංශයක් විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.
- අවදානම් සහ අනුකූලතා අංශය මාසික පිරික්සුම් ලැයිස්තුවක් තුළින් රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කරන අතර එහි සාරාංශය මාසික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සභාගත කරනු ලැබේ.
- ගනුදෙනුවලට ඇතුළත් වන විට සහ රාජකාරි ඉටු කිරීමේදී සෑම සේවකයෙකුම මූල්‍ය අධිකාරී අත්පොතට අනුකූල විය යුතුය.
- ශාඛා ක්‍රියා පටිපාටි අත්පොත් ඇතුළුව අංශ ක්‍රියා පටිපාටි අත්පොත් සේවකයින්ට අනුගමනය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.
- ආයතනික සැලැස්මේ කොටසක් ලෙස මානව සම්පත් සැලසුම් කිරීම සහ සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව නිතිපතා සිදු කරනු ලැබේ.
- රක්ෂණය ඇතුළුව අවදානම් අවම කිරීම, මෙහිදී මෙය පිරිවැය ඵලදායී වේ.
- සදාචාරාත්මක ව්‍යාපාර ප්‍රමිතීන්
- තෙවන පාර්ශවීය සේවා ගිවිසුම්කරණ සහ ක්‍රියාවලි බාහිරකරණය සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ
- සමාගමට ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් ඇති අතර වාර්ෂික පරීක්ෂණ සිදු කරනු ලැබේ.
- කාර්ය මණ්ඩලයේ මග පෙන්වීම සහ පාලනයන් විධිමත් කිරීම සඳහා සේවක ව්‍යාපාර චර්යා සංග්‍රහය, අඛණ්ඩතාව වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය සහ කොටස් වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.
- රාජකාරි වෙන් කිරීම ඉහළම ප්‍රායෝගික මට්ටමට එක් එක් මෙහෙයුම් ක්ෂේත්‍රයට ඇතුළත් කර ඇත.
- අභ්‍යන්තර විගණනය සිදු කළ විගණන තුළින් සමාගමේ අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කරන අතර සොයාගැනීම් විගණන කමිටුව සමඟ හුවමාරු කර ගනී. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද නියාමනය කෙරේ.
- සමාගමේ තොරතුරු සහ සයිබර් ආරක්ෂාව සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය කාලෝචිත මෘදුකාංග උසස් කිරීම සහතික කරයි.

### 38.5 ප්‍රාග්ධන කළමනාකරණ රාමුව

සමාගමේ ප්‍රාග්ධන කළමනාකරණ රාමුව පාර්ශවකරුවන්ට හා ඔප්පුහිමියන්ට ප්‍රතිඵල ස්ථිරවම උපරිම කිරීම සහතික කිරීමට ප්‍රාග්ධන ව්‍යුහය හා මූලාශ්‍ර ප්‍රශස්ථ කිරීමට සකස් කරයි.

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ සමාගමේ ප්‍රවේශය සහයෝගී ආකාරයෙන් වත්කම්, වගකීම් සහ අවදානම් කළමනාකරණය, නිරන්තර පදනමක් මත වාර්තාකළ සහ අවශ්‍ය ප්‍රාග්ධන මට්ටම් අතර අඩුපාඩුව තක්සේරු කිරීම සහ ආර්ථික තත්ත්වයන් හා අවදානම් ලක්ෂණ වෙනස්වීමේදී සමාගමේ ප්‍රාග්ධන තත්ත්වයට බලපෑම් කිරීමට සුදුසු පියවර ගැනීම හා සම්බන්ධ වේ. ප්‍රාග්ධන අවශ්‍යතාවන් කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලීන පදනමක් මත පුරෝකථනය කෙරේ.

සමාගම සිය ප්‍රතිපත්ති හා සිය ප්‍රාග්ධන ව්‍යුහයේ ක්‍රියාවලිවලට පෙර වසරවල සිට සැලකියයුතු වෙනස්වීම් සිදු කර ඇත. මෙසේ, වසර තුළ සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහයේ කිසිදු වෙනසක් වී නොමැත.

### ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ, ප්‍රතිපත්ති හා ප්‍රවේශය

සිය ප්‍රාග්ධන තත්ත්වයට බලපාන අවදානම් කළමනාකරණය කිරීම සඳහා සමාගම පහත සඳහන් ප්‍රාග්ධන කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති සහ ප්‍රවේශයන් ස්ථාපිත කර ඇත.

සමාගමේ සහ පරිපාලිත සමාගමේ නුබුන්වත් මට්ටම් නියාමක විසින් නියම කර ඇති මට්ටම්වලට වඩා ඉහළින් පවත්වා ගැනීම සහ එමඟින් ඔප්පු හිමියන්ට ආරක්ෂක මට්ටමක් ලබා දීම.

සේවයේ යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ එහි කොටස් හිමියන්ගේ සහ ඔප්පු හිමියන්ගේ අවශ්‍යතා සපුරාලන බව සහතික කරමින් ප්‍රාග්ධනය කාර්යක්ෂමව වෙන් කිරීම සහ ව්‍යාපාරයේ සංවර්ධනයට සහාය වීම.

ශක්තිමත් ද්‍රවශීලතාව පවත්වා ගනිමින් මූල්‍ය නම්‍යතාව රඳවා ගැනීම.

ව්‍යාපාරයට ආවේනික අවදානම් සැලකිල්ලට ගනිමින් වත්කම් හා වගකීම්වල පැතිකඩ පෙළගැස්වීම.

නව ව්‍යාපාර වර්ධනයට සහයවීමට සහ ඔප්පුහිමියන්, කොටස්හිමියන්, නියාමකයින් සහ වෙනත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීමට මූල්‍ය ශක්තිය පවත්වා ගැනීම.

සිය ව්‍යාපාර පරමාර්ථවලට සහයවීමට හා කොටස්හිමියන්ගේ වටිනාකම උපරිම කිරීමට ශක්තිමත් ණය ශ්‍රේණිගතකරණ සහ යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පවත්වා ගැනීම.

සමාගමේ මෙහෙයුම් නියාමන මාර්ගෝපදේශ සහ රාමු වලට යටත් වේ. එවැනි රෙගුලාසි, අනුමැතිය නියම කිරීමට සහ කටයුතු නියාමනය කිරීමට පමණක් නොව, අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය, නුබුන්වත් ආන්තිකය, අනුමත වත්කම් අවශ්‍යතා යනාදිය වැනි ඇතැම් සීමාකාරී විධිවිධාන පැනවීම ද සිදු කරයි. එමඟින් රක්ෂණ සමාගම්වල අනපේක්ෂිත වගකීම් මතුවන විට ඒවා සපුරාලීම සඳහා පැහැර හැරීමේ අවදානම, නුබුන්වත්භාවය අවම කරයි.

සමාගම මූල්‍ය වසර තුළ මෙම සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වී ඇත.

## 39. වෙන් කිරීම

### 39.1 වෙන් කිරීම සඳහා නෛතික පදනම (IRCSL අවශ්‍යතාව)

2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ වෙන් කිරීමේ මාර්ගෝපදේශ (යොමුව: IBSL/DG/LEG/14/02/089 සහ IBSL/DG/ LEG/13/09/468), සහ අංක. 23/0431/604/046 හා 2023 මාර්තු 17 දිනැති කැබිනට් තීරණය මෙන්ම අංක. 23/2397/604/239 හා 2023 දෙසැම්බර් 18 දිනැති කැබිනට් තීරණය යටතේ අනුමතකළ වෙන් කිරීමේ ආදර්ශය අනුව, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් වෙනම නෛතික ආයතන දෙකකට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

2023 දෙසැම්බර් 22 දින, දිස්ත්‍රික් උසාවියේ නඩුවක් ගොනු කළ අතර, 2024 ජනවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙන් කිරීම සඳහා උසාවි නියෝගය ලබාගන්නා ලදී. ඉන්පසුව, 2024 ජනවාරි 19 දින, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් 2007 අංක 7 දරන සමාගම් පනතේ 256 වගන්තිය පරිදි කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කළ අතර වැඩපිළිවෙලේ යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. වත්කම් හා වගකීම් මාරු කිරීම ඇතුළුව 256 වගන්තියේ අයදුම්පත අනුව වාණිජ මහාධිකරණය මත පුළුල් බලය පවතී. සමාගම් පනතේ 257 (1) (අ) වගන්තියෙන් විශේෂයෙන් "ජංගම හෝ ස්ථාවර දේපල, වත්කම්, හිමිකම්, බලය, බැඳියාවන්, වගකීම්, ගිවිසුම් සහ සහභාගිත්වයන් මාරු කිරීම හෝ පැවරීම සඳහා" නියෝග කිරීමට උසාවියට ලබා දේ.

වෙන් කිරීමෙන් ඇතිවන ප්‍රධාන ගනුදෙනු අනුමත කිරීම පිණිස 2024 ජනවාරි 16 දින අති විශේෂ මහ සභා රැස්වීමක් පවත්වන ලදී. අමාත්‍ය මණ්ඩලය, උසාවියේ අවශ්‍යතාව සහ ලබාගත් කොටස්හිමියන්ගේ අනුමැතිය සමඟ, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් සිය ජීවිත සහ සමාන්‍ය ව්‍යාපාරයෙන් රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම සිදුකිරීමේ නියාමන අවශ්‍යතාව සමඟ අනුකූල වී ඇත. ඉන් පසුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2024 පෙබරවාරි 01 දින සිට පිළිවෙලින් ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත වෙන වෙනම රක්ෂණ බලපත් ලබා දෙන ලදී.

### 39.2 SLFRS 3 අවශ්‍යතාව යටතේ වෙන් කිරීම

SLFRS 3 - ව්‍යාපාර සංයෝජන අනුව, පොදු පාලනය යටතේ ආයතන අතර ගනුදෙනු සම්මත විෂය පථයෙන් විශේෂයෙන් බැහැර කෙරේ. එමනිසා, ගනුදෙනුවෙන් පෙර හා පසුව එකම පාර්ශවය හෝ පාර්ශවයන් විසින් අවසාන වශයෙන් පාලනය කරන ආයතන අතර වත්කම් සහ වගකිම් මාරු කිරීම SLFRS 3 යටතේ ව්‍යාපාර සංයෝජනයක් අර්ථවත් නොවේ.

ඒ අනුව, එකි ගනුදෙනු ගනුදෙනුවේ පාදක වූ හරය පිළිබිඹු වන විකල්ප ගිණුම්කරණ ප්‍රමිති භාවිතයෙන් ගණනය කෙරේ. මෙම සංදර්භය තුළ, වැඩපිළිවෙල යෝජනා ක්‍රමය සහ 2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධන) පනතේ 53 වගන්තිය අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ඉදිරිපත් කිරීම සහ අනාවරණ පිළිබඳ මාර්ගෝපදේශවලට අනුව මාරුකළ වත්කම් හා වගකීම් SLICGL විසින් හඳුනාගෙන ඇත. කිසිදු කීර්තිනාම හෝ අත්කර ගැනිම මත ලාභ හඳුනා නොගන්නා අතර පොත්වල වටිනාකමේ අඛණ්ඩතාව සහ වාර්තාකරණ කාලසීමාවන් තුළ මූල්‍ය තොරතුරුවල සැසැඳීම සහතික කරයි.

### 39.3 නව නීතිමය ආයතන දෙකකට ව්‍යාපාර වත්කම් හා වගකීම් මාරු කිරීම

මෙම විධිමත් වෙන් කිරීමට පෙර, SLIC සිය ජීවිත හා සාමාන්‍ය රක්ෂණ අංශ වෙනම ව්‍යාපාර අංශ ලෙස පවත්වාගෙන ඇති අතර ඒ එක් එක් අංශයට එයටම අයත් ලාභ හා අලාභ ප්‍රකාශන, මූල්‍ය මෙහෙයුම්, සහ උපායමාර්ගික අවධානයන් අයත් විය. මෙම ස්වාධීන කළමනාකරණය විසින් එක් එක් ව්‍යාපාර අංශයේ වත්කම් හා වගකීම් දැනටමත් සුවිශේෂී ලෙස වෙන් කරන ලද බව සහතික කර ඇත.

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අතර වත්කම් හා වගකීම් වෙන් කිරීම අනුමත වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව පවත්වන ලද අතර සෑම සමාගමකටම තමන්ට අදාළ ව්‍යාපාර මාර්ගවලට අනුරූපව සුදුසු වත්කම් හා වගකීම් ලබාදුන් බවට සහතික වේ.

තවද, SLICGL සියලුම අදාළ නිති, රෙගුලාසි, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියෝග සහ මෙම වෙන් කිරීම සහ වත්කම් හා වගකිම් වෙන් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිති අවශ්‍යතාවන්ට අනුකූල වී ඇත. මහාධිකරණය විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, වත්කම්වලට අනුරූප උපලබ්ධි නොවූ සංචිත මෙන්ම රඳවාගත් ඉපයීම්වලට අදාළ වගකීම් මාරු නොකරන ලද අතර පරිපාලක සමාගම සමඟ රඳවා ගන්නා ලද බව සඳහන් කළ යුතුය.

වෙන් කිරීමෙන් පසුව, SLICGL මුළු වත්කම් රු. බිලියන 41.6ක් වූ අතර මුළු ස්කන්ධය හා මුළු වගකීම් පිළිවෙලින් රු. බිලියන 15.1 ක් හා රු. බිලියන 26.5 ක් විය. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. බිලියන 14 ක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය සීමිත ප්‍රාග්ධන සංචිතයට අමතර රු. බිලියන 1 ක් වෙන් කර ඇති අතර ඉන් මූල්‍ය විචක්ෂණභාවය හා දිගුකාලීන ස්ථාවරත්වය කරා සමාගමේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

ඒ අනුව, 2024 ජනවාරි 19 දිනැති එකී උසාවි නියෝගය පරිදි, සහ නීතිය ක්‍රියාත්මක කිරීම අනුව, 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් හි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ සියලුම වත්කම් SLICLL වෙත මාරු කරන ලද අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ සියලුම වත්කම් SLICGI වෙත මාරු කරන ලදි.

මාරුකරන ලද වත්කම්වල නෛතික හිමිකාරත්වය අදාළ බලධාරීන් විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය මත මහාධිකරණය විසින් ලබා දුන් නියෝගය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් වෙතින් SLICLL සහ SLICGL වෙත මාරු කරන ලදී. කෙසේවෙතත්, යම් අදාළ බලධාරීන් විසින් පවත්වාගන්නා වාර්තාවල එකී මාරු කිරීම වාර්තා කිරීමට ක්‍රියාත්මක කළ යුතු වැඩිදුර ප්‍රායෝගික පියවර අවශ්‍ය වේ. එයට අවශ්‍ය පරිදි පරිපාලන නම වෙනස්වීම් ඇතුළුව වෙනත් යම් විධි ඇතුළත් වන අතර ඒ සඳහා එකී බලධාරීන්ට අවශ්‍යවන වෙනත් විධි සමඟ අදාළ බලධාරීන් වෙත උසාවි නියෝගය ඉදිරිපත් කළ යුතුය.

රක්ෂකයාගේ නමට තබාගත් වත්කම් සම්බන්ධයෙන් 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ 30 වගන්තියට අනුව මහාධිකරණය විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව සියලුම වාර්තාවලින් නව නෛතික හිමිකාරත්වය පිළිබිඹුවන බව සහතික කිරීමට මෙම පරිපාලන සංක්‍රාන්තිය ක්‍රියාත්මක වෙමින් පවති.

## 39. වෙන් කිරීම (ඉතිරි කොටස)
## 39.3 නව නීතිමය ආයතන දෙකකට ව්‍යාපාර වත්කම් හා වගකීම් මාරු කිරීම (ඉතිරි කොටස)

**පරිපාලන නම වෙනස්වීම් ඇතුළුව වෙනත් විධි**

- පරිපාලක සමාගමෙන් (SLIC) SLICGL වෙත මෝටර් රථවල පරිපාලන නමේ වෙනස.

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, රු. මිලියන 228 ක ධාරණ පිරිවැයක් සහිත මෝටර් වාහන සමාගම (SLICGL) වෙත 2024 පෙබරවාරි 01 දින සිට නිත්‍යානුකූලව මාරු කරන ලදි. තවද, කළමනාකාරිත්වය පරිපාලක සමාගමෙන් පරිපාලන නම මාරු කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටී. සමාගම මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර 2025 අවසානය වන විට සමස්ත පරිපාලන මාරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරයි.

- පරිපාලක සමාගමෙන් (SLIC) SLICGL වෙත මූල්‍ය ආයෝජනවල පරිපාලන නමේ වෙනස.

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, රු. බිලියන 31.3 ක පිරිවැය සහිත මූල්‍ය වත්කම් සමාගම (SLICGL) වෙත 2024 පෙබරවාරි 01 දින සිට නිත්‍යානුකූලව මාරු කරන ලදි. මෙයට සමගාමීව, පරිපාලක සමාගමෙන් මෙම මූල්‍ය උපකරණවල පරිපාලන නම මාරු කිරීමට ගතහැකි සියලු පියවර ගෙන ඇත. කෙසේවෙතත්, සමහර මූල්‍ය උපකරණ පරිපාලක සමාගමේ නම යටතේ තවදුරටත් පවතී.

2024 දෙසැම්බර් 31 දිනට හා 2025 මාර්තු 31 දිනට මාරු කිරීමේ ක්‍රියාවලියේ තත්ත්වය පහත පරිදි වේ.:

| මූල්‍ය උපකරණ වර්ගය | බැංකුව/ආයතනය | 2024 දෙසැම්බර් 31 දිනට | 2025 මාර්තු 31 දිනට නිමකළ | 2025 මාර්තු 31 දිනට ක්‍රියාත්මක | නිමකිරීම % |
|---|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | CDS ගිණුම * | **10,319,746** | – | 10,319,746 | – |
| ලැයිස්තුගත ණයකර | CDS ගිණුම * | **3,282,503** | – | 3,282,503 | – |
| ලැයිස්තුගත නොකළ ණයකර | ලංකා බැංකුව | **1,001,589** | 1,001,589 | – | 100 |
| | DFCC බැංකුව පීඑල්සී | **1,061,178** | 1,061,178 | – | 100 |
| | මහජන බැංකුව | **507,014** | 507,014 | – | 100 |
| වාණිජ පත්‍රිකා | LOLC හෝල්ඩින්ග්ස් පීඑල්සී | **1,717,952** | 1,717,952 | – | 100 |
| කාලින තැන්පතු | ලංකා බැංකුව | **3,049,286** | 2,946,719 | 102,567 | 97 |
| | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | **203,043** | 203,043 | – | 100 |
| | හැටන් නැෂනල් බැංකුව පීඑල්සී **** | **57,908** | – | 57,908 | – |
| ඒකක භාර | සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් *** | **3,095,920** | – | 3,095,920 | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | ලංකා බැංකුව ** | **3,791,482** | – | 3,791,482 | – |
| | හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ** | **2,457,800** | – | 2,457,800 | – |
| | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ** | **3,944,310** | – | 3,944,310 | – |
| | වෙල්ත් ට්‍රස්ට් ** | **1,034,484** | – | 1,034,484 | – |
| ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | **2,602,341** | 2,602,341 | – | 100 |

** සමාගම වර්තමානයේ ලැයිස්තුගත කොටස් සහ ලැයිස්තුගත ණයකරවල පරිපාලන නමේ වෙනස සඳහා ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ඉල්ලා ඇති සියලුම ලියවිලි විධිමත්ව ඉදිරිපත් කර ඇති අතර, කොමිෂන් සභාවේ විධිමත් අනුමැතිය විගණකගේ වාර්තාවේ දිනයට අපේක්ෂා කරයි.*

*** සමාගම සියලුම ප්‍රාථමික වෙළෙන්ඳන් සමඟ CDS ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. සමාගම 2025 සැප්තැම්බර් 30 දින වන විට මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරයි.*

**** සමාගම ඒකක භාරවල පරිපාලන නමේ වෙනස සකස් කර ගැනීම සඳහා අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. සමාගම 2025 සැප්තැම්බර් 30 දින වන විට මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරයි.*

***** සමාගම ඉල්ලා ඇති තොරතුරු භාර දී ඇති අතර 2025 මැයි 31 දින වන විට බැංකුව පරිපාලන නම වෙනස් කරනු ඇත.*

39. වෙන් කිරීම (ඉතිරි කොටස)

39.3 නව නීතිමය ආයතන දෙකකට ව්‍යාපාර වත්කම් හා වගකීම් මාරු කිරීම (ඉතිරි කොටස)

- පරිපාලක සමාගමෙන් (SLIC) SLICGL වෙත බැංකු ගිණුම්වල පරිපාලන නමේ වෙනස් කිරීම

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, බැංකු ගිණුම්වල නෛතික හිමිකම 2024 පෙබරවාරි 01 දින සිට සමාගම (SLICGL) වෙත මාරු කරන ලදී. තවද, සැලකියයුතු බැංකු ගිණුම් ගණනාවක පරිපාලන නම් 2025 මාර්තු 31 දිනට වෙනස් කර ඇති අතර කළමනාකාරිත්වය SLIC වෙතින් පවතින බැංකු ගිණුම්වල පරිපාලන නම් වෙනස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටි.

| බැංකුවේ නම | බැංකු ගිණුම් ගණන | 2025 මාර්තු 31 දිනට නිමකළ | නිමකිරීම % |
|---|---|---|---|
| ලංකා බැංකුව | 18 | 18 | 100 |
| කාගිල්ස් බැංකුව * | 1 | – | – |
| චීන බැංකුව * | 1 | – | – |
| කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 6 | 6 | 100 |
| DFCC බැංකුව * | 1 | – | – |
| හැටන් නැෂනල් බැංකුව * | 6 | – | – |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 1 | 1 | 100 |
| නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් | 1 | 1 | 100 |
| පෑන් ඒෂියා බැංකුව * | 1 | – | – |
| මහජන බැංකුව | 8 | 8 | 100 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව * | 1 | – | – |
| සම්පත් බැංකුව * | 2 | – | – |
| ස්ටෑන්ඩර්ට් චාර්ටඩ් බැංකුව * | 7 | – | – |
| සෙලාන් බැංකුව * | 1 | – | – |
| | 55 | 34 | 62 |

* සමාගම ඉල්ලා ඇති තොරතුරු ලබා දී ඇති අතර 2025 සැප්තැම්බර් 30 අවසානය වන විට බැංකු විසින් පරිපාලන නම් වෙනස් කරනු ඇත.

වෙන් කිරීමට අදාළ පරිපාලන නාමය වෙනස් කිරීම ඇතුළු ඇතැම් පරිපාලනමය කරුණු තවමත් සිදුවෙමින් පවතින බැවින් හා පුළුල් පශ්චාත් වෙන්කිරීමේ ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස විසඳමින් පවතින බැවින් සහ විගණක වාර්තාවේ දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් ලිඛිත ප්‍රතිචාරයක් ලැබීමේ ක්‍රියාවලියක යෙදී සිටින බැවින්, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් දීර්ඝ කිරීමක් ඉල්ලා ඇත.

## 40. සම්බන්ධිත පාර්ශව අනාවරණ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 24 (LKAS) – "සම්බන්ධිත පාර්ශව ගණුදෙනු", අනුව, ආයතනයේ කටයුතු සැලසුම්කරණය, මෙහෙයවීම, සහ පාලනය කිරීමේ අධිකාරීත්වය සහ වගකීම ප්‍රධාන කලමනාකරණ මණ්ඩල පිරිසට අයත් වේ. ඒ අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

**මව් සමාගම සහ අවසාන පරිපාලක පාර්ශවය**

සමාගමේ ආසන්න සහ අවසාන පාලක පාර්ශවය ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් වන අතර එය සමාගමේ කොටස්වලින් 100%ක් දරනු ලබයි.

**ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP)**

ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සෘජුව හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම සහිත පුද්ගලයින් වෙති.

සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරු ඇතුළුව) ඉහත නිර්ණායක සපුරාලන තෝරාගත් ප්‍රධාන සේවකයින් සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

## 40. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස)
## ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) (ඉතිරි කොටස)

2024 දෙසැම්බර් 31 දිනට, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සාමාන්‍ය රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

| අධ්‍යක්ෂගේ නම | වෙනත් සම්බන්ධිත ආයතනයන්හි අධ්‍යක්ෂධුරය | අධ්‍යක්ෂධුරයේ ස්වභාවය | බැඳුණු දිනය | ඉල්ලා අස් වූ දිනය |
|---|---|---|---|---|
| නුසිත් කුමරතුංග මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | සභාපති/<br>විධායක නොවන අධ්‍යක්ෂ | 23.10.2024 | නැත |
| | ලංකා විදුලිබල මණ්ඩලය | විධායක නොවන අධ්‍යක්ෂ | | |
| රොනල්ඩ් සී පෙරේරා මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | සභාපති/<br>විධායක නොවන අධ්‍යක්ෂ | 29.04.2024 | 08.10.2024 |
| | ලංකා බැංකුව | සභාපති/<br>විධායක නොවන අධ්‍යක්ෂ | 20.01.2023 | 13.03.2024 |
| | ලංකා හොස්පිටල්ස් කෝපරේෂන්<br>කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂ | 01.01.2022 | 24.10.2024 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්<br>කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම<br>මහජන බැංකුව | විධායක නොවන අධ්‍යක්ෂ | 29.04.2024 | නැත |
| | එල්සීබී ෆිනෑන්ස් පීඑල්සී | සභාපති/<br>විධායක නොවන අධ්‍යක්ෂ | | |
| රවින්ද්‍ර පත්මප්‍රිය මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්<br>කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂ | 29.04.2024 | නැත |
| | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් | | |
| ආචාර්ය කිත්සිරි මංචනායක මයා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | විධායක නොවන අධ්‍යක්ෂ | 29.04.2024 | 09.10.2024 |
| නිශාන්ත දයානන්ද මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්<br>කැනොවින් හෝටේල්ස් ආන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම<br>කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂ | 24.10.2022 | 31.12.2024 |
| අනිල් කොස්වත්ත මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | විධායක නොවන අධ්‍යක්ෂ | 29.04.2024 | නැත |
| | ලක්ආර්කේඩ් අත්තිඩිය වෙඩ් පාර්ක් රිසෝර්ට් (පුද්ගලික) සමාගම | | | |
| නඹමාල් මයිකල් පැල්පොල මහතා | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්<br>ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්<br>කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂ | 24.10.2022 | 08.10.2024 |

## 40.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

ප්‍රධාන කලමනාකරණ පිරිස් සඳහා ගෙවීම් පහත දක්වේ:

| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| අධ්‍යක්ෂ ගාස්තු හා දීමනා | **1,988** | – |

වාර්තාකරන දිනයට, ප්‍රධාන කලමනාකරණ පිරිස්වලට අදාළ ගෙවියයුතු/ලැබියයුතු කිසිවක් නොමැත.
එමනිසා, ප්‍රධාන කලමනාකරණ පිරිස් වෙතින් හිඟ ශේෂ අනුව කිසිදු හානිකරණ අලාභයක් වාර්තා කර නොමැත.

## 40. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස)

### 40.2 ආසන්න සහ අවසාන පාලන සමාගමේ, අවසාන මව් සමාගමේ - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමූහ ආයතන සමග ගනුදෙනු

| සමාගමේ නම | සම්බන්ධතාවයේ ස්වභාවය | ගනුදෙනුවල ස්වභාවය | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | මව් සමාගම | ආයෝජනයට අදාළ ගනුදෙනු | (16,179,974) | – |
| | | කළමනාකරණ වියදම් | (1,558,970) | – |
| | | නිරවුල් කිරීම | 18,544,791 | – |
| | | ලැබියයුතු වාරිකය | 2,138 | – |
| | | ගෙවූ වාරිකය | (2,138) | – |
| | | හිඟ කුලී වියදම | 331,254 | – |
| | | නිරවුල් කුලී වියදම | (331,254) | – |
| | | හිඟ උපයෝගිතා වියදම | (303,512) | – |
| | | නිරවුල් උපයෝගිතා වියදම | 302,991 | – |
| | | සම්මාන මුදල | 915 | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | අනුබද්ධ | ආයෝජනයට අදාළ ගනුදෙනු | (2,561,845) | – |
| | | කළමනාකරණ වියදම් | (6,991,638) | – |
| | | නිරවුල් කිරීම | 8,489,091 | – |
| | | රක්ෂණ වාරිකය | 5,945 | – |
| | | වාරික නිරවුල් කිරීම | (5,945) | – |
| | | හිඟ වත්කම් උපයෝගිතා ගාස්තුව | (3,238) | – |
| ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් | අනුබද්ධ | රක්ෂණ වාරිකය | 213,316 | – |
| | | වාරික නිරවුල් කිරීම | (105,412) | – |
| | | හිඟ හිමිකම | 35,230 | – |
| | | හිමිකම් නිරවුල් කිරීම | (35,230) | – |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | අනුබද්ධ | රක්ෂණ වාරිකය | 68,128 | – |
| | | වාරික නිරවුල් කිරීම | (31,412) | – |
| කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | අනුබද්ධ | රක්ෂණ වාරිකය | 5,528 | – |
| | | වාරික නිරවුල් කිරීම | (4,184) | – |
| | | හිඟ හිමිකම | 1,656 | – |
| | | හිමිකම් නිරවුල් කිරීම | (1,656) | – |
| සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | අනුබද්ධ | රක්ෂණ වාරිකය | 10,650 | – |
| | | වාරික නිරවුල් කිරීම | (10,650) | – |
| | | හිඟ හිමිකම | 36 | – |
| | | හිමිකම් නිරවුල් කිරීම | (36) | – |
| ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී | අනුබද්ධ | රක්ෂණ වාරිකය | 66,490 | – |
| | | පරිපාලක සමාගමෙන් මාරු කිරීම - වාරිකය | 355 | – |
| | | රක්ෂණ වාරිකය නිරවුල් කිරීම | (62,987) | – |
| | | හිඟ හිමිකම | 12,529 | – |
| | | ගෙවනලද හිමිකම | (12,529) | – |
| | | ලබාදෙන ලද රසායනාගාර සේවා | 19,745 | – |
| | | රසායනාගාර සේවා නිරවුල් කිරීම | (19,709) | – |

## 40. සම්බන්ධිත පාර්ශව අනාවරණ (ඉතිරි කොටස)

### 40.2 ආසන්න සහ අවසාන පාලන සමාගමේ, අවසාන මව් සමාගමේ - ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සමූහ ආයතන සමඟ ගනුදෙනු (ඉතිරි කොටස)

| සමාගමේ නම | සම්බන්ධතාවයේ ස්වභාවය | ගනුදෙනුවල ස්වභාවය | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|---|
| **ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම** | අනුබද්ධ | රක්ෂණ වාරිකය | **11,781** | – |
| | | පරිපාලක සමාගමෙන් මාරු කිරීම - වාරිකය | **4** | – |
| | | රක්ෂණ වාරිකය නිරවුල් කිරීම | **(9,014)** | – |
| | | හිඟ හිමිකම | **259** | – |
| | | ගෙවන ලද හිමිකම | **(259)** | – |
| | | ලබාදෙන ලද රසායනාගාර සේවා | **2,642** | – |
| | | රසායනාගාර සේවා නිරවුල් කිරීම | **(2,642)** | – |
| **කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම** | අනුබද්ධ | රක්ෂණ වාරිකය | **2,931** | – |
| | | වාරික නිරවුල් කිරීම | **(2,931)** | – |
| | | හිඟ හිමිකම | **2,699** | – |
| | | හිමිකම් නිරවුල් කිරීම | **(2,699)** | – |

වසර තුළ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් (මව් සමාගම) කැන්විල් හෝල්ඩින්ග්ස් භාණ්ඩාගාරයට මාරු කර ඇත.

## 41. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වේ. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ සිදුවීම් ලෙස සිදුවීම් වර්ග දෙකක් හඳුනාගත හැකිය:

- ගැලපීම් සිදුවීම් - වාර්තාකරන දිනයට පැවති තත්ත්වයන් පිළිබඳ අමතර සාක්ෂියක් ලබාදෙන සිදුවීම්
- ගැලපීම් සිදුවීම් - වාර්තාකරන දිනයෙන් පසු ඇති වූ තත්ත්වයන් පිළිබඳ සඳහන් කරන සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර සුදුසු අවස්ථාවලදී පහත දැ හැර මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වල ගැලපීම් හෝ අනාවරණ සිදුකර ඇත.

### 41.1 අධ්‍යක්ෂධූරවල පසුකාලීන වෙනස්වීම්

| අධ්‍යක්ෂගේ නම | අධ්‍යක්ෂධූරයේ ස්වභාවය | බලාත්මක දිනය |
|---|---|---|
| **පත්කිරීම්** | | |
| ආර් පී බුල්ජන්ස් මහතා | විධායක නොවන | 2025 ජනවාරි 01 |
| ආර් ධර්මේන්ද්‍ර මහතා | විධායක නොවන | 2025 ජනවාරි 01 |
| එන් ඩී බී උනම්බුව මහතා ජනාධිපති නීතිඥ | විධායක නොවන | 2025 ජනවාරි 01 |
| **ඉල්ලා අස්වීම්** | | |
| නිශාන්ත දයානන්ද මහතා | විධායක නොවන | 2025 ජනවාරි 01 |
| අනිල් කොස්වත්ත මහතා | විධායක නොවන | 2025 ජනවාරි 01 |

ඉහත සඳහන් දැ හැරුණු විට, මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණ අවශ්‍ය විය හැකි වාර්තාකරන දිනයෙන් පසු සිදු වූ සැලකියයුතු සිදුවීමක් නොමැත.

## 42. වෙන් කිරීම් හා අසම්භාව්‍යයන්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**වෙන්කිරීම**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, සමාගමට පහසුවෙන් මැනිය හැකි වර්තමාන නෛතික හෝ හිතකර බැඳීමක් ඇත්නම්, සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වියහැකිනම්, වෙන් කිරීම් හඳුනා ගනී. මුදලේ කාලීන වටිනාකම සහ වගකීමට විශේෂිත අවදානම් පිළිබඳ වර්තමාන වෙළෙඳපොල තක්සේරු කිරීම් පිළිබිඹුවන පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කරමින් වෙන් කිරීම් තීරණය කෙරේ. වට්ටම ආපසු හැරවීම ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

**අසම්භාව්‍ය බැරකම්**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අනාගත බැඳීමක් ඇතිවී හෝ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති වී තිබුනද ගෙවීම සිදුවිය හැකි හෝ ප්‍රමාණය පහසුවෙන් මැනිය නොහැකි අවස්ථාවේදී අසම්භාව්‍ය බැරකම් අනාවරණය කෙරේ.

2024 දෙසැම්බර් 31 දිනට සමාගමට අනාවරණය කිරීම සඳහා අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොමැත.

## 43. වත්කම් උකස් කිරීම

වාර්තාකරණ දින අවසානයට බැඳීම් සඳහා සුරකුම් ලෙස කිසිදු වත්කමක් පිරි නමා නොමැත.

# 08

# අතිරේක තොරතුරු


**167**
රක්ෂණ ව්‍යාපාරයේ කාර්යසාධනය

**168**
දස වසරක සාරාංශය ආදායම් ප්‍රකාශය

**170**
දස වසරක සාරාංශය – ශේෂ පත්‍රය

**172**
ශාඛා ජාලය

**184**
ආයතනික තොරතුරු

**185**
වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය

# රක්ෂණ ව්‍යාපාරයේ කාර්යසාධනය

